
# බුදුසරණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564 ක් වූ පොසොන් පුර පසළොස්වක පෝය දින
රාජ්‍ය වර්ෂ 2020 ජූනි 05 වනදා සිකුරාද
BUDUSARANA, FRIDAY JUNE 05, 2020
55 වන කාණ්ඩය, 01 වන පත්‍රය, පිටු 36 ආරම්භය 1965 - 06 - 13
මිල රු. 40.00
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්

www.budusarana.lk email: budusarana@lakehouse.lk



## මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව 4,5,6 දිනවල දී...

# කසාවතක අසිරිය

**බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමෙන් වර්ෂ 218 ක් ගත වූ පසු මුළු දඹදිව ම එකම අධිරාජ්‍යයා වූයේ අශෝකයන් ය.**



ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද,අභිධර්ම කථිකාචාර්ය, ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත,
**බලංගොඩ රාධ හිමි**

## අශෝක රජුගේ ආනුභාවය

උඩ දිශාවටත්, යට දිශාවටත් සැතපුම් දහසයක් දක්වා ඔහුගේ ආඥාව දෙවියන් සහ නාගයන් ද පිළිගෙන ඇත. දිනක් පාසා දෙවියන් විසින් අනෝතප්ත විලෙන් පැන් කළ දහසක් අශෝකයන්ගේ රාජ මන්දිරයට රැගෙන එයි. දෙවියන් විසින් හිමාලයෙන් ඉතා රසවත් වූ නාගලතා දැහැටි ද රැගෙන ඒ. එලෙසින් ම දිනපතා ඖෂධ පිණිස අරලු සහ නෙල්ලි ද, රන්වන් වූ ප්‍රණීත අඹ ගෙඩි ද, හිමාලයෙන් රැගෙන එන්නේ දෙවියන් විසිනි.

රජු ඇතුලු බිසෝවරුන්ට සෑහෙන පරිදි සුවඳ විලවුන් හා වටිනා වස්ත්‍ර, අඳුන් හා ස්නානය කරන විට ඇඟ ගානා සුවඳ කුඩු වැනි දෑ දිනපතා රැගෙන එන්නේ නා ලොව නාගයන් විසිනි. ඡද්දන්ත දහ තලාවේ වැවෙන හැල් වී ගැල් නවදහසක් දිනක් පාසා ගෙනෙනු ලබන්නේ ගිරවුන් විසිනි. මීයන් විසින් වී පොතු ඉවත් කරනු ලැබේ. රජු ඇතුලු පිරිස අනුභව කරන්නේ එම සහල්වලින් පිසූ රස මුසු බතකි. කර්මාන්ත ශාලාවල යකඩ තැලීම සිදු කරන්නේ වලසුන් විසිනි. රජුගේ විනෝදාස්වාදය උදෙසා කරවීක පක්ෂීන් පැමිණ මිහිරි හඬින් නාද නංවයි. මී මැස්සන් ඒ ඒ දිශාවලින් පැමිණ රජ මාලිගාව අවට මී බඳින්නේ රජු උදෙසා ය.

## මහා කාල නා රජු මැවූ බුදුරුව

මෙවන් ආනුභාවයක් ඇති අශෝක රජු එක්දිනක් රන් හැකිලි බන්ධනයක් යවා කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම යන සිව් බුදුවරුන් දුටු කල්පයක් ආයුෂ ඇති මහා කාල නම් නා රජු තම රාජාංගනයට ගෙන්වා ගත්තේ ය. වේදිකාවක් සාදවා, මහර්ඝ ආසනයක් පනවා, එහි හිඳුවා බුදුරුව මවා පෙන්වන ලෙස ආරාධනා කළේ ය. එය පිළිගත් කාල නා රජු මහා පුරුෂ ලක්ෂණවලින් සහ අසූවක් කුඩා ලක්ෂණවලින් ප්‍රවලිත වූ රැස් විහිදෙන බුදුරුව මවා පෙන්වී ය. දින සතක් පුරාවට මවා පෑ මෙම අසිරිමත් බුද්ධ රූපය දෙස බලා සිටි රජු "අක්ෂි පූජා" නම් දෑස විවර කොට බුදුරුව දෙස බලා සිටියහ. බුදුරදුන් පිරිනිවන් වැඩි පසු එවැනි නිර්මිත බුදුරුවක් සියැසින් දුටු පළමු සහ අවසන් ඉන්දීය රජවරයා ඔහු ය.

මෙසේ කල් ගතවන විට එක්දිනක් සිරි මැදුරු තලයේ සක්මන් කරමින් සිටි රජුගේ නෙත ගැටුණේ උපශාන්ත පැවිද්දෙකි. ඔහු නමින් නිග්‍රොධ සාමණේරයන් ය. අශෝක රජු පළමුව තමාට ලැබුණ උදේනි රාජ්‍යය හැර අන් රාජ්‍යයන් ද යටත් කරමින් එන ගමනේදී සුමන නම් තම සොයුරාගේ රාජ්‍යය ද අත්පත් කර ගත්හ. ඒ වන විට සුමනගේ භාර්යාව වන සුමනා දේවිය දරු ගැබ් ඇත්තී ය.ඇය රහසේ ම පලා යන විට එක් චණ්ඩාල ගමකට නො දුරෙහි සුවිසල් නුග රුකක් සමීපයට එන විට එම වෘක්ෂ යට අධිපති දේවතාවා "සුමනාවෙනි" යි කියා නමින් ම ඇය අමතා නවාතැන් ගැනීම පිණිස සාලාවක් මවා දී ඇයට ආරක්ෂාව සපයා දුන්නේ ය. ඇය එහි දී රන්වන් පුත් කුමරෙකු වැදුවා ය. නුග ගසේ දේවතා විසින් අරක්ෂා කළ නිසා නිග්‍රොධ කුමරු ලෙස නම් තැබූහ. ඒ ගම්මානයේ නායකයා ඇය තම ස්වාමි දියණිය ලෙස සිතමින් සියලූ උපකාර ගෞරව දැක්වී ය.

මෙසේ පුරා සත් වර්ෂයක් ගත වන විට දුව පැන ඇවිදින මේ පුතුගේ පුණ්‍යානුභාවය දුටු මහාවරුණ රහතන් වහන්සේ සුදුසු කාලය පැමිණෙන තුරු ඒ ප්‍රදේශයේ ම වාසය කරමින් සිට කල් යල් බලා රජ කුමාරියට දැනුම් දී පුත් කුමරු පැවිදි කළේ ය. පැවිදි කිරීමට හිස කෙස් කපන මොහොතේදී ම රහත් භාවයට පැමිණි නිග්‍රොධ සාමණේරයන් වහන්සේ දිනක් මව්තුමිය දැකීම පිණිස පා සිවුරු ගෙන ඇගේ නිවසට යාම සඳහා අශෝකයන්ගේ රජමාලිගාවට නුදුරින් ගමන් කරන විට උපශාන්ත විලාශය දැකීමෙන් රජුගේ සිත පහන් විය. ඒ මොහොතේදී ම ආරාධනා කොට රජමාලිගාවට වැඩමවා සුදුසු ආසනයක වැඩ හිඳින ලෙස ආරාධනා කළහ. අන්‍ය වූ වැඩිහිටි භික්ෂුවක් නො දැක රජතුමාගේ අතට පාත්‍රය දී සිංහාසනයේ අසුන් ගත් සේක. එය දුටු රජුට පැහැදීම තවත් වැඩිදියුණු විය. සාමණේරයන් වහන්සේ ධම්මපදයේ අප්පමාද වර්ගය දේශනා කොට රජතුමාගේ පැහැදීම දියුණු කළහ.

දිනෙන්දින මහා සඟරුවන වැඩමවා සැට දහසක් සඟ පිරිසට නිති දන්වැට පැවැත් වූහ. රහතන් වහන්සේලා රජතුමා ඇතුලූ පිරිස තිසරණ සහිත පඤ්චසීලයෙහි පිහිටුවා චිත්ත ප්‍රසාදය දියුණු කළහ. අශෝකාරාමය ඉදි කරවා සැට දහසක් මහා සඟනට පූජා කළ අශෝක රජු සිව්පසයෙන් ම උපකාර කළහ. දිනක් අශෝක රජු මහා දන් දී සැට දහසක් සඟ පිරිස මැද වාඩිවී බුදුරදුන් දෙසූ ධර්මස්කන්ධයන් කොපමණ ද කියා ඇසූහ. ස්කන්ධ අසූහාර දහසක් යැයි රහතන් වහන්සේලා පිළිතුරු දුන්හ. එය අසා සිත පහදවා ගත් අශෝක රජු නගර අසූහාර දහසක වෙහෙර විහාර අසූහාර දහසක් තනවන්නට ඇමතිවරුන්ට අණ කළහ. සංඝයා විසින් ද ඉන්ද ගුප්ත නම් රහතන් වහන්සේ විහාර කර්මාන්තයේ කටයුතු මෙහෙයවන්නා ලෙස පත් කළහ.තෙරුන් වහන්සේ තම ආනුභාවයෙන් විහාර කර්මාන්තයේ කටයුතු තුන් අවුරුද්දකින් නිම කරවා අශෝකාරාමයේදී සියලූ විහාරයන් සඟ සතුකොට පූජා කිරීමේ මහා පින්කම සූදානම් කළහ. එම උත්සවය සඳහා භික්ෂූන් වහන්සේලා කෝටි අසූවක් ද භික්ෂුණීන් අනූහය ලක්ෂයක් ද වැඩම කළහ.

## ලෝක විවරණ ප්‍රාතිහාර්ය

ඒ අතර රහතන් වහන්සේලා ලක්ෂ ගණනක් විය.එහි දී රජතුමාගේ චිත්තප්‍රසාදය වැඩිදියුණු කිරීම පිණිස රහතන් වහන්සේලා විසින් "ලෝක විවරණ" "ප්‍රාතිහාර්ය" සිදු කරන ලදී. ඒ අනුව රජතුමාට අශෝකාරාමයේ සඟ පිරිස ඉදිරියේ වාඩිවී සිට මුලූ දඹදිව් තලය බෙර ඇසක් සේ සමතලා වී මුහුද දක්වා පෙනෙන්නට සැලැස්වී ය. අසූහාර දහසක් විහාර එකම මොහොතේ පූජා වන අසිරිය දුටු රජතුමා අපමණ ප්‍රීතියක් ලබා, මෙවැනි ප්‍රීතියක් අන් කවරෙකුට ඉපදී ඇත්දැයි සංඝයාගෙන් ඇසූහ. පිළිතුරු වදාළ මොග්ගලීපුත්ත තිස්ස රහතන් වහන්සේ මහරජුනි ඔබ වැනි දායකයෙක්දිවමත් බුදුන් කළ ද නොසිටියේ යැයි ප්‍රකාශ කළහ. එසේ නම් ස්වාමීනී, මම බුදු සසුනෙහි හිමිකරුවෙක් දැයි විමසූ රජුට රහතන් වහන්සේ ප්‍රකාශ කළේ කොපමණ පූජාවන් කළත් තම දරුවෙකු පැවිදි කරන තුරු සසුනෙහි කොටස්කරුවෙකු නො වන බවයි.

## මිහිඳු කුමරු පැවිදිවීම

එය ඇසූ අශෝක රජතුමා තමාගේ සමීපයෙහි සිටි මිහිඳු කුමරු හා සංඝමිත්තා කුමරිය අමතා පැවිදිවන්නට කැමැත්ත විචාරා, ඔවුන් ඉහළින් ම කැමති වූ පසු පැවිදි කරවීම සඳහා රහතන් වහන්සේලාට භාර කළහ. ඒ වන විට විසි හැවිරිදි මිහිඳු කුමරු පැවිදි උපසම්පදාව ලැබූ සීමා මාලකයේ දී ම රහත් භාවයට පත් වූහ. දහඅට හැවිරිදි සංඝමිත්තා ද පැවිදි වී මහරහත් භාවයට පත්විය.

ඒ කාලයේ දී බුදු සසුනට උළාර ලාභ සත්කාර ලැබෙන නිසා පිරිහී ගිය ආහාරපාන ඇති බොහෝ අන්‍යාගමිකයන් යැපීම් ක්‍රමයක් ලෙස කසාවතක් දරා භික්ෂූන් ලෙස පෙනී සිටිමින් නොයෙක් පව්කම් සිදු කරන ආකාරය දුටු රහතන් වහන්සේලා වනගත වූහ.උපෝසථ හා පවාරණ විනය කම් සත් අවුරුද්දකින් සිදු නොවුණ බව දැනගත් අශෝක රජු මොග්ගලී පුත්තතිස්ස රහතන් වහන්සේ වැඩමවා ගෙන භික්ෂු වේශධාරීන් නෙරපා හැර උපෝසථ විනය කර්මාදිය කරවීය. මොග්ගලීපුත්ත තිස්ස රහතන් වහන්සේ ඇතුලූ දහසක් රහතන් වහන්සේලා එකතුව තුන්වන ධර්මසංගායනාව ද සිදු කළහ. අතිශයින් සුවපත් සිතක් ඇති අශෝක රජුගේ අනුග්‍රහයෙන් සාමන්ත රාජ්‍ය ගණනාවකට ධර්ම දූතයන් පිටත් කර යැවී ය.

## ලාංකේය පුනරුදය

මිහිදු මහා රහතන් වහන්සේ ය. මිස්සක පව්වෙන් උදා වූ පොසොන් සඳක් සදිසි ව කසාවතෙහි රැඳී සීල ගුණ සුගන්ධයෙන් ලක්ධරණීතලය පාරිශුද්ධ කළේ මිහිදු මා හිමියෝ ය. මහා බෝධීන්වහන්සේ වැඩම කරවා ලූ සංඝමිත්තාවෝ ද සිංහලයන්ට අපමණ සෙනෙහසක් දැක්වූහ. එදා වැඩම කළ ධර්මදූත කණ්ඩායමේ සිටි සියල්ලන් ම පාහේ අශෝකයන්ගේ රජ පවුලට සම්බන්ධ ව සිට පැවිදි වූවෝ ය.

අසරණ වී සිටි සිහලූන්ට තිසරණය ලබා දී, සෙල්ලමට දඩයමේ ගිය සිහලූන් සිල්වතුන් කර ගස්, ගල් දෙවොල් පිදූ සිහලූන්ට ථූපාරාම ආදී මහා සෑ තනවා දී ඔවුන් සැබෑ වන්දනා ගමනක කැඳවාගෙන ගියහ. කසාවතින් ලක් ධරණීතලය ඔපවත් කළ සිල් ගුණ සුවඳ හෙළ බිමට කා වැද්දවූ ලෞකික හා ලෝකෝත්තර සැනසීමේ මාවත හෙළයන්ට විවර කර දුන් මිහිඳු මහ රහතන් වහන්සේ ලක් බිමේදී ම පිරිනිවන් වැඩම කළහ. සංඝමිත්තාවෝ ද මේ බිමේ ද ම පිරිනිවන් වැඩම කළහ.

පොසොන් ආමාවෙන් සිත් සැනහෙන අදවන්දිනෙක ඒ ශ්‍රී නාමයන් ගෞරවයෙන් සිහි කරමු. සිල් ගුණ රකිමින් බුදුගුණ සිහි කරමු.සඝ ගුණයේ අසිරිය විඳ ගැනීම සඳහා ධර්මය ම පුරුදු කරමු.මිහිඳු මහා රහතන් වහන්සේගේ කරුණා ගුණය හැම සිතකට ම දැනේවා.



# පොසොන් සඳේ සදහම් කිරණ



**ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් දහම් පණිවිඩය අනුබුදු මිහිඳු මහරහතුන් වහන්සේ විසින් පොසොන් මස පුර පසළොස්වක පොහෝ දින ලක්වැසියන්ට හඳුන්වා දීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව ආගමික ජාතික සංස්කෘතික සාමාජික හර පද්ධතීන් උරුම කරගනිමින් ලෝක ඉතිහාසය තුළ අභිමානවත් ගමනක් පැමිණ ඇති බව අප කවුරුත් දන්නා කරුණකි.**

එනිසාම ධර්මද්වීපය ඉන්දියන් සාගරයේ මුතු ඇටය, පෙරදිග මහා ධාන්‍යාගාරය ලෙස පෙරදිග පමණක් නොව අපරදිග වාසීන්ගේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වෙමින් සම්මානනීයත්වයට පත් වූ බව ඓතිහාසික මූලාශ්‍රය මගින් මැනවින් ප්‍රකට වී ඇත.

මිහිඳු මහරහතුන් වහන්සේ දේවානම් පියතිස්ස මහරජතුමා මුණ ගැසී කළ ප්‍රථම සාකච්ඡාව මෙහිලා අතිශයින්ම වැදගත් වන්නකි. උන්වහන්සේගේ ප්‍රමුඛ අභිලාෂය වන්නේ සතර වටින්ම මුහුදෙන් වටවුණ, සම ශීත හා උෂ්ණ දේශගුණයෙන් සමලංකෘත වූ, ඊශාන දිගින් හා නිරිත දිගින් වරින් වර අවශ්‍ය පරිදි වැසි ලැබෙන, තුරු ලතාදියෙන් විසිතුරු වූ, සුන්දර මිනිසුන්ගේ විහරණයෙන් සමලංකෘත වුණු මෙම දිවයින තුළ සම්බුදු දහම ස්ථාපිත කිරීමයි. එහිදී, ලක්වැසි ජනතාවට යමක් මැනවින් අවබෝධ කර ගැනීමට අවශ්‍ය ඥානය තිබේදැයි ධර්ම දේශනා කිරීමට ප්‍රථමයෙන් පරීක්ෂා කිරීම උන්වහන්සේගේ පළමු කාර්යය වූ බව පෙනේ.

ඒ අනුව මිස්සක පව්වේ දී මිහිඳු මාහිමියෝ අඹ පැනයෙන් –හා ඤාති පැනයෙන් රජතුමාගෙන් විමසීම ආරම්භ කළේ ඉහත කාරණාව සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙනි.

අඹ පැනය හා ඥාති පැනය පිළිබඳ ඓතිහාසික පැරණි වාර්තාවක් අපට හමුවන්නේ සමන්තපාසාදිකා විනය අටුවාවෙහි බාහිර නිදාන වර්ගයේ ය. එසේම මහාවංසය හා දීපවංසයේ ද මේ පිළිබඳ විස්තරයක් ඇතුළත් වේ. සමන්තපාසාදිකා විනයට්ඨ කථාවේ එය සඳහන් වන්නේ මෙසේ ය.

"එ දවස්හි තාම්‍රපර්ණීද්පයෙහි පොසොන් පසළොස්වක දා මූලනක්ෂත්‍ර නම් නැකතක් වේ. රජතෙම නැකැත් ඝෝෂා කරවා උත්සව කරව් යයි ඇමතියන්ට ද අණකොට සතළිස් දහසක් පුරුෂයන් පිරිවර කොට ඇතියේ මුව දඩකෙළි කෙළිනු කැමැත්තේ නුවරින් නික්ම මිස්සක පර්වතය යම් තැනෙක්හි එතැනට ගියේ ය. ඉක්බිති ඒ පර්වතයෙහි අධිගෘහිත එක් දේවතාවෙක් රජහට තෙරුන් දක්වන්නෙමියි රෝහිතමෘග වේශයක් ගෙන නුදුරු තැන තණ කන්නාක් මෙන් හැසිරේ. රජතෙම ඔහු දැක දැන් (තණ කෑමට) ප්‍රමාදවූ ඔහු විදින්නට අයුතු යයි දුනුදිය පෙළි. මුව තෙමේ අම්බස්තල මාර්ගයට පැමිණ පැන යන්නට පටන් ගත්තේ ය. රජතෙම පසු පස්සෙන් අම්බස්තලයට ම නැංගේ ය. මුව තෙමේ ද තෙරුන්ගේ නුදුරු තන්හි දී අතුරුදන් විය"

අනතුරුව රජතුමා සමග ඇතිවුණු ප්‍රශ්නෝත්තර සාකච්ඡාව පිළිබඳ අපගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

**මහරජ මේ ගස කුමක්ද?**

**ස්වාමීනි මේ අඹ ගසකි.**

**මහරජ මේ අඹ ගස හැර වෙනත් බොහෝ අඹ ගස් තිබේද?**

**ස්වාමීනි, මේ අඹ ගස හැර වෙනත් බොහෝ අඹ ගස් ඇත.**

**මහරජ, මේ අඹ ගස ද වෙනත් අඹ ගස් ද හැර වෙනත් ගස් තිබේද?**

**ස්වාමීනි වෙනත් බොහෝ ගස් ඇත. එහෙත් ඒවා අඹ ගස් නොවේ.**

**රජතුමනි වෙනත් අඹ ගස් ද, අඹ නොවූ ගස් ද හැර තවත් ගස් තිබේද?**

**ස්වාමීනි ඇත. ඒ මේ අඹ ගසයි.**

**මහරජ ඔබට ඤාතීහු සිටිත්ද?**

**ස්වාමීනි බොහෝ ඤාතීහු ඇත්තාහ.**

**මහරජ ඔබට ඤාතීහු හැර වෙනත් ඤාති නොවන අය සිටිත්ද?**

**ස්වාමීනි ඤාතීන්ට වඩා ඤාතී නොවන බොහෝ අය සිටිති.**

**මහරජ ඔබගේ ඤාතිහුත්, ඤාති නොවන අයත් හැර වෙනත් කිසිවෙක් සිටිත්ද?**

**ස්වාමීනි සිටිත්. ඒ මම ම වෙමි.**

මෙම ප්‍රශ්න විසර්ජන අවස්ථා දෙකෙහි ම ඉතා වැදගත්ම අවස්ථාව අවසානයේ දී අසන ලද ප්‍රශ්නයයි.

ස්වාමීනි, වෙනත් අඹගස් ද අඹ නොවන ගස් ද හැර තවත් ගස් තිබේද?

යන පැනයට දෙවනපෑතිස් රජතුමා දුන් පිළිතුර වන්නේ ඇත ස්වාමීනි, ඒ මේ අඹ ගසයි.

ඥාති ප්‍රශ්නය ද එසේ ම ය.

මහරජ ඔබගේ ඥාතීනුත්, ඥාති නොවන අයත් හැර වෙනත් කිසිවෙක් සිටීද?

ඇත ස්වාමීනි, ඒ මම වෙමි. මෙම අසන ලද අවසන් ප්‍රශ්නයට බොහෝ දෙනෙක් පිළිතුරු නොමැතිව අන්ද මන්ද වී කල්පනාවේ නිමග්නව වික්ෂිප්ත වීමට ඉඩ ඇත. එහෙත් රජතුමා එක එල්ලේම, ක්ෂණිකව, නිවැරදි ම පිළිතුර ලබාදීමට සමත්වීම මිහිඳු මාහිමියන්ගේ අතිශය ප්‍රසාදයට හේතුවූවාට කිසිදු සැකයක් නැත. උන්වහන්සේ ලක්දිවට පැමිණීමේ ප්‍රධාන පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීමට මඟ පෑදී ඇති බව ඉන් නිගමනය කරන්නට ඇත.

සොබා දහමත්, පරිසරයත්, සත්ව ලෝකයත්, කෙරෙහි අසීමිත ආදරයෙන් සෙනෙහසින්, ලෙන්ගතු කමින් බැඳී ගිය හෙළයන් යමක් පිළිබඳව පවතින සත්‍ය ඒ අයුරින්ම, ඇඩි සංයමයෙන් යුතුව අවබෝධකර ගැනීමේ ඥානය ස්වභාවයෙන්ම ලබා ඇති බව උන්වහන්සේ මෙම සාකච්ඡාව අනතුරුව අවබෝධ කොට ගත්හ.

මිහිඳු මාහිමියෝ ඉහත සාකච්ඡාව මගින් පියවරෙන් පියවර රජතුමාගේ ඥාන කෝෂ ය සංස්පර්ශ කරමින් ලක්වැසියන් සතු තීක්ෂණ නුවණ නැමැති මන්දිරය මත බුදුදහමේ අසිරිමත් දහම් පණිවිඩය මැනවින් ස්ථාපිත කළහ.

පැරැණි සිංහල ජන සමාජය රජතුමා අනුව යමින් සකස් වී තිබූ බව ඉතිහාසය පරීක්ෂා කිරීමෙන් මැනවින් ප්‍රකට වේ. මෙහි ප්‍රතිඵලය වූයේ අනුබුදු මිහිඳු මාහිමියන් හඳුන්වා දුන් බුදු දහමට සියලු ලක්වැසියෝ අනුගතවීමයි. ගම්දනව් සිසාරා මහ මන්දිරවල ජීවත්වන රාජරාජ මහාමාත්‍යාදීන්ගේ සහ කුඩා අතු පැල්වල ජීවත් වන දුගී දුප්පත් සියලුදෙනා අතර ම මෙම නැවුම් දහම වැඩි කලක් නොගොස් ප්‍රචලිත වන්නට විය. මෙම යථාර්ථවාදී දහමේ මිහිර විඳින්නට ලක්වැසියෝ යුහුසුළු වූහ.

ජාතික ආගමික ශාසනික සංස්කෘතික සාමාජික සෑම අංශයකම අර්ථාන්විත හර පද්ධතීන් උරුම කරගනිමින් නැවුම් මාවතක් ඔස්සේ ගමන් කිරීමට හෙළයෝ සැදී පැහැදී කටයුතු කළහ.


අඹ පැනයත්, ඥාති පැනයත් රජතුමාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉවසීමෙන් හා විමසීමෙන් යම් ප්‍රශ්නයකට අදාළ ම නිවැරදි පිළිතුර සොයාගැනීමට අවශ්‍ය දැනුමත්, දෛනික ජීවිතයේ මුහුණු දෙන ගැටලුවලට සුදුසුම විසඳුම් සොයා ගැනීමට අවශ්‍ය ප්‍රඥවත් හුරුපුරුදු කර වැඩි දියුණු කර ගනිමින් ලක්වැසියෝ ලොව අභිමානවත් ජාතියක් ලෙස නැගී සිටීමට සමත් වූහ.

එමනිසා අනුරාධපුර යුගයෙන් පටන් ගෙන පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ, සීතාවක, මහනුවර යුග පසුකරමින් කොළඹ දක්වා පැමිණි මඟ විමසීමේ දී ලෝක ඉතිහාස කතාපොතේ ලක්වැසියන්ට සුවිශේෂ තැනක් හිමි වී ඇත. එකී සුවිශේෂත්වය හිමිවන්නේ මුදල ධනය පසෙක තබා ගුණයත්, දහමත් හිසමත තබාගෙන එය ආරක්ෂා කොට පෝෂණය කරමින් එයට අනුගත ව අභිමානවත් ගමනක් පැමිණීමට හෙළයෝ සමත් වූහ.



කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
පෑලියගොඩ විද්‍යාලංකාර
පිරුවන්හි ආචාර්ය
**ආචාර්ය මල්වානේ චන්ද්‍රරතන හිමි**

මීළඟ බුදුසරණ කලාපය පොසොන් අව අටවක පෝද ජුනි 13 වන සෙනසුරාද



# ලාංකේය ජන ජීවිතයේ ආධ්‍යාත්මික ප්‍රතිමූර්තිය

**ශ්‍රී ලංකාවට බුදු දහමේ අසිරිය හිමි වන්නේ දඹදිව ධර්මාශෝක මහරජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තියේ තවත් එක් මහඟු ඵලයක අසිරිය නිසා යි.**

ඉතින් පියරජු සෙවණේ තම දහරදිවි පෙවෙත ගත කළ මහින්ද නම් පුත්කුමරු පියරජු එතෙක් අනුගමනය කළ දිග් විජය පිළිවෙත නිසා සිදු වූ කුරිරු මිනිස් ඝාතන හා වෙනත් ගොරබිරම් අත්දැකීම් නිසා යම් පමණකට සසල බවකින් කල් ගෙවන්නට ඇතැ යි සිතන්නට තරම් අපට කරුණු තිබෙනවා. එදා අපේ බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සියවස් තුනකට පසු එනම් බු.ව.236 පොසොන්පුර පසළොස්වක පොහෝ දිනක මිහිඳු මාහිමියන් ලංකාවට වැඩම කරන්නේ එවකට ලංකාවේ රජකම් කළ දෙවානම්පියතිස්ස රජතුමාගේ අදෘෂ්ඨ මිත්‍රයෙකු වූ දඹදිව ධර්මාශෝක මහරජතුමාගේ ධර්මවිජය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙසට යි. මිහිඳු මහරහතන් වහන්සේ තම පියමහ රජතුමාගේ මෙහෙයවීමෙන් ධර්මදූත කණ්ඩායමක් ද සමඟ මේ සිරිලකට වැඩමවන අවස්ථාව වන විට මෙරට විවිධ මිථ්‍යා ආගමික මතවාද විශ්වාස කළ පිරිසක් විසූ බව අප පැහැදිලි ව දන්නා කරුණක්. යහපත, අයහපත පිළිබඳ පැහැදිලි දැක්මක් එදා පැවති කිසි ම දහමකින් ජනතාවට කියා දී තිබුණේ නැහැ. එදා සිටි ජනතාව ජීවිතයේ විවිධ තැතිගැනීම්, බියවීම්, අසරණවීම් වැනි අවස්ථාවල දී අන්ධ භක්තියෙන් එදා පැවති ආගමික මතවාද අදහමින් දහස් ගණන් හිංසාකාරී සත්ව බලබිලි පූජා පුදමින් යාග හෝම බලි බිලි පූජා පවත්වමින් ඔවුන් ඒ ඒ වෙලාවට අවශ්‍ය කරන තාවකාලික අස්වැසිල්ලක් පමණක් ලබා ගත්තා. එහි භයානකකම නම් ඒ තාවකාලික අස්වැසිල්ල ත් සමඟ ම ඇති වන සදාකාලික පසුතැවිල්ල යි. ඒ කිසි ම දහමකින් දුකින් පෙළෙන සත්වයාට එයින් මිදීමට පිළිසරණක් හෝ මගක් කියා දුන්නේ නැහැ. එසේ කියා දී තිබුණා නම් මුල දී පෙන්වා දුන් පරිදි රජතුමා ඇතුළු රාජකීය පිරිස නැකත් ක්‍රීඩා දිනයක් ලෙස සැලකුණු පොසොන් පොහෝ දින හිංසක විනෝද ක්‍රීඩාවක යෙදීමට ඉඩක් නැහැ. එසේ නම් ඒ තත්වයෙන් මුදවා මේ නවතම දහම අනුව ජීවිත ගොඩ නගා ගැනීමට නම් ලක්වැසි ජනතාවට ධාර්මික ජීවන ප්‍රතිපදාව කුමක්දැ යි පෙන්වා දීමට උන්වහන්සේ උනන්දු වූ බව පෙනෙනවා. එසේ නම් එය එදා අවශ්‍ය කර තිබුණු සුචරිතවත් දැහැමි සමාජයක් ලංකාව තුළ නිර්මාණය කිරීම උන්වහන්සේගේ අරමුණ වුණා. තවත් සතෙකුට, ප්‍රාණියෙකුට හිංසාවක් කර ලබන සතුට ප්‍රීතිය මෙලොවට පරලොවට අවැඩ ගෙන දෙන ක්‍රියාවක් බැවින් ඊට හුරුව සිටි ලක්වැසි ජනතාව එයින් මුදවා ගැනීමට මේ නවතම දහම හේතු වුණා. එය අහම්බෙන් සිදු වූවක් නොව මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවේ දී ආරම්භයේ දීම දේශනා කළ ධර්ම දේශනා මගින් ජන හදවත්වලට එය ඇතුළු කිරීමට ගත් උත්සාහය නිසා යි.



වාරියපොල ශ්‍රී සුමංගල පිරිවෙන්
රාජමහා විහාරාධිපති.
මහනුවර අස්ගිරි මහාවිහාරයේ උපාධ්‍යාය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

දේවානම් පියතිස්ස රජතුමා මුව දඩයමෙහි ගිය අවස්ථාවේ ඒ හිංසක විනෝද ක්‍රීඩාවෙන් අතමිදී ශාන්ත සුවයක ආශ්වාදය ලබන්නේ ත් එදා පටන් රට ධාර්මිකත්වයට යොමු වන්නේ ත් මිහිඳු මාහිමියන් ප්‍රධාන ධර්මදූත මෙහෙවරෙහි යෙදුණු ඒ උතුම් කල්‍යාණ මිත්‍රයන් වහන්සේලාගේ උපශාන්ත දර්ශනයෙනු යි. එ පමණක් නොව මිහිඳු මාහිමියන් විසින් මාතෘකා කොටගත් සූත්‍ර දේශනා කීපයක් ද මෙම අවිහිංසාවේ ආශීර්වාදය ඉස්මතු කොට දැක්වීමක් වුණා.

මේ කාරණයේ දී අවිහිංසාව කියා කියන්නේ සත්වහිංසාව පමණක් ම නොවෙයි. අපේ ජීවන පැවැත්මේ දී යම් කිසියම් ක්‍රියාවකින් තවත් අයෙකුට හිංසනයක් වෙනවා නම් ඒ හැම ක්‍රියාවක් ම හිංසක ක්‍රියාවක් වෙනවා. එහෙම නම් පන්සිල් පදවලින් කියැවෙන දුසිරිත්වලින් තොර ජීවිතයක් ගත කිරීම ම අවිහිංසක පැවැත්මක් බවට පත් වෙනවා. ජීවත් වන මිනිසා නිසා තවත් අයෙකුට යම් හිංසාවක් වෙනවා නම් එය සාපරාධී ක්‍රියාවක් බවට පත් වෙනවා වගේ ම ඔවුන් දුක සේ රැස්කර ගන්නා දේපොළවලට යම් අගතියක්, පැහැර ගැනීමක්, විනාශයක් වෙනවා නම් එය ද බරපතළ හිංසනයක් බවට පත් වෙනවා. මේ තත්වය වෙනස් කරලීමට යි මිහිඳු මාහිමියන් දැහැමි පන්සිල් සුරකින සමාජයක් නිර්මාණය කිරීමට තමන් වහන්සේගේ දේශනා යොදා ගත්තේ.

අද අපේ බෞද්ධ සමාජයේ තහවුරුව පවතින මළගිය මව්පිය, ඥාතිමිත්‍රාදීන්ට පින් පැමිණ වීමේ චාරිත්‍රය තහවුරු වීමට බලපෑවේ උන්වහන්සේ දේශනා කළ “පේතවත්ථු දේශනාවේ” දැක්වෙන “තිරොකුඩ්ඩ” සූත්‍ර දේශනාව යි. මේ සූත්‍රයෙන් කියැවෙන කතාව ඉතා වැදගත් වෙනවා. මෙවැනි කතාපුවත් මගින් පස්පව් කරමින්, අධාර්මික ව ජීවත් වන අය ප්‍රේත ලෝකවල ඉපිද අනන්ත අප්‍රමාණ ව දුක් විඳින අයුරු පෙන්වා දුන්නා. මේ පේතවත්ථු බුද්ධ දේශනාවේ හා අට්ඨකථාවේ එන විස්තරයට අනුව කෙනෙක් මිය ගිය පසු ප්‍රේතාත්ම භාවයක් ලබන්නට හේතුන් වන්නේ මෙලොවට, පරලොවට දුක පිණිස හේතු වන අකුසල කර්ම කිරීම යි. මේ අකුසල කර්ම ලෙස එම විස්තරයන්ට අනුව, සඟසතු දේ අයථා පරිහරණය, සත්ව හිංසාව, බොරුව, ලෝභය, ඊර්ෂ්‍යාව හා වෛරය, වැරදි කාම සේවනය බව විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ තුළින් පෙනෙනවා.

මේ නිසා ජනතාව පසපව් වලින් වැළකුණා. සත්පුරුෂ ව කටයුතු කරන, ශීලාදි ගුණධර්ම රකින අය පින්කම් කරමින් සිට මියගිය පසු දිව්‍ය විමානවල පහළ වන කථා පුවත් ඉදිරිපත් කරන විමානවත්ථු දේශනා මගින් සමාජයේ ධාර්මික ජීවන මං පෙත් විවර වුණා. දැහැමි සමාජයට අවශ්‍ය කරන. මිනිස් හදවත්වල කරුණාව ජනිත කරවීම, කළගුණ සැලකීම වැනි ගුණධර්ම ප්‍රගුණ කරවීම, දුකට පත්වන අයට පිහිට වීමෙන් ඒ අය මුදවා ගැනීම වැනි සමාජ සාරධර්ම රාශියක් ද සමාජයට හුරු කිරීමට හේතු වෙනවා. මෙහිදී හැදෙන වැඩෙන බාල පරපුර තේරුම් ගන්න ඉතා වැදගත් කරුණක් වන්නේ ළමා අවදියේ සිටම සුචරිතවත් දැහැමි මග කුමක් ද යන්න අවබෝධ කර ගැනිමට පෙළඹීම යි. හිංසාව හැමවිට ම තමන්ට ත් අනුන්ට ත් වධ දෙන කරුණක් වෙනවා. එපමණක් නොව මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේශනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලද “බාලපණ්ඩිත සූත්‍රයෙන්” උන්වහන්සේ ඉස්මතු කර දක්වන්නේ බාල අසත්ජනයන්ගේ ඇසුරෙන් පුද්ගලයා පස්පවට යොමු වන ආකාරය මෙන් ම, නුවණැති සත් පුරුෂ සේවනයෙන් ජීවිතය උසස් තත්වයට පත් කරගත හැකි ආකාරය යි.

ගස්ගල් පර්වත අදහමින් විවිධ මිථ්‍යාමත අනුව කටයුතු කළ ජනතාව තුළ එම අන්ධ භක්තිය නැති කර බුද්ධාදී රත්නත්‍රයේ සරණ යාමේ අගය පෙන්වා දීම නිසා තෙරුවන් සරණ ගිය දැහැමි ගති සිරිත් ජනතාව වැළඳ ගත්තා.

ගමේ පන්සල, ගමේ පාසල බවට පත්වෙමින් ධර්ම ශාලාවට රැස්වන ගමේ ජනතාවට දහම කියා දෙන පන්සලේ හාමුදුරුවෝ ජනතාවගේ ආචාර්යවරයා, අනුශාසකයා බවට පත්වීම නිසා ගමත් පන්සල ත් එකට බැඳුණා. බටහිර ජාතින්ගේ පැමිණීම සිදුවුණු ක්‍රි.ව. 1505 දක්වා ම එය ශක්තිමත් වුණා. මේ නිසා ලංකාවට ආ පෘතුගීසින් ඇතුළු බටහිර ජාතීන් මේ තත්වය හරිහැටි දැන ගෙන ගමත්, පනසලත් ඈත් කරන විවිධ උපක්‍රම යෙදුවා. දරුවෙකු මවුගේ කුසේ පිළිසිඳ ගත් මොහොතේ සිට වයස් ගත ව මිය යන තුරාවට ගමේ පන්සලේ හාමුදුරුවන්ගේ මැදහත් වීමෙන් හැම වැදගත් කාර්යයක් ම සිදු කිරීම ලංකාවේ සාමාන්‍ය ජනජීවිතයට තදින් හුරු පුරුදු වුණා. උපන් දරුවට දෙනු ලබන නම පවා ගමේ පන්සලේ හාමුදුරුවන්ගෙන් ලබා ගත්තා. එය තෙරුවන් ගුණ ප්‍රකට වන, තෙරුවන් හෝ ධර්ම කරුණු හා සැසඳෙන අර්ථය දෙන නමක් බවට පත් වුණා. රජවරු පවා බුද්ධදාස, මුගලන්, කාශ්‍යප, සද්ධාතිස්ස වැනි නම් යොදා ගත්තේ ඒ හුරුව නිස යි.

# මිහිඳු මා හිමියන්ගේ වැඩමවීම ප්‍රෞඪ ශිෂ්ටාචාරයක ආරම්භයයි

**මෙවර රාජ්‍ය පොසොන් උත්සවය සමරන්නේ ‘ආරෝග්‍ය පරමා ලාභා’ නිරෝගී බව පරම ලාභය වන්නේ ය යන සම්බුද්ධ වදන තේමා කර ගනිමිනි.**



ඓතිහාසික මිහින්තලේ රජමහා විහාරාධිපති හා භාරකාර, ආචාර්ය

**වළවාහැංගුණවැවේ ධම්මරතන හිමි**

**ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසේ පොසොන් පුර පසළොස්වක පොහෝ දිනෙක මිහිඳු මා හිමියන් ලක්දිව මිහින්තලාවට වැඩම කළේ ප්‍රෞඪ ශිෂ ්ටාචාරයක ආරම්භය සනිටුහන් කරමිනි.**

ලක්වැසියන් තුළ මහා ආධ්‍යාත්මික විප්ලවයක්, බුද්ධි ප්‍රබෝධයක් ඇති කරමින් එද මිහින්තලාවෙන් ලක්දිව සිසාරා දම් අමා ගඟ ගලා ගියේ ය. මිථ්‍යා විශ්වාසයෙහි ගිලුණු ජන ජීවිතය ලොව්තුරු සදහම් එළියෙන් ආලෝකවත් ව ධාර්මික වූයේ ය.

උතුම් තෙරුවන් සරණ හැර අන් සරණක් නො වන බව වටහා ගත් සිංහලයෝ ජීවිතයේ සෑම සියලු කටයුත්තක දී ම තෙරුවන්ගේ ආශිර්වාදය ලබා ගත්හ. වැවයි – දාගැබයි, ගමයි පන්සලයි කහ සිවුරයි සංකල්පය තුළ නිර්මාණය වූ අපූර්ව සංස්කෘතිය ලෝකයක් පුදුම කරවීමට සමත් විය. ධර්මාලෝකයෙන් ප්‍රභාවිත වූ ශ්‍රී ලංකාද්වීපය ධර්මද්වීපයක් ලෙසින් මෙන් ම, පෙරදිග ධාන්‍යාගාරය ලෙසින් ද ලොව කීර්තියට පත්විය. අදත් අප තුළ ආඩම්බරය දනවන කලා ශිල්ප, ගෘහ නිර්මාණ ශිල්පය, වාරි තාක්ෂණය, භාෂා සාහිත්‍ය ආදී සංස්කෘතිකාංග සම්බුදු දහමින් පෝෂිත වූ මා හැඟි නිර්මාණයන් ය. එද මිස්සක පව්වේ දී මිහිඳු මහ රහතන් වහන්සේ තිස්ස නිරිඳුට ධර්මය දේශනා කිරීමත් සමග එම පූණ්‍ය භූමිය ලෝකයේ ප්‍රථම අභය භූමිය බවට පත්වුණි. පළමු ආරාම පූජාව, උතුම් පැවිද්ද, උපසම්පදාව, පළමු වස් විසීම සිදු වූ පූණ්‍ය භූමියට බවට පත්වුණි. ඝන කැලෑවෙන් වැසීගිය ගල්ලෙන් සිත් දැහැන් ගත කරවන අලංකාර විහාර මන්දිර බවට පත්වුණි. දහස් ගණන් රහතන් වහන්සේ වැඩ සිටි පූජා භූමියක් බවට පත්වුණි.

රාජ රාජ මහා මාත්‍යාදීන්ගේ, ලංකාවාසී බෞද්ධ ජනතාවගේ ගෞරවාදරය, පුද පූජාවන් හිමිවන, අසිරිමත් පින්කම් සංවිධානය වන පූණ්‍ය භූමියක් බවට පත්වුණි.

අනුබුදු මිහිඳු මා හිමි ගුණ සමරමින් විශේෂයෙන් ඈත අතීතයේ පටන් අද දක්වාත් රාජ රාජ මහාමාත්‍යාදීන් ඇතුළු ලක්වැසි ජනතාව මිහින්තලා පුදබිමෙහි මහා පින්කම් සංවිධානය කරමින් මිහිඳු මා හිමියන්ට ගෞරවයෙන් යුතුව පූජෝපහාර දක්වන්නේ උන්වහන්සේ හෙළ ජන හදවත්හි ජීවමාන ව වැඩ සිටින නිසා ය.

වර්තමානයේ උද වී තිබෙන කොරෝනා උවදුර විසින් ලෝකයේ බොහෝ රටවල් බිලි ගනිමින් සිටිය දී, මේ පුංචි රටේ එම රෝග උවදුර පාලනය කර ගනිමින් සිටින අවස්ථාවක දී වුව අනුබුදු මිහිඳු මා හිමියන් වෙනුවෙන් පූජෝපහාර දැක්වීම පිණිස පොසොන් උත්සවය රාජ්‍ය උත්සවයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම ද, මිහින්තලා පුදබිමේ පැවැත්වෙන එම පින්කම් සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ පින්බර සහභාගිත්වය ද සම්බුදු දහම උදෙසා රාජ්‍ය නායකත්වයේ ආදර්ශය කෙසේ විය යුතුද යන්න ගම්‍ය කරන්නකි. වෙසෙසින් ආගමට දහමට මුල්තැන දෙන මෙවැනි නායකත්වයක් ලැබීම ද බෞද්ධ ජනතාව ලද භාග්‍යයකි.

මෙවර රාජ්‍ය පොසොන් උත්සවය සැමරෙන්නේ ‘ආරෝග්‍ය පරමා ලාභා’ නිරෝගී බව පරම ලාභය වන්නේ ය යන සම්බුදු වදන තේමා කර ගනිමිනි.

නිරෝගී බවත්, පරිසරයත් සමග ඇත්තේ ද සුවිශේෂී සම්බන්ධතාවයකි. දූෂිත පරිසරය මානව ප්‍රජාවගේ නිරෝගී බවට තර්ජනයකි. අද ලෝකය මුහුණ දී සිටින කොරෝනා උවදුර ද දීර්ඝ කාලයක් පුරා මිනිසා පරිසරය අමතක කරමින් පරිසරයට එරෙහි වීම නිසා ලද දඬුවමකි. මෙවර ලෝක පරිසර දිනය යෙදී තිබෙන්නේ ද පොසොන් පෝය දිනය යෙදුණු අද දිනයේ ය.

පරිසරය රැක ගැනීමේ අගය බෞද්ධ ජනතාවට අමුතුවෙන් කියා දිය යුතු දෙයක් නොවේ. මිහිඳු මහ රහතන් වහන්සේ ඒ පාඩම අපට මුලින් ම කියා දුන්නේ ද මේ පූණ්‍ය භූමියේ දී ය.

මුව දඩයමේ ගිය තිස්ස රජුට මිහිඳු මා හිමියන් දේශනා කොට වදාළේ ඔබ මේ භූමියේ අයිතිකරු නො ව බාරකරු පමණක් බවයි. අහසේ, පොළොවේ, ජලයේ ජීවත්වන සියලු අපා, දෙපා, සිව්පා, බහුපා සතුන් ඇතුළු සමස්ත පරිසරයේ ම ආරක්ෂකයා වන බවයි. ගහට – කොළට, ඇළට – දෙළට, හමායන මදනලට, සතා සීපාවට සංවේදී වීමේ, ආදරය, කරුණාව දැක්වීමේ, හා රැකවරණය සැලසීමේ අගය අපේ හදවත් තුළ රෝපණය කළෝ අනුබුදු මිහිඳු මා හිමිපාණෝ ය.

දහමට අනුගත නො වන අදහැම් දනන් වෙතින් වන පරිසර විනාශය වළක්වා මේ ලක් දෙරණ සුරක්ෂිත කර ගැනීම ද අප සතු වගකීමකි. විශේෂයෙන් ‘බෞද්ධ සංස්කෘතිය අනුව යමින් අප හැදී වැඩී තිබෙන්නේ ආධ්‍යාත්මික ගුණ ධර්මයන්ට මුල් තැන දෙමිනි. කළගුණ සැලකීම, අසරණයන්ට පිහිට වීම, අන්‍යෝන්‍ය උපකාරය, මානව හිතවාදී බව, බුදු දහමින් අප ලද දායාදයන්'ය. ඒ දායාදයන් රටක වඩාත් සුරක්ෂිත වන්නේ ද දැහැමි රාජ්‍ය නායකත්වයක් තුළ දී ය. පෙර රජදරුවෝ ආදර්ශයෙන් ම එය පසක් කළ හ.

වර්තමානයේ ලොවක් භීතියට පත් කළ කොරෝනා වයිරස උවදුර අවස්ථාවේ සමස්ත රට වැසියන් තම දරුවන් සේ සලකමින් ඔවුන් ආරක්ෂා කර ගන්නට, පිහිට විය යුතු අයට පිහිට වන්නට අපේ රාජ්‍ය නායකත්වය කටයුතු කිරීම අගය කළ යුතු ය. ජාතිය ආරක්ෂා කරගනිමින්, දසරාජ ධර්මයෙන් යුතුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ගෙන යන වැඩපිළිවෙළ සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව සඳහා ද සුවිශේෂී වේ. මිහිඳු මා හිමියන් සම්බුදු දහම අනුව බලාපොරොත්තු වූයේ ද රටේ පාලකයා දසරාජ ධර්මයෙන් යුතුව දැහැමිව රාජ්‍ය පාලනය ගෙන යනු දැකීම ය.

එසේම භයානක වසංගත රෝගයක් හමුවේ වුව ද බාධක මැඩ ගනිමින් ලේක්හවුස් ආයතනය මෙවර 58 වැනි වරටත් මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජා පින්කම පැවැත්වීම ද මා හැඟි ය.

1963 වසරේ දී ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ උදාරතර සංකල්පයකට අනුව මිස්සක පව්වට විදුලි ආලෝකය ලබා දීමේ පූණ්‍ය මහෝත්සවය ආරම්භ විය. එසේ ආරම්භ වූ මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව කවර බාධා පැමිණිය ද වසරක් පාසා, අඛණ්ඩ ව පවත්වාගෙන යාමට ලේක්හවුස් ආයතනයට හැකිවීම ද ලක්වැසි බොදු දනන්ගේ භාග්‍යයකි.

බුද්ධ ශාසන අමාත්‍යංශය, ලංකා විදුලිබල මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විවිධ ආයතන, දෙපාර්තමේන්තු ද, සංස්ථා, මණ්ඩල, ලංකා බැංකුව, ජාතික ලොතරැයි මණ්ඩලය, ධයලොග් ආයතනය ඇතුළු විවිධ ආයතන මෙහිදී රාජ්‍ය පොසොන් පින්කම සාර්ථක කර ගැනීමෙහිලා විවිධාකාරයෙන් දක්වන සහයෝගය මෙහිදී සිහිපත් කළ යුතුම ය.


එමෙන් ම ගෝලීය වසංගතයක් හමුවේ එය ජයගන්නට ජනාධිපතිතුමාට ශක්තියක් වෙමින් කටයුතු කරන වෛද්‍යවරු ප්‍රමුඛ සෞඛ්‍ය අංශ ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය ඇතුළු ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන සියලු දෙනාට ද, මේ උතුම් දිනයේ ආශිර්වාදය හිමි විය යුතුම ය.

> ‘ අපේ රටේ රෝග උවදුර පාලනය කර ගනිමින් සිටින අවස්ථාවක දී වුව අනුබුදු මිහිඳු මා හිමියන් වෙනුවෙන් පූජෝපහාර දැක්වීම පිණිස පොසොන් උත්සවය රාජ්‍ය උත්සවයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම ද, මිහින්තලා පුදබිමේ පැවැත්වෙන එම පින්කම් සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ගේ හා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ පින්බර සහභාගිත්වය ද සම්බුදු දහම උදෙසා රාජ්‍ය නායකත්වයේ ආදර්ශය කෙසේ විය යුතුද යන්න ගම්‍ය කරන්නකි. වෙසෙසින් ආගමට දහමට මුල්තැන දෙන මෙවැනි නායකත්වයක් ලැබීම ද බෞද්ධ ජනතාව ලද භාග්‍යයකි. ’

රමණී සුබසිංහ

# අපේ උරුමය අනාගතයට රැක ගනිමු

**බෞද්ධ දර්ශනයේ පණිවිඩය මේ ලක් දෙරණට නිල වශයෙන් ලැබෙන්නේ අනුබුදු මිහිඳු මාහිමියන්ගේ වැඩම වීමත් සමඟ ය. මහා වංශයේ සඳහන් වන්නේ මහින්දගමනයත් සමඟ අපට සංස්කෘතියක් ලැබුණු බව ය.**



නුවර කලාවියේ
ප්‍රධාන සංඝනායක
රුවන්මැලි චෛත්‍යාරාමාධිකාරී
**පල්ලේගම**
**හේමරතන නා හිමි**

මිහිඳු හිමියන්ගේ මැදිහත් වීමෙන් සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රැගෙන වැඩම කිරීමත් සමඟ අටළොස් කුලයක ශිල්පීන් මෙහි පැමිණිය හ. ඒ සමඟ අපේ රටේ කැටයම් ශිල්පය, මූර්ති ශිල්පය ඇතුළු නොයෙකුත් කලාංග වර්ධනය වූ බව ප්‍රසිද්ධ කාරණාවකි.

ඉන්දියාවෙන් මූල බීජය එසේ ලැබුණත්, පසු කාලීන ව අපට ආවේණික, සිංහල කලාවක්, සංස්කෘතියක් බුදු දහම කේන්ද්‍ර කරගෙන මේ රටේ ඇතිවුණි. අද අපට දකින්නට ඇති බොහෝ කලා කෘතීන් හි නෂ්ඨාවශේෂ එදා ඒ මූලයෙන් පැවත ආ අප විසින් දේශජ කරගත් දේ ය.

සමාධි බුදු පිළිම වහන්සේ, අවුකන බුදුම පිළිම වහන්සේ දෙස නෙත් යොමන්න. මහා රළු පරළු කළුගලක්, මටසිළිටි කොට බුදුගුණ කැටි වූ මේ සා සියුම් නිර්මාණයක් කරන්නට තරම් අපූරු ප්‍රාගුණ්‍යයක් හෙළයාට තිබුණි.

සඳකඩ පහණ ගත්ත ද, රුවන්මැලි මහා සෑරදුන් වැනි මහා ථූපයක් ගත්ත ද, වාපී සංස්කෘතිය ගත්ත ද එහි තිබෙන්නේ සිංහල කලා ශිල්පීන්ගේ දක්ෂතාවය යි. අභිමානය යි. ඒ වගේ ම සරල ජීවිතය, චාම් බව විදහා දක්වන, බුදු දහමත් සමඟ පදනම් වූ කලා නිර්මාණයන් ය, ඒ අභිමානය තුළ අර්ථවත් වන්නේ. එය වඩාත් පැහැදිලි වන්නේ බටහිර කලා නිර්මාණ සමඟ සංසන්දනය කිරීමේ දී ය.

බටහිර බොහෝ කලා නිර්මාණ රාගය ඇවිස්සෙන, සිත චංචල කරන ස්වරූපයක් ගනී. එහෙත් දේශීය කලා නිර්මාණ සිත නිවන්නේ ය. ජීවිතය හා ගැඹුරු දහමක් කියා පාන්නේ ය. ඉසුරුමුණියේ ප්‍රසිද්ධ පෙම් යුවළ දෙස නෙත් යොමු කළ ද කාමය අවුස්සන, සිත නොසන්සුන් කරන ස්වරූපයක් එහි නැත. ඒ අපේ කලාවේ අභිමානය යි. අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ අපට උරුම වූ දේශජ සංස්කෘතියයි.

දුකේ දී පිහිට වන, වැඩිහිටියන්ට ගරු කරන සංස්කෘතියක් ලොව ඉතා අඩු ය. කොරෝනා උවදුර හමුවේ සිංහල ආචාර ක්‍රමය ලොව ම පිළිගනී. එය චාම් ය. ඕනෑම අවස්ථාවක, ඕනෑම කෙනෙකුට පරිහරණය කළ හැකි ය. ළෙන්ගතුකම, සුහදතාවය ඇති කරන්නේ ය. එය සරල, එහෙත් ගැඹුරු අර්ථයක් ඇති ව සිංහල සංස්කෘතිය තුළ පවත්වාගෙන ආ දෙයකි. මේ සෑම දෙයක් ම බුදු දහම ඇසුරේ ගොඩනැගුණු දේ ය.

අතීතයේ සම්පතක් ලෙස රැක ගනිමින්, පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන ආව ද අද අපේ සමහර පිරිස් මේ වටිනාකම් නොවටිනාකම් ලෙස ප්‍රතික්ෂේප කරනු පෙනේ. එය කනගාටුදායක ය. එදා අපේ ආහාරවේල අපි විසින් ම සකසා ගනු ලැබූවෙමු. කෙනෙකුට අත නොපා ජීවත් වීමට උත්සාහ ගත්තෙමු. මේ සියල්ල ම දහමත් සමඟ බැඳුණු, ලෞකිකත්වය තුළින් ම ලෝකෝත්තර ස්වරූපයට යන්නට පුළුවන් පියගැට පෙළක් ලෙසයි සිදු කර තිබෙන්නේ. හැම සංස්කෘතිකාංගයක ම බුදු දහමේ හඳුන්වන ප්‍රඥාව ස්පර්ශ වූ ස්වභාවයක් පෙනෙන්න තිබුණි.

චාම් ජීවිතය අගය කළ, අවිහිංසාව පැතිරූ පංචශීල ප්‍රතිපත්තිය අභිමානයක් ලෙස රැකගෙන තමන්ගේ ආධ්‍යාත්මයත් දියුණු කරගෙන පැමිණි ගමනකි අපට තිබුණේ. එය අද යම් ප්‍රමාණයකට ගිලිහී යන බවක් පෙනේ. එදා හෙළයා ප්‍රාණඝාතය, හොරකම, සමාජ විරෝධී හැසිරීම, බොරුකීම, සුරාව පිළිකුල් කළහ. එහෙත් අද අපේ ඒ අභිමානය ගිලිහී යමින් තිබේ. ඒ නිසා පොසොන් පෝය දවසක අපට ලැබුණු උරුමය, වර්තමානයට ගැළපෙන සේ ආපසු සකස් කරගත්තේ නම් ඒ අභිමානය නැවත වර්ධනය කරගත හැකි ය. එය පොසොන් සිතිවිල්ලක් බවට පත්කර ගනිමු.

**රමණී සුබසිංහ**

# පරිසර හිතකාමී දේශයක ඇරඹුම

**අසිරිමත් පොසොන් පොහෝ දිනයක සිදු වූ මහින්දගමනය ලක් ඉතිහාසයේ විශිෂ්ටතම සංධිස්ථානයකි.ජාතියක ප්‍රෞඪත්වයේ, දේශයක අභිමානයේ ඇරඹුමකි.**



අනුරාධපුර අටමස්ථානාධිපති
ආචාර්ය
**පල්ලේගම**
**සිරිනිවාස නා හිමි**

බ්‍රාහ්මණ ආගම ප්‍රධාන කොටගත් ජෛන, පරිබ්‍රාජක, ආජීවක, තාපස වැනි ශ්‍රමණ ඉගැන්වීම් පමණක් නොව වෘක්ෂ, ඉර,හඳ,තාරකා, අග්නි ආදී වූ පෙනෙන, නොපෙනෙන, බලවේග දේවත්වයෙහි ලා සැලකූ ලාංකේය ජන සමාජය මිථ්‍යා මතවලින් මුදවාගෙන අඳුරෙන් අඳුරට නොව ආලෝකයෙන් ආලෝකයට යන සිරි සදහම් මාවත අනුබුදු මිහිඳු මා හිමියෝ ලාංකේය ජන සමාජයට පෙන්වා දුන්හ. උන්වහන්සේගේ ආගමනය ලක් දෙරණට පායූ පූර්ණ සූර්යයා ලෝකයක් බඳු විය. ඒ සදහම් ආලෝකය තුළ 'තමන්ගේ විමුක්ති දායකයා තමා ම ය යන උතුම් දහමට අනුව සමාජය වෙනස් විය. රාජ්‍ය නායකත්වයේ අනුශාසකයා බවට පත්වූයේ භික්ෂූන් වහන්සේ ය. ඒ අනුව සතර සංග්‍රහ වස්තුවලට අනුගත ව, සතර අගතියෙන් තොරව, දස රාජ ධර්මයෙන් හා පංච ශීල ප්‍රතිපදාවෙන් යුතු ව , දස සක්විති වත්, සිව් බඹ විහරණ ධර්මයන් ප්‍රගුණ කරමින්, සප්ත අපරිහානීය ධර්ම ආදී බුදු දහමේ ඉගැන්වෙන ධර්මෝපදේශයන්ට අනුගත ව රාජ්‍ය පාලනයක් මෙරට ස්ථාපනය විය.

බොදු මග ගිය නරපතීහු තමන්ගේ දිවි පරදුවට තබා සම්බුදු දහමත්, ලක් දෙරණත් ආරක්ෂා කරගත් හ. දන්ත ධාතූන් වහන්සේගේ ආරක්ෂකයා රජු වශයෙන් පිළිගැනීමට මෙරට වැසියෝ පෙළඹුණේ ද ඒ නිසා ම ය.

රජු අනුව ගිය ජනතාව තුළ ද දයාව, කරුණාව, ඉවසීම, මව්පිය වැඩිහිටියන් සැලකීම, ඔවුනොවුන්ට ගෞරවය කිරීම, වෛරය – ක්‍රෝධය වෙනුවට මෛත්‍රී සහගත සිතිවිලි වර්ධනය කිරීම, ත්‍යාගශීලි වීම, පස්පව් නොකිරීම, අල්පේච්ඡ වීම, සරල දිවි පෙවෙත තුළ පවට ලජ්ජා බිය වීම ආදී ගුණධර්ම වර්ධනය විය. උතුම් ගුණධර්මවලින් සපිරි ආධ්‍යාත්මික ජන සමාජයක් නිර්මාණය වුණි.

එදා දේවානම්පියතිස්ස රජතුමා විසින් මුළු අනුරාධපුරය ම ඇතුළත් වන පරිදි සිය මගුල් ඇතුන් ලවා අද්දවා, රන් නඟුලකින් තමන් විසින් ම මායිම් නගා, අතපැන් ගන්වා මිහිඳු මහරහතන් වහන්සේ උදෙසා මහමෙවුනාව පූජා කළ බව මහාවංශයේ දැක්වේ. පසු කලෙක මහා විහාරය නමින් ලොව පසිඳු වූයේ මහමෙවුනා උයනෙහි පිහිටි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි සෑ රදුන්, ඇතුළු මහා සිද්ධස්ථාන ආශ්‍රිත ව පැතිරී ගිය භූමිය යි.

මහා විහාරය භික්ෂු අධ්‍යාපනයේ ද කේන්ද්‍රස්ථානය විය. පිරිසුදු ථේරවාදී බුද්ධ ධර්මය රට පුරාම ව්‍යාප්ත වූයේ මහාවිහාරය කේන්ද්‍ර කරගෙන ය. ලාංකේය රජ දරුවන් හා මහා විහාරයීය භික්ෂූන් වහන්සේලා අතර වූයේ බිඳිය නොහැකි සම්බන්ධතාවයකි. ඒ තුළ නිර්මාණය වූ පසුබිම ලාංකීය සමාජයේ සුරක්ෂිත බවට ම හේතු විය. රජුන් පත් කිරීම, උපදෙස්දීම, ලක් දෙරණ සම්බුදු සසුනට පූජා කිරීම රටට, ජාතියට සම්බුදු දහමට එරෙහි ව යම් බලවේගයක් වේ නම් මූලිකත්වය ගෙන කටයුතු කිරීම පූජනීය වස්තු මුල් කරගෙන මහා පෙරහර පූජෝපහාර පැවැත්වීම ආදී සුවිශේෂ අවස්ථාවන් හි දී භික්ෂූන් වහන්සේ ප්‍රධානත්වය ගත් හ.

භික්ෂූන් වහන්සේගේ අවවාද, අනුශාසනා ලැබ ආධ්‍යාත්මික ගුණ ධර්මයන්ගෙන් පෝෂණය වූ සිංහල ජන සමාජය තුළ විශිෂ්ට සාහිත්‍ය කලාවන්ගෙන් යුතු සංස්කෘතියක් ද බිහිවිය. සාගරය පරදවන මහා වැව් නිර්මාණය තුළ රට කෘෂිකර්මාන්තයෙන් ද පෝෂණය විය. ගෘහ නිර්මාණය, මූර්ති කැටයම්, වෙහෙර විහාර ඇතුළු ලෝකයක් විස්මිත කරවන කලා නිර්මාණ මිහිඳු සංස්කෘතියේ ප්‍රතිඵලයන් ය.

මෙවර පරිසර දිනය යෙදී තිබෙන්නේ ද පොසොන් පොහෝ ද ය. බොදු ජන ජීවිතයත්, පරිසරයත් අතර ඇත්තේ වෙසෙස් සම්බන්ධතාවකි.

සැබෑ බෞද්ධයා කිසිවිටෙකත් ගහ කොළට, ඇළට දෙළට, සතා සිවුපාවාට හානිවන කවර හෝ කාර්යයක නිරත නොවන්නේ ය. තමන් නිසා පරිසරයත්, පරිසරය නිසා තමනුත් ආරක්ෂාවන බව හේ දනී. අද ලෝකයක් මුහුණ දෙන කොරෝනා වයිරසය වැනි භයානක රෝග උවදුරු ලෝකය පරිසරයට එරෙහි වීමේ , පරිසරය ඉක්මවා යාමේ ප්‍රතිඵලයන් ය. එහෙයින් මිහිඳු හිමි සමරන මේ උතුම් පොහෝ දිනයේ අපි අපේ පරිසරය රැක ගැනීම පිළිබඳව ද අවධානය යොමු කිරීම ඉතා වැදගත් ය.

# සම්බුදු දහම එකම රැකවරණයයි



අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක
අස්ගිරිය ඓතිහාසික
ගෙඩිගේ රාජමහ විහාරාධිකාරී
පොළොන්නරුව
සොළොස්මස්ථානාධිපති, ශාස්ත්‍රපති
**වේඬරුවේ ශ්‍රී උපාලි අනු නා හිමි**



**අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ එදා ලාංකේය ජනතාවට හඳුන්වා දුන් තථාගත ශ්‍රී සද්ධර්මය මේ පුණ්‍ය භූමිය සිසාරා මැනවින් ස්ථාපිත විය. උන්වහන්සේ ගේ උත්සාහය ලක් දෙරණේ සාර්ථක ව මල්ඵල ගැන්වීමට බලපෑ ප්‍රධාන සාධක කිහිපයකි.**

මිහිඳු මා හිමියන් මෙරටට වැඩම කරන විට ලක් දනන් වෙත යම්කිසි ආගමික ක්‍රමවේදයක් පැවතිණි. ඒ පුද සිරිත් හා චාරිත්‍ර වාරිත්‍රවලට සම්බුදු දහමින් තදබල විවේචනයක් සිදු වූයේ නැත. ඊට අනුගත වූ ස්වභාවයක් පෙනෙන්නට තිබුණි.

එමෙන් ම, එවකට භාවිත වූ භාෂාව සහ ධර්මදූතයන් වහන්සේගේ පාලි භාෂාවත් අතර විශේෂ සමීප බවක් තිබුණි. අනෙක් අතට අපේ රට පුංචි රටකි. එකල විශාල ජනගහනයක් ද නොවී ය.

කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කළ ලක් දනන් අතර බොහෝ විට සාමකාමී බවක් පැවතුණි. ස්වයංපෝෂිත ආර්ථික රටාව නිසා ජනතාවට ආහාරයෙන් අග හිඟයක් නොවී ය. ඒ තුළ නව දහමක් ව්‍යාප්ත කිරීම වඩාත් පහසු වුණි. එවකට ජටිල, බ්‍රාහ්මණ ආදී විවිධ ආගම් හා ඇදහිලි ක්‍රම පැවතිය ද ඒවාට සම්බුදු දහමට අභියෝග කරන්නට තරම් ශක්තියක් ද නොවී ය.

මිහිඳු මහරහතන් වහන්සේ අසල්වැසි රාජ්‍යයේ බල සම්පන්න අශෝක අධිරාජයාණන් ගේ පුතණුවන් වීම ද සුවිශේෂත්වයකි. එසේ රජ පෙළපතින් නැකම් කීම ද ආගන්තුක නායකත්වය හා ඒ දහම පිළිගැනීමට ප්‍රබල හේතුවක් වන්නට ඇත.

මිහිඳු මාහිමියන්, පළමුව තමන් වහන්සේ හඳුන්වා දුන්නේ රටේ රජතුමාට ය. ශ්‍රී සද්ධර්මයේ පණිවුඩය ගෙනහැර දැක්වූයේ රජතුමාට ය. තිසරණ සරණ ගිය රජතුමා බෞද්ධයකු බවට පත්වීම තුළ රටේ ජනතාවට තිසරණයෙහි පිහිටා බෞද්ධයන් බවට පත්වීම ද කිසිදු අභියෝගයක් නොවන්නේ ය.

මිහිඳු මා හිමියන් ලක් වැසියන්ට දේශනා කරන ලද සූත්‍ර දේශනා ඇතුළත් ශ්‍රී සද්ධර්මය පිළිබඳව ද විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

චූල්ලහත්ථි පදෝපම සූත්‍රය, පේත වත්ථු, විමානවත්ථු, සච්චසංයුත්තය, , දේව දූත සූත්‍රය, ආසිවිසෝපම සූත්‍රය, අනවතග්ගිය සූත්‍ර දේශනා, අග්ගික්ඛන්ධොපම සූත්‍රය, අප්පමාද සූත්‍රය, බාල පණ්ඩිත ආදී සූත්‍ර දේශනාවන් පිළිබඳ ව ජීවිතය පිළිබඳ ව මූලික අවබෝධයක් ලබාගැනීමට අවස්ථාව ලැබුණි. ඒ වගේ ම පවට බිය වීමේත්, පිනට නැඹුරු වීමේත් වටිනාකම ජනතාවට අවබෝධ වුණි.

පුරාතනයේ සිට පවත්වාගෙන ආ කිසියම් ඇදහිලි ක්‍රමයක් තිබුණා නම්, පුද පූජා, සිරිත් විරිත් තිබුණා නම් මේ දහම් දේශනා තුළින් ඒවාට බලවත් පහරක් එල්ල වූයේ නැත. සිදුවූයේ ඒවායෙහි නවීකරණයකි. ඒ නිසා ඊට අනුගත වීමක් සිදුවුණි.

රටක නායකත්වය අත්‍යවශ්‍යයෙන් ම ප්‍රබුද්ධ විය යුතු ය. මිහිඳු හාමුදුරුවෝ, දේවානම්පියතිස්ස රජුගෙන් ද ඒ ප්‍රබුද්ධ බව බලාපොරොත්තු වූ හ. එය විමසීමට උන්වහන්සේ කිසියම් පරීක්ෂණයක් සිදු කළහ. එය බුද්ධි පරීක්ෂණයකි . ඒ සඳහා උන්වහන්සේ භාවිත කළේ අඹ පැනය සහ ඤාති පැනයයි.

රජු විසින් ලබාදුන් පිළිතුරු තමන් නායකත්වයට සුදුස්සෙකු බව ම පසක් කළේ ය. එවන් නායකත්වයක් යටතේ සිටින ජනතාව තුළ ද නිසැකයෙන් ම යම් බුද්ධිමත් බවක්, තිබිය යුතු ම ය. අනුබුදු මිහිඳු හිමි දෙසා වදහළ උතුම් දහම ලක් දෙරණ පුරා විසිරී පැතිරී යන්නට මෙරට ජනතාව තුළ වූ ඒ බුද්ධිමත් බව වෙසෙසින්ම ඉවහල් වන්නට ඇත.

ඒ අනුව රටේ නායකත්වයත්, ජනතාවත් සිරි සදහම් මගට අනුගත කරවූ මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට බෞද්ධ පාලනයකට අවශ්‍ය පදනම නිර්මාණය කළහ. කෘෂිකාර්මික ජීවන රටාව තුළ රටේ ආර්ථික සංවර්ධනයට පදනම නිර්මාණය කර දුන්හ. එතැන් සිට, දුකේ දී, විපතේ දී ගස් ගල් වඳිමින්. නොපෙනෙන බලවේගයන්ගේ ආරක්ෂාව , රැකවරණය පැතූ ජනතාව දන, සීල, භාවනා දී, පින්කම්වලට යොමු වූහ. පවට බිය වූහ. ලජ්ජා වූහ. අවිහිංසාවාදී ගුණාංග වර්ධනය කළහ. පරිත්‍යාගය, සත්ත්ව කරුණාව, අන්‍ය මතවලට ඇහුම්කන් දීම, ජීවිතයේ මුහුණ දෙන්නා වූ අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් උපේක්ෂාවෙන් විඳ දරා ගැනීම ආදී ගුණාංග ලක් ජන ජීවිතයට බද්ධ වුණි. ඒ ගසට පොත්ත මෙනි.

එතැන් සිට මෙරට පාලනය කළ හෙළ රජදරුවෝ බෞද්ධාගමානුකූල ව දස රාජ ධර්මයෙන් රට පාලනය කළහ. දන් පින්කම්වලට උනන්දු වූ හ. දුටුගැමුණු මහ රජතුමා පිනට දහමට මොන තරම් නැඹුරු වූයේ ද කියනවා නම් එතුමා පින් පොතක් පවා භාවිත කළේ ය. එතුමාගේ මරණ මඤ්චකයේ දී ඒ පින් පොත් කියවාගත් බව ඉතිහාසයේ සඳහන් ය.

මිහිඳු හිමි මේ පින්බිමේ ස්ථාපිත කළ සම්බුදු දහමින් සුපෝෂිත අපූර්වත ම ආචාර ධර්ම, ඇතුළත් සංස්කෘතිකාංග හෙළයාගේ ලේ, මස්, ඇට නහර දක්වාම කාවැදුණි.

අපේ රටට සොළී, මාඝ ආදී නොයෙකුත් ආක්‍රමණ ඇතිවුණි. අවසන ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක් බවට පත්වුණි. කවර ආක්‍රමණයක් යටතේ වුවද මිහිඳු සංස්කෘතිය මේ රටේ අදටත් ජීවමාන ය. සුරක්ෂිත ය. මිහිඳු මා හිමියන් මිනිස් හදවත් තුළ මොනතරම් ජීවමානද යත් පොසොන් පොහෝද සිව් දිගින් පැමිණෙන ජනී ජනයාගෙන් මිහින්තලා පුදබිම පිරී ඉතිරී යාමෙන් ම එය පසක් කර ගත හැකි ය.

පසුකාලීන ව අපේ රටේ කිතුණු, හින්දු, ඉස්ලාම් ආදී ආගම් ද ව්‍යාප්ත වුණි. එහෙත් ඒ සියලු ආගම්වලට බෞද්ධ සංස්කෘතිය තුළ කිසියම් රැකවරණයක් මිස හානියක් වන්නේ නැත. එය බොහෝ විට අන්‍ය ආගමිකයන් ද පිළිගන්නකි.

මේ පොසොන් පෝද අප අධිෂ්ඨානයක් ඇති කරගත යුතුව තිබේ. සම්බුදු දහම අපට ඇති එකම රැකවරණයයි. ඒ දහම් මග දැන ජීවිතයට ගළපා ගැනීම තුළ ප්‍රායෝගික කරගැනීම තුළ මෙලොව ජීවිතය සේ ම පරලොව ජීවිතය ද සුවපත් වන්නේ ය. අපි ඒ දහම් මග අනුගමනය කරමු. තථාගත බුදු පියාණන් වහන්සේටත්, අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේටත් කරන සැබෑ ගෞරවය එයයි.

**රමණී සුබසිංහ**

## පිහිට පතයි

දෙඩන්දූව, මෝදර පටුමග, අංක 18/2 හි පදිංචි නිමල් විතානගේ (59) අවිවාහක අයෙක් බවත් ඔහු හදිසි අනතුරකට ලක්ව ආබාධිතව සිටින බවත් කියයි. කිසිදු රැකියාවක් කර ගැනීමට නොහැකි ඔහුට ජීවත්වීමට අපහසු බවද කියයි. හැකි අයෙක් වෙතොත් පිහිට වන ලෙස ඉල්ලා සිටියි. වැඩි විස්තර 0768818272 දුරකථන අංකය වේ.

## මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ සීල සමාදානය (අන්තර්ජාල සජීවි විකාශනය)

පෙරවරු 6.00 – 7.00 සිල් සමාදන් කරවීම හා අනුශාසනාව හිඟුරක්ගොඩ විභාවි නා හිමි, 7.00 – 7.30 සම්බුද්ධ පූජාව (භික්ෂූන් වහන්සේ සියලු දෙනා සහභාගිත්වයෙන්) 8.00 – 9.00 භාවනාව – යටිරාවන ධර්මාරාම හිමි, 9.00 – 10.000 විශේෂ ධර්ම දේශනය – ලග්ගල අසම හිමි, 10.00 – 10.45 – තෙරුවන් ගුණ සජ්ඣායනාව – හක්මන සුමනසිරි හිමි, 10.45 – 11.30 – සම්බුද්ධ පූජාව (භික්ෂූන් වහනන්සේ සියලු දෙනා සහභාගිත්වයෙන්) පස්වරු 12.30 – 1.30 පිරිත් සජ්ඣායනාව – මහපිරිත් සූත්‍ර දේශනාව (භික්ෂූන් වහන්සේ සියලු දෙනා සහභාගිත්වයෙන්), 1.30 – 300 ධර්ම සාකච්ඡාව – මහරගම ධම්මසිරි හිමි, උල්ලිඳුවාවේ විනයධම්ම හිමි, 3.15 – 4 – 15 විශේෂ ධර්ම දේශනාව – තලල්ලේ චන්දකිත්ති හිමි, 4.15 – 5.15 ධම්මපදය – පානදුරේ පසන්න හිමි, 5.30 – 6.30 ලක්වාසි, ලෝ වැසි සැමට සෙත්පතා බෝධි පූජාව (භික්ෂූන් වහන්සේ සියලු දෙනා සහභාගිත්වයෙන්)

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
පෙසොන් පුර පසළොස්වක 2020.06.05

# අපේකම රැක ගැනීම

සම්බුදු දහමේ ආභාෂය ලැබ සිංහලයා, අභිමානවත්, ප්‍රෞඪ ජාතියක් බවට පත් වූයේ අදවන් පොසොන් පුන් පොහෝ දිනෙක අනුබුදු මිහිඳු මා හිමියන් අපෙ රටට වැඩම කිරීමත් සමඟ ය. නිර්මල සංස්කෘතියක් හා සභ්‍යත්වයක් ඇති, ශිෂ්ට සම්පන්න , අදීන ජාතියක් ලෙස අපි එදා පටන් අපට ම සුවිශේෂී වූ අනන්‍යතාවක් ගොඩනගා ගත්තෙමු.

එහෙත් ඒ විශිෂ්ට බෞද්ධ සංස්කෘතිය කාලයක් තිස්සේ විවිධ විපරිනාමයන්ට හසුවෙමින් පැමිණ යම් ආකාරයක සෝදාපාළුවකට ලක්වීමේ ස්වභාවයක් ගෙවී ගිය කාලය පුරා දකින්නට ලැබුණු බව නො රහසකි.

එදා ලක්දිව පෙරදිග ධාන්‍යාගාරය බවට පත්විය. ඒ හෙළයා සම්බුදු දහම අනුව ගිය අනලස් ජාතියක් වූ නිසා ය. අපේ මුතුන් මිත්තන්ගේ ඇවතුම්– පැවතුම් වාම් ය.

ජීවිතය සරල ය. අවශ්‍යතා සීමිත ය. ජීවන ගමන සාමකාමී ය. පරිසර හිතකාමී ය. අන්‍යෝන්‍ය උපකාරී ය . උනුන්ට ගෞරවයෙන් යුතු ය.

එකල සූ සැට බරණින් සැරසුණු තරුණ කාන්තාවක් වුව පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා තනි මග ගිය ද ඇය නිරුපද්‍රිත වූ බව කියැවේ. එවන් විනයවත්, ශෝභමාන සමාජයකට මෙවන් විපර්යාසයක් සිදු වූයේ ඇයි දැයි අප අපවෙතින් ම විමසා බැලිය යුතුව තිබේ.

රටක සමාජ, ආර්ථික, දේශපාලනික ස්වභාවය අනුව එහි වැසියන්ගේ චර්යා ධර්ම ද වෙනස්වීම ස්වභාවයකි. ඒ වෙනස සුබදායී වන්නේ නම් යහපත් ය. තම රට, ජාතිය, ආගම නො හඳුනන තරමට, තමන්ගේ සංස්කෘතිය අමතක වන තරමට, තමන්ට තමන්වත් හඳුනා ගන්නට බැරි තරමට රටක ජනතාව වෙනස් වන්නේ නම් ඒ තුළ ඇති වන්නේ ගැටලුවකි. බිහි වන්නේ අක් මුල් නැති ජාතියකි. මං මුළා වූ ජාතියකි.

එවන් ජාතියකට ඉතිරි වන්නේ මුතුන් මිත්තන් රැක දුන් අභිමානවත් ඉතිහාසයකි. හරසුන් අනාගතයකි.

එදා ගමත් , පන්සලත් අතර තිසි සමීපත්වය තුළ අප ආ ගමන් මග ඉතා ශක්තිමත් විය.

මෙලොවට සේ ම, පරලොවට ද වැඩදායි විය. අහස සිඹින දාගැබ්, සයුරු පරදන මහ වැව්, සෞන්දර්යයෙන් අනූන, එහෙත් ජීවිතයේ යථා ස්වභාවය පෙන්නුම් කරන කලා නිර්මාණ, රසවත් ලෙස බස හැසිර වූ අපේ ම සාහිත්‍යයක් අපට උරුම වූයේ ඒ ශක්තිමත් බවෙහි ප්‍රතිඵලයක් ලෙසට ය.

එවන් කලා කෘතියකින්, සාහිත්‍ය කෘතියකින් අප ලද ආනන්දය අවසන ප්‍රඥාව වෙත ගෙන ගියේ ය. ඒ ප්‍රඥාව ජීවිතයට අපූරු ලෙස ගැළපුණේ ය.

එහෙත් මේ සියල්ල ක්‍රමයෙන් මඟ හරිනු ලැබ අපගේ අනන්‍යතාව විනාශ කර ගනිමින් පැමිණ ආ බවක් හැඟේ.

අද උතුම් පොසොන් පුන් පොහෝ ද අප අධිෂ්ඨාන කරගත යුතු වන්නේ මිහිඳු සංස්කෘතියෙන් අපට ලැබුණු උරුමය රැක ගන්නට ය.

විශේෂයෙන් රටක යහපත හෝ අයහපත තීරණය කරන ප්‍රධාන සාධකය එහි නායකත්වයයි. දූර දර්ශී නායකයෙක් වේ නම් රටේ ගමන් මග යහපත් ය. ලක්වැසියන් ලෙස අද අප භාග්‍යවන්ත වී තිබේ. ඒ මිහිඳු මා හිමියන් අපේක්ෂා කළ දහම් මග යමින්, දසරාජ ධර්මයෙන්, සතර සංග්‍රහ වස්තුවෙන් රට කරවන නායකත්වයක් ලැබීමට ය. දේශීයත්වය හා අපේකම ආරක්ෂා කර ගන්නට ඒ නායකත්වයෙහි නිවැරැදි දැක්මක් ඇති බව වර්තමානයේ ආදර්ශයෙන් ම පෙන්වා තිබේ. අපගේ වගකීම ඒ උත්සාහය මල්ඵල ගැන්වීමට දායක වීම ය. ඒ තුළ අපට සුබදායක අනාගතයකට මග විවර වනු ඇත.

# පොසොන් සඳ එළියේ තුන් සිංහලයට ගලා ගිය සදහම් පණිවිඩය

**පොසොන් සඳ එළියත් සමඟ තුන් සිංහලය සිසාරා ගලා ගිය සම්බුද්ධ සදහම් පණිවිඩය තුළ මුලින් ම දැක්වෙන්නේ පංච ශීලයයි.**



උතුරු උතුරුමැද දෙනුවර
ප්‍රධාන සංඝනායක
අනුරාධපුර ශ්‍රී සම්බුද්ධ ජයන්ති
විහාරාධිපති ආචාර්ය
**නුගේතැන්නේ**
**පඤ්ඤානන්ද මාහිමි**

පංච ශීලයේදී මුලටම ඇත්තේ "පාණාතිපාතා" ලෙස අප කියවන පරපණ නැසීමෙන් වැළකී සිටීමේ සිල් පදයයි.

සටන වෙනුවට සාමය ඇති කිරීමෙන් හිතේ ඇතිවන සමාධිය ගැන සම්බුදු හිමියන් ධම්ම පදයේදී මනා ලෙස විවරණය කර තිබේ. සටනක දී මිනිසුන් මරා දමා ජයග්‍රහණය කළත් , එය ජයග්‍රහණයක් නොවන බවත් , සැබෑ ජයග්‍රහණය වන්නේ තමා ජයගැනීම බවත් සම්බුදු හිමියන් පැහැදිලිව දක්වා ඇත.

වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැති නමුත් අවෛරයෙන් වෛරය නැතිකොට, බ මෛත්‍රී චිත්තනයෙන් සාමය ඇතිකර ගත හැකි ය. සියලුම දෙනා දඬුවමට ද , මරණයට ද බියවෙති. මේ යථාර්ථය තුළ පිහිටා ආත්ම දමනය ඇති කරගෙන තමා විසින්ම තමා පාලනය කරගැනීමෙන් මුළුමහත් මානව සමාජය තුළ සාමය ඇතිකර ගත හැකි ය. ලෝකයේ ඉතාමත් අමාරු දෙය වන්නේ තමා විසින්ම තමා දමනය වී අනුන් දමනය කරන්නට යාම ය. අනුන්ට අවවාද අනුශාසනා කරන්නට පෙර තමා ඒ තුළ පිහිටිය යුතු ය.

ක්‍රෝධ කරන්නා මෛත්‍රියෙන් ජයගත යුතු ය. අසත්පුරුෂයා සත්පුරුෂකමින් ජයගත යුතු ය. මසුරු මිනිසා ත්‍යාග දීමෙන් ජයගත යුතු අතර, බොරු කියන මිනිසා සත්‍යයෙන් ජයගත යුතු ය. සම්බුද්ධ ධර්මය මෙය යි.

"සක්කපඤ්ඤ" සූත්‍රයේදී සම්බුදු හිමියන් මේ යථාර්ථය පැහැදිලි කර ඇත. මිනිසා අතර සාමය හීන වී, යුද ඇතිවීමට හේතුව කුමක්දැයි ශක්‍ර දෙවියන් බුදු හිමිගෙන් විමසූ විට සියල්ලට හේතුව අධික තණ්හාව බව බුදු හිමියන් මෙහිදී දේශනා කර තිබේ. තණ්හාව චිත්ත සන්තානයෙන් උදුරා දැමිය හැකි නම් එතැන සාමය පැළවන බව උන්වහන්සේ පැහැදිලි කර තිබේ. අප නිවැරැදි ව මිනිසුන් හඳුනාගෙන කටයුතු කළ යුතු ය. එවිට මතුවන පැහැදිලි සංජානනය තුළින් නිවැරැදි තීරණ ගතහැකි අතර, ඒ තීරණ බොහෝ දෙනාගේ හිතසුව පිණිස වන බව "සප්ත ජටිල" සූත්‍රයේදී බුදුහිමියන් දක්වා ඇත.

සංයුක්ත නිකායේ "වේපචිත්ති" සූත්‍රයට අනුව බලය ඇති තැනැත්තා දුබලයා කෙරෙහි ඉවසීම උතුම්ම ඉවසීම වේ. දුබලයා නිතරම බැරිකමට ඉවසති.

සංයුක්ත නිකායේ "රජ්ජ" සූත්‍රයේ සඳහන් වන අන්දමට නොනසමින්... නොනස්වමින්... පැහැර නොගනිමින්... පැහැර නොගන්වමින්... ශෝක නොකරමින්... ශෝක නොකරවමින්... ධර්මයෙන් රාජ්‍ය පාලනය කළ යුතු යැයි සම්බුදු හිමියන් දක්වා ඇත.

අධම්මික සූත්‍රයේ දැක්වෙන අන්දමට ගව රැළක ප්‍රධානියා ඇදට ගමන් කරයි නම්... පසුපසින් එන සෙසු ගවයෝද ප්‍රධානියා අනුගමනය කරති.

අංගුත්තර නිකායේ "නගරෝපම" සූත්‍රයේ දී නොබිඳිය හැකි බල කොටුවක තිබිය යුතු කරුණු හතක් දක්වා ඇත. රටක ආරක්ෂාව වෙනුවෙන් අනුගමනය කළ හැකි බෞද්ධ ගුණාංග කීපයක් ම ඇත. පංචශීල ප්‍රතිපත්තිය, සප්ත අපරිහානීය ධර්ම, දස රාජ ධර්ම, දස සක්විති වත්, සතර සංග්‍රහ වස්තු, සතර බඹ විහරණ, සතර අගතියෙන් තොර වීම, මෛත්‍රී චින්තනය ආදී ගුණධර්ම රාශියක් ම ඒ අතර වෙති.

ධර්මාශෝක රජතුමාගේ "ගිරිනාර්" ලිපි අංක හයෙහි මහජනතාවට සේවය කළ යුතු ආකාරය එතුමා විසින් මෙසේ දක්වා ඇත.

- මහජන ශුභසාධනය උදෙසා දිවා රෑ නොබලා වැඩ කිරීම මගේ එකම අධිශ්ඨානය යි.
- මිනිසාගේ යහපත සඳහා දිවා රෑ නොබලා වැඩ කිරීම මගේ බලවත් වගකීම යයි මම සිතමි.
- මිනිසාගේ යහපතට වැඩ කිරීම තරම් තවත් ශ්‍රේෂ්ඨ කෘත්‍යයක් මට නැත්තේ ය.
- දිවා රෑ වෙහෙසී මා වැඩ කළත් එම සේවා ප්‍රමාණයෙන් මම සෑහීමකට පත් නොවෙමි.
- මා ගන්නා හැම වීර්යයක ම අවසාන ප්‍රාර්ථනය වන්නේ ජනතාව සුවපත් කිරීම ය.
- මට මගේ ස්වර්ගය සැදී ඇත්තේ ජනතාවට සේවය කිරීම තුළින් බව මම දැන සිටිමි.
- මගේ පුත්‍රයෝ ද ඔවුන්ගේ පුත්‍රයෝ ද මේ ප්‍රතිපත්ති අනුගමනය කෙරෙත්වා.

කාලිංග ගිරිනාර් ලිපි අංක හතෙහි සියලු ජනතාව මගේම දරුවන් සේ සලකා කටයුතු කරන බව දැක්වේ. සම්බුදු හිමියන් රාජ්‍ය පාලකයාගේ පැවැත්ම මෙසේ විය යුතු යයි ජාතක පාලියෙහි දක්වා ඇත්තේ මේ අන්දමට ය.

**"යථා පිතා වාපි මාතා**
**අනුකම්පකා අත්ථකාමා පජානං**
**ඒවමේව වො හෝතු අයංචරාජා**
**තුම් හේව වො හෝථ යථෙව පුත්තා"**

"මව්පියන් සිය දූවා දරුවන්ගේ දියුණුව ප්‍රාර්ථනා කරන්නේ යම් සේ ද, එසේම රාජ්‍ය පාලකයා සියලුම රට වැසියන් තමාගේ ම දරුවන් සේ සලකා කටයුතු කිරීම වැදගත් වේ."

එම ගාථාවේ අදහස මෙයයි.

බලය හෝ අන් කිසිවක් සඳහා හෝ උනුන් විනාශ කරගන්නා සුළු සටන් නැති සාමකාමී සමාජයක් ගොඩනැගීම බුද්ධ ධර්මයේ පරම පිවිතුරු ප්‍රාර්ථනාවයි. ජය පරාජයක් නැති එවන් සමාජයක් තුළ රජ වන්නේ සාමය යි. එහි දී වැඳුම් පිදුම් ලබන්නේ ධන බලයෙන්,යුද බලයෙන් මිනිසුන් හා රටවල් ජය ගන්නා අය නොව තමා විසින් තමා ම දිනාගන්නා මිනිසුන් ය. මෙහිදී වෛරය මෛත්‍රියෙන් ද, අධර්මය ධර්මයෙන් ද ජය ගනී. ආදරය, කරුණාව, මෛත්‍රිය, සාමය තේරුම් ගෙන මිනිසුන් ලෙස ජීවත් විය යුතු ය යි නිරතුරු ව බුදුන් වහන්සේ දේශනා කර තිබේ.

විවිධ කරුණු පදනම් කරගෙන අපේ රටේ විවිධ ජාතීන් අතර පැන නැගී ඇති මතභේද, අවුල් වියවුල්, අසමගිකම් බැහැර කරලීමට මෙම සම්බුද්ධ සංකල්පය අනුව කටයුතු කළ යුතු ය. සම්බුදු දහම නිසි ලෙස අනුගමනයෙන් මිනිසුන්ගේ හදවත් තුළ සැබෑ සාමය, සහජීවනය, හොඳ හිත ගොඩනැගෙයි.

අනුරාධපුර හා මිහින්තලය ආශ්‍රිත ව පොසොන් දා මතුවන සඳ එළියෙන් තුන් සිංහලය ම මෛත්‍රියෙන්, සාමයෙන්, සහජීවනයෙන් සුවපත් වේවායි ප්‍රාර්ථනා කරමි.

# සිංහල ජාතියේ සංවිධායකයා

**මිහිඳු මහ රහතන් වහන්සේ අපේ රටට වැඩම කරන්නේ ශාන්ති නායක අමාමෑණී බුදු පියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 236 කට පසුව ය. උන්වහන්සේ පැමිණීමට පෙර ශ්‍රී ලංකාද්වීපය යක්ෂ, රාක්ෂස, දේව, නාග කියන සිව් හෙළ යන්ගෙන් ඉතා ම විස්මිත නිර්මිතයන් සහිත ව දියුණුවට පත්ව පැවති දේශයකි.**

**'මේ රටට සෙසු පිරිස් පැමිණෙන්නේ බුද්ධ ධර්මය දකින්නට ය. ඉගෙන ගැනීමට ය. ඒ නිසා ඒ බුද්ධ ධර්මය ආරක්ෂා කොට, හොඳින් පිළිපදින ආදර්ශමත් ජාතියක් බවට අපට පත් වෙන්නට හැකි නම් සැබෑ ලෙස ම මිහිඳු හිමි සමරන සංස්කෘතියක් සමාජයෙහි ස්ථාපිත කළ හැකි වනු ඇත.'**



මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ
ශ්‍රී රෝහණ පාර්ශ්වයේ
ප්‍රධාන සංවිධායක හා විධායක කාරක සභික
අධ්‍යාපන අමාත්‍යංශයේ
පිරිවෙන් ඒකකයේ ජතික උපදේශක
ශාස්ත්‍රපති
**දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

රාවණා යුගය ගෙන බැලුවහොත් ඉතා විශිෂ්ට සංස්කෘතියක්, ලෝකය විස්මිත කරවන නිර්මාණ බිහි වූ යුගයකි. දඬු මොණර යන්ත්‍රය, ආලකමන්දවක් සේ පැවති සීගිරිය වැනි තැන් සමග බලන විට එකල විශිෂ්ට සමාජයක් තිබුණු බවට කිසිදු සැකයක් නැත.

පණ්ඩුකාභය රජ දවස රජතුමා සමග සිටි චිත්තරාජ, කාලවේල, වළවාමුඛී වැනි දේවත්වයෙන් සැලකූ යක්ෂ යක්ෂණියන් රජු සමග සම අසුන්හි වාඩි වී රැගුම් නැරඹූ බව ඉතිහාසය කියයි.

ඒ වගේ ම තිවංකගම, තිවංක බමුණා චන්දන ග්‍රාමයේ සිටි බ්‍රහ්මණයින් ප්‍රබල ප්‍රාන්ත නායකත්වයක් ඉසිලූ නායකයින් බව අපට පෙනේ. දෙරමඬලාව ගමේ සිටි ආචාර්යවරුන් වගේ අය රටට බොහෝ බලපෑම් කළ කණ්ඩායම් ය.

ඒ නිසා මිහිඳු මා හිමියන්ගේ වැඩම වීම සිදු වූයේ ඉතා ම බුද්ධිමත් ජනතාවක් සිටින දේශයකට ය. එසේ නැතිව ම්ලේච්ඡ ජනතාවක් සිටි දේශයකට නොවේ.

මිහිඳු මා හිමියන් දේවානම් පියතිස්ස රජුගෙන් අඹ ප්‍රශ්නය හා ඥාති ප්‍රශ්නය විමසුවේ ඒ බුද්ධිමත් බව පිරික්සීමට ය. ප්‍රත්‍යක්ෂ සහ අනුමානය පදනම් කරගෙන ප්‍රශ්න අසා රජුගේ දැනුම පරීක්ෂා කිරීමකි එදා සිදුවූයේ.

ඒ වගේ ම අපට තිබුණ ඉතා බලගතු දෙයක් වූයේ පරිසර සාධකයි. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රථමයෙන් දේශනා කළ "චූල්ලහත්ථිපදෝපම" සූත්‍රයේ දී මිනිසුන්ට බණ කියන්නේ ඇත් අඩි උපමාවට ගෙන ය. එකල ලාංකේය ජන සමාජයට ඇතුන් ඉතා ළ බැඳි ය. හීලෑ කරගත් ඇතුන්ගෙන් අපට මහත් සේවයක් සැලසුණි. ඒ ලාංකේය සමාජය පරිසරයත් සමඟ ජීවත් වූ නිසාය.

මිහිඳු මහ රහතන් වහන්සේ අපේ රටට වැඩම කළේ මිත්‍රත්වයෙනි. අප දන්වා, බුදුරජාණන් වහන්සේ දෙවතාවක් ම අපේ රටට වැඩම කළේ යුද ගිනි නිවීමට ය. එක් අවස්ථාවක මහියංගනයේ යක්ෂ දමනය සිදුවුණි. එදා යක්ෂයින් විසින් නාගයින්ට අයිති උයනක් ග්‍රහණය කර ගනු ලැබීමට යාම තුළයි ඒ යුද්ධය ඇතිවුණේ..

ඊළඟට නාගයින් අතර ම යුද්ධයක් ඇතිවුණි. ඒ චූලෝදර හා මහෝදර අතර ය. බුදුරජාණන් වහන්සේ ඒ යුදගිනි ද නිමා දැමූහ. මේ ආකාරයට එක් පැත්තකින් රාජ්‍යත්වය භේද භින්නවලින් පිරිහීමට ලක්වුණි.

තවත් පැත්තකින් ලෝකයේ පළමුවැනි වතාවට වාපී සංස්කෘතිය ආරම්භ කරන්නේ අපේ රටේ ය. ඒ පණ්ඩුකාභය රජ දවස අභය වැව නිර්මාණය කිරීමත් සමඟ ය. මල්වතු ඔය හරහා වළවේ ගඟ ඔස්සේ අපේ ශිෂ්ඨාචාරය ආරම්භ කර තිබුණි. ඒ නිසා මිහිඳු සංස්කෘතියක් මේ රටේ ස්ථාපිත කිරීමට මිහිඳු මා හිමියන්ට පහසුවක් වුණි. සිංහල ජාතියේ සංවිධායකයාණන් මිහිඳු මහ රහතන් වහන්සේ බව අප කියන්නේ ඒ නිසයි. උන්වහන්සේ වෙන් ව, කොටස් ව, ගෝත්‍ර අනුව තැන තැන සිටි බුද්ධිමත් ජනතාව සංවිධානය කළහ. පිළිවෙළකට මතු කළහ. ඒ පිළිවෙළ සඳහා උන් වහන්සේ අපට බෝ හාමුදුරුවන් වහන්සේ හඳුන්වා දුන්හ. අපේ මුළු ශ්‍රී ලංකාව ම එකතු වුණේ බෝධීන් වහන්සේ රෝපණය කළ දිනයේ ය. එහි දී සියලු ම ප්‍රදේශවල සිටි ගෝත්‍ර නායකයින් එක් රැස් වී තිස්ස රජතුමාගේ නායකත්වය පිළිගෙන, ඒක ඡන්දයෙන් එක ම ධජයක් යටතට පැමිණියහ. එය මිහිඳු මහරහතන් වහන්සේගේ දක්ෂ තාවක ප්‍රතිඵලයකි.

ඊළඟට උන්වහන්සේ අපේ භාෂාව විධිමත් කළහ. අපට හොඳ හෙළ බසක් තිබුණි. ඒ හෙළ බසට අවශ්‍ය කරන අක්ෂර මාලාවක් සකස් කර දීමට උන්වහන්සේ කැප වූහ. හෙළ බස මුල් කොටගෙන ත්‍රිපිටකය හෙළ බසට නැගුණි. හෙළ බසින් අටුවා නිර්මාණය වුණි.

ඒ වගේ ම අරිට්ඨ හාමුදුරුවෝ පැවිදි කොට මේ රටේ සංඝ සමාජය ආරම්භ කළහ. ඒ තුළ හෙළ සංස්කෘතිය ක්‍රමවත් කළහ. ඒ ක්‍රමවත් කිරීමට උන්වහන්සේ භාවිත කළ මෙවලම් ඉතා වටිනාකමින් යුතු ය.

අල්පේච්ඡ බව ඉන් ප්‍රධාන ය. රහතන් වහන්සේ විශාල පිරිසක් සමග උන්වහන්සේ සැතපුණේ මිහින්තලාවේ ගල්ගුහා තුළය. මිහිඳු ලෙන නැරඹූ විට අදත් අපට එය විද්‍යමාන වේ. එහි දී උන්වහන්සේ ජනතාවට ඉගැන්වූයේ භික්ෂූන් වහන්සේ කියන්නේ සුබර පිරිසක් වන බව ය. පෝෂණය කිරීමට අපහසු පිරිසක් නොවන බව ය.

අනෙක් පසින් උන්වහන්සේ හෙළ ජාතියට අල්පේච්ඡතාවය ලබා දුන්හ. ලැබෙන දෙයින් සොම්නසට පත්වෙන්නට, වුවමනාවන් පසුපස නොදුවන්නට ඉගැන්වූහ.

ඒ සමග උන්වහන්සේ මේ ජාතිය සංවිධානය කළහ. අපේ රටට පිටතින් නොගැනීමටත්, ලෝකයට දිය හැකි දේ ත් නිර්මාණය කළහ. උන්වහන්සේ අපට ධජයක් නිර්මාණය කළහ. මිහිඳු මා හිමියන් මෞර්ය වංශිකයෙකි. උන්වහන්සේට තිබුණේ මොණර සලකුණ ය. එහෙත් අපට ලබා දුන්නේ සිංහ ලාංඡනයයි. උන්වහන්සේ අප වෙනම ජාතියක් ලෙස සංවිධානය කළහ. ඒ සඳහා වෙනම හේතුවක් තිබුණි. බුදුරජාණන් වහන්සේ ගේ පරිනිර්වාණ මංචක මොහොතේ දී ආශිර්වාද ලබාගෙන ආ විජය කුමරු වැනි අයගෙන් ලැබුණු කතන්දර ය. ඒ සිංහ කතාව ය. ඊට එහාට ගිහින් මිහිඳු හාමුදුරුවෝ එය අර්ථවත් කළහ.

බුදුරජාණන් වහන්සේ මේ ලෝක ධාතුවේ සිටි සිංහ රාජයාණන් වහන්සේ ය. උන්වහන්සේ සැතපුණේ සිංහ සෙය්‍යාවෙනි. පැවැත්වූයේ සිංහ නාදය. උන්වහන්සේ තුළ තිබුණේ සිංහ දහමකි. ඒ නිසා තමයි අශෝක අධිරාජයා බුදු රජාණන් වහන්සේ සංකේතවත් කිරීමට සිංහ ලාංඡනය භාවිත කළේ.

මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට පැමිණ අටමස්ථානය සලකුණු කොට මෙතැන මහා දගැබ ඉදිවන්නේ ය. මෙතැන බෝ හාමුදුරුවෝ රෝපණය වන්නේ ය. මේ ආදී වශයෙන් මේ තාත්වික නිර්මාණ කළේ තනිකරම ඉදිරියට දෙපා තබාගෙන වාඩි වී සිටින සිංහයකුගේ රූපය සැකසෙන ලෙසට ය.

උන්වහන්සේ ලක් සමාජය විධිමත් ව සංවිධානය කිරීමට සඟමිත් රහත් තෙරණිය ඇතුළු කොට දහ අට ශ්‍රේණියක පිරිසක් ශිල්ප, ශාස්ත්‍ර, ශ්‍රේණි ලෙස ගෙන්වා ගෙන ඒ අයගෙන් මේ දේශය සංවිධානය කළහ. රාජ්‍ය පාලනය ක්‍රමවත් කළහ.

ගංගානම් ගඟේ ජලය සහිත ව ධර්මාශෝක අධිරාජයා මගින් ඒ ක්‍රමවත් අභිෂේකයට අවශ්‍ය කරන රාජ්‍ය උපකරණ ගෙන්වා අපේ තිස්ස රජතුමාට "දේවානම්ප්‍රිය" යන ගෞරව නාමයක් ලබා දී එතුමා සියලු දෙනාගේ ම නායකයා හැටියට පත් කළහ. ඒ නැවත ප්‍රශ්න, ගැටලු ඇති නොවන ආකාරයට ය. ඒනිසා රාජ්‍යත්වය, පිළිබඳව, දේශපාලනය පිළිබඳ ව ලෝකය අයත්ත ආයත්ත නොකිය වූ කාලයේ අපේ දේශය තුළ සැබෑ විදිහට එය ක්‍රමවත් ව ගෙන යාමට අවශ්‍ය වැඩපිළිවෙළ උන්වහන්සේ සකස් කළහ.

වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, නිල්වන් ගොයමයි, කහ සිවුරයි යන සංකේතය ලබාදුන්හ. වැව තුළින් කෘෂිකාර්මික ආර්ථිකය ගොඩනැගූහ. දාගැබ, පන්සල ඔස්සේ සම්පූර්ණයෙන් ම අපේ සංස්කෘතියේ තිබෙන්නා වූ සාර ධර්ම ආරක්ෂා කර දුන්හ. කුඹුර ඔස්සේ අපේ ආහාර වේල සකසා ලෝකය ජය ගන්නට හැකි ලෙස සකස් කළහ. ඒ විතරක් නොවේ. අපේ චීවරය මේ ජාතියේ මුර දේවතාවා බවට පත්කළහ. පිරිවෙන් අධ්‍යාපනය අරඹා ඒ තුළින් මේ දේශයම ගොඩනැගූහ.

ආයුර්වේදය, නක්ෂත්‍රය, තාරකා ශාස්ත්‍රය එදා ලෝවා මහා ප්‍රාසාදයේ නව වැනි මහලේ තිබුණේ ආකාශ වස්තූන් පරීක්ෂා කරන පරීක්ෂණාගාරයකි. ඒ තත්ත්වයට ගෙන එන්නට උන්වහන්සේ ශක්තිය ලබා දුන්හ.

උන්වහන්සේ මේ සමාජයට ගෙන දුන් ලස්සන පණිවිඩයක් තිබේ. ඒ පොළොව බාර නොගන්නා කිසිදෙයක් පොළොවට ලබා නොදෙන ලෙස ය.

කාලමහා ප්‍රාසාදය අපේ පළමු පිරිවෙන ය. එය හැදුවේ මැටි ගසා ය. එය පොළවට ඉල්ලන දේ ය. මේ දේශය තුළ යමක් ඉදිකළා නම් ඒ සියල්ල ම මේ මහපොළොවට පස්වන දේ ය. ඒ නිසා තමයි රජ කාලයේ මහා මාළිගා අද දකින්නට නොලැබෙන්නේ.

අපට ලෝකයෙන් ගෙන එන්නට කිසි දෙයක් නැත. එහෙත් ලෝකයට අපෙන් ගෙන යන්නට දේ ඇත. නානකාමර සංකල්පය ලෝකය හඳුනා ගත්තේ අනුරාධපුරයෙනි. මිහිඳු සංස්කෘතිය තුළ වැසිකිළි හා කැසිකිළි එකක් නොව දෙකකි. ඒ අනුව මළ පහවල සිටින පණුවාටවත් මැරෙන්නට ඉඩ දුන්නේ නැත. මේ ක්‍රමවත්, විධිමත් ඒ වැසිකිළි ගල් අදත් අනුරාධපුරයේ දක්නට ලැබේ. ඒ වගේ ම පිරිසුදු ජල පරිහරණ ක්‍රම, ජලපෙරණ හඳුන්වාදුන්හ. ලෝකය මේවා අරගත්තේ ය. අමෙරිකාවේ නාසා ආයතනය එදා අතීත සිංහලයන් ගොඩනැගූ දේ, මිහිඳු යුගයේ තිබුණු දේ ගැන පවා පරීක්ෂණ කොට ඔවුන්ගේ දේට යොදා ගත්හ. ඒ නිසා අපට තිබෙන්නේ තව දුරටත් ලෝකයට දෙන්නට ය.

මේ රටට සෙසු පිරිස් පැමිණෙන්නේ බුද්ධ ධර්මය දකින්නට ය. ඉගෙන ගැනීමට ය. ඒ නිසා ඒ බුද්ධ ධර්මය ආරක්ෂා කොට, හොඳින් පිළිපදින ආදර්ශමත් ජාතියක් බවට අපට පත් වෙන්නට හැකි නම් සැබෑ ලෙස ම මිහිඳු හිමි සමරන සංස්කෘතියක් සමාජයෙහි ස්ථාපිත කළ හැකි වනු ඇත.

එදා මිහඳු මහරහතන් වහන්සේ මේ බිමේ අවිහිංසාව පැතිරූහ. දුසිල්ව සිටි අය සිල්වත් කළහ. අශීලාචාර ව සිටියා නම් කෙනෙක් ශීලාචාර කළහ. භක්තිය මත කෙනෙක් සිටියා නම් සැදැහැවතෙක් බවට පත්කළහ. ඒ වගේ ම මෝඩ තීරණ ගන්නා කෙනෙක් සිටියා නම්, නැණවතෙක් කළහ. අපට යන්නට තිබෙන්නේ ආපස්සට මිස ඉදිරියට නොවේ. මෙය අතීත කාමය නොවේ. අනුරාධපුරයේ යුගයට ගමන් කළේ නම් නැවත අපේ රට මේ ලෝකය තුළ මුතු ඇටයක් බවට, ධාන්‍යාගාරයක් බවට, ධර්මද්වීපයක් බවට පත්වනවාට කිසිදු සැකයක් නැත.

**රමණී සුබසිංහ**

# නිරෝගී ජීවිතයට ධර්මෝපදේශ

**මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලක්වැසියන් වෙත දයාද කරන ලද විශිෂ්ටතම සම්පත පාලි භාෂාමය වූ ඉපැරැණි ධර්ම විනයයි. එම ධර්ම විනය පාදක කොටගෙන මෙරට ජනතාවට උගන්වා ඇති සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට අදළ වූ සදුපදේශයන් ද රැසකි.**

මහාචාර්ය
**දේවාලේගම මේධානන්ද හිමි**



බුදු දහම අනුව අපට වැළඳෙන රෝග දෙයාකාරය. එනම් කායික හා මානසික යනුවෙනි. යමෙකු වසර දහයක් හෝ සියයක් හෝ කායික රෝගවලින් තොරව සිටිය හැකි ය. එහෙත් මානසික රෝගවලින් තොරව වසන්නෙකු රහතන් වහන්නේ නමකගෙන් මෙපිට දක්නට නොලැබේ. යනු බුද්ධ වචනයයි.

ඒ අනුව පුහුදුන් සියල්ලෝ මානසික රෝගීහු වෙති. ඒ ඔවුන් තුළ රෝග නිදනයන් වන රාග, ද්වේෂ, මෝහ ආදී කෙලෙස් ඇති බැවිනි. මානසික රෝගාබාධයන්ගෙන් තොර වුව ද බුදුවරුන්ට ද කායික රෝග වැළඳේ. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ, මුගලන් මහ රහතන් වහන්සේ වැනි රහතුන් වහන්සේ ද විවිධ ආබාධවලට ලක් වූ බව සූත්‍රාන්තයන් හි සඳහන් වේ. උන්වහන්සේ ද ආබාධිත වූහ. කායිකව දුක් පීඩාවන් ට ගොදුරු වූ හ. දැඩිලෙස ගිලන් වූහ. අවසන් වස්සාන යාමයේ **වේලුව ගමෙහි වැඩ සිටි බුදුරජාණන්** වහන්සේ ආබාධිත වූහ. ශාරීරික දුක් උපන්හ. දැඩිව ගිලන් වූ උන් වහන්සේට ලෝහිතක්ඛන්දිකා නම් රෝගය වැළැඳුණ බව සඳහන් වේ. එයින් දැඩි දුක් වේදනා ඇතිවිය. එම අවස්ථාවට පෙර ද විටින් විට බුදුරජාණන් වහන්සේ රෝගී වූ තැන් පෙළ දහමෙහි දැක්වේ.

මේ අනුව කායික රෝග මේ ලෝක සත්ත්වයන්ට පමණක් නොව සියලු මානසික රෝග යන්ගෙන් මිදුණු බුද්ධාදී උතුමන්ට ද අදාළවේ. මිනිසුන්ට වැළඳෙන අනේක විධ වූ කායික රෝග 34ක් ගැන ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් වේ. සූතිසක් වූ කායික රෝග මාලාව පිළිබඳ ගිරිමානන්ද සූත්‍රයේ අවසන් වන්නේ එබඳු රෝග පිළිබඳ වර්ගීකරණයකිනි. ඒවා රෝග හේතු ලෙස ද හැඳින්විය හැකි ය.

වාතය කිපීමෙන් හටගන්නා ආබාධ, පිත කිපීමෙන් හට ගන්නා ආබාධ, සෙම කිපීමෙන් හටගන්නා ආබාධ, ඉහත කී තුන්දෙස් කිපීමෙන් හට ගන්නා ආබාධ, ඍතු වෙනස්වීමෙන්, නුසුදුසු ඉරියව් නිසා, අනුන්ගේ උපක්‍රම නිසා, කර්ම විපාකයෙන් වැළදෙන ආබාධ මෙසේ හඳුන්වා දී ඇත. කය සහ මනස අතර ඇත්තේ සාපේක්ෂක සම්බන්ධයකි.

ඒ අනුව කායික රෝගී බව මෙන් ම නීරෝගී බවට ද මනස බලපායි. මානසික නීරෝගී බවට සේ ම රෝගී බවට කය බලපායි. කායික හේතු නිසා මානසික පීඩනයත්, එයින් තව තවත් කායික රෝගාබාධත් වැළඳිය හැකි ය. මානසික හේතු නිසා කායික රෝග උපදී.

අත්තස්සද්වාර ජාතකයේ සඳහන් පරිදි ආරෝග්‍යය පුද්ගලයෙකුගේ මෙලොව දියුණුවට හේතුවන කරුණු අතර පළමුවැන්න ය. එබැවින් ඉහත කී රෝගවලින් අත් මිදී නිරෝගී ජීවිතයක් ගතකරන සමාජයක් ඇතිවීම බුදුරජාණන් වහන්සේගේ අපේක්ෂාවයි. කරුණු එසේ වුව ද ආරෝග්‍ය මදයෙන් මත් නොවිය යුතුයැයි උන්වහන්සේ වදාළහ. නීරෝගී ව සිටීමෙන් හෙවත් ආරෝග්‍ය මදයෙන් මත් වන්නෝ කයින් ද, වචනයෙන් ද දුසිරිත් කරති. මතු දුගති ගාමී වෙති. රෝග පීඩා වැළදෙන්නේ නැතැයි මුළාවට පත්වෙති. කායික වශයෙන් රෝගීවීම වළක්වා ගැනීමේ එක් කරුණක් නම් නිසි ලෙස ආහාර ගැනීමයි. එය ආහාර සප්පාය ලෙස හඳුන්වා තිබේ. එසේ ම සිහි නුවණින් සලකා බලා ආහාර ගැනීම ය. අල්පේච්ඡතාවෙන් ආහාර පරිභෝග කිරිම ය.

හික්ෂූන් වහන්සේ ආහාර අනුභව කරන්නේ හුදෙක් දිවි පැවැත් ම සඳහා ය. දිවි පැවැත් ම ද හුදෙක් ඒ සඳහා ම නොව දුක්ඛ නිස්සරණයට උපකාර වන බ්‍රහ්ම චර්යාවට අනුග්‍රහය පිණිස ය. පැවිද්ද සිව් පසයෙහි ම ප්‍රමාණවත් ව ලැබීමෙන් සතුටුවෙයි. සිවුරෙන් සතුටුවෙයි. අහරෙන් සතුටු වෙයි. ජීවිතයට ප්‍රමාණවත් වූ සෙනසුනෙන් සතුටු වෙයි. ලෙඩදුක් නසන බෙහෙතෙන් සතුටු වෙයි. පැවිද්ද ලද පමණින් සතුටු වන්නේ ය. පහසුවෙන් පෝෂණය කළ හැකි වන්නේ ය. නිසැකව ම ප්‍රත්‍ය පරිභෝජනය හා බැඳුණු මෙම චිත්තාවත් හා චර්යාවත් ද රෝග පීඩා වළක්වා ගැනීමට උපකාරී වේ.

නිබඳව ම තණ්හාවෙන්, අතෘප්තිකර ව ජීවත්වීම බුද්ධ වචනයට අභිමත නොවේ. එයින් මානසික මෙන් ම කායික රෝගී බව ද ඇතිවේ. සිව්පසයෙහි ලද පමණින් සතුටු වීම ආර්යවංස ධර්මයක් බව බුද්ධ වචනයෙහි පෙන්වා දේ. ලද පමණින් සතුටු වීම, එම පිළිවෙතෙහි ගුණ කීම, අයුතු ලෙස පිණ්ඩපාතයෙහි නොහැසිරීම, පිණ්ඩපාතය ලැබීමෙන් හෝ නොලැබීමෙන් වික්ෂිප්ත සිත් උපදවා නොගැනීම, ආදීනව දකිමින් පරිභෝග කිරීම අනලස් වීම එහිලා වර්ණනා කොට ඇත. ලද පමණින් සතුටු වීම, සුදුසු ගැළපෙන දෙයින් සතුටු වීම ආර්යවංස ප්‍රතිපදාව ය. පමණ නොදැන ආහාර අනුභව කිරීමට පුරුදු වී සිටි කොසොල් රජු ඇමතූ බුදුරජාණන් වහ්නසේ හැම කල්හි මනා සිහි නුවණින් යුතු ව පමණ දැන ආහාර ගන්නා තැනැත්තා කායික වේදනාවන්ගෙන් තොරවන බව ද, වැළඳූ ආහාර සෙමෙන් දිරවීමෙන් ආයුෂ පාලනය වන බව ද වදාළහ.

ආහාර පරිභෝජනයේ දී මෙන් ම ජල පරිහරණයේ දී ද සෞඛ්‍ය සම්පන්න ව ක්‍රියාකිරීම ගැන ධර්ම විනයෙහි දක්වා ඇත්තේ ඉතා විශාල උනන්දුවකිනි. මව පුතෙකු පෝෂණය කරන්නා සේ, වැස්ස අලස පුද්ගලයා මෙන් ම අනලස් තැනැත්තා ද පෝෂණය කරන බව පෙළෙහි සඳහන් වේ. පොළොව ඇසුරු කළ සියලු ප්‍රාණීහු වැස්ස නිසා ජීවත් වෙති. මෙසේ වැස්ස ද ජලය ද අගය කළ බුදුරජාණන් වහන්සේ අපිරිසුදු බව නො ඉවසූහ. ජලය පිරිසුදුව තබා ගැනීම ඉතා වැදගත් කරුණක් බව විනයෙහි දක්වා තිබේ. ඒ සඳහා භාවිත කළ යුතු උපකරණ ද දක්වා ඇත. භික්ෂූන් වහන්සේ ජලය පෙරා පානය කළ යුතු ය. ඒ සඳහා පෙරහන් කඩක් අනු දැන ඇත. සෞඛ්‍ය රැක ගැනීම සඳහා ද, කුඩා ප්‍රාණීන්ගේ දිවි රැකුම සඳහා ද පැන් පෙරා පරිහරණය කරන ලදී. නොපෙරූ ජලය භික්ෂූන්ට ඇකැප ය.

යම් භික්ෂුවක් අමනාප සිතින් තවත් භික්ෂුවකට පෙරහන නොදේ නම් ඔහුට ඇවැතක් සිදු වේ. පෙරහණක් නැති විට සිවුරු කොණෙන් හෝ ජලය පෙරා ගැනීමට අනුශාසනා කර ඇත.

මෙසේ ජල දූෂණය වළකනු පිණිස ආරාම තැනීමේ දී පානීය පරිභෝජනීය ජලාශ සමීපයෙහි සෙනසුන් නොකළ යුතු යැයි පෙන්වා ඇත්තේ ය. මේ හැරුණු විට සේනාසන පරිභෝජගය හා බැඳුණු උපදෙස් රාශියක් ද පෙළ දහමේ දැක්වේ.

යම් වෙහෙරක වෙසේ ද, ඒ වෙහෙර කුණු කසළ සහිත ද, ඉදින් හැකිනම් පිරිසුදු කළ යුතු ය. වෙහෙර පිරිසුදු කරන්නා විසින් පාත්‍රා සිවුරු පිටතට ගෙන ගොස් එක් පැත්තක තැබිය යුතු ය. බුමුතුරුණු තවත් පසෙක තබා අව්වේ වේලා පිරිසුදු කොට ගසාදමා ඇතුළට ගෙනවුත් පෙර තිබූ පරිදි ම තැබිය යුතු ය. ඇඳ ද , පාපිස්න ද එක් පසෙක අව්වේ වේලා පිස දමා ආවාසය ඇතුළට ගෙන ගොස් තිබූ තැන්හි ම තැබිය යුතුය.


ඇඳ එක් පසෙක අව්වේ වේලා පිරිසුදු කොට ගසා දමා පහත් කොට දොර පළු, බිත්ති ආදිය නොකඩා මැනවින් තිබූ සෙයින් ම තැබිය යුතු ය. පුටුව ද, මෙට්ටත්, කොට්ටත්, නිසීදනය ද, පසතුරුණු ද, කෙළ ගසන බඳුන ද එසේ තැබිය යුතු යැයි උගන්වා තිබේ. මේ සියලු උපදෙස් සෞඛ්‍ය සම්පන්න පැවැත්මකට උපකාර වේ. ඉදින් වෙහෙර මකුළු දැල් බැඳ ඇත්තේ ද, පළමුව ඉහළ සිට පහළට ඒවා ඉවත් කළ යුතු ය. කුටියට එළිය වැටෙන ලෙස ජනේල, දොරපළු විවෘත කොට තැබිය යුතු ය. කුටියේ මුලු සතර පිස දැමිය යුතුය. හුණු පිරියම් කළ යුතුය. බිත්තිය කිළිටි වී ඇත්නම් තෙමූ රෙදි කඩකින් පිස දමා ගත යුතු ය. කසළ රැස්කොට පසෙකට දැමිය යුතුය. භික්ෂූන් සමීපයේ දූවිලි ඇති ඇඳ ඇතිරිලි, සිව්රු ආදිය ගසා නොදැමිය යුතු ය. ඉදිරිපස මිදුලේ සිට උඩු සුළඟට හෝ යටි සුළඟට සෙනසුන ගසා නොදැමිය යුතු ය. ඉදින් පෙර දිගින් දූවිලි සහිත වාතය හමයි නම් පෙරදිගින් ඇති ජනෙල් වැසීම සුසුදු ය.

මේ ආදී වශයෙන් සෙනසුන්, සෞඛ්‍ය සම්පන්න ව, පිරිසුදු ව පවත්වාගෙන යාමට පනවන ලද මාර්ගෝපදේශ හා විනය නීති රාශියකි. එක් අතකින් ආහාර පරිභෝජනයේ දී ද එසේ ම ජල පරිහරණයේ දී ද, එසේ ම පරිසරය විධිමත් ව පවත්වා ගැනීමෙන් ද වාසස්ථාන නිසිලෙස පවත්වා ගැනීමෙන් ද භික්ෂූන්ගේ වාසස්ථාවල ඇඳ පුටු ආදිය පිරිසුදුව තබා ගැනීමෙන් ද ආදී වශයෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට අවශ්‍ය උපදෙස් රාශියක් ම විනයෙහි සඳහන්ව ඇත.

> වැස්ස අලස පුද්ගලයා මෙන් ම අනලස් තැනැත්තා ද පෝෂණය කරන බව පෙළෙහි සඳහන් වේ. පොළොව ඇසුරු කළ සියලු ප්‍රාණීහු වැස්ස නිසා ජීවත් වෙති. මෙසේ වැස්ස ද ජලය ද අගය කළ බුදුරජාණන් වහන්සේ අපිරිසුදු බව නො ඉවසූහ.

# ඓතිහාසික මිහින්තලා ලේක්හවුස්

# ආලෝක පූජා පුණ්‍ය මහෝත්සවය





58 වන වසර

**මෙරට ප්‍රථම පොසොන් ආලෝක පූජාව ලෙස 1963 වසරේදී ඇරැඹි මිහින්තලා - ලේක්හවුස් ආලෝක පූජාව 58 වැනි වරට මෙවරත් කොරෝනා වයිරස උවදුර හමුවේ වුවද මිහින්තලා පුණ්‍ය භූමියේ දී 4, 5, 6 දිනවලදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.**

සෞඛ්‍ය නීති රීති අනුව, දුරස්ථ බව රැක ගනිමින් මිහින්තලේ රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන හිමිපාණන්ගේ අවවාද අනුශාසනා පරිදි මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව පැවැත්වීමට ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය හා පාලනාධිකාරිය කටයුතු කිරීම එතෙර - මෙතෙර බොදු ජනතාවගේ නොමඳ සතුටට හේතු වන කරුණකි.

රාජ්‍ය පොසොන් උත්සවය ද මෙවර මිහින්තලා පුදබිමේ දී 'ආරෝග්‍ය පරමා ලාභා' යන තේමාව යටතේ පැවැත් වේ. එම උත්සවයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත්, අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් ප්‍රධාන අමුත්තන් ලෙස එක්වීමට නියමිත ව තිබීම මිහින්තලා පුදබිමට කරන ගෞරවයකි.

පොසොන් පසළොස්වක පොහෝ දිනයත්, මිහින්තලාවත්, ලේක්හවුස් ආයතනයත් 'බුදුසරණ' පුවත්පතත් අතර ඇත්තේ වසර 60කට ආසන්න කාලයක් තිස්සේ පවත්වාගෙන එන නොබිඳිය හැකි නොබිඳිය යුතු ගෞරවණීය සබඳතාවකි.

එය අන් කිසිවක් නොව කුමන බාධක මධ්‍යයේ වුව වසර 58ක් තිස්සේ මිහින්තලා පුදබිම ආලෝකවත් කරමින් මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව නිසාම ඇතිවූ සබඳතාවකි.

ලේක්හවුස් ආලෝක පූජාව ඇරඹෙන්නේ ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන්ගේ අදහසක් අනුව ය.

ලේක්හවුස් ආයතනයේ එවකට කළමනාකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ රංජිත් විජයවර්ධන මහතාගේත් අධ්‍යක්ෂ වරයෙකු වූ ජී. බී. එස්. ගෝමස් මහතාගේත් මෙහෙය වීමෙන් එදා ආලෝක පූජාව ආරම්භ විය. 1963 සිට නොකඩවා පැවැති මෙම ආලෝක පූජාව නිසා මිහින්තලාවට පොසොන් පසළොස්වක දින හා ඒ ආශ්‍රිත දිනවල යන එන බැතිමතුන්ට මහත් සෙතක් සැලැසුණි.

ඈත අතීතයේ බොදු දනන් මිහින්තලා පුද බිම වන්දනා මාන පිණිස පැමිණියේ බොහෝ දුර බැහැර ගෙවාගෙන පාගමනිනි. වෙහෙස නොබැලූ ඔවුහු පෝද සඳ එළියේ ම මිස්සක පව්ව තරණය කළහ. ඒ හුළු අතු, පන්දම් එළියේ ආධාරයෙනි. අගනුවර සිට විශාල විදුලි ජනක යන්ත්‍ර මිහින්තලාවට ගෙන ගොස් පුද බිමේ අඳුර දුරු කරමින් විදුලි ආලෝකය දීමට කටයුතු කිරීම බොදු ජනතාව ලද භාග්‍යක්ම විය.. ඒ සඳහා සම අනුග්‍රහය එදා සිට අද දක්වා ම ලබා දෙන්නේ විදුලිබල මණ්ඩලයයි.

මෙම ආලෝක පූජාව ඇරැඹීමත් සමග මිහින්තලේ ප්‍රදේශයේ පොසොන් මාසය පුරාම බෞද්ධ ආගමික ප්‍රබෝධය හා

> රාජ්‍ය පොසොන් උත්සවය මිහින්තලා පුදබිමේ දී 'ආරෝග්‍ය පරමා ලාභා' යන තේමාව යටතේ පැවැත් වේ. එම උත්සවයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත්, අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් ප්‍රධාන අමුත්තන් ලෙස එක්වීමට නියමිත ව තිබීම මිහින්තලා පුදබිමට කරන ගෞරවයකි.

ආගමික වැඩ සටහන් පැවැත්වීමේ අවස්ථාව තවත් වැඩි විය. ඒ අනුව දන්සල්, ජල පහසුකම් හා සෞඛ්‍ය පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්ද වැඩි විය.

මිහින්තලා පුද බිමට ස්ථිර විදුලි ආලෝකය ලැබෙන්නේ 1978 වසරේ දී ය. පසුව ආලෝක පූජාවේ වියදම් කටයුතු සඳහා මිහින්තලා ආලෝක පූජා භාරය නමින් අරමුදලක් ද බිහි විය.

මේ ආලෝක පූජාවට සමගාමී ව මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පාසල් ගණනාවක සිසු සිසුවියන් සිල් සමාදන් කරවීමේ වැඩසටහන් ද පැවැත්විණි. ඒ අයට අවශ්‍ය සිල් රෙදි ලේක්හවුස් ආයතනයේ මෙහෙයවීමෙන් ලබාදුන් අතර මිහින්තලාව හා පොසොන් පසළොස්වක දිනය පිළිබඳව කථික හා රචනා තරග ද 'බුදුසරණ' පුවත්පත අනුග්‍රහයෙන් ආරම්භ විය.

පසුගිය වසරේ අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා රටේ අනාරක්ෂිත බවක් ඇතිව තිබුණත් ලේක්හවුස් ආයතනය මිහින්තලා ආලෝක පූජාව පැවැත්වීම නිසි අයුරින්ම සිදු කළේ ය. මින් පෙරද එවැනි අවාසනාවන්ත කාල උදාවිය.

1985, 1988, 1986 වසරවල කොටි ත්‍රස්තවාදීන් හා විප්ලවීය කණ්ඩායම්වල සාමාජිකයන් කළ පහරදීම්, බියගැන්වීම් හමුවේ වුව ද ආලෝක පූජාව නොකඩවා පැවැත්වීමට ඒ ඒ කාලවල ලේක්හවුස් පාලනාධිකාරිය කටයුතු කළේ ය.

1985 ආලෝක පූජාව පැවැත්වුණේ අනුරාධපුරයට කොටි ත්‍රස්තවාදීන් පහරදී දින 15 - 20ක් යාමටත් පෙර යුද්ධයේ දරුණුතම උණුසුම මැද බව මතක් කළ යුතුව ඇත.

එකල කොටි ත්‍රස්තවාදීහු අනුරාධපුරය හා මිහින්තලේ අවට ගම්මාන වලට ද ප්‍රහාර එල්ල කළහ. එවන් භයානක යුද වාතාවරණයක් යටතේ මගේ පියාණන් වන හිටපු බුදුසරණ කර්තෘ ප්‍රේමසිරි අබේසිංහ මහතා, එවකට ලේක්හවුස් පිරිස් කළමනාකාරතුමා ප්‍රමුඛ සේවක පිරිසක් දිවි නොතකා මිහින්තලාවට ගොස් මිහින්තලේ ලේක්හවුස් ආලෝක පූජාව දින තුනක්ම සිදු කළේ බුදුදහ ම රටට ම පැතිරූ තැන පොසොන් පසළොස්වක දින අඳුරේ තැබීමට නොහැකි බැවිනි.

1989 වසරේ දී මින්තලා ලේක්හවුස් ආලෝක පූජාවට සමගාමී ව මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍ර දේශයේ පාසල් සඳහා විද්‍යාගාරයක් ඉදිකළේ ය. ඊට පසු වසරවල දන්ත ශල්‍යාගාරයක්, පුස්තකාලයක් ලබා දෙන ලදී. මේ යටතේ මිහින්තලේ මහා විද්‍යාලයට 'බුදුසරණ' පුස්තකාලය හා පරිගණක මධ්‍යස්ථානයක් පිරිනමා ඇත.

කම්මික්කුළම මහා විද්‍යාලයට විද්‍යාගාරයක් ලබා දී ඇති අතර එම ගම්මානය 1990 දී විදුලි ආලෝකයෙන් ආලෝකවත් කිරීමට ද ලේක්හවුස් ආයතනය කටයුතු කළේය. කුරුන්දන්කුලම විදුහලට වඩු කාර්මික පුහුණු වැඩපොළක් ද, මිහින්තලා කතිටු විදුහලට දන්ත ශල්‍යාගාරයක් ද, ලේක්හවුස් මිහින්තලා ආලෝක පූජාවට සමගාමීව ලබා දී ඇත.

ඊට අමතර ව ලේක්හවුස් ආයතනයේ අනුග්‍රහයෙන් පසුගිය වසරවල දී මිහින්තලේ උඩ මළුවට අලංකාර බුදු මැදුරක්, පොහොය ගෙයක් හා දෙළොස්මහේ පහනක් ද ලබා දී තිබේ.

2002 දී පමණ මිහින්තලාවේ පැරැණි විදුලිබල පද්ධතිය ඉවත්කොට භූගත විදුලිබල පද්ධතියක් ඇති කිරීමට මේ ආලෝක පූජාවට සම අනුග්‍රහය දක්වන විදුලිබල මණ්ඩලය පියවර ගත්තේ ය.

මීට පෙර ලේක්හවුස් ආයතනයේ අනුග්‍රහයෙන් මිහින්තලේ පුදබිමෙහි ආලෝක පූජාව සිදු කළේ පොසොන් පසළොස්වක දින, ඊට පෙරදිනය හා ඊට පසු දින පමණි. නමුත් විදුලිබල මණ්ඩලයේ ඉහත පියවර නිසා මිහින්තලයේ පුදබිම දැන් රාත්‍රී 10 තෙක් විදුලි බලයෙන් ආලෝකවත් ව පවතී. එය එහි යන එන සැදැහැවතුන්ට මහඟු සෙතකි.

මේ අනුව වසර 58ක් තිස්සේ නොකඩකොට පවත්වාගෙන ආ මිහින්තලා ලේක්හවුස් ආලෝක පූජාව සෞඛ්‍ය ගැටලු මධ්‍යයේ වුවද සෞඛ්‍ය ආරක්ෂිත ලෙස මෙවරත් පැවැත්වීමට කටයුතු කරන ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුඛ ලේක්හවුස් අධ්‍යක්ෂ මණ්ඩලයටත් ඒ සඳහා කවදත් සම අනුග්‍රහය දක්වන විදුලිබල මණ්ඩලයටත්, ඩයලොග් ආයතනයටත්, ජාතික ලොතරැයි මණ්ඩලයටත් බෞද්ධ ජනතාවගේ පුණ්‍යානුමෝදනා හිමි වනු ඇත.

නිහාල් පී. අබේසිංහ



# මහින්දාගමනයෙන් පෝෂණය වූ හෙළ සංස්කෘතිය

**ක්‍රි.පූ. 236 වැන්නෙහි අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනය බැතිබර හදවතින් ලක්ෂ සංඛ්‍යාත ජනීජනයා විසින් සිහිපත් කරනුයේ උන් වහන්සේගෙන් පෝෂණය ලද දරු දැරියන් වශයෙන් කෘතෝපහාර දැක්වීමේ අත්‍යන්ත ලැදියාවෙනි, සෙනෙහසිනි.**

මහා මහේන්ද්‍ර මහ රහතන් වහන්සේ ඇති කළ සමාජ විපර්යාසය ආධ්‍යාත්මික විප්ලවය, චින්තන ප්‍රබෝධය ආදී සියල්ල සමස්තයක් වශයෙන් හෙළ සංස්කෘතිය යැයි කීවාට කිසිදු වරදක් නොවේ. සංස්කෘතිය සමාජ සංවර්ධනයේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකල්පයකි. මානව පැවැත්මේ දී සිදුවන සෑම ක්‍රියාකාරකමක් ම සංස්කෘතියට සම්බන්ධ වෙයි. දෛනිකව එදිනෙදා භාවිතයට ගනු ලබන උපකරණ, අවි ආයුධ, ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත්, විශ්වාස, පුදපූජා ආදී වූ මේ සියල්ල සංස්කෘතියේ උපාංගයෝ වෙති. සමාජයේ පුද්ගල ජීවන රටාව මෙහෙයවන ආර්ථික චර්යාව, සමාජ චර්යාව, දේශපාලන චර්ය්‍යාව, සහ විනෝද කටයුතු ආදී මේ සියල්ල ම ද සංස්කෘතිය තුළින් ම විද්‍යමාන වෙයි. අනෙක් පැත්තෙන් මිනිසාගේ තෘප්තිය පිණිස, සමාජයේ සාමය පිණිස, පුද්ගලයාගේ ශික්ෂණය පිණිස, මිනිසාට හිතකර පරිසරයක් පවත්වා ගෙන යාම පිණිස අවශ්‍ය කෙරෙන ක්‍රියාදාමය සංස්කෘතිය වශයෙන් ව්‍යාඛ්‍යානය කළ ද වරදෙක් නොවේ.

එදා මිහිඳු මාහිමියන් හට දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ.247-207) මුණ ගැසුණේ ක්‍රීඩා පිණිස සතුන් දඩයම් කරමින් සිටියදී ය. මිහිඳු මාහිමි දුටු සැණින් බිම වැටුණු දුනු ඊතල නැවතත් සත්ත්ව හිංසනය සඳහා එසවුණු බවක් සඳහන් නොවේ. මිහිඳු මාහිමියන් බුදුදහම හඳුන්වා දී ඒ අනුව දෛනික ජීවිතය සකස් කර ගැනීමට ජනතාවට උපදෙස් දුන්හ. භික්ෂූන් වහන්සේලා ධර්ම දේශනා සඳහා මාතෘකා තෝරා ගැනීමේ දී ගිහියන්ගේ සිත් ඇදී යන මාතෘකා කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරිණි. දක්ඛිණා විභඞ්ග සූත්‍රය එවැනි ජනප්‍රිය දේශනයක් විය. බුදුරදුන්ගේ පටන් සිව්පා සතුන් දක්වා නා නා තරාතිරමේ පුද්ගලයන් දාහතර දෙනෙකුට දන්දීමෙන් ඒ ඒ පමණට ආනිසංස ලැබෙන අයුරු එහි පැහැදිලි කර ඇත. තම තමන්ගේ වත්කමේ හැටියට පරලොව සැපත සඳහා පින් කර ගන්නට ගිහි ජනතාව යුහුසුළු වූහ.


දේවදූත සූත්‍රය ද එවැනිම තවත් ජනප්‍රිය දේශනාවකි. අපායේ දී පව්කාරයින්ට විඳින්නට සිදුවන වධහිංසා ඇස් ඉදිරියේ මවා දැක්වීමක් එයින් සිදු කෙරිණ. පවිත් වැළකී යහපත් ජීවිතයක් ගත කරමින් සමාජය කෙරෙහි තමන් අතින් ඉටුවිය යුතු යුතුකම් වටහා ගන්නට නොහැකිව ක්‍රියාකරන අනුවණ නපුරු මිනිසුන් පවට බිය ගන්වා ප්‍රාණඝාතාදී අකුසල කර්මවලින් වැළැක්වීමට මේ සූත්‍ර දේශනා බොහෝ සෙයින් ප්‍රයෝජනවත් විය. එසේම ලෝකයට සමාජයට යම්කිසි සෙතක් යහපතක් සැළැස්වීමට මිනිසුන් උනන්දු කරන දේශනා ද පැවැත්වූහ. පරලෝ සැපත පිණිස නොයෙක් පිළිවෙළේ පින් රැස්කර ගැනීම රජුගේ පටන් දුගී ගොවියා දක්වා හැම ගිහියෙකුගේම චේතනාව බවට පත්කළහ. ලෝක සත්වයා පතන ධනය, ආරෝග්‍ය, රූප සම්පත්තිය, දීර්ඝායුෂය, ඥානය, බලය, කුලය යනාදිය ලැබීම හෝ නොලැබීම තම තමා විසින් කරනු ලබන කුසලාකුසල ක්‍රියාවල ප්‍රතිඵල මතම සිදුවනු ලබන්නක් යන මතය සමාජ ගතවීමෙන් මුළුමහත් සමාජය ම අකුසලයෙන් දුරුව කුසලයට ලංව ජීවිත ගොඩනගා ගැනීමේ උත්සාහයක යෙදුණේ මෙම දේශනාවල ප්‍රතිඵල වශයෙනි.

දහඩිය මහන්සියෙන් හරිහම්බ කර ගත් දෙයින් කරන පින්කමෙන් ලැබෙන ආනිසංස වැඩි යයි පිළිගත්හ. මෙම අදහස නිසා මහසිළු මහතිස් රජතුමා වරක් වෙස්වලා ගෙන කෙතක වැඩකොට ලත් සහලින් දන් දී ඇත. තවත් වරෙක උක් කෙතක වැඩ කොට ලත් උක් සකුරු මහ සඟනට පූජා කෙළේය.

මෙලෙස ගිහි ජනතාව උස් පහත් භේදයක් නොමැතිව "පුණ්‍ය" සංචිත එක්රැස් කිරීමට උත්සාහවත්ව ක්‍රියා කෙළේය.

මෙම පදනම මත සැකසුණු ජීවිත ඉතා චාම් සැහැල්ලු එකක් විය. ගෘහ ජීවිතය සම්පූර්ණයෙන්ම ඉතා නිරවුල් හැල හැප්පීම්වලින් තොරව සෙමෙන් සෙමෙන් ඉදිරියට ගලා යන්නක් විය. මල නොතලා රොන් ගෙන මී බඳින්නා වූ බඹරෙකු මෙන් අනුන් නොතලා නොපෙළා දැහැමෙන් වීර්ය්‍ය වඩන්නාට වේ තුඹසක් බැඳෙන්නාක් මෙන් ධනය රැස්විය. මහජනයා නොපෙළා ධාර්මික ධනය ඉපයීමකි එය.

එලෙස නිවැරැදිව හරි හම්බ කළ ධනය නිවැරදි ව පාවිච්චි කළහ. අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා යන ගුණත්‍රය අනුව ජීවිතය ගත කිරීමට හුරු පුරුදු වූහ. හැම විටම මේ ගුණයන්වලට තම බාල පරපුර ද හුරු පුරුදු කළහ. බුදුරජාණන් වහන්සේ දෙමාපියන් හැඳින් වූ පූර්වාචාර්ය යන නාමයට අන්වර්ථවත් වන සේ ක්‍රියා කළහ.



මහාචාර්ය
**ඉත්තදෙමලියේ ඉන්දසර නා හිමි**

එබැවින් පරපුරෙන් පරපුරට හෙළදිව බෞද්ධයෝ ශ්‍රේෂ්ඨ සංස්කෘතියකට උරුමකම් කියන්නෝ බවට පත්වූහ.

දෛනික ජීවිතයේ ඇවතුම් පැවැතුම්වල කැපී පෙනෙන වෙනසක් බෞද්ධ ගෙදරක දැකිය හැකි ය. බෞද්ධ ගෙදරක කිසිදු දරුවෙකු කෑම ගන්නා විට තලු ගැසීමක් කරන්නේ නැත. කෑම අත්ලෙහි ගෑවෙන්නේ නැත. කෑම කන ගමන් ඇඟිලිවල ගැවුණු කෑම දිවෙන් ලෙව කා කන්නේ නැත. කන තැන වටපිට බත්හුළු ඉහිරවන්නේ නැත. බත් පිඟාන එකවර හනා ගොඩ ගසා ගන්නේ නැත. බත් පිඟානෙහි හැම තැනින්ම හනා කන්නේ නැත.

මහින්දාගමනයෙන් පසු බුදු දහමෙන් ලද ඒ හුරුපුරුදු සිහල සිරිත් ලෙස පවත්වා ගෙන එති.

ආගන්තුක ස්ථානයකට ගියවිට විශේෂ සැලකිල්ලකින් එහි දී හැසිරීමට වගබලා ගනිති. පාවහන් සහිත ව ගෙදරකට කිසිදු අවස්ථාවක ඇතුළු නොවේ. ඇතුළුවීමට පළමුව පාවහන් ගැලවීම බෞද්ධයාගේ සිරිතකි. මඟතොට ගමන් කිරීමේ දී කොක් හඬ ලා සිනාසීම, කතා කිරීම බෞද්ධයාගේ සිරිත නොවේ. අනුන්ට හිරිහැරයක් නොවන පරිදි යාම ඊම පමණක් නොව කතා බහ කිරීම ද ඔවුන්ගේ සිරිතයි.

එසේම ගෙදරදී හෝ වෙනත් පිට තැනක දී තුනටියේ දෙඅත් ගසා ගෙන සිටීම හෝ හිස දෙඅත් බැඳ සිටීම මහ මූසල කමක් ලෙස ගැමියෝ හඳුන්වති. එය නොකළයුතු දෙයක් ලෙස බුදුදහමෙහි ඉගැන්වෙයි.

හෙළබොදුනුවන්ගේ ඇඳුම ද ඉතා චාම් ය. ඔහුගේ ඇඳුමෙහි පාට සුදුපාට ය. හෙළ බොදුනුවාට නිල ඇඳුමක් ඇත. එය කලාපීය වශයෙන් සහ ආගමික වශයෙන් ගැළපෙන පරිදි සකස් වූවකි. ඝර්ම කලාපීය රටක ජීවත්වෙන අප ඇඳුම් ඇඳිය යුත්තේ ලොම් ඇඳුම් මෙන් ඝන, ඇඟට හිරවෙන ඇඳුම් නොවේ. උෂ්ණයට ගැළපෙන සැහැල්ලු ඇඳුමක් විය යුතු ය. එසේම අනවශ්‍ය ආකාරයට ශරීරය විවරවන ලෙස ද නොවේ. මේ බව තවත් අපට පැහැදිලි වන්නේ අපේ පැරැණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් වන කාව්‍යශේඛරය දැක්වෙන කවකිනි.

පෙකණිය නොදක්වා
සළු ඇඳ බොලට දක්වා
නොපව තන දක්වා
සිනා නොමසෙන් දසන් දක්වා"

යනුවෙන් නාභිය නොපෙනෙන පරිදිද, කෙණ්ඩය වැසී යන පරිදි සහ පියයුරු අංශයක් නොපෙනෙන පරිදි සළු ඇඳිය යුතු ය. දත් පෙනෙන පරිදි මහ හාස්‍යය නොකරව යනුවෙන් පතිකුලයට යන තම දියණියට මහ බමුණු අවවාද දී ඇත.

මෙලෙස ඇඳුම් ඇඳීමේ ආභාසය හෙළ බොදුනුවනට ලැබී ඇත්තේ බුදුදහමේ ඉගැන්වෙන සේඛියා ධර්මවලින් යයි කිව හැකි ය. ජාතික ඇඳුම නමින් හෙවත් ආර්ය සිංහල ඇඳුම නමින් අද හෙළයනට උරුමව ඇති නිල ඇඳුම සැකසී ඇත්තේ ද මෙම බලපෑම නිසා යයි කිව හැකි ය. පිරිමින් අඳින 'නැෂනල් එක' යයි හඳුන්වන උඩුකය වසන ඇඳුම අත්දිගට මැණික් කටුව ද වැසෙන සේ සකස් වූවකි. යටි කය වසන ඇඳුම ඇස්වටය ද වැසෙන සේ සකස් වූවකි. භික්ෂුවක සිවුරෙන් වසන ප්‍රමාණය ම ගිහියා ද ඇඳුමෙන් ආවරණය කරයි.

හෙළ කාන්තාවට ද නියම කර ඇත්තේ ඔසරිය නමින් හඳුන්වන චාම් ඇඳුමකි. ඇය ද එය ඇඳීමෙන් සංවර බවක් ඇතිකර ගනී.

කෙළ ගැසීමේ දී වුව සංවර බවකින් යුතුව සිදු කරන බව දැකිය හැකි ය. භාරතය හා සංසන්දනාත්මක ව බලන විට මෙම කරුණුවලදී ලාංකේය බෞද්ධයාගේ අතිශය සංවර බවක් දැකිය හැකි ය. එය බුදු දහමෙන් මහින්දාගමනය සමග ඇති වූ සංස්කෘතික පෝෂණයේ ප්‍රතිඵලයක් යයි කිව හැකි ය.

සංස්කෘතිය ගතික ස්වභාවයෙන් යුතු ය. එය නොකඩවා වෙනස්වෙමින් පවතී. වෙනස් විය යුත්තේ සමාජ ප්‍රගමනයට සහ සුභ සිද්ධියට හානිදායී ආකාරයෙන් නොවේ. පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරන පරම්පරාගත නිපදවීමක් ලෙස ද සැලකෙන සංස්කෘතිය ලංකාවේ ඇති වී ඇති වෙනස්කම් දෙස බලන විට පැරැණි හෙළ සංස්කෘතියේ වටිනාකම කියා නිම කළ නොහැකි ය.

# අභියෝග හමුවේ ජීවිතය ජය ගැනීමට...





වාද්දුව ශ්‍රී ලංකාරාමාධිපති
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
නිකාය සංවර්ධන සභාවේ
නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශාස්ත්‍රපති

**වාද්දුවේ ධම්මවංස හිමි**

**අදින් වසර 327 කට පෙර අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කළ සේක. උන්වහන්සේ ලංකාවට වඩින සමයේ සිටි හෙළයෝ කෘෂි කාර්මික ජීවිතයක් ගත කළ පිරිසකි.**

මිහිඳු මහරහතන් වහන්සේ වැඩම වීමට පෙර සිටම වැව් තැනීම ආදී තාක්ෂණික දැනුමක් තිබුණත් ඔවුනට අවශ්‍ය ආධ්‍යාත්මික දර්ශනයක් නො තිබුණි. පණ්ඩුකාභය සමය පිළිබඳ මහාවංසයේ දැක්වෙන විස්තරයෙන් ඔවුන්ගේ ආගම යක්ෂ, දේව විශ්වාස හා ගස් ,ගල් ඇදහීම වූ බව පැහැදිලි වෙයි.

මහාවංසය සහ සමන්තපාසාදිකාව අනුව මේ ද්වීපය කකුසඳ බුදුරජාණන් වහන්සේගේ කාලයේ 'ඕජදීප' නම්විය. කෝනාගම බුදුරජාණන් වහන්සේගේ කාලයේදී 'වරදීප' නම් විය. කස්සප බුදුන්ගේ කාලයේ 'මණ්ඩදීප' නම් විය. ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයේ 'සිංහලදීප' නම් විය. මහින්දාගමනය කාලය වන විට සිංහල ද්වීප, ලංකාදීප, සහ තම්බපණ්ණි යන නම් ව්‍යවහාර විය.

මහින්දාගමනය වන කාලයේ මැනවින් අකුරු භාවිතය පැවති අතර විදේශවලට රාජ්‍යතන්ත්‍රික ලිපි ලිවීමත්, රාජ්‍ය දූතයන් විදේශ රටවලට යැමත් සිදුවිය.අකුරු භාවිතයක් මතු නොව වචන උච්චාරණයක් නැති කාලයේත් මනුෂ්‍යයෝ ලංකාභූමියේ සිටි අතර ඔවුන් අදහස් ප්‍රකාශ කිරීමට නැගූ හඬ තුළින් ලංකාවේ භාෂාව සකස් විය. එම භාෂාව සිංහලයි. රට සිංහලේයි. . පුරා විද්‍යා මහාචාර්ය රාජ් සෝමදේව මැතිතුමාගේ පැහැදිලි කිරීම් තුළින් මේ කරුණු ශාස්ත්‍රීයව ඉදිරිපත් වේ. යටත් පිරිසෙන් අවුරුදු එක් ලක්ෂ විසි දහසක පමණ මනුෂ්‍ය ඉතිහාසයක් ශ්‍රී ලංකාවට පවතී. ඕස්ට්‍රේලියව ,ඉන්දියාව තරම්ම ස්වාධීන මානව ඉතිහාසයක් අපට පවතී.

මේ දීර්ඝ කාලය තුළ ඇතිවුණු අභියෝගවලට ලෝකයේ පොදු මිනිසා මුහුණ දුන්නා සේ ලාංකිකයෝ ද මුහුණ දුන්හ. ඔවුන්ට ද ඉපැරණි ලොව අනෙක් මනුෂ්‍යයන්ට මෙන් සමාන ආගමික චාරිත්‍ර පැවතුණි. ස්වාභාව ධර්මයේ අපැහැදිලි අවස්ථා දෙවිවරු ලෙසත්, ඉන් බියට පත් වන අවස්ථා දේව කෝප ලෙසත් ,බලවත් යක්ෂයින් ආරක්ෂකයන් ලෙසත් ,මහා ගස් දේවතාවුන් වසන ස්ථාන ලෙසත් සැලකීම ප්‍රාග් ඓතිහාසික යුගයේ සියලු රටවල පැවති විශ්වාසයන් ය.

ලාංකිකයෝ ද මෙම චාරිත්‍ර පිළිපැද්දහ. ලොව පාලනය කරන දේව මණ්ඩල ගැනත් පසුව නිර්මාතෘ දෙවියකු හෝ මහාත්මයක් හෝ මහා පුරුෂයකු හෝ ඇතැයි මිනිස්සු ක්‍රමයෙන් පිළිගත්හ. එබැවින් ආගම් බිහිවිය. බුදුරජාණන් වහන්සේ මිනිසුන් ආගම් සරණ යන්නේ බියෙන් තැතිගත් නිසා බව ප්‍රකාශ කළහ. ආගමේ නිර්මාණය ගැන නූතන මානව විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයන් ප්‍රකාශ කරන මේ කරුණ ඊට බොහෝ කලකට පෙර බුදු හිමියෝ වදාළහ.

**'බහුං වෙ සරණං යන්ති**
**පබ්බතානි වනානි ච**
**ආරාම රුක්ඛ චේත්‍යානි**
**මනුස්සා භය තජ්ජිතා'**

බියෙන් තැති ගස් මිනිස්සු පර්වත,වන,ආරාම(කැලෑ) ගස් සරණ යන බවත් ඒ සරණය උතුම් නොවන බවත් උන්වහන්සේගේ දේශනයයි.

මෙම ආගමට දැනුම ලබාගැනීම, හැදෑරීම, විමසීම, තර්කනය, විචාරය අයිති නොවේ. නිසි ලෙස චාරිත්‍ර කළ යුතු ය. කට වරද්දා නොගත යුතු ය. ගත වරද්දා නොගත යුතු ය. ඒ නිසා මෙම ආගමේ අධිකාරිත්වය දරන පූජකවරු බිහිවිය. මිනිසාගේ ඉපදීමේ සිට මරණය දක්වාත් මරණයෙන් පසු පවත්වන යාගහෝම, බලි බිලි ආදි චාරිත්‍රත් ඇති විය. ඒ සියල්ල දන්නෝ පූජකයෝය. මේ පරිසරය ලංකාවේ ද පැවතුණි. පණ්ඩුකාභය සමයේ ලංකාවේ පැවතියේ මෙම ආගමික පරිසරයයි. මහාවංසයේ දස වන පරිච්ඡේදයේ මෙම විස්තර දැක්වේ. යම් අභියෝගයක් ඇති වුවහොත් පූජකයන්ගේ මාර්ගයෙන් දෙවිවරුන්ට, යකුන්ට, ගස්ගල් වලට, යාඥකිරීමත් බලි බිලි දීමත් කළයුතු විය. මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කළේ මෙම සමාජ පරිසරය තුළයි. ඉන්දියාවේ පැවති ආගම් සියල්ලම වාගේ ලංකාවට බලපා තිබුණි, මුහුදු ගමන් හා ඊට අදාළ තාක්ෂණය ලාංකිකයන්ට මේ වන විට තිබුණු අතර වෙළඳුන් ඉන්දියවෙන් ලංකාවට පැමිණියහ. සංස්කෘතික වාහකයන් වෙළඳුන් බැවින් එකල ඉන්දියාවේ පැවති බ්‍රාහ්මණ ආගම පමණක් නොව ශ්‍රමණ සම්ප්‍රදා ද ලංකාවට පැමිණ තිබුණි.

මිහිඳු මහ රහතන් වහන්සේට ලංකාවේදී මුණ ගැසුනේ තීක්ෂණ නුවණක් ඇති,බුදු දහම වැනි ගැඹුරු දහමක් වටහා ගත හැකි රජ කෙනෙකි. උන්වහන්සේ මුලින්ම දේශනා කළ චූල්ලහත්ථි පදෝපම සූත්‍රය සහ එහි සංකල්ප වටහා ගැනීමට ප්‍රමාණවත් දැනුමක් දෙවානම් පියතිස්ස රජුට තිබුණි. සාමාන්‍ය ගිහි පුද්ගලයෙක් ආර්ය ස්වභාවයට පත්ව ආර්ය ශීලය, ආර්ය ඉන්ද්‍රිය සංවරය, ආර්ය සමාධිය, වඩමින් නිවන් මග ගමන් කරන ආකාරය එහි පැහැදිලි කෙරෙයි. බුදු වදන සියලු ආගම් හා දර්ශන වලට හත්ථි පදෝපම වන්නේ කෙසේ දැයි එහි පැහැදැලි කෙරෙයි. මිනිසාට බලපාන ගැටලුවලට යාග හෝම හෝ බලි බිලි පැවැත්වීම හෝ බලවතුන් පාමුල වැඳ වැටී යාඥ කිරීම හෝ නොවන ස්ව උත්සාහයෙන් මුහුණ දීමට ආර්ය ශීලය පදනම් කර ගත් උට්ඨාන වීර්යය ඇතිකරගත යුතු බව මේ සූත්‍රයේ නිර්දේශ වෙයි. යහපත් ඉන්ද්‍රිය සංවරය ඇති කරගත යුතු අතර ඉන් ප්‍රධාන මනෝඉන්ද්‍රිය උට්ඨාන වීර්යයෙන් සංවර කරගත යුතු ය, මෙලෙස වඩන නුවණ ප්‍රඥාවට මග පාදයි.

බුදුරජාණන් වහන්සේ ප්‍රතිපදා දෙකක් වදාළහ. එකක් අනගාරික ප්‍රතිපදාවයි. අනෙක අගාරික ප්‍රතිපදාවයි. ලෝවැසි ප්‍රජාවගෙන් වැඩිම ප්‍රතිශතය අගාරිකයි. පැවිද්දන් නොව ගිහියෝයි. අනගාරික වන්නෝ දුලබයි. එහෙත් එය උසස් චර්යාව වෙයි. ගිහි පැවිදි දෙපක්ෂයටම තම ජීවන පැවැත්ම අභියෝගයකි. මෙයින් ගිහි ජීවිතය සංකීර්ණ ය. බැඳීම් සහිතය. ව්‍යාකූල ය. එම ගිහියන්ට ආර්ථික අභියෝග රාශියකි. මේ අභියෝගවලට මුහුණ දෙන ආකාරය බුදුරජාණන් වහන්සේ දේශනා කළ අවස්ථාවක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ පැහැදිලි කෙරෙයි.කාම භොගී ගිහියකු වන දීඝජානු කෝලිය නම් තැනැත්තා තමන්ට හා තම සමාජයට බලපාන අභියෝගයක් විසඳීමට ක්‍රම වේදය බුදුරජාණන් වහන්සේගෙන් විමසී ය. 'ස්වාමිනි , අපි කාම හෝගි ගිහියෝ වෙමු . ගිහි සැප භුක්ති විඳින්නෝ වෙමු. අඹු දරු සම්බාධ සහිත ව වාසය කරමු. කසී සළු දරමු. සුවඳ සඳුන් පරිභෝග කරමු. රන් රිදී මසු කහවනු ඉවසමු. අපට මෙලොව සහ පරලොව සැප පිණිස දහමක් දේශනා කරනු මැනවි.'

ගිහියෙක් මෙලොව පරලොව හිත සුව ලබා ගන්නේ කෙසේ ද යන්න මෙහි අභියෝගයයි. මෙලොව ජීවිතයේ අභියෝග ජයග්‍රහණයට සම්පදා සතරක් උන් වහන්සේ වදාළහ. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා,කල්‍යාණ මිත්තතා හා සමජීවිකතා යන සතරයි. තමන් කරණ රැකියාව හෝ නිෂ්පාදන කාර්යය ධාර්මික විය යුතු අතර එහි දක්ෂව, අනලස් ව, සුදුසු කාල හා පරිසරය දැන, උපාය ශක්තියෙන් හා විමර්ශන බුද්ධියෙන් කටයුතු කිරීම හා කරවීම උට්ඨාන සම්ප්‍රදාවයි. මෙසේ උට්ඨාන වීර්යයෙන්, බාහු බලයෙන්, දහඩිය වගුරුවා, උපයන ලද දැහැමි ධනය රජුන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන්, සැඩ පහරින් ,අප්‍රිය ඥාතීන්ගෙන් රැක ගැනීම ආරක්ඛ සම්පදාවයි. විශේෂ යෙන්ම උපයන ධනය විනාස වන්නේ දුරාචාරයෙන් සහ පාපමිත්‍රයන් නිසා යි .එබැවින් ස්ත්‍රී ධූර්ත, සුරා ධූර්ත, අක්ෂ ධූර්ත නොවිය යුතුයි, මේ ඉගැන්වීම ඉහත සූත්‍රයේ පුළුල්ව විස්තර වෙයි. පුද්ගලික ජීවිතයට පමණක් නොව රාජ්‍යයක ආර්ථික නිෂ්පාදනයට හා සංරක්ෂතාවට මේ ඉගැන්විම මැනවින් අදාළ වෙයි.

**( මෙම ලිපියේ ඉතිරි කොටස එළඹෙන අව අටවක පෝද පත්‍රයේ පළ වේ)**

# මහින්දාගමනයෙන් පෝෂණය වූ හෙළ සාහිත්‍යය





බළංගොඩ ශ්‍රී ධර්මානන්ද
පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නා හිමි**

**මහින්දගමනය ලාංකේය ඉතිහාසයෙහි සුවිශේෂී සංධිස්ථානයකි. ලාංකික සමාජය තුළ ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික, සමාජීය හා ආර්ථික වශයෙන් සිදු වූ වෙනස අවිවාදාත්මක ය. මහින්දගමනය ඉහත සඳහන් අංශවලට පමණක් නොව කලා ශිල්ප, චිත්‍ර මූර්ති හා කැටයම් ආදී සෑම අංශයක් කෙරෙහි පුළුල් බලපෑමක් කර ඇත.**

ගසට පොත්තත්, පොත්තට ගසත් මෙන් සිංහල ජාතිය හා බුදු දහම එකට වෙළාගත් අයුරු ඉතිහාසය තුළින් දැක ගන්නට පුළුවන. මිහිඳු හිමියෝ ලාංකික ජනතාවගේ ඇවතුම්, පැවතුම් හා සිත් සතන් නිවැරැදිව හඳුනාගෙන ධර්ම දේශනා කළ ශ්‍රේෂ්ඨ උත්තමයෙකි. උන්වහන්සේ දේශනා කළ ධර්මය, අනුගමනය කිරීම ශ්‍රී ලාංකිකයින්ට දුෂ්කර කාර්යයක් නොවී ය. ගැඹුරු දර්ශනයක් ඉදිරිපත් කිරීමට වඩා උන්වහන්සේගේ අවධානය යොමු වූයේ මිනිසාගේ දෛනික ජීවිතය හැඩගැස්වීමටයි. අකුසල් පැත්ත ඉවත් කර කුසල් පැත්තට යොමු කරලීමටයි.

බුදු දහම හඳුන්වාදීමත් සමඟ මේ රටේ ජනතාව නව ජීවයක්, ප්‍රාණයක් ලැබූහ. බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරන්නට පටන් ගත්හ. මිනිසුන් එකමුතුව ගමේ පන්සලක් හා බණ මඩුවක් සාදාගත්හ. බණ මඩුව ගමේ පාසල බවට පත්විය. භික්ෂූන් වහන්සේ ගුරුවරයා විය. මේ නිසා ගමේ නායකත්වය භික්ෂූන් වහන්සේට ලැබුණු අතර ගමේ ආරවුල් විසඳුවේ ද උන්වහන්සේ ම ය. ගමේ ආරක්ෂක මුරදේවතාවා බවට පත්වූයේ ද භික්ෂූන් වහන්සේ ය. පොත පත මෙන් ම අනිකුත් කලා ශිල්ප ඉගෙන ගත්තේ ද පන්සල කේන්ද්‍ර කරගෙන ය. පන්සල කේන්ද්‍ර කරගනිමින් සිංහල භාෂාවත්, සිංහල සාහිත්‍යයත් ලේඛන කලාවත් දියුණුවට පත් වූ අයුරු ලංකා ඉතිහාසයෙන් අපට පෙන්නුම් කරයි.

සිංහල ජාතියේ ගුරුවරයා වූ භික්ෂුව අධ්‍යාපන ක්‍රියාවලියට අවශ්‍යය පොත පත ලිවීමට ද ක්‍රියා කර ඇත. මේ සියලු පොතපත රචනා කළේ බුදු දහම පදනම් කරගෙන ය. සමහර ලේඛකයින් ගේ උත්සාහය තිබුණේ බුදුගුණවලින් එකක් තෝරාගෙන රසවත් කතාන්දරයක් වශයෙන් එය විස්තර කිරීමයි.

ගුරුළුගෝමී පඬිතුමා "අමාවතුර" ලියා ඇත්තේ බුදුරදුන්ගේ "පුරිස ධම්ම සාරථී" ගුණය පෙන්නුම් කිරීමටයි. මයුරපාද හිමියන් විසින් "අරහං" යන බුදුගුණය පෙන්නුම් කෙරමින් පූජාවලිය රචනා කර ඇත. දඹදෙනි යුගයේ විසූ විද්‍යා චක්‍රවර්තී පඬිවරයා විසින් බුදුගුණ වර්ණනා කරමින් "බුත්සරණ" ලියා ඇත. "දහම් සරණ" හා "සඟ සරණ" යන කෘතීන් ද එතුමා විසින් ලියන ලද ඒවා යැයි ද සමහරු ප්‍රකාශ කරති. කියවන්නා තුළ සදාචාරවත් ජීවිතයක් ගොඩනැංවීමත්, අකුසල ක්‍රියාවලින් මුදවා කුසලයට යොමු කරලීමත් මුල් කරගෙන මෙවැනි බෞද්ධ සාහිත්‍ය කෘති නිර්මාණය කර ඇත.

බෞද්ධ කතා සාහිත්‍යය තුළ ඉතාම ජනප්‍රිය කෘතියක් ලෙස කුරුණෑගල අවධියේ රචිත ජාතක පොත්වහන්සේ හඳුන්වා දෙන්නට පුළුවන. දඹදෙනි යුගයේ දී ධර්මසේන හිමියන් විසින් රචිත "සද්ධර්ම රත්නාවලියත්", ධර්මකීර්ති හිමියන් විසින් රචිත "සද්ධර්මාලංකාරයත්" ධර්මකීර්ති හිමියන්ගේ ශිෂ්‍යයකු විසින් ලියන ලද "සද්ධර්මරත්නාකරයත්" විවිධ බෞද්ධ කතා වස්තු එකතුකොට සකස් කරන ලද බෞද්ධයන් අතර ජනප්‍රිය ග්‍රන්ථයන් ලෙස දක්වන්නට පුළුවන.

අපේ වන්දනාවට හා ගෞරවයට පාත්‍ර වූ ත්‍රිවිධ චෛත්‍යයන් මුල්කරගෙන ඒවායේ ඇති ඓතිහාසික තොරතුරු කියාපාමින් රචනා කර ඇති සාහිත්‍ය ග්‍රන්ථ ද පැරැණි සාහිත්‍ය තුළින් දැකගත හැකි ය. රුවන් වැලි සෑයේ ඉතිහාසය පෙන්නුම් කරන "ථූපවංශය", දළදා සමිඳුන්ගේ ඉතිහාසය පෙන්නුම් කරන "දළදා සිරිත", බුදුරදුන්ගේ ලලාට ධාතුව විස්තර කරමින් රචනා කර ඇති "ධාතුවංශය", ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ඉතිහාස කතාව කියා පාන "බෝධිවංශය" දුගියෙකුට හිස දන් දුන් දැහැමි සිරිසඟබෝ කතා පුවත අලළා රචිත "එළු අත්තනගලු" වැනි ඓතිහාසික තොරතුරු හෙළි කරන සාහිත්‍ය කෘතීන් අප චින්තනය නිවැරැදි මඟට යොමු කරලීමට මහඟු පිටිවහල ක් වී ඇත.

අපේ පැරැණි පද්‍ය සාහිත්‍ය දෙස බලන විට ඒවා ජාතක කතා මුල්කරගෙන සම්පාදනය කර ඇති බව පැහැදිලි ය. හිස නර කෙසක් දැක රජකම අතහැර තපසට ගිය මඛාදේව රජතුමාගේ කතාවේ ඇතුළත් "මුවදෙව්දාවත" අපට දැනට ඇති පැරැණිම ගී කාව්‍යයකි. දෙවැනි පැරකුම්බා රජු විසින් රචිත "කව් සිළුමිණ", වෑත්තෑවේ හිමියන් විසින් රචනා කළ "ගුත්තිල කාව්‍යය", තොටගොමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද "කාව්‍යසේඛරය" වැනි වටිනා ජනප්‍රිය කාව්‍ය ග්‍රන්ථවලට මූල බීජයන් ලෙස ගෙන ඇත්තේ ජාතක කතාවන් ය. විශේෂයෙන් ජාතක පොත් වහන්සේ පූජාවලිය, සද්ධර්මරත්නාවලිය වැනි කෘති අපේ බෞද්ධ ජනතාව අතර නිතර භාවිත වූ ධර්ම ග්‍රන්ථයන් ය. භික්ෂූන් වහන්සේ තම ධර්ම දේශනා සඳහා මෙම ග්‍රන්ථ උපයෝගී කර ගත්හ. පොහොය දිනවල සිල්සමාදන් වූ උපාසක උපාසිකාවෝ මෙම දහම් පොත් හඬනගා කියවමින් තම ශ්‍රද්ධාව වර්ධනය කර ගත්හ.

ජාතක පොතෙහි ජාතක කථා පන්සිය හතළිස් හතක් ඇතුළත් ය. සෑම ජාතක කතාවකින් ම කිසියම් උපදෙසක් අපට ලබා දී ඇත. මතු දවසක බුදුවෙන බෝසත් චරිතයන් මෙම දේශනා තුළින් විදහා දක්වා ඇත. බෝසතාණන් වහන්සේ නිතරම හැසිරෙන්නේ අන්‍යයන්ට ආදර්ශයක් ගත හැකි වන පරිද්දෙනි. පාරමිතා පූරන ආකාරය, දස අකුසලයන් හි දෙස් පෙන්නුම් කිරීම. මෙලොවත් පරලොවත් දියුණුවට හේතුවන උපදේශයන් වැනි කරුණු ජාතක පොත කියවන පාඨක ලෝකයාට අවබෝධ වනු ඇත. සෑම ජාතක කතාවකින් ම සුවිශේෂී උපදේශයක් ලැබෙන අතර, එක් කතාවක් තුළ විවිධ අවස්ථාවන්ගෙන් අපට ලබාගත හැකි අතිරේක පාඩම් ද බොහෝ ය.

"ඉල්ලීස" ජාතක කතාව තුළින් පාඨකයාට මුලින් ම ලබාදෙන උපදේශය දෙස බලමු.

එහි අසූ කෙළක් පමණ ධන සම්පත් ඇති "මච්ඡරීයකෝසිය" නම් සිටු පුත්‍රයෙක් වසන්නේ ය. ඒ සිටු පුත්‍ර තෙම "තණ කෙන්දක් තෙල් ගා එයින් තෙල් බිංදුවකුත් අනුන්ට නොදෙන්නේ ය. තෙමේත් අනුභව නොකරන්නේ ය." මෙසේ ඔවුන්ගේ වස්තු සමූහය පුත්‍රධාරාදීන්ටවත්, ශ්‍රමණ, බ්‍රහ්මණ ආදීන්ටවත් ප්‍රයෝජනයට නොපැමිණෙනේ ය. රාක්ෂස අධිගෘහිත වූ පුෂ්කරණියක් මෙන් අපරිභෝග ව සිටින්නේ ය. මෙවැනි මූලික වදන් වැලකින් ඉල්ලීස ජාතකයේ අරමුණ පෙන්නුම් කර ඇත. සමාජයේ දක්වෙන විවිධ චරිත ස්වභාවයන් ජාතක කතා අපට පෙන්නුම් කර ඇත.

බෝධිසත්වයන් වහන්සේ සෑම අවස්ථාවලම මනුෂ්‍යයෙකු වූ බව නොපෙනේ. තිරිසන් සත්වයකු ලෙස උපත ලැබූව ද බෝසතාණන් තම ජාති වර්ගයා රැක ගනිමින්, ගුණධර්ම ආරක්ෂා කර ගනිමින් , බුද්ධිමත් ව ක්‍රියා කළ ආකාරය දැක ගන්නට පුළුවනි. ජාතක පොතේ එන කතාන්දර ලියා ඇත්තේ බණ මඟ අනුගමනය කරමිනි. සිංහල සංස්කෘතිය තුළ දක්නට ඇති අව්‍යාජ බව, සරල බව, ලජ්ජාව හා භය එමෙන් ම සංයත පැවැත්මත් ජාතක පොත අපට ප්‍රදර්ශනය කර ඇත.

ජාතක කතාකරු මිනිස් සිත මතුපිටින් පමණක් නොව එය විනිවිද දුටු අයෙකි. මිනිසා රාගයට, ද්වේෂයට, මෝහයට යට වී නොයෙකුත් අපරාධ හා දූෂණ ක්‍රියාවන් සිදු කරන බව ජාතක කතාව අපට පෙන්නුම් කරයි. මහින්ද ගමනයෙන් අපට ලබාදුන් සදාචාරාත්මක උරුමයන් ආරක්ෂා කර ගනිමින් සමගියෙන් සමාදනයෙන් සහජීවනයෙන් , යුත් ජීවිත ගොඩනගා ගැනීමට ජාතක කතා පොත් වහන්සේ අපවෙත මොනතරම් මහඟු මෙහෙයක් ඉටුකර ඇත් ද?

ගෞතම බුදුරජාණන් වහන්සේ දීපංකර බුදුරදුන්ගෙන් විවරණ ලබා පාරමිතා පුරමින් ගත කළ ජීවිතයත්, සිද්ධාර්ථ කුමාරයා වශයෙන් ගත කළ ජීවිතයත්, බුද්ධත්වයෙන් පසු පරිනිර්වාණය දක්වා ගත කළ ජීවිතයත් පූජාවලිය ග්‍රන්ථය තුළ ඇතුළත් ය. පූජාවලිය ඕනෑම කෙනෙකුට කියවා තේරුම්ගත හැකි විචිත්‍රවත් බසින් රචනා කරන ලද්දකි.

"සද්ධර්ම රත්නාවලිය" බණ කතා සාහිත්‍යය ග්‍රන්ථයකි. බෞද්ධ සාහිත්‍යයේ එන විවිධ කතා උපයෝගී කර ගනිමින් සුදුසු තැනට සුදුසු උපමා යොදමින් විස්තර කළ යුතු තැන විස්තර කරමින් දේශීය පරිසරය තුළින් ලැබූ අද්දැකීම් ඉවහල් කර ගනිමින් සරල සිත් ගන්නා භාෂා සම්ප්‍රදායකින් ලියන ලද මෙම සද්ධර්මරත්නාවලිය ජනප්‍රිය ධර්ම සාහිත්‍ය ග්‍රන්ථයකි. මෙම හිමියෝ පිටිසර ඉපිද හැදී වැඩී ජීවිතයට පුළුල් අත්දැකීම්ලත් හිමිනමක බව මෙම ග්‍රන්ථය තුළින් දැක ගත හැකි ය. තැනට සුදුසු අයුරින් ප්‍රස්ථා පිරුළු යොදමින් කතාව කියවන්නාට රමණීය ආශ්වාදනයක් ලබා දී ඇත. ගැමියන්ගේ හදවත් හඳුනාගත් ධර්මසේන හිමියෝ පාඨක හදවත් ඇද බැඳ තබා ගැනීමට සමත් අයුරින් සද්ධර්ම රත්නාවලිය රචනා කර ඇත.

කෝට්ටේ යුගයේ වැඩ සිටි වීදගම මෛත්‍රී හිමියන් විසින් "බුදුගුණ අලංකාරය" වැනි ශ්‍රද්ධාව ජනිත කරවන පද්‍ය ග්‍රන්ථය නිර්මාණය කර ඇත. "හංස සංදේශය" හා "ලෝවැඩ සඟරාව" ද රචනා කළේ උන්වහන්සේ ම ය.

පාඨකයා තුළ මහත් ශ්‍රද්ධාවක්, භක්තියක් ඇති කරලීමට සමත් අයුරින් හා පද්‍ය ගායනය තුළින් රසාත්මක සංයත වින්දනයක් උපදවාලීමට සමත් අයුරින් මෙම ග්‍රන්ථය අප වෙත ප්‍රදානය කර ඇත. විශේෂයෙන් එදා අපේ පැරැණි ගැමියා මෙවැනි ධර්ම ග්‍රන්ථ කියවමින් තම ජීවිතය ධර්මය තුළින් ආලෝකමත් කර ගත්තා සේ වර්තමාන තාක්ෂණික ලෝකය තුළ විවිධ ප්‍රශ්න ගැටලුවලින් පීඩනයට, අසහනයට පත්වන මනසට සුවදායක සහනයක් සැනසිල්ලක් ලබා ගැනීම සඳහා විවේක අවස්ථාවල නැවත නැවතත් මෙවැනි සාහිත්‍යමය ග්‍රන්ථ පරිහරණය කරන්නට අප අධිෂ්ඨාන කරගත යුතු ව ඇත.

**දීපා පෙරේරා**

# අවිහිංසාවාදී බුදු දහමේ ප්‍රභාව ලොවට හෙළි කරමු

ජනාධිපති
ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා



ශ්‍රී සම්බුද්ධ ධර්මය රැගෙන වැඩම කළ අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය සිහිපත් කරමින් මහත් ශ්‍රද්ධා භක්තියෙන් යුක්තව ආමිස හා ප්‍රතිපත්ති පූජාවෙහි නිරත වීම අප රටේ බොදු ජනයා වසර දහස් ගණනක සිට සිරිතක් කොට ගෙන සිටිති. ඒ උන්වහන්සේගේ ආගමනය ශ්‍රී ලංකාද්වීපයෙහි ආගමික, සංස්කෘතික, සමාජයීය, දේශපාලනික ආදී සෑම අංශයකින් ම ශිෂ්ටාචාරමය පරිවර්තනයකට හේතු වූ නිසා ය.

සහශ්‍රක දෙකකටත් වඩා අතීතයට දිවෙන, මිහිඳු මහරහතන් වන්සේ සහ එකල අපේ නරපතියා වූ දේවානම් පියතිස්ස රජු අතර හමුව ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සුවිශේෂීම සංසිද්ධියයි. අපේ සමාජ වටිනාකම්, ආර්ථිකය, සාහිත්‍යය, කලාව හා ශිල්ප ක්‍රම පවා මහින්දාගමනය තුළින් අලුත් මගක් ගත්තේ ය. අහස උසට නිමැවුණු දාගැබ් ද, මහසයුර සදිසි මහවැව් ද, රට ස්වයං පෝෂිත කළ කෙත්වතු ද, ලොව මවිත කළ අද්විතීය කලා නිර්මාණයන් ද, ඒ සියල්ලට ම වඩා අටලෝ දහමින් අකම්පිත, ගහකොළ සතාසීපාවාට පවා සාධාරණය ඉටුකළ, අපිස් බව ජීවිත ප්‍රවෘත්තිය කරගත්, සිවු බඹවිහරණ ලෙහි දරාගත් ලාංකික බොදුනුවා ද බිහිවන්නේ මේ සමාජ සංස්කෘතික විප්ලවයත් සමඟය.

අභිමානවත් රටක්, ජාතියක් ලෙස අප ඉදිරියට පැමිණියේ මිහිඳු හිමි දෙසූ දහමෙන් හා අනුදැන වදාළ ජීවන මග ඔස්සේ ය. දෙලොව යහපත පිණිස සබුද්ධිකව ක්‍රියා කරන ශිෂ ්ටසම්පන්න සමාජයක් බිහිකිරීමට දැ ඒ දහම ඉවහල් විය. එබැවින් අතීතයට පමණක් නොව අනාගතයට ද අප රටක් ලෙස ලද වටිනාම දායාදය වන බුදු දහම අපට උරුම වූ උතුම් දිනය පොසොන් පුර පසළොස්වක පොහොය ලෙස සෑම හදවතකම ලියැවී තිබේ.

අප සෞභාග්‍යවත් දේශයක් කරා රට මෙහෙය වන්නේ අතීතයෙන් ලද අත්දැකීම්වලට හා බුදු දහමෙන් ලද ආභාෂයට අනුගතව ය. සැමට සාධාරණය ඉටුවනුයේ ආධ්‍යාත්මික ගුණ වගාවෙන් පිරිපුන්, විනයගරුක හා සමෘද්ධිමත් සමාජයක බව මගේ විශ්වාසය යි. මගේ රජය වර්තමානයට පමණක් නොව අනාගතයට ද සැලසුම් ක්‍රියාත්මක කරන්නේ එකී පදනම මත පිහිටා බව කිව යුතු ය. රට වර්තමානයේ මුහුණ දී ඇති වසංගතය හමුවේ වුව ද අප, ශිෂ්ටාචාරගත පදනම වූ ඒ දර්ශනයෙන් බැහැර වූයේ නැත. යථෝක්ත පදනමෙන් තොර ගමනක් ශ්‍රී ලාංකිකයන් වන අපට නොමැත.

එළැඹ ඇති මෙවර පොසොන් සමය සමාජය හා ජීවිතය දෙස තථාගත දහමට අනුගතව යථාර්ථවාදීව බැලීමට හා අවිහිංසාවාදී බුදු දහමේ ප්‍රභාව ලොවට හෙළි කිරීමට අවස්ථාව කර ගැනීම අනුබුදු මිහිඳු මා හිමියන්ට කළ හැකි වටිනාම උපහාරය බව මගේ හැඟීමයි.

ඔබ සැමට පින්බර පොසොන් මංගල්‍යයක් වේවා යි පතමි.

# සිංහල දීපය සත්‍යයේ දර්ශනයෙන් ඒකාලෝක විය

අග්‍රාමාත්‍ය හා බුද්ධශාසන අමාත්‍ය
මහින්ද රාජපක්ෂ මැතිතුමා



ජාතියක් ශිෂ්ට කළ, ජාතියක් ප්‍රෞඪවත් කළ, ජාතියක් සංවර්ධනය කළ, ජාතියක් සංරක්ෂණය කළ බුදු දහමේ පදනම වැටුණු පරම පූජනීය පොසොන් පොහෝ දිනය දෙදස් තුන්සිය විසි අට වෙනි වරට මෙවර උදා වේ.

දඹදිව අශෝක අධිරාජ්‍යයාගේ ආශිර්වාදයෙන් වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත පිරිස එදා මිහින්තලේ අම්බස්තලයේ සිට දෙවන පෑතිස් මහ රජු වෙත දායාද කළ ශ්‍රී සදහම් ගඟුළ මෙරට දස දිසාවේ අස්සක් මුල්ලක් නැර පැතිර යාමට ගත වූයේ කෙටි කාලයකි.

මෙම ධර්මවිජය පණිවිඩයත් සමඟ අවිද්‍යාවෙන් දුර්වර්ණ වී තිබූ සිංහල දීපය සත්‍යයේ දර්ශනයෙන් ඒකාලෝක විය. ඒ නිසා නිර්මල සංස්කෘතියක් හා සභ්‍යත්වයක් ඇති, ශිෂ්ට සම්පන්න ජාතියක් බවට පත් වූයේ කෙටි කලකිනි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට එක්සේසත් කළ ශ්‍රේෂ්ඨ නරපතියන්, රණකාමී සෙන්පතියන්, වනයේ තිබූ මහා කළු ගලට මෛත්‍රිය, කරුණාව, සමාධිය වැනි උතුම් ගුණාංග එක් කළ විස්මිත කලාකරුවන්, සොබාදහමේ අසිරිය කියා පෑ ශ්‍රේෂ්ඨ කවියන් මෙරට පෝෂණය කළහ.

මෙවර පොසොන් උදාවත් සමඟ ලෝක පරිසර දිනය ද එදිනට යෙදී තිබේ. අපේ මුතුන් මිත්තන්ගේ සම්, මස්, නහර, ඇට, ඇට මිදුළු ඔස්සේ කිඳා බැස තිබූ මෙ ශ්‍රේෂ්ඨ දර්ශනය නිසා ඇළට දෙළට, ගහට කොළට, සතා සිව්පාවට නිරන්තරයෙන් ආදරය කරන හා ඒවා ආරක්ෂා කරන අනභිබවනීය ජාතියක් බිහි විය.

අද යම් තරමකට එයට පිටු පෑ නිසා මුළු ලෝකයට ම නැවත වරක් ආපසු සිතා බැලීමට කොවිඩ් 19 වසංගතය සුවිශේෂී පාඩමක් කියා දේ. ලංකාවේ එම වසංගතය ජයග්‍රහණයේ මාවතට යොමු කිරීමට හැකි වූයේ අප මුළු මහත් රටක් ලෙස එකාවන් ව කටයුතු කළ නිසාත්, බුදුදහමේ පෝෂණය මත පිහිටා ගුණ දහම් හා වත්පිළිවෙත් පිරීමත් නිසාය. තව කෙටිකලක් සෞඛ්‍ය හා ආරක්ෂක අංශ ලබා දෙන උපදෙස් මත අපි සැවොම ක්‍රියා කළ යුතු වෙමු.

ඒ තුළින් මෙම වසංගතය සහමුලින් පරාජය කිරීමට රටක් හා ජාතියක් ලෙස ඉදිරියට යාමට හැකි බව මාගේ විශ්වාසයයි. එබැවින් ගුණ ධර්ම පෙරටු කොට සැමට දයාව හා කරුණාව දක්වා මෙම වසංගතය ජය ගැනීමට අදිටන් කර ගමු.

සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා – සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා

# දරුවන්ට ලබාදිය හැකි හොඳම දායාදය



ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ
උඩරට අමරපුර පාර්ශ්වයේ
වැඩබලන මහ නායක
**යාලගමුවේ ධම්මිස්සර අනු නා හිමි**

**මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කළ අවස්ථාවේ 30,000ක් පමණ පිරිසක් දඩකෙළියේ ගොස් සිටි බව අටුවා ටීකාවල දැක්වෙනවා. එදින දඩ කෙළියක් මෙන්ම කැළෑ යුද පුහුණුවක් සිදු කර ඇති බවත් එහි දැක්වෙනවා.**

එම කැළෑ පුහුණුවලදී සතුන් දඩයම් කිරීම එම ක්‍රියාදාමයටම අයත් වූවක් බවයි පැවසෙන්නේ. මෙරටට වැඩම කිරීමට පෙර සිටම මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට සංස්කෘතිය හොඳින් දැන සිටියා. එම නිසයි මුටසීව රජ සමයේ මෙරටට වැඩම නොකර, දේවානම්පියතිස්ස රාජ්‍යත්වය ලබන තෙක් සිට මෙරටට වැඩම කරන ලද්දේ. උන් වහන්සේ චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේ සිට ක්‍රමයෙන් ජනතාවට දහම් දේශනා කළේ දහම ජනතාවගේ ජීවන ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දෙමින්.

සත්ත්ව ඝාතනය යන්න එක්වරම පිළිකුල් කර හෙළා දැකීම සිදු කෙළේ නැහැ. ක්‍රමයෙන් ජනතාවට ඒ බව හුරු කළා. විශේෂයෙන් ම බුදු දහමේ දැක්වෙන පාඨයකින් ඒ බව මෙහිදී පෙන්වා දිය හැකියි.

'පාණාතිපාතං පහාය
පාණාතිපාතං පටිවිරතො හොති
විහීත දණ්ඩො
විහීත සත්තො
ලජ්ජී දයා පණ්නො
සම්බ ප්‍රාණ භූත හිතානුකම්පි විහරති

සතුන් මැරීමෙන් වෙන්වීම, දඬුවම් කිරීමෙන් වෙන්වීම, ආයුධ භාවිතයෙන් වෙන්වීම, වැනි ක්‍රියාදාමයන් ඔස්සේ සියලුම සත්වයන්ට හිතානුකම්පී ව වාසය කිරීම එයින් අනුමත කර තිබෙනවා.

වර්තමානයේ දරු දැරියන්ට පවා අවිහිංසාව පෙන්වා දිය යුත්තේ ඒ අනුවයි. බුදුරජාණන් වහන්සේ පවා ගැරඬියකු පෙලූ දරුවන්ට අවිහිංසාව පහදා දුන් අයුරු අප ඉගෙන ගෙන තිබෙනවා. දරුවන්ට ඔවුන්ගේ මනසට තේරුම් යන අයුරින් පහදා දීමයි මෙහිදී වැදගත් වන්නේ.

ඒ සඳහා පවත්නා ක්‍රමවේදය, සංස්කෘතියම උදාහරණ ලෙස පෙළගස්වන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ දඹදිව වැඩ සිටි කාලයේ මහා බ්‍රහ්මයා උතුම් ලෙස සලකමින් තිබූ ආගම් දර්ශන නිසා උන් වහන්සේ දේශනා කෙළේ 'බ්‍රහ්මාති මාතා පිතරෝ' මවුපියන් බ්‍රහ්මයාට හා සමානයි යනුවෙන්.

මිහිඳු මහ රහතන් වහන්සේ පවා විමානවත්ථු හා පේතවත්ථු දේශනා කරමින් ජනතාවට තේරුම් යන ආකාරයටයි ගුණදහම් ජනතාවට දේශනා කෙළේ. විශේෂයෙන්ම පංචසීලය ආගමික ප්‍රතිපදාවකට වඩා ජීවන ප්‍රතිපදාවක් ලෙසින් ජනතාවට හඳුන්වා දුන්නා. වර්තමානයේ දරු දැරියන්ට අවිහිංසාව වැනි ගුණධර්ම වටහා දිය යුත්තේද ඒ ලෙසින්. ඔවුන්ගේ ජීවන ප්‍රතිපදාවක් ලෙසින් සමාජයේ පරිසරයේ ම උදාහරණ සහිතවයි.

**මෙම ලිපියේ ඉතිරි කොටස එළඹෙන පොසොන් අව අටවක පෝද (13) පත්‍රයේ පළවේ.**

**තාරක වික්‍රමසේකර**

# ප්‍රතිපත්ති පූජාවට පෙළ ගැසෙමු

**මහා මිහිඳු සංස්කෘතිය දේශයේ සමඟියට මූලික පදනම දමන ලදී. මෙම සංස්කෘතික පුනරුදය තුළින් ජාතියේ සාමූහිකත්වය සහ මානව සබඳතා ශක්තිමත් වී ශ්‍රී ලාංකේය ජනතාව ලෝකයේ භාග්‍ය සම්පන්න ජන කොටසක් බවට පත් විය.**

විශාල වැව් සහ නෙක පොකුණුවලින් ද සනසන නුවර කලාවියේ ජනතාවගේ නිරන්තර ශීර්ෂාභිවන්දනයට පත් වූ අනුරාධපුර පුණ්‍ය භූමිය ශ්‍රී ලාංකික ජනතාවට පෙසොන් සමයට ආරාධනා කරන්නේ ඉමහත් ශ්‍රද්ධාවෙනි. අතීතයේදීත් එසේ සිදු විය.

තොසත් වඩන වන මැද පුන් සඳ අතරේ
අසන් මගේ ළඳ දිය පිත් කළ මෙවරේ
තැනූ නොයෙක් වැඩ සිරිමා බෝ අතුරේ
ගොසින් වඳිමු ළඳ අප අනුරාධපුරේ

විටෙක රජරට තියගයෙන් ඉරිතලා යයි. එහෙත් ලැබෙන සෑම අවස්ථාවක ම සිය ජීවනෝපාය වූ කෘෂිකර්මය ක්‍රමවත් ව ගොඩ නගා ගන්නා ජනතාව මිහිඳු සංස්කෘතියෙන් ලද පෝෂණයෙන් පෙසොන් සමයේ දී සැදැහැවතුන් සඳහා දැවැන්ත දන්සල් හා සිල් සමාදන් වන උවැසුවන්ට සංග්‍රහයන් සූදානම් කරයි. මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කළ දිනය පෙසොන් දිනය යි. එදින ශ්‍රී ලාංකික ජනතාවට මහා සැණකෙළි දිනයකි. දෙවැනි පැතිස් රජු අනුරාධපුරය තුළ උත්සව සංවිධානය කරමින් තම පිරිස සමඟ මිස්සක කඳු ශිඛරයේ මුව දඩයමේ නිරත විය. මෙම මොහොතේ දී මිහිඳු මහ රහතන් වහන්සේ දෙවන පැතිස් පරිපාලනය හා ඥාන ශක්තිය අවබෝධ කරගනිමින් බෞද්ධ දර්ශනය දේශීය සංස්කෘතියට බද්ධ කරයි.

මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ චූල්ල හත්ථි පදෝපම සූත්‍රය, දේවදූව සූත්‍රය, බාල පණ්ඩිත සූත්‍රය, විමාන වත්තු දේශනය, පේතවත්ථු ආදී දේශනා තුළින් ගැඹුරු සමාජ ධර්මයන්, අන්තර්ගතයන් අපට මඟ පෙන්වා දෙන ලදී.

මූලික දර්ශනික පදනම විමංසනය යි. කුඩා ඇත්පා සටහන දැක ඒ පා සටහනෙන් දැක්වෙන්නේ වනයේ ජීවත් වන ලොකුම ඇතා යැයි නොසිතය යුතු ය. සොයා විමසා බලා විමංසනයෙන් යුතුව කටයුතු කළ යුතු ය.



අනුරාධපුර ලංකාරාමාධිකාරී
උතුරු මධ්‍යම දිශාවේ
ප්‍රධාන අධිකරණ සංඝ නායක
**රැළපනාවේ ධම්ම ජෝති නා හිමි**

දෙවන පැතිස් හමුවේ දී ක්ෂණික අවබෝධය වැටහෙන බුද්ධියේ සුවිශේෂී ලක්ෂණ මිහිඳු හිමියන් තේරුම්ගෙන අවබෝධය සහ තාර්කික බව සමාජයට ප්‍රභල සාධකයක් බව කියා දෙයි. හැඟීම් විචක්ෂණ සහ ප්‍රඥාව ද පොදු යහපතට මූලික පදනම් දමයි. මෙම දැවැන්ත මූල ධර්ම මිහිඳු සංස්කෘතියෙන් සමාජයට පෙන්වා දෙමින් ක්‍රෝධ නොකිරීමටත්, ඉවසීමටත් නිර්ලෝභී ව අත්‍යවශ්‍ය බියෙන් තොරව අසුබ සෙවණැලි වලින් දුරස්ව ජීවිතයට මුහුණ දෙන ආකාරය මිහිඳු සංස්කෘතිය සමාජයට ඉස්මතු කර පෙන්වයි.

අනිත්‍ය බව, පීඩා සහිත බව සහ තමන් කැමැති ලෙස නොපවතින බව යන ත්‍රිලක්ෂණයන් තුළින් බෞද්ධ දර්ශනය ජීවිතය පිළිබඳ යථාර්ථය පැහැදිලි කර දුන් අතර, මිහිඳු හිමියන් තමාගේ සම්ප්‍රාප්තියෙන් අනුරාධපුර මහා විහාරය කේන්ද්‍ර කරගෙන විවිධ කලා කෘතීන් හා ගෘහ නිර්මාණ ශිල්පය තුළින් ජීවිතයේ සෞන්දර්යාත්මක පැතිකඩ අපට පෙන්වා දෙයි. අභයගිරිය, ජේතවනය, මිහින්තලය, ලෝවාමහා ප්‍රාසාදය, කුට්ටම් පොකුණ, රන්මසු උයන, පොකුණු පියගැට පෙළ, බිතු සිතුවම්, සඳකඩ පහන් ආදිය තුළ දැවැන්ත නිර්මාණාත්මක සම්භවයක් සෞන්දර්යාත්මක ලෙස ශ්‍රී ලාංකික චින්තනයට උරුම කර දෙන ලදී.

අනුරාධ ග්‍රාමය, මල්වතු ඔය කේන්ද්‍ර කරගෙන ගම්මාන ආරම්භයත් සමග ඉපැරැණි වාරි තාක්ෂණය සමඟ අභය වැව, තිසා වැව, වැනි නිර්මාණ වලින් අනුරාධපුර සමාජයේ ආර්ථිකය ගොඩනඟයි. විවිධ අතිරේක භෝග සමඟ සමාජය පෝෂිත සමාජයක් බවට මිහිඳු සංස්කෘතිය මඟින් නිර්මාණය වේ. අතීතය තුළින් ලබාගත් අත්දැකීම් සමඟ වර්තමාන සමාජයට පවා ජාතික නිෂ්පාදනයන්ට දායකත්වය ලබා දෙයි. වී නිෂ්පාදනය, බඩ ඉරිඟු, සෝයා ඇතුළු විවිධ නිෂ්පාදන භෝග මඟින් නිෂ්පාදන දායකත්වයෙන් රජරට ජනතාව අද ජාතියේ පෙර ගමන්කරුවන් වී ඇත.

දැවැන්ත ලෙස පෝෂණය වූ මිහිඳු සංස්කෘතියේ කේන්ද්‍රස්ථානය වූ අනුරාධපුර රාජධානියෙන් බිහි වූ මිහිඳු සංස්කෘතියේ ජීව ගුණය වර්තමානය දක්වා අඛණ්ඩ ව ගලාවිත් එම ජීවය නිසාම වර්තමානයේ දී නිදහස් නිවහල් සාමකාමී ශ්‍රී ලංකාව බවට, වර්තමාන නිවැරැදි නායකත්වයක් තුළින් එක්සේසත්ව මෙම මොහොතේ පුණ්‍ය භූමියක් බවට පත් වී ඇත.

**ගම්පහ වතුරුගමට නුදුරු ආරණ්‍ය සේනාසනයක භාවනානුයෝගිව වැඩවසන ස්වාමීන්වහන්සේලාට දානය පිළියෙලකර දෙමින් ආගමානුකූල ජීවිතයක් ගත කිරීමට කැමති පවුල් බරින් තොර නීරෝගී අවුරුදු 45-55 අතර පිංවතෙකු අවශ්‍යයි.**
එම ස්වාමීන් වහන්සේලාට දානයක් පිරිනැමීමට කැමති පින්වතුන්ටද අවස්ථාව තිබේ.
**070-5026501**

**අගනුවර විහාරස්ථානය පැවිදි වීමට කැමති මැදි වියේ ආගම දහමට ලැදි අයෙකු සොයමි. දීමණාවක් දෙනු ලැබේ.**
0719 313 363
එස්.වජිරසිරි හිමි.
533001505v
ආනන්දාරාමය
සාලමුල්ල,කොළොන්නාව

**අගනුවර විහාරස්ථානය නතර වී සේවය කළ හැකි දුසිරිතෙන් තොර අයෙකු සොයමි. දීමණාවක් දෙනු ලැබේ.**
0719 313 363
එස්.වජිරසිරි හිමි.
533001505v
ආනන්දාරාමය
සාලමුල්ල,කොළොන්නාව

**පැවිදි කිරීම සඳහා**
වාද්දුවේ මාවල පුරාණ විහාරස්ථානයට ගොවිකුල අවුරුදු 11 සිට 15 දක්වාවූ දරුවන් බලාපොරොත්තුවේ. අධ්‍යාපන කටයුතු සඳහා වගකීම භාරගනු ලැබේ.
**075-7117110**
**071-4401239**

**"O" වර්ගයේ + හෝ - වකුගඩුවක් අවශ්‍යයි**
**071-8303956**

**මෙවර කඨිණ පිංකම සඳහා අනුග්‍රාහක පිංවතුන් අවශ්‍යයි.**
075-5157475

**පැවිදිව නිවන් දකිමු**
බුද්ධ කාලයේ මෙන් පැවිදිව ධර්ම විනය හදරා බාහිර දෙයින් වැළකී ප්‍රතිපත්ති පිරීමට ඔබට මනා අවස්ථාවකි. වයස 25 - 55 අතර අයට ගම්පහ සහ අම්පාර සුදුසු ස්ථාන දෙකකි.
**අමතන්න - දිමුතු**
0777137002

**ගරු සේවයක්**
**විධායක තනතුරකින් විශ්‍රාමික, නීරෝගී දුසිරිතෙන් තොර ඉංග්‍රීසි හා පරිපාලන දැනුමැති යහපත් සමාජ සම්බන්ධතා ඇති තනි පුද්ගලයෙකි. වැඩිහිටි නිවාසයක සියලුම පාලන කටයුතු වැටුප් රහිතව ඉටුකළ හැක.**
070-6384980

**ආරාමයකට**
**අවු 50 - 60 කැපකාරියක් උවමනායි.**
**වැටුප 15,000/-**
**0772805005**

**තායිලන්තයෙන්**
ගෙන්වන ලද අඩි 1 1/2 ක් උස ලෝහමය රන් ආලේපිත ඉඳි පිළිම හා අඩි 4 1/2 ක් දින ශ්‍රී පතුල විකිණීමට.
0718071009

**ජීවත් වීමට මිස රජවීමට නොව**
වෙහෙර විහාර, බුදු පිළිම, දේව ප්‍රතිමා, අසූ මහා ශ්‍රාවක ප්‍රතිමා, විහාර සිතුවම් සියලුම කලා නිර්මාණ ඉතාම සාධාරණ මිලට ඉදිකර දෙමි. දුෂ්කර පන්සල්වලට ප්‍රමුඛත්වය දෙමි.
**0712277198 / 0763195173**

අලුතින් චෛත්‍ය ඉදිකිරීම, පරණ චෛත්‍ය නැවත පිළිසකර කිරීම, මෝල්ඩින් වැඩ, අටවිසි බුදු මැදුර, මල් ආසන, වාහල්කඩ, ඝණ්ටාර කුලුන, වළාකුළු බැම්ම, අතරමග නැවතුන වැඩ ඉතා අඩු මිලට කර ගැනීමට විමසන්න.
**හිරුහංස ආට්ස්**
0762457230

**O පොසිටිව් වර්ගයේ වකුගඩුවක් හැකි ඉක්මනින් අවශ්‍යයි.**
**071 1654353 / 071 3621384**

**ධර්මදානයක්**
දුෂ්කර ආරණ්‍යයක වැඩවසන ස්වාමීන්වහන්සේ නමකගේ පුද්ගලික පරිහරණය සඳහා ත්‍රිපිටක පොත් වහන්සේලා උවමනා කර තිබේ.
**076-3880748**

මම සැලකිය යුතු උගත්කමක් සහ විනීත ගතිපැවතුම් ඇති මැදිවියේ අවිවාහක කාන්තාවක්මි.
**වැදගත් කාරුණික වැඩිහිටි මහත්මියක් ළඟ ආරක්ෂිතව නැවතීමට සොයමි.**
මා හට උපකාරයක් ලෙස එවැනි අවස්ථාවක් සලසා දෙන්නේ නම් පින්.
**ගාල්ල අවටින් නම් වඩාත් හොඳයි.**
**0769119161**

**සමෘද්ධි ලාභී පවුල් 40 ක් පමණ වෙසෙන, සෘජු ආදායම් නොමැති අඩු පහසුකම් සහිත පෞරාණික විහාරයක 2020 ඇසළ මස 04 වන පොහොය දින අවපෑලවියෙන් ආරම්භවන වස් තුන්මාසය වස්වසන ස්වාමීන් වහන්සේලා 03 නමකට**
අටපිරිකර, සිවුරු, අඳිනකඩ, සෙසු පිරිකර, වියළි ආහාර ද්‍රව්‍යය, බෙහෙත් ගැනීමට, ප්‍රවාහන පහසුකම් සඳහා මුදල්, පඬුරු පූජා කිරීමට කැමති සත්පුරුෂ ධානපතීන්ට ආරාධනා.
**දුරකථන අංක 0774706503**

**වැඩිහිටියන්ට නවාතැන්**
අලුතෙන් ආරම්භ වැඩිහිටි නිවහන සඳහා නේවාසික වැඩිහිටියන් බඳවා ගනු ලැබේ. ප්‍රනීත ආහාර, සාත්තු සේවය, වෛද්‍ය පහසුකම් ඇතුළුව ජීවිතාන්තය දක්වා ආගමානුකූලව සුවසේ සිටිය හැකි ඉතාම නිස්කලංක ස්ථානයකි. (ඉහුම් පිහුම්, ආගමික කටයුතු සඳහා නොමිලේ කෙනෙකු අවශ්‍යයි)
**0710903803**

**ආයාචනයයි**
වකුගඩු ඉවත්කළ අසාධ්‍ය රෝගියකුට "O" වර්ගයේ වකුගඩුවක් ඉක්මනින් අවශ්‍යව ඇත. පරිත්‍යාගශීලියකු සිටී නම්
**0769998936**
**අමතන්න**

**ප්‍රතිපත්තියෙන් සිත වඩමු**
පොල්පිටිමූකලාන ධර්ම ශ්‍රී විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ වස්කාලයේ කෙටි / දිගුකාලීනව පැවිදි වීමට පිංවත් ඔබට අවස්ථාව ඇත. උපාසක / උපාසිකා පිංවතුනටද භාවනාව සඳහා පහසුකම් ඇත.
**විමසීම් :**
**077-0683061**
**071-2300351**

**වර්තමානයේ ඇති වූ කොරෝනා නමැති මහා වසංගතය නිසා, මුළු ලෝකයම අසීමිත බියකට, සැකයකට පත්ව සිටින මොහොතක මෙවර උපසම්පදා පුණ්‍ය මහෝත්සවය කල් දැමීමට මල්වතු අස්ගිරි මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර කාරක මහා සංඝ සභාව ම තීරණය කළහ. තවදුරටත් එම වසංගත තත්ත්වය පවත්නා නිසා උපසම්පදාවට සම්බන්ධ වන මහා සංඝ රත්නයේත්, සැදැහැවතුන්ගේත් ආරක්ෂාව සලසාලීම වශයෙන් මේ වර්ෂයේ දී උපසම්පදාව නොපැවැත්වීමට තීරණය විය. මල්වතු පාර්ශ්වයේ අති ගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහා නායක මාහිමිපාණන් වහන්සේ සහ අස්ගිරි පාර්ශ්වයේ අති ගෞරවාර්හ වරකාගොඩ ශ්‍රී ඥානරතනාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ හා, මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය අනුනායක ස්වාමීන් වහන්සේ සිව් නමත්, ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ සහිත ගරුතර කාරක සංඝ සභාවත් විසින් සාකච්ඡා කොට මේ වර්ෂයේ උපසම්පදාව නොපැවැත්වීමට තීරණය කරනු ලැබූ අතර, ලබන වර්ෂයේ සිට නැවත උපසම්පදාව පැවැත්වීමට තීරණය කරන ලද බව ස්‍යාමෝපාලි මහ නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය පහමුණේ ශ්‍රී සුමංගල නා හිමිපාණන් වහන්සේ සහ ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය මැදගම ධම්මානන්ද නා හිමිපාණන් වහන්සේ පවසති.**

# මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය උපසම්පදා පුණ්‍ය මහෝත්සවය



සෝමවති රජමහා විහාරාධිපති, ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය
**පහමුණේ ශ්‍රී සුමංගල නා හිමි**

**ශ්‍රී ලංකාද්වීපයෙහි සම්බුද්ධ ශාසනය පිහිටූ විමෙන් පසු තථාගත බුදුපියාණන් වහන්සේ අනුදැන වදාළ උපසම්පදාව මිහිඳු මා හිමියන්ගෙන් පසුව අනුරාධපුර මහා විහාරය මුල් කරගෙන සිදු විය. ඒ නිසා එම උපසම්පදාව 'මහා විහාර' උපසම්පදාව නම් විය.**

එතැන් පටන් අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ හා මහනුවර රාජධානිවල දී ඒ ඒ රජවරු මුල් වී උපසම්පදාව පිහිටු වූ ආකාරය ඓතිහාසික වාර්තාවල සදහන් වේ.

ක්‍රි.ව. 1705 වන විට නරේන්ද්‍රසිංහ රාජ්‍ය කාලයේ දී එකම උපසම්පදා භික්ෂුවක්වත් ලක්දිව නොසිටි බවත්, නම ගමවත් ලියා ගන්නට බැරි පිරිසක් එදා ලක්දිව සිටි බවත් මහා වංශය ආදී ඓතිහාසික ග්‍රන්ථවලින් පැහැදිලි වේ. එවන් වකවානුවක දී ජාතියේ පිනට වැලිවිට සරණංකර හිමිපාණන් වහන්සේ බිහිවූහ.

උන්වහන්සේ, නරේන්ද්‍රසිංහ රජු පහදවාගෙන පළමුවෙන් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට අවස්ථාව සැලසූහ. ඒ සඳහා තෝරා ගත්තේ 1502 දී වික්‍රමබාහු රජතුමා විසින් සාදවන ලද පෝයමළු විහාරයයි. එහි දී පළමුවෙන් අධ්‍යාපනය ලබා දුන් අතර, එහි ඉඩකඩ මද නිසා නරේන්ද්‍රසිංහ රජුගේ අනුග්‍රහය අනුව උඩුනුවර නේමකන්දේ සිද්ධස්ථානයක් පිහිටුවා අධ්‍යාපනය වැඩි දියුණ කරමින්, උඩ – පහත දෙපළාතේ ම ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා දුන්හ.

ඒ වනවිට එකම උපසම්පදා භික්ෂුවක්වත් නොමැති වූ අවස්ථාවකි. සම්බුද්ධ ශාසනය නම් උපසම්පදා භික්ෂූන් වහන්සේ අත්‍යවශ්‍යම ය. උපසම්පදා භික්ෂූන් වහන්සේගෙන් තොරව ශාසනයක් නැත. සම්බුද්ධ ශාසනය යනු උපසම්පදා භික්ෂූන් වහන්සේගෙන් සමන්විත ව පවතින ශාසනයයි. කෝට්ටේ යුගයේ දී ලංකාවේ බිහිවූ උපසම්පදාව ම තායිලන්තයටත්, බුරුම රටටත් රැගෙන ගොස් තිබුණි. ඒ සමගම බෝධීන් වහන්සේත්, බුද්ධ ප්‍රතිමා වහන්සේත්, ත්‍රිපිටකයත් ලංකාවේ සිට ඒ රටවලට ගෙනගිය බව ජිනකාලමාලිය ආදී සියම් රටේ වංශ කතාවේ සඳහන් වේ.

වැලිවිට සරණංකර හිමියන් විසින් තුන්වැනි වතාවට කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සම්බන්ධ කරගෙන සියම් රටේ හෙවත් තායිලන්තයේ අයෝධ්‍යා නගරයට දූතයන් යවනු ලැබී ය. එහිදී පරම ධාර්මික රජතුමාටත්, ශ්‍රී නිවේස සංඝරාජ මාහිමියන්ටත් කරුණු කියා ලක්දිව උපසම්පදාව පිහිටුවීමට උපාලි හිමියන් ඇතුළු තිහකට අධික උපසම්පදා භික්ෂූන් වහන්සේ සහිතව ම මැති ඇමැතිවරුන් 1753 වර්ෂයේ ලංකාවට ගෙන්වාගන්නා ලදී. එදා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා අපමණ සතුටට පත්ව උපාලි හිමියන් ඇතුළු හිමිවරු පිළිගත්තේ ය. පොහොයමළු විහාරයේ ඉඩ මදි නිසා රජතුමාගේ මල්වත්ත පූජා කරමින් වර්තමානයේ පවත්නා පෝය සීමාව ඇතුළු සංඝාවාසය ඉදි කළේ ය. භික්ෂූන් වහන්සේ එහි වඩා හිඳුවා 1753 වර්ෂයේ ජූලි මස 15 වැනි දින වර්තමාන සම්බුද්ධ ශාසනයේ පළමුවැනි උපසම්පදාව මල්වතු මහා විහාර පෝය සීමාවේ දී පිහිටවූයේ ය. එහි දී කොබ්බෑකඩුවේ හිමි, වැලිවිට සරණංකර හිමි, හුලංගමුවේ හිමි, තිබ්බටුවාවේ බුද්ධ රක්ඛිත හිමි යන හිමිවරු ඇතුළු මල්වතු විහාරයෙන් පස් නමක් ද, අස්ගිරි විහාරයෙන් නාවින්නේ හිමි ද යන සය නම උපසම්පදා කරනු ලැබූහ.

ඊට පසුදින පටන් මල්වතු, අස්ගිරි විහාර දෙකෙහි හා ලක්දිව නොයෙක් විහාරස්ථානවලින් වැඩම වූ සාමණේරයන් වහන්සේ උපසම්පදා කළ ආකාරය ස්‍යාමෝපසම්පදාව, සංඝරාජ සාධු චර්යාව, මහාවංශා දී ග්‍රන්ථයන් හි ද සඳහන් වේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් රාජකීය ආභරණ පළඳවමින් වාහලනාග නාමයෙන් ම එකී සාමණේරයන් වහන්සේට ගෞරව දක්වමින් උපසම්පදා කරනු ලැබීමට සලස්වනු ලැබී ය. එදා ආරම්භ වූ උපසම්පදාව වාර්ෂික ව වෙසක් පොහොයේ සිට පොසොන් පොහොය දක්වා මල්වතු – අස්ගිරි උභය මහා විහාරයන්හි පැවැත්වීමට කටයුතු සැලැස්වීය. එහි දී පොහොය පහට විහාරස්ථාන දෙකෙහි ම වාහල නාග නාමයෙන් දහනමක් උපසම්පදා කිරීමට සැලැස්වේ. මේ අයුරින් 1753 වසරේ සිට ආරම්භ කළ උපසම්පදා උත්සවය අවුරුදු 266 ක් මුළුල්ලෙහි අඛණ්ඩව ම පවත්වාගෙන එන ලදී.



ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ලේඛකාධිකාරී ආචාර්ය
**මැදගම ධම්මානන්ද නා හිමි**

**රමණී සුබසිංහ**

---

රේරුකානේ
චන්දවිමල මහා නා හිමි

## ධර්ම ශ්‍රවණයේ අනුසස්

**කෙනෙකුට යහපත් කෙනෙකු වීමට ඇත්තා වූ උසස් ම හේතුව බුද්ධ ධර්මය ඇසීම ය. මනුෂ්‍යයෝ ධර්මයෙන් ඈත් වූ පමණට ගුණ හීනයෝ වෙති. ධර්මය ඇසුරු කළ කළ පමණට ගුණවත් වෙති.**

ශිල්පශාස්ත්‍ර කොතෙක් දැන සිටියත්, කොතෙක් ධනය තිබුණත්, නෑයන් මිතුරන් කොතෙක් සිටියත්, ගුණයෙන් හීන තැනැත්තේ සුවඳින් තොර වූ කැල මල සේ නො වටනා පුද්ගලයෙකි. විරූප වූවත් දිළිඳු වූවත් ශිල්ප ශාස්ත්‍ර නො දනිතත් ගුණවතා පූජ්‍ය පුද්ගලයෙකි. සැවැත්නුවර වීථිවල කසළ ඉවත් කරන්නකු වූ සුනීත ගුණවතකු වීම නිසා රජුන් විසින් පවා පුදනු ලබන්නෙක් විය. ගෞරවයෙන් බණ අසන, තැනැත්තේ ක්‍රමයෙන් පව් නො කරන, පින් කරන ගුණවතෙක් වේ. එය දහම් ඇසීමේ එක් අනුසසකි. නො ඇසූ දෑ අසන්නට ලැබීම ය, ඇසූ දෑ පිරිසුදු වීමය, සැක දුරුවීම ය, දෘෂ්ටිය සෘජුවීම ය, සිත පැහැදීම යන අනුසස් පස දහම් ඇසීමෙන් ලැබෙන බව ප්‍රකාශිත ය.

දහම් දෙසන කල සාධුකාර දෙන පින්වතාගේ මුඛයෙන් මානෙල් මල් සුවඳ ඇති වන බව කතා වස්තුවත් සමඟ මනෝරථ පූරණී නම් වූ අංගුත්තර අටුවාවේ දක්වා තිබේ. චම්පා නුවර ගග්ගරා නම් පොකුණෙහි විසූ මැඩියෙක් කිසි ම තේරුමක් නැති ව දහම් දෙසන හඬ පමණක් අසා දෙව් ලොව උපන් බව විමාන වත්ථු ප්‍රකරණයෙහි දක්වා තිබේ. ලක්දිව කුඹල් තිස් පව්වෙහි විසූ පන්සියයක් පමණ කිරි වවුලන් තේරුම් නොමැතිව සතුටු සිතින් දහම් හදාරන හඬ අසා ඒ පිනෙන් මිනිස් ලොව උපන් බව ද, තලගුරු වෙහෙර ධම්මදින්න තෙරුන් වහන්සේගේ දහම් හදාරන හඬ සතුටින් ඇසූ, කණ ගැරඬියකු ඒ පිනින් මිනිස් ලොව ඇමති කුලයෙහි උපන් බව ද දක්වා තිබේ. බණ ඇසීමේ කුසල බලයෙන් දෙව් මිනිස් සැප ලැබූවන්ගේ ගණනක් නැත. බණ අසා සෝවාන් ආදි සතර මග, සතර ඵලයට පැමිණ නිවන් දුටුවන්ගේ ගණනක් ද නැත්තේ ය. එබැවින් සකල සම්පත් ලබා දෙන්නා වූ තථාගතයන් වහන්සේගේ ධර්මය අත්‍යාදර ගෞරවයෙන් අසත්වා.

**බෞද්ධයාගේ අත්පොත ඇසුරිනි**

# අනුබුදු මිහිඳු මා හිමි සත් දිනක් තුළ දෙසූ දම් අමා ගඟ



කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

**අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවීම එවකට භාරතයේ වැඩ සිටි ශාසන භාරධාරී යතිවරයාණන් වහන්සේලා සහ ධර්මාශෝක නරපතියන් විසින් ගන්නා ලද ඓතිහාසික තීන්දුවක ප්‍රතිඵලයකි. එසේම ශ්‍රී ලාංකිකයන් විසින් රාජ්‍ය ගෞරව සහිත ව උන්වහන්සේ ඉමහත් භක්තියෙන් පිළිගැනීම ද ඓතිහාසික හා දුරදර්ශී තීරණයකි.**

මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවේ එතෙක් පැවති සංස්කෘතියට ආධ්‍යාත්මික ප්‍රවේශයක් ලබාදීමෙන් කරන ලද මහඟු මෙහෙවර ශ්‍රී ලාංකිකයන් වන අප විසින් අදටත් සමරනු ලබන්නේ ඉමහත් බැතියෙන් බව අපි දනිමු.

එවකට තරුණ ජවයෙන් හා සුවිශද බුද්ධියකින් හෙබි දුරදර්ශී හා තේජෝබල සම්පන්න යතිවරයාණන් වහන්සේ නමක් වූ මිහිඳු මහරහතන් වහන්සේ අටුවා සහිත ත්‍රිපිටකය ද මෙරටට රැගෙන වැඩි බව ඓතිහාසික ලේඛනවල සඳහන් වේ. එහි අරමුණ වන්නේ සැබෑ නිර්මල බුදු දහම මෙහි ස්ථාපනය කිරීම බව ඉතා පැහැදිලි ය.

ඓතිහාසික ලේඛනවලට අනුව උන්වහන්සේ මෙරටට පැමිණි දිනයේ සිට සිදුවී ඇති විශිෂ්ට විප්ලවය හා සංස්කෘතික පුනරුදය විද්වතුන්ගේ පවා විමර්ශනවලට භාජනය වන අතර ඔවුන්ගේ නිගමන අනුව මිහිඳු මාහිමියන්ගේ ලංකා ගමනය ඉතා සැලසුම් සහගත වූවකි.

උන්වහන්සේ පූර්ව සැලසුම් සහිතව මෙරටට වැඩම කළ අතර, එය වටහා ගත හැකි එක් ක්‍රමයක් වන්නේ උන්වහන්සේ විසින් කරන ලද දේශනාවන් විමසීම ය. එම දේශනාවන් අසා දින කිහිපයක් ඇතුළත මෙරට ජනයා හට දහසක් පමණ බුදුදහම වැළඳගත් බව කියැවේ. එබැවින් මෙම ලිපියෙන් සලකා බැලෙනුයේ උන්වහන්සේ විසින් මුල් දින කිහිපය ඇතුළත කරන ලද සූත්‍ර දේශනාවන් පිළිබඳව ය.

මිහිඳු මාහිමියන් මෙරටට පැමිණි විගස දේවානම්පියතිස්ස රජතුමා සමග දාර්ශනික සංවාදයක යෙදුණු බව අපි දනිමු. රජතුමාගේ බුද්ධි මහිමය තේරුම් ගත් පසු උන්වහන්සේ විසින් රජුට දෙසිය යුතු පළමු දේශනය සඳහා තථාගත දේශනා අතර මජ්ඣිම නිකායට අයත් චූල්ලහත්ථිපදෝපම සූත්‍රය තෝරා ගත්හ. මිහිඳු මාහිමියන්ගේ අභිප්‍රාය වූයේ කිසියම් ජන කොටසක් ආගමට හරවා ගැනීම නොව තථාගත ධර්මයේ ආස්වාදය පතුරුවා හැරීමයි. ඒ සඳහා රජතුමාට මෙන්ම රජ පෙළ පත හා බැඳුණු සෙසු ජනයාට බුද්ධ දේශනාව සම්බන්ධයෙන් බුද්ධිමය අවදියක් තිබිය යුතු බව උන්වහන්සේ මැනවින් දැන සිටියහ. ඓතිහාසික වාර්තා අනුව චූල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව ඇසීමෙන් පසු දේවානම් පියතිස්ස රජ ඇතුලු රජ පවුලේ සියලු දෙන තෙරුවන් සරණ ගිය බවත්, ඇතැම් අය සෝවාන් ඵලයට පවා පත් වූ බවත් සඳහන් වේ.

## චූල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව

චූල්ලහත්ථිපදෝපම සූත්‍රය තරමක් කුඩා සූත්‍රයකි. හත්ථි - පද - උපම යන පද තුන එකතු වී එම පාලි වචනය සෑදී ඇත. ඇතෙකුගේ පා පියවර උපමා කොට මෙම සූත්‍රය දෙසා ඇත. එහි පිලෝතික හා ජාණුස්සොණි යන බෞද්ධ නොවන බ්‍රාහ්මණ තරුණයන් දෙදෙනෙකු අතර සිදුවන සාකච්ඡාවක් වේ.

පිලෝතික බුදු දහම වළඳගත් පුද්ගලයෙකු නොවුණ ද බෞද්ධ දර්ශනයේ වටිනාකම හා එහි අනුගාමිකයන් ගැන ඇඩි ප්‍රසාදයකින් සිටි කෙනෙකි. ඔහු දිනක් ඒ බව ජාණුස්සෝණි නම් තම මිතුරාට ප්‍රකාශ කළේ ය. එය අසා සිටි ජාණුස්සෝණි බුදුරදුන්ගේ ප්‍රඥව හා වියත්බව වැඩි උනන්දුවකින් විමසී ය.

බුදුරදුන්ගේ ප්‍රඥව හා වියත් බවට සමකළ හැකි තත්වයක සිටින කිසිවෙක් දෙවියන් සහිත ලෝකයේ නොමැති බවත්, එම ප්‍රඥව පැසසීමට තමාට වචන නැති බවත් එහිදී පිලෝතික පවසයි. ඔබ එතරම් පැහැදුණේ කොහොම ද? ජාණුස්සෝණි ප්‍රශ්න කරයි. එවිට පිලෝතික මෙසේ පිළිතුරු දෙයි.

යම් සේ ඇතුන් වසන වනයක සිටින පුරුෂයෙක් දිගින් පළලින් මහතින් යුතු ඇත් පා සලකුණක් දැක, මේ විශාල හස්තියෙකැයි නිගමනය කරන්නාක් මෙන් මම ද බුදුරදුන්ගේ ඥාණපද හතරක් දැක උන්වහන්සේ සම්‍යක් සම්බුද්ධ බව, උන්වහන්සේගේ ධර්මය ස්වාක්ඛාත බව, උන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා නියම මාර්ගයට තිසි පරිදි පිළිපන් පිරිසක් බව දැනගතිමි යැයි කී ය.

සියුම් බුද්ධි ඇති තාර්කික ඇතැම් ක්ෂත්‍රියයෝ උන්වහන්සේ සමඟ තර්ක කිරීමට ප්‍රශ්න සකසාගෙන පැමිණ උන්වහන්සේගෙන් ධර්මය අසා පැහැදී ප්‍රශ්න නො විමසාම ශ්‍රාවකයන් බවට පැමිණීම ඉන් පළමු වැන්නයි.

දෙවැන්න එබඳුම මහත් බුද්ධි ඇති බමුණු පඬිවරු වාද කිරීමට පැමිණ ප්‍රශ්න නො අසා නිහඬව ම උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වීමයි. ඇතැම් ගෘහපති පඬිවරු ද එසේම ශ්‍රාවකයන් බවට පත්වීම තෙවැන්න වන අතර සිවුවැන්න වන්නේ ඇතැම් ශ්‍රමණ පඬිවරු ද මෙසේම බුදුරදුන්ගේ දේශනාවෙන් ඉමහත් උත්තේජනයට පත්ව ශ්‍රාවක භාවය ලැබීමයි. මෙම පියවර හතර දැක මම මෙසේ බුදුරදුන්ගේ ප්‍රඥව ගැන පැහැදුනෙමියි පිලෝතික කී ය.

මෙයින් අතිශය ප්‍රසාදයට පත් ඔවුහු බුදුරජාණන් වහන්සේ වෙත ගොස් තමන් දෙදෙනා අතර සිදු වූ සංවාදය හෙළි කළහ. මෙ පමණකින් ඇත් පද උපමාව සම්පූර්ණ නොවේ යැයි වදාළ බුදුන් වහන්සේ සීල සමාධි ප්‍රඥවන් අනුක්‍රමයෙන් පිරිසිදු කොට, ආධ්‍යාත්මික ජීවිතයක් ලබා ගන්නා අයුරුත්, චතුරාර්ය සත්‍ය පසක් කර ගන්නා ආකාරයත් ඔවුනට පැහැදිලි කොට, එසේ කිරීමෙන් හත්ථි පද උපමාව සම්පූර්ණ වන බව වදාරති. අවසානයේ ඔවුහු දිවි ඇති තෙක් බුදුන් සරණ යන බව සතුටින් ප්‍රකාශ කරති.

මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ පළමුදිනයෙහි ම කළ මෙම දේශනාව අසා හතලිස් දහසක් දෙනා සෝවාන් ඵලයට පැමිණි බව සඳහන් වේ. මෙසේ ශ්‍රී ලංකාවේ ශාසන ප්‍රතිෂ්ඨාව සිදු වන්නේ බෞද්ධ දර්ශනය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් සහිත ශ්‍රී ලාංකික ජනයාගේ දායකත්වයක් සහිතව ය. මිනිසුන්ගේ පමණක් නොව දෙවියන්ගේ නෙත් විවර වීමක් ද මෙදින සිදුවිය. ඒ එදින පැවිදි කරන ලද භණ්ඩුක සාමණේරයන් වහන්සේ අභිඥ පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී ඉන් නැගිට මුළු දිවයිනටම ඇසෙන සේ ධර්ම ශ්‍රවණය සඳහා දේවාරාධනයක් කළ බැවිනි. මිහිඳු මහරහතන් වහන්සේ එදින පැමිණි දෙවියන්ට සමචිත්තපරියාය නම් සූත්‍ර දේශනාව කළහ.

## සමචිත්තපරියාය සූත්‍ර දේශනාව

මෙම සූත්‍රය පුද්ගල අධ්‍යාත්මයේ පවතින සංයෝජන හා බාහිර සංයෝජන අරබයා බුදුරදුන් විසින් සැරියුත් හිමියන්ටත්, සැරියුත් තෙරුන් විසින් භික්ෂූන්ටත් දේශිත සූත්‍රයකි.

> **සංසාරය කෙතරම් දීර්ඝ කාලයක් ද යන්න පැහැදිලි කිරීමට මෙහි සූත්‍ර රාශියක උපමා දක්වා ඇත. සංසාරයෙහි සැරිසරන කල්හි කෙනෙකු පානය කරන මව් කිරි ප්‍රමාණය සතර මහා සාගරයේ ජලයට වඩා වැඩි බව එක් සූත්‍රයක් දක්වා තිබීම ඉන් එක් නිදසුනකි.**

සැරියුත් තෙරුන් පිරිනිවන් පෑමට ආසන්න ව දෙසූ මෙමසූත්‍ර දේශනාව ඇසීමට දෙවි දේවතාවන් ගිණිය නොහැකි තරම් විශාල සංඛ්‍යාවක් පැමිණි බව සඳහන් වේ. මිහිඳු මාහිමියන් මෙම සූත්‍රය දෙවියන්ට දෙසීමේ පසුබිම බුද්ධිය පමණක් නොව ශ්‍රද්ධාව හා භක්තිය ද සහිත ව බුදුදහම දෙස බලන පුද්ගලයෙකුට තේරුම් ගැනීම අපහසු නැත. සමචිත්තපරියාය සූත්‍ර දේශනාව ධ්‍යාන, විදර්ශනා, මාර්ග ඵල හා නිර්වාණය ලබා ගන්නා ආකාරය විස්තර කෙරෙන ගැඹුරු ධර්ම පර්යායකි. සය ආකාරයකින් විදර්ශනා භාවනාව වඩන ආකාරය මෙහි විස්තර වේ.

ප්‍රධාන වශයෙන් මෙහි සාකච්ඡා වන කරුණු අතර, ආධ්‍යාත්මික සංයෝජන යන්නෙන් අදහස් වන්නේ කාම භවයෙහි බැඳීමයි. බාහිර සංයෝජන යනු රූප අරූප භවයන්හි බැඳීමයි. සත්ත්වයා කාම භවයෙහි මෙන්ම, රූපාරූප භවයන්හි ගෙවන ආත්මවල ස්වභාවය පිළිබඳ ගැඹුරු දේශනාවක් මෙහි අන්තර්ගත වේ.

මෙම සූත්‍ර දේශනාවසානයෙහි ධර්මාභිසමය ලද දෙවියන්ගේ සංඛ්‍යාව නියමයක් නැති අතර අසංඛ්‍ය වූ නාග සුපර්ණයෝ සරණ ශීලයෙහි පිහිටියහ. ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනය පිහිට වූදිනයේ සිට දෙවියන්ගේ ආරක්ෂාව ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගැනීමට මෙය ඓතිහාසික වූත්, ප්‍රමාණවත් වූත් කරුණකි.

## ප්‍රේත වස්තු හා විමාන වස්තු දේශනා

මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩම වීමෙන් දෙවන දිනයෙහි දෙවනපෑතිස් නරනිඳුන් විසින් පිරිනැමූ දානයෙන් පසු පේතවත්ථු විමානවත්ථු හා සච්චසංයුක්ත දේශනා කළහ. ප්‍රේතවස්තු යනු මිනිස් ලොව සිටිය දී අකුසල කර්ම කළ ස්ත්‍රී පුරුෂයන් ප්‍රේතයන් හා ප්‍රේතියන් වී දුක් විඳින අයුරු පෙන්වා දෙන දේශනාවන් ය.

මුගලන් මහරහතන් වහන්සේ එම ලෝකවලට ඍද්ධියෙන් වැඩම කොට ඔවුන් සමඟ කතා බස් කොට යළි මිනිස් ලොවට වැඩම කොට ඒවා මිනිසුන්ට වදාරණ ලද්දේ මිනිසුන් අකුසලයෙන් වැළැක්වීම පිණිස ය. මෙම කථා වස්තු ඇතුළත් ග්‍රන්ථය ප්‍රේත වස්තුව නමින් ත්‍රිපිටකයෙහි දක්නට ලැබේ. එසේම උන්වහන්සේ දිව්‍ය විමානවලට ගොස් දෙවියන් හා දෙවඟනන් එම සම්පත් අනුභව කරන්නේ කුමන පින්කමකින් දැයි ඔවුන්ගෙන් අසා දැනගෙන මිනිස් ලොවට දේශනා කරන ලද්දේ එකී මිනිසුන් කුසලයෙහි පිහිටුවීම සඳහා ය. එබැවින් මිහිඳු මහරහතන් වහන්සේ මෙම දේශනාවන් මෙහි දී දේශනා කරන ලද්දේ මෙරට වැසියා අයහපත් ක්‍රියාවලින් වළකා ගැනීමටත්, ඔවුනට යහපත් ආචාර ධර්ම පුරුදු පුහුණු කිරීමටත් බව ඉතා පැහැදිලි ය. අකුසලයෙන් ඈත්විය යුත්තේ කවර හේතුවක් නිසා ද? කුසල් කිරීමෙන් සාංසාරික ව ලැබිය හැකි සැප විපාක මොනවාද, සතුටින් සොම්නසින් මෙලොව මෙන් ම, පරලොව ගත කළ හැකි උපාය මාර්ගය කුමක් ද යන්න මෙම දේශනාව මගින් උන්වහන්සේ සිංහල ජනයාට පහදා දුන්හ. මෙම දේශනාව අවසානයෙහි විශේෂයෙන් කාන්තාවෝ පන්සීයක් සෝවාන් ඵලයෙහි පිහිටි බව මහාවංසය හා සමන්තාපාසාදිකා වනි ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වේ.

## සච්චසංයුත්ත සූත්‍ර දේශනාව

මිහිඳු මාහිමියන් දෙවන දිනයෙහි දෙසූ සච්චසංයුත්ත දේශනාව කුඩා සූත්‍ර රාශියක එකතුවකි. සංයුත්ත නිකාය නම් ග්‍රන්ථයේ එම සූත්‍ර දක්නා ලැබේ. තථාගතයන් වහන්සේ විසින් දේශිත විවිධ වූ හා, ගැඹුරු වූ දහම් කරුණු රැසක් මෙහි දක්නට ලැබුණ ද එහි ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන ආර්ය සත්‍යය නොයෙක් ආකාරයෙන් ධර්මානුකූල ව විස්තර කිරීමකි.

සංසාරය අතිශය බිහිසුණු බවත්, එහෙයින් ම සත්ත්වයා අසීමිත දුක්ඛ වේදනාවන්ට පාත්‍ර වන බවත් පෙන්වා දෙන මෙම සූත්‍ර අවධාරණය කරනුයේ සාංසාරික අත්දැකීම් සියල්ල දුක් බව හා ඒවා දුක් වශයෙන් තේරුම් ගෙන එය අභ්‍යාසයක් වශයෙන් නිතර නිතර භාවනාවක් වශයෙන් වැඩිය යුතු බවයි.

මිහිඳු මහ රහතන් වහන්සේ මෙම දේශනාව පහදා දීමෙන් අපේක්ෂා කරන්නට ඇත්තේ මෙමදිවයිනෙහි වැසියන්ට හරවත් ජීවන රටාවක් හඳුන්වා දීම විය යුතු ය. සැප ලැබිය හැක්කේ දුකෙහි දුක්වීමෙන් නොව, දුක දුකක් වශයෙන් තේරුම් ගෙන අකම්ප්‍යව කටයුතු කිරීමෙනි.

## දේවදූත සූත්‍ර දේශනාව

මිස්සක පර්වතයට වැඩි මිහිඳු මහරහතන් වහන්සේ ඇසිත් දුටු ජනයා තැන් තැන්වල උන්වහන්සේගේ ගුණ කී ය. එබැව් අසා මහත් ජන ගංගාවක් රජ මිදුලට රැස්විය. එයින් ඇති වූ කලබැගෑණියත්, සියලු දෙනාට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමත් නිසා දෙවනපෑතිස් රජතුමා ඇත්හල පිළිසකර කොට සරසවා එහි මගුලැතු සිටින ස්ථානයෙහි තෙරුන්ට අසුනක් පැනවී ය.

මිහිඳු මහරහතන් වහන්සේ එහි රැස්ව සිටි පිරිසට පව් කළවුන්ට මරණයෙන් පසු හිමිවන දරුණු දුක් වේදනාවන් ගැන කියැවෙන දේවදූත සූත්‍ර දේශනාව කළහ. කයින්, වචනයෙන්, මනසින් දුසිරිත් කොට මිසදිටු ව ආර්යයන්ට උපවාද කළාහු මරණින් මතු නිරයේ උපදිති. එහිදී යමපල්ලෝ ඔවුන් යමරජු වෙත ගෙන දක්වති. යමරජු ළදරු ව මළ මූත්‍ර ගොඩෙහි උඩුකුරුව සිටීම, ලෙඩවීම, ඉඳුරන් දිරා යාමෙන් මහලුවීම, මරණයට පත්වීම යනාදී වශයෙන් තොප වෙත පැමිණි දේවදූතයන් නො දැක්කෙහු දැයි ඔවුන්ගෙන් ප්‍රශ්න කරති. නො දුටුවෙමි ස්වාමීනි'යි පැවසූ කල්හී ඉපදීම, ලෙඩවීම, ජරාව හා මරණය ස්වභාව කොට සිටියදී ප්‍රමාදය හේතුවෙන් ඒවා තේරුම් නොගෙන දුසිරිත්කම් කිරීම තොපගේ මව්පිය ඥති ආදි අන් කිසිවෙකු විසින් කරන ලද ඒවා නොවන බවත්, තොප විසින්ම කළ ඒවා බවත් පවසා එහි විපාක විඳිව් යැයි ඔවුන්ට සිතීමට පවා නොහැකි තරමේ දරුණු වධ හිංසා පමුණුවති.

එයින් ඔවුහු මහත් දුක් විඳිති. මෙය මිනිසුන් වන අපට සාංසාරික ව මුහුණ පෑමට සිදුවන තත්වයක් බව සූත්‍රයේ දක්වයි. මෙම සූත්‍රය ප්‍රබන්ධ කථාවක ලක්ෂණ පෙන්නුව ද ගැඹුරු දර්ශනයක් හා ආචාර විද්‍යාත්මක වැදගත්කමක් සහිත සූත්‍රයකි.

මිහිඳු මහරහතන් වහන්සේ මෙම සූත්‍රය දේශනා කිරීමෙන් සිංහල ජනයාට අපූරු ජීවිත ගැඹුරක් ප්‍රකට විය. එයින් හටගත් සමුත්තේජනය හේතුවෙන් බණ ඇසීමට පැමිණි පිරිස ශීඝ්‍රයෙන් වැඩිවිය. එනිසාම ඇත් හළෙහි අවකාශ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අසල පිහිටි නන්දන උයනෙහි තෙරුන්ට අසුන් පැනවීමට රජතුමාට සිදුවිය. තෙරණුවෝ එහිදී ආසිවිසෝපම සූත්‍ර දේශනාව පැවැත්වූහ.

## ආසිවිසෝපම සූත්‍ර දේශනාව

අප පරිහරණය කරන ශරීරයේ සංයුතියක් වන සතර මහාභූත දරුණු විස ඇති නාගයන් සිවු දෙනෙකුටත්, පඤ්චස්කන්ධය දරුණු වධකයන් පස් දෙනෙකුටත්, අපගේ තෘෂ්ණාව ඇතුළත සැරිසරන වධකයෙකුටත් ආදී වශයෙන් සම කොට මෙහි ආලය දුරුකොට කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන සතර ඕඝයන් තරණය කිරීමෙන් නිර්වාණය සාක්ෂාත් කර ගන්නා ආකාරය මෙම සූත්‍රයේ පෙන්වා දෙයි.

මිහිඳු මහරහතන් වහන්සේ දෙසූ මෙම සූත්‍රය අසා දහසක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ. උන්වහන්සේ දිවයිනට පැමිණි මෙම දෙවන දිනය සවස් භාගය වන විට දෙදහස් පන්සියයක් දෙනා සෝවාන් ඵලයට පත්වූහ. කෙසේ වෙතත් දවස ගෙවී යනු කිසිවෙකුට නො දැනුණි. තෙරුන් වහන්සේ දැන් සවස් වී ඇතැයි මිස්සක පර්වතයට වඩිනු පිණිස සූදානම් විය. රජතුමා බුහුමන් සහිත ව ඒ අසල තිබූ මහමෙවුනා උයන ආවාසයක් වේවායි සඟුනට පූජා කළේ ය. එහි එදින වැඩ විසූ තෙරුන් වහන්සේ පසුදින රජ මැඳුරෙහි දානය වළඳා, නන්දන වනයෙහි දී අනමතග්ගිය සූත්‍ර දේශනා කළහ.

## අනමතග්ගිය සූත්‍ර දේශනා

සංයුක්ත නිකාය නම් ත්‍රිපිටක ග්‍රන්ථයෙහි අනමතග්ගිය සංයුක්තය නමින් වෙනම කොටසක් ඇත. එහි සූත්‍ර රාශියක් වේ. එම සූත්‍ර සියල්ලෙහි ම පැවසෙන්නේ අක් මුල් නැති සංසාරය පිළිබඳව ය. මහණෙනි, මේ සංසාරය අනවරාග්‍රය. මුලක් අගක් නො දත හැක්කේ ය. යැයි තථාගතයන් වහන්සේ විසින් දේශනා කළ කරුණ මෙහි නොයෙක් ආකාරයෙන් විස්තර වේ. සංසාරය කෙතරම් දීර්ඝ කාලයක් ද යන්න පැහැදිලි කිරීමට මෙහි සූත්‍ර රාශියක උපමා දක්වා ඇත. සංසාරයෙහි සැරිසරන කල්හි කෙනෙකු පානය කරන මව් කිරි ප්‍රමාණය සතර මහා සාගරයේ ජලයට වඩා වැඩි බව එක් සූත්‍රයක් දක්වා තිබීම ඉන් එක් නිදසුනකි. මෙතරම් දිගු සංසාරයෙහි අපට අත් විඳීමට සිදුවන දුක් කන්දරාව කොපමණ දැයි මෙම සූත්‍රවලින් සිතා ගත හැකි ය. සැබැවින්ම සංසාරයෙහි සැරිසැරීම දුකක් මිස සැපක් නොවේ. එහි ලැබිය හැකි ආස්වාදය අල්ප ය. දුක් වේදනා අනල්ප ය.

## අග්ගික්ඛන්ධොපම සූත්‍ර දේශනාව

මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කළ පළමු සතියෙහි සයවන දිනයෙහි දේශනා කරන ලද්දේ අග්ගික්ඛන්ධොපම සූත්‍රයයි. **මෙම සූත්‍රය දේශනා කරන බුදුන් වහන්සේ මහත් ගිනි කඳක් පෙන්වා දුසිරිත් කරමින්, දුසිල් ව, පාපී ලෙස හා මිච්ඡා ආජීවයෙන් යුතුව ලෞකික කාම සම්පත් පරිභෝජනය කරමින් ජීවත් වීමට වඩා එම ගිනි කඳ වැළඳගෙන මියයාම උතුම් බව වදාරති.** මිහිඳු මහරහතන් වහන්සේ රට පාලනය කරන්නන්ටත්, රට වැසියාටත් මෙම සූත්‍රය දේශනා කිරීමේ අරමුණ වන්නට ඇත්තේ හොරකම, වංචාව, අල්ලස වැනි පාප ධර්ම කෙරෙන් තොර හා අව්‍යාජ මානව දයාවෙන් යුතු සංස්කෘතියක් සැකසීමට විය යුතු ය. අනෙක් අතින් ආත්මීය පිරිසිදු බව තුළින් ඇතිවන සතුට මිනිස් ප්‍රජාව වෙත ළඟා කරවීම සඳහා විය යුතු ය. මෙම සූත්‍ර දේශනාවත් සමඟ සෝවාන් ඵලයට පත් උතුමන්ගේ සංඛ්‍යාව අට දහස් පන්සීයයක් විය.

## අප්පමාද සූත්‍ර දේශනාව

සත්වන දිනයෙහි රජුගේ අන්තඃපුර බිසොවුන්ට අප්‍රමාද සූත්‍ර දේශනාව අවවාද කළහ. අප්‍රමාදය යනු පමා වීම නොවේ. සතියෙන් හෙවත් සිහියෙන් කටයුතු කිරීමයි. බුදුන් වහන්සේගේ දේශනාවට අනුව සමස්ත බුදු දහම ම මෙම පදයට ඇතුළත් වේ. එතරම් වැදගත්කමක් එහි පවතී. අප්‍රමාදී ව සිහි නුවණින් යුතුව කටයුතු කිරීම සෑම පුද්ගලයෙකුගේ ලෞකික හා ලෝකෝත්තර ජයග්‍රහණයේ සැබෑ රහසයි. මෙම සූත්‍රයෙන් ඔවුනට අවවාද කළ මිහිඳු මහරහතන් වහන්සේ සෑගිරියට වැඩම කළහ.

මෙම සූත්‍ර කිහිපයේ අන්තර්ගතයෙන් පැහැදිලි වන්නේ මිහිඳු මහරහතන් වහන්සේ ඉතා විධිමත් සැලසුමකින් යුතුව මෙරට ජනයාගේ සංස්කෘතිය, ජීවිතාවබෝධය හා සංස්කෘතික හැසිරීම සමස්ත ලෝකයටම ආදර්ශයක් වන පරිදි සැකසීමට ශක්තිමත් පදනමක් දමා ඇති බවයි.





# සීල සුගන්ධය හමා ගිය

# පොසොන් පුන් පොහෝ ද



කොළඹ බෞද්ධාලෝක මාවත නාරද
බෞද්ධ ධර්මායතනාධිපති
ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**තලල්ලේ චන්දකිත්ති හිමි**

**අනුබුදු මිහිඳු මා හිමියන් අප රටට වැඩමවීමෙන් පසුව ශ්‍රී ලංකා ධරණී තලයට බුදු දහමේ මිහිරියාව ලැබුණා. එදා මිහින්තලාවේ මිස්සක පව්වේ දී මිහිඳු මහ රහතන් වහන්සේ දෙවනපෑතිස් රජු වෙත බුදු දහමේ තිබෙන හරය වටහා දීමත් සමගින් රජතුමා ඇතුලු සියලු පිරිස බෞද්ධ උපාසක භාවයෙහි පිහිටා මේ ලක්දිව සිල්වත් පිරිසක් බිහිවීම ආරම්භ වුණා.**

මුව දඩයමේ ගිය තිස්ස රජුට මිහිඳු මාහිමියන් වහන්සේ එහි ආදීනව වදාළා. උන්වහන්සේ තිස්ස රජු දහමට නැඹුරු කරවීමට චූල්ලහත්ථිපදෝපම දේශනාවෙන් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ජනිත කරවා ඉන් අනතුරුව සිදුකළේ පවට ලජ්ජා, භය ඇතිකරලීම යි.

මිහිඳු මා හිමි දේවානම්පියතිස්ස රජුට ලජ්ජා, භය ඇතිකරලීම සඳහා දේශනා කළේ විමානවත්ථු සහ ප්‍රේතවත්ථු දේශනා යි. විමනා වත්ථුවේ පින්කම් කොට දෙව්ලොව ගිය පිරිසත්, ප්‍රේත වත්ථුවේ පව් කොට දුගතියේ ගිය පිරිසත් පිළිබඳ සඳහන් වෙනවා. මේ කාරණා දෙක රජුට පැහැදිලි කරනවාත් සමගම පවට ලජ්ජාව භය ඇතිවුණා. එනිසා ඔවුන් කායික ව, වාචසික ව හික්මුණා. සිල්වන්ත වුණොත් සුගතිගාමි වන බවත් දුස්සීල වුණොත් දුගතිගාමී වන බවත්, රජතුමා තේරුම් ගත්තා. මේ ලෝකයේ ජීවත්වන අප හැමෝම සැපයට කැමැතියි. දුකට අකැමැතියි. සැපට කැමැති නම්, සැප විඳින ප්‍රතිපදාව අනුගමනය කළ යුතු වෙනවා . දුකට අකැමැති නම් දුකෙන් නිදහස් වීමේ ප්‍රතිපදාව අනුගමනය කළයුතු වෙනවා. සැප විඳින ප්‍රතිපදාවට පින කියනවා. පරලොව ජීවිතය සැපවත් කර ගන්නට උපකාරි වෙන මූලික සුබ ප්‍රතිපදාවට යි සීලය කියන්නේ. ඒ සීලයේ තිබෙන වටිනාකම දේවානම් පියතිස්ස රජුට මිහිඳු මාහිමි පැහැදිලි කර වදාළා. පවට භය ඇතිවන විට දුස්සීල බවින් වළකින්න ඔහු පෙළඹුණා. සුගතියේ සිත බැඳෙන විට සිල්වන්ත වුණා.

සීලය කියන්නේ කයෙන්, වචනයෙන් සංවර වීමයි. සිත සංවර වීම ශ්‍රද්ධාවේ ඇති ස්වභාවය යි. මිනිස්සු දුස්සීල වන්නේ කයෙන් සහ වචනයෙන්. ඒ දුස්සීලකම සමාජයට දැනෙන්නේ කය, වචනය අසංවර වන විටයි. මිහිඳු හිමියන් ලංකාවට වැඩම කරන කාලයේ දේවානම්පියතිස්ස රජුට පින, පව පිළිබඳ හැඟීමක් තිබුණේ නැහැ. එනිසයි එතුමා විනෝදයට දඩයමේ ගියේ. ධර්මය ඇසූ රජු පළමුව සිල්වත් වුණා. ඉන්පසු තමන්ගේ අනුගාමිකයන් සීලයේ පිහිටවූවා. ඒ අනුව පංචසීල ප්‍රතිපදාව රාජ්‍ය පාලනයට එක් කරන්නට එතුමා සමත් වුණා. එතුමා ලක්වැසි හැම දෙනාම කයින්, වචනයෙන් සංවර කරලීමට පෙළඹුණා. රාජ්‍ය නීතියට පවා සිල්පද ඇතුළත් කර ලංකා ජන සමාජය සිල්වත් කළා. සතුන් මැරීම තහනම් කොට ආඥාවක් පැන වූයේ සීලයෙන් ලැබෙන සුවය අන් අයටත් ලබා දීමට යි. මිනිසුන් සිල්පද රැක්කා.සීල ප්‍රතිපදාවට ගරු කළා. සීලයෙන් ලැබෙන අභය හෙවත් බිය නැතිව ජීවත්වීමට තිබෙන හැකියාව තහවුරු වුණේ අප මාහිමියන්ගේ පැමිණීමෙන් බව අප තේරුම් ගත යුතුයි.

විවිධ මිථ්‍යාදෘෂ්ඨීන්ට අනුගත ව සිටි ජන සමාජයක් සම්මා දිට්ඨියෙහි පිහිටුවා ඒ සම්මා දිට්ඨිය පූර්වාගමනය වූ සීල ප්‍රතිපදාවට නැඹුරු කරවන්න එතුමාට හැකියාව ලැබුණා. අරිට්ඨ කුමාරයා ප්‍රමුඛ ප්‍රධාන රාජකීය කුමාරවරුන් පැවිදි කර ලංකාවේ සංඝ ශාසනය ඇති කළා. ඒ සංඝ ශාසනය ඇතිකරනවාත් සමගම ලක්දිව සම්බුද්ධ ශාසනය ලක්දිව් තලයේ ස්ථාපිත වුණා. හෙළදිව උපසම්පදා භික්ෂූන් වහන්සේ පහළ වෙනවා සමගම උපසම්පදා සීලය ස්ථාපිත වුණා. ඒ වගේම සංඝමිත්තා රහත් තෙරණියගේ සම්ප්‍රාප්තිය සමගින් අනුලා දේවිය ඇතුලු බිසෝවරු පැවිදි වෙනවා සමග ම මෙහෙණී සස්න ආරම්භ වෙලා ඔවුන් ද සිල්වන්ත වුණා. මේ සැමට හේතු වුණේ මහින්දාගමනය තුළින් ඇති වූ සැබෑ ආලෝකය යි. මේ ආකාරයට ලංකා සංඝ ශාසනයත්, මෙහෙණී සසුනත් නිසා අප ජනතාව සිල්වන්ත කරන්නට අවශ්‍ය මූලික අඩිතාලම වැටුණා. ශාසනයට ප්‍රවිෂ්ඨ වූ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම භික්ෂු ශාසනයත් භික්ෂුණී ශාසනයත් පෝෂණය කළා. ඔවුන්ගේ අවවාද අනුශාසනා තුළින් උපාසක උපාසිකා ගිහි පිරිස නිත්‍ය ශීලය පංචසීලය ලෙසින් පිළිගෙන සිල්වත් ජීවිතයක් ගතකළා.

පවින් වැළකුණා. පවේ ආදීනව දුටු නිසා. පිනෙහි යෙදුණා පින් සිදු කළවිට පිනෙන් ලැබෙන ආනිශංස දැකීමෙන්, පවින් වැළකීමට දුස්සීලයෙන් වැළකිලා කය වචනය සංවර කර ගත්තා. කය වචනය සංවර වීම තුළ සිත එකඟ වෙනවා. සිත එකඟ වීමෙන් සමාධිය වැඩෙනවා. සමාධිය විදර්ශනා ඤාණය පාදක වෙනවා. සීලයෙන් සිල්වත් වූ කෙනෙකුගේ සිත තුළ ගොඩ නැගෙන සමාධිය විපස්සනා නුවණ පහළ කරමින් සියලු කෙලෙසුන්ගෙන් මිදෙන්නට ඒකාන්තයෙන් උපකාර වෙනවා. ඒ ආකාරයට කටයුතු කළ බොහෝ දෙනා සෝවාන්, සකෘදගාමි, අනාගාමි, අරහත් කියන මාර්ගඵලවලට පත්වුණා. ඒ සමගම ලක් දරණී තලයේ බහුතරයක් දෙනා බෞද්ධ ආගම වැළඳ ගැනීමත් සමග ඇතිවූ සම්මාදිට්ඨිය බොහෝ සිත්තුළ ස්ථාවර වුණා. සම්‍යක් දෘෂ්ඨිකයන්ගෙන් ලංකාව පිරී ඉතිරී යන්නට පටන් ගත්තා. එයට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය දේවානම්පියතිස්ස රජතුමා ලබාදුන්නා වගේම, එයට අවශ්‍ය කරන මූලික මාර්ගෝපදේශනය මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලබා දුන්නා.

එදා මිහිඳු මා හිමි ලක්දිව් තලයට වැඩම කර මේ සමාජ පරිවර්තනය සිදුකළේ නැත්නම් අදත් ඇතැම් රටවල උදවිය වගේ අප මිථ්‍යාදෘෂ්ඨී අන්දකාරේ ගිලිලා, කෙ තරම් පව් රැස් කරගෙන සංසාර ගමන දුගතියට හෙළාගෙන ද? එනිසා අප මේ සැම දෙයක් ම ලංකර ගත්තේ උන්වහන්සේගෙන් අපට ලැබුණ ආභාෂය, ධර්මාලෝකය නිසයි. උන්වහන්සේ අපට වදාළ සීලමය ප්‍රතිපදාවේ තිබෙන සුවඳ අප හොඳින් තේරුම් ගත්තොත් එය අප ලැබූ ඉහළම දායාදය යි. සිල් සුවඳ උත්තරීතරම සුගන්දය යි. සිල් සුවඳ දසතම සුවඳ පතුරන ප්‍රබල සුවඳක්. මිහිඳු මහ රහතන් වහන්සේගේ පැමිණීමෙන් ඇති වූ ඒ සීල සුගන්ධය අද දක්වා අඩු වැඩි වෙමින් ලක්දිව තලයේ පවතිනවා.

ඒනිසා අප අද දවසේ කළ යුත්තේ උන්වහන්සේ පැතුරූ ඒ සුවඳ අඩු වෙන්නට නොදී තව තවත් වැඩිදියුණු කිරීම යි. ඒ සඳහා සීල, සමාධි, ප්‍රඥා බහුල වශයෙන් පුරුදු කරගෙන සුවඳ හමන මලක් ලෙස කටයුතු කරන්නට වැයම් කරමු.

**නයනා නිල්මිණී**

## මිහින්තලාවේ ධර්මාලෝකය

පොසොන් පොහෝ දින
මිහින්තලාවම
මෙත් ජලයෙන් සෝදා
මහින්ද මාහිමි සඟුන් පෙරටු කොට
මිස්සක පව්වෙ එදා
බුදුන් දෙසූ බණ තිස්ස රජුන් වෙත
කියා මනස සාදා
ලොවෙන් උතුම් රට කළා මේ පින්බිම
නමදිමු මලින් පුදා

මිහින්තලාවෙන් ධර්මාලෝකය
දසත ම විසිර ගියා
ලක්වැසියන් හැම සිත් තුළ මොහඳුර
සැණෙකින් සැඟව ගියා
දහමින් සැනැහුණු මිනිසුන් බිහිවෙන
පුදබිම් පිරී ගියා
මහ රහතුන්ගෙන් අනුරාපුරයේ
අහස ම වැසී ගියා

ලංකා රජ්‍යයි සම්බුදු සසුනයි
ගහට පොත්ත සේ බැඳී ගියා
හෙළ බොදු ආරට ලක්වැසියන් තම
ජීවන ගමෙන්
යෙදී ගියා
සුබිත මුදිත වූ බත බුලතින් සරු
ගම් බිම් මුළු රට
මැවී ගියා
දෙව් බඹ සේනා හැම වැඳ වැටෙනා
රටකැයි ලෝ තුළ දිලී ගියා

**ගී පද සංකල්පනා**
**තලල්ලේ චන්දකිත්ති හිමි**





ප්‍රංශයේ ජේතවනාරාමාධිපති
ප්‍රංශයේ ප්‍රධාන අධිකරණ සංඝනායක

**මුරුංගාගස්යායේ ඤාණිස්සර නා හිමි**

# පොසොන් උදාවේ දහම් සිසිලස

**බුදුරජාණන් වහන්සේ ලොවට දායාද කළ බුදු දහම, තුන්වන ධර්ම සංගායනාවෙන් පසුව අශෝක අධිරාජයාගේ අධීක්ෂණය යටතේ රටවල් නමයකට ධර්මදූතයන් වහන්සේලා වැඩම කළ ආකාරය ශාසන ඉතිහාසයේ සනිටුහන් වෙනවා. එම රටවල් නමයට අපේ ශ්‍රී ලංකාවත් ඇතුළත් වුණා.**

සමණා මයං මහාරාජ යනුවෙන් එදා මිහිඳු මහරහතන් වහන්සේ දෙවන පැතිස් මහරජුට තමන් වහන්සේ හඳුන්වා දෙමින් ආරම්භ කළ බුදු දහමේ පණිවුඩය මිහිඳු මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මෙහි වැඩම කළ ධර්මදූතයන් වහන්සේලාගේ ද සහායෙන් ලංකාවේ ගම් නියම් ගම් දක්වා පැතිරී ගොස් මුළු රටම බෞද්ධ සංස්කෘතිය තුළින් ඔපවත් වූ ආකාරය ශාසන ඉතිහාසය සනිටුහන් කරයි. එසේ ආරම්භ වූ බෞද්ධ පුනරුදය සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් සමග වැඩම කිරීමත් සමග වඩාත් අර්ථවත් ආකාරයෙන් සිද්ධ කිරීමට මාර්ගය පෑදුණු බව පැහැදිලි ය.

සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමග ශ්‍රේණි දහ අටකට අයත් පිරිස් පැමිණීමත් සමගම ලංකාවේ දියුණුවට විවිධාකාරයේ නිර්මාණයන්ද බිහි වූ බව පැහැදිලි වනවා. අහස් උසට බැඳි දාගැබ්, ලෝවා මහා ප්‍රසාදය වැනි ගොඩනැගිලි, මහසයුර සිහියට නැගෙන අන්දමේ වැව්, සැතපුමකට අඟලක් වන ආකාරයට ඉදිකළ වාරිමාර්ග තාක්ෂණය, සිත් පිත් නැති මහා කළු ගල් තුළ උපශාන්ත බුදුරුව මතුවීම් වැනි විස්කම් වැඩ වසර දහස් ගණනක් ගත වුවද අද ද අපට දක්නට ඇත්තේ එදා ඒ සිදු කළ උදාර මෙහෙවරෙහි ප්‍රතිඵල අනුව බව පෙනී යයි. ඔබ ශ්‍රී ලාංකික බෞද්ධයෙක් නම් අද ඔබ අනුගමනය කරනු ලබන උසස් අන්දමේ සිරිත් විරිත් ආදිය මිහිඳු මහරහතන් වහන්සේ අපට දායාද කර දුන් ප්‍රතිඵල බව කල්පනාවට ගත යුතුය.

අද භික්ෂූන් වහන්සේලා සිවුර පොරවාගෙන ආගමික කටයුතුවල නිරත වන්නේත්, ඔබ සුදු රෙදි පොරවාගෙන සිල් සමාදන්ව කටයුතු කරන්නෙත් මවුපිය ගුරුවර වැඩිහිටි ආදීන්ට ගෞරව දක්වා කටයුතු කරන්නෙත්, එදා දුන් එම දායාදයේ ප්‍රතිඵල නිසා බව අප වටහා ගත යුතු ය. මිහිඳු මහරහතන් වහන්සේ දෙසූ දහම් තුළින් පෝෂණය ලබා අතීතයේ ජීවත් වූ සිංහල ජනතාව ආදර්ශමත්, ගුණගරුක ජීවිතයක් ගතකළ බව ඉතිහාසයේ සඳහන් වෙනවා. රොබට් නොක්ස් ලංකාව ගැන ලියා ඇති සටහන්වල එය මනාව පැහැදිලි වෙනවා. “ඔවුහු (ලාංකිකයෝ) බේබදුකමට පිළිකුලක් දක්වති. මෙම පුරුද්දට ඇබ්බැහි වූ අය ඔවුන් අතර සුලබ නොවෙති. අන්සතු දෙයක් ගැනීම පිළිකුල් කරති.” ඉංග්‍රීසි පාලකයන්, සඳහන් කළේ මිනිසුන් දහස් ගණනක් අනුරාධපුරයට එක්රොක් වුවත් කිසිදු පොලිස් නිලධාරියෙකු නොමැති ව ඒ හැම දෙනෙක් ම කිසිදු කලබලයකින් තොරව ඉතා සන්සුන් ආකාරයෙන් ආගමික වතාවත් සිදුකර ආපසු විසිර යන ආකාරය පුදුමයක් බවයි. මේවා අද හිතන්නට ඕන දේවල්. මේ වන විට ඉදිරි අනාගත පරපුර සකස් කළ හැකි ද යන්න ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙන්නේ. මේ සඳහා බලපාන කරුණු අතර මත් වතුර අංක එකට බලපාන බව පෙනෙනවා.

එදා මත් වතුර පානය කිරීමට පිළිකුල් කළ සිංහලයා බේබදුකමට පුරුදු කළේ ඉංග්‍රීසි පාලකයෝ ය. ලංකාණ්ඩුකාර විලියම් ගෙගරි ලාංකිකයන් අතර මත් වතුර ප්‍රචලිත කිරීම පිණිස මහත් උනන්දුවෙන් කටයුතු කරපු කෙනෙක්. රට වැසියන් අකමැති වුවත් ඒ ගැන නොසලකා රටේ අස්සක් මුල්ලක් නැර ම සෑම ගමකම ඔහු විසින් තැබෑරුම් පිහිටවනු ලැබුවා. මත් වතුර පානය කිරීමෙන් ලැබෙන රසය කුමක්දැයි පෙන්වීමට මත් වතුර නොමිලේ බෙදා හැරීමට සිදු වෙනවා. අවුරුදු කීපයකට කලින් මත්පැන් බීමට පෙළඹිය හැකි මිනිසුන් සියයට එක් අයකුවත් නොසිටි පළාත් ගැන මම දන්නවා.

විදේශ ආක්‍රමණ නිසා අපේ තිබූ සාරධර්ම බොහෝවිට ගිලී ගිය බව ඉතිහාසය පුරාවටම දකින්නට ලැබෙන දෙයක්. දරුවන් හදා වඩා වර්ධනය කිරීමේ දී මවුපියන්ට බුදු දහමෙන් දී ඇති උපදේශ වන්නේ වැරැදි වැඩ වලින් ඉවත් කර යහපතෙහි පිහිටුවා ළමයන්ට ඉගෙනීමක් ලබා දිය යුතු බවයි.

එහෙත් මේ වන විට ගුණධර්ම කෙසේ වුවත් මොන ක්‍රමයකින් හෝ උසස් ඉගෙනීමක් ලබා දී උසස් රැකියාවකට යොමු කිරීමට බොහෝ දෙමව්පියන් උත්සාහ කරන්නේ. ‘ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු’. ගුණයෙන් යුතු දරුවෙක් තමන්ගේ දෙමව්පියන් කවදාවත් අතරමං කරන්නෙ නැහැ මේ නිසා තමයි අංක එකට ගුණයත්, දෙකට දැනුමත්, තුනට හැකියාව ත් ඇති දරුවන් උසස් බව සඳහන් කර තියෙන්නේ. වාසනාවට වගේ අදත් තම මව්පියන් ඇස්දෙක වාගේ ආරක්ෂා කරන දූදරුවන් ද අප සමාජයේ දක්නට ලැබෙනවා වැඩිහිටියන් මහ මග දමා යන දරුවන් ගැන අප කතා කරනවා.

සමහරවිට කුඩා වයසේ තම මව්පියන් කළ වැරැදි නිසා ඒ දරුවන් එසේ කරනවා වන්නට පුළුවන්. එම ක්‍රියාව නිවැරැදි යැයි කීමට උත්සාහ ගන්නවා නෙවෙයි. කුඩා කාලය තුළ තමන්ට දකින්නට අසන්නට ලැබෙන දේ පසුකාලීන ව තම ජීවිතයට උපයෝගී කර ගන්නා ආකාරය පැහැදිලි කිරීමටයි අවශ්‍ය වන්නේ. කුඩා දරුවා නිතර අනුගමනය කරන්නේ වැඩිහිටියන් කරන දේ. කතා කරන්නේ වැඩිහිටියන් කතා කරන භාෂාව. තරුණ පුතෙක් තම වයසක පියාට වතුර දුන්නේ පොල් කට්ටක. කෑම දුන්නෙ පුවක් කොළයක. දවසක් කෑම දෙන්න සොයන විට ඒ දෙකම හොයාගන්නට බැරි වුණා. ඔහුට හිටිය පුංචි පුතෙක්. ඒවා කෝ කියලා පුංචි පුතාගෙන් ඇසූවිට, උඹ වයසට ගියාට පස්සේ කෑම දෙන්න මම ඒවා අරන් තිබ්බා කියලා උත්තර දුන්නා. කරුණු තේරුම් ගත් තරුණ පුතා ඉන්පසු තාත්තාට හොඳින් සංග්‍රහ කළා.

පුංචි ළමයින් කතා නොකළාට ඔවුන්ට ඇතිවන හැඟීම් මේ කථාවෙන් පැහැදිලි වෙනවා. වැඩිහිටියන් ළමයෙකුගෙන් ඉගෙන ගත යුතු පාඩම් මේවා. මේ නිසා වැඩිහිටියන් තමන් කරන කටයුතු පිළිබඳ ව අවබෝධයක් ඇතිව දරුවන්ට ආදර්ශයක්වන ආකාරයට කටයුතු සිදු කළ විට එමගින් තමන්ට සැනසීමක් උදාකර ගන්නට හැකි වනවා.

එදා පොසොන් පොහෝදා සාරධර්ම ඇතුව ආරම්භ වූ මෙම සංස්කෘතිය තව දුරටත් ඉදිරියට ගෙන යාමට අධිෂ්ඨාන කරගෙන වැඩි පිරිසක් කටයුතු කරන්නේ නම් ලාංකික ජන සමාජය යහපත් එකක් බවට පත් කිරීම අසීරු නොවන බව සඳහන් කළ හැකිය ඒ සඳහා ඔබට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද හිමි වේවා.

## කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ උපසම්පදා විනය කර්මය කල්යයි

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ වාර්ෂික උපසම්පද පුහුණු වැඩ සටහන ජුනි මස 24, 25, 26, 27 දිනයන්හි කෝට්ටේ රජමහා විහාරස්ථානයේ පැවැත්වීමට නියමිතව තිබූ අතර එම උපසම්පද විනය කර්මය දින නියමයක් නොමැතිව කල් දමා ඇති බව එම සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරි අග්ගමහා පණ්ඩිත මහාචාර්ය කොටපිටියේ රාහුල අනු නා හිමියෝ දන්වා සිටිති.

## පිහිට පතයි

වකුගඩු රෝගියකු සඳහා ඕ පොසිටිව් හෝ ඒ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇති බැවින් පරිත්‍යාගශීලියෙකු වෙතොත් 0779660192 දුරකතනයෙන් අමතන්නැයි ඉල්ලීමක් කෙරේ.

# සිත පහදවාගෙන තෙරුවන් ගුණ සිහි කරමු

**ශ්‍රී ලංකාද්වීපයට ආලෝකය උදා වූයේ අද වැනි පොසොන් පෝය දවසකයි. විශේෂයෙන්ම තුන් සරණය අපට ලැබුණේ මේ පොසොන් පෝය දවසේයි. එදා මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කර එකල රජකළ දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු ලාංකික පිරිස උතුම් තිසරණයේ පිහිටුවූවා.**

එදා දේශනා කළ උතුම් සූත්‍ර දේශනාව මජ්ඣිම නිකායේ පළමු කොටසේ පළමු සූත්‍රය වන චූල්ලහත්ථි පදෝපම සූත්‍රයයි. හස්තියෙකුගේ පියවර සටහනට උපමාකර වදාළ දේශනාව. එහිදී විශේෂයෙන් දේශනා කරන්නේ පුද්ගලයෙක් තුණුරුවන් සරණ අවබෝධයෙන් ස්ථාවරව පිහිටන ආකාරයයි. බොහෝ බෞද්ධයන් මෙම සූත්‍රයේ නම දන්නා නමුත් කියවා නැති බවට බොහෝ දුරට විශ්වාසයි. ඒ නිසා මේ පොසොන් පෝය දවසේ බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් ශ්‍රේෂ්ඨ දේශනාව කියවීමට අධිෂ්ඨාන කර ගත යුතුයි.


තිසරණයට පත්වීම පහසු කටයුත්තක් නොවේ. බුද්ධං සරණං ගච්ඡාමි. ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි යැයි කියූ පමණින් කෙනෙකු තිසරණයට පත් වන්නේ නැහැ. පළමුවෙන් ම ඒ තුන් සරණය ඉගෙන ගන්නට ඕනේ. බුදුරජාණන් වහන්සේගේ ගුණ, ශ්‍රී සද්ධර්මයේ ගුණ, ආර්ය මහා සංඝරත්නයේ ගුණ අප පිළිවෙළින් අර්ථ සහිත ව ඉගෙන ගන්නට අවශ්‍යයි. ඉන්පසුව ඒ ගුණ පිළිබඳ ඇතිකරගන්නා වූ පැහැදීම මත අචල වූ ශ්‍රද්ධාවක්, ඇතිකරගන්නට ඕනේ.

බුදුරජාණන් වහන්සේගේ ගුණ කදම්භය කැටි කොට දේශනා කළ සූත්‍ර දේශනා 18000 ක් පමණ ගුණ නවයකට වෙන්කර තිබෙනවා. ඒ තමයි අරහං සම්මා සම්බුද්ධෝ ,විජ්ජා චරණ සම්පන්නෝ , සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ , පුරිසධම්මසාරථී, සත්ථා දේවමනුස්සානං බුද්ධෝ, භගවාති.

බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ සේක. අපත් රහසින්වත් පව් කරන්නේ නැතිව සැම මොහොතකම අවංක ලෙස ජීවත්වීමට උත්සාහ කළ යුතුයි. බොහෝ පිරිසක් බාහිරව එක ප්‍රතිරූපයක් අභ්‍යන්තර ව තවත් ප්‍රතිරූපයක් පෙන්වන්නේ. අභ්‍යන්තරයේ සිටින්නේ අඩුපාඩු සහිත පුද්ගලයෙක්. බාහිරව සිටින්නේ ගුණ සහිත පුද්ගලයෙක් නම් අභ්‍යන්තරයේත් ඒ ගුණ සහිත පුද්ගලයෙක් සිටිය යුතුයි. ඒ සඳහා ක්‍රම ක්‍රමයෙන් අපේ අඩුපාඩු හදාගැනීමට උත්සහ ගන්නට ඕනේ. ඒ සඳහා මේ අරහං බුදුගුණය ඉතා වැදගත් වෙනවා. බුදුරජාණන් වහන්සේගේ අනෙක් බුදුගුණවල තියෙන ගුණ අපට ගන්නට පුළුවන්කමක් නැහැ. සම්මා සම්බුද්ධ ගුණය, අසම සම වූ බුදු කෙනෙකුට පමණක් ආවේණික වූ ගුණයක්. විජ්ජා චරණ සම්පන්නෝ, සුගත ලෝකවිදූ, අනුත්තරෝ, පුරිසදම්ම සාරථී, සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා යන ගුණ සියල්ලම උන්වහන්සේටම පමණයි.



> බොහෝ පිරිසක් බාහිරව එක ප්‍රතිරූපයක් අභ්‍යන්තර ව තවත් ප්‍රතිරූපයක් පෙන්වන්නේ. අභ්‍යන්තරයේ සිටින්නේ අඩුපාඩු සහිත පුද්ගලයෙක්. බාහිරව සිටින්නේ ගුණ සහිත පුද්ගලයෙක් නම් අභ්‍යන්තරයේත් ඒ ගුණ සහිත පුද්ගලයෙක් සිටිය යුතුයි. ඒ සඳහා ක්‍රම ක්‍රමයෙන් අපේ අඩුපාඩු හදාගැනීමට උත්සහ ගන්නට ඕනේ



**පොල්පිටිමුකලානේ පඤ්ඤාසිරි හිමි**

අප ඒ ගුණවලට සත්කාර කරමින් , ගරුකරමින් පළවෙනි බුදුගුණයේ ආදර්ශය අපේ ජීවිතයට ගැනීමෙන් ම අපේ ජීවිත සාර්ථක කරගන්න පුළුවන්. ධර්මය ගැන කියවෙන විට ධර්මය ගැනත් ඉගෙන ගන්නට ඕනේ. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ – මේ ධර්මය මුල මැද අග යන සැම තැනම යහපත් වන පරිදි මැනවින් දේශනා කර තිබෙනවා. අප ධර්මය ඉගෙන ගන්නට ඕනේ. ඇතැම් පිරිස් වෙනත් දේවල් ගොඩාක් ඉගෙන ගත්තත් ධර්මය ඉගෙන ගැනීමට වැඩි කැමැත්තක් නැහැ. ධර්මය ඉගෙන ගැනීමට ශ්‍රද්ධාව තිබිය යුතුයි. බුදුරජාණන් වහන්සේගේ අවබෝධය පිළිගන්නට ඕනේ. සූත්‍ර ධර්ම බොහෝ තිබෙනවා, ඒ ප්‍රමාණයෙන් මිහිඳු මහරහතන් වහන්සේ දේශනා කළ සූත්‍ර ටිකවත් අවබෝධ කරගැනීම අපේ ජීවිත සකස් කරගැනීමට ප්‍රමාණවත්. ඒ අතර චූලහත්ථි පදෝපම සූත්‍රය, සමචිත්ත පරියාය සූත්‍රය, විමාන වත්ථු, පේත වත්ථු, ප්‍රධාන තැනක් ගන්නවා. විමාන වත්ථු කියන්නේ පින්කරලා දිව්‍ය ලෝකවල ගිය අයගේ කථා පුවත්, පේත වත්ථු කියන්නේ පව් කරලා ප්‍රේත ලෝකවල උපදින කථා පුවත්.

සච්ච සංයුක්තයේ චතුරාර්ය සත්‍ය පිළිබඳ දේශනාව තියෙනවා. ආසිවිසෝපම සූත්‍රය විෂ සහිත සර්පයන්ට උපමා කර කළ දේශනාවක්. බජ්ජනීය සූත්‍රය රූපය පිළිබඳ කෙරෙන දේශනාවක්. ඊළඟට ධම්මචක්කපවත්තන සූත්‍රය, එනම් ප්‍රථම ධර්ම දේශනාව, මේ මූලික දේශනා කිහිපයක් ඉගෙන ගැනීමෙන් අපේ ජීවිත සාර්ථක කරගන්න පුළුවන්. ඒ නිසා මේ ධර්මය ස්වාක්ඛාතායි. අකාලිකයි. ඕනෑම කාලයක අවබෝධ කරගන්න පුළුවන්. ඒහි පස්සිකෝ – ඇවිත් බලා පිළිගන්න කියන්න තරමට නිර්මල ධර්මයක්. ඕපනයිකෝ – තමන්ගේ ජීවිතයට ගළපා බලා පිළිගන්නට ඕනේ. විශේෂයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය තමන්ගේ ජීවිතයට ගලපා බලන්න පුළුවන්. තරුණ කෙනෙක් වයසට යාමේදී සියල්ල අනිත්‍ය බව පෙන්නුම් කරනවා. ඒ වෙනස්වීම දුකක්. අපට අවශ්‍ය ආකාරයට පවත්වාගෙන යන්න බැහැ. එය අනාත්ම වශයෙන් හඳුන්වනවා. තම තමන්ගේ නුවණට අනුවයි මේ ධර්මය තේරුම් ගැනීමේ හැකියාව තිබෙන්නේ. සමහරුන්ට නුවණ නැති නිසා බුද්ධ දේශනාව තේරෙන්නේ නැතිව විවිධ අර්ථකථන දීලා බුද්ධ ධර්මය විකෘති කරනවා.

ඊළඟට ශ්‍රාවක සංඝරත්නයේ ගුණ අප ඉගෙන ගන්නට ඕනේ. අප තනි භික්ෂූන් වහන්සේ නමකගේ ගුණයක් දැක පහදිනවා. අගුණයක් දැක අපහදිනවා. නමුත් මෙහි තිබෙන්නේ එසේ නොවෙයි.

උන්වහන්සේ රාග, ද්වේශ, මෝහ ප්‍රහාණය කිරීමේ මාර්ගයට පිවිසි උත්තමයෝ ය. ඍජු ප්‍රතිපදාවේ නැතිනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීමයි. චතුරාර්ය සත්‍ය අවබෝධ කර තිබීම දෙතිස් මහා කතාවලින් වැළකී දස කතාවෙන් යුක්තවීමයි. පුද්ගලයන් වශයෙන් අට දෙනයි. යුගය වශයෙන් හතරයි. උන්වහන්සේලාට දුර සිටද දානය පිළිගැන්වීමට සුදුසුයි. තමන්ගේ නිවෙස්වලට වැඩම කළ විට දන්දීමට සුදුසුයි. නිවන අරමුණු කර දන් පිළිගැන්වීමට සුදුසුයි. ලෝකවාසීන් විසින් නමස්කාර කිරීමට සුදුසුයි. ලෝකවාසීන්ට පින්සිදු කර ගැනීමට තිබෙන පුණ්‍ය ක්ෂේත්‍රය. උන්වහන්සේලාට දන්පැන් පූජාකර පින් රැස් කර ගන්න.

තනි භික්ෂුවක් අරමුණු කරගෙන දෝෂාරෝපණය කරමින් සිටියොත් විශාල අකුසල කර්ම රැස්කර ගන්නවා. ඒ නිසා ඔබ කළ යුත්තේ මහා සංඝයාට දානය පූජාකර පින් රැස්කර ගැනීමයි. ඒ පින් රැස්කර ගැනීම සුගතියට යාමට උපකාර වෙනවා. මේ ශ්‍රේෂ්ඨතම රත්න තුන අපට ලැබුණේ අද වැනි පොසොන් පොහෝ දවසකයි. මේ තුන්සරණේ සරණ ගියොත් අනිවාර්යෙන්ම ඒ තැනැත්තාට සුගතියට යාමට ලැබෙනවා.

යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේගේ සරණ යනවනම් ඒ කෙනා සතර අපායට යන්නේ නැහැ.

මිනිස්කය අතහැරියාට පසුව දෙව්ලොව උපත ලබනවා

අප දිව්‍ය ලෝකයක ඉපදුණොත් එහි බොහෝ කාලයක් ආයුෂ විඳින්න පුළුවන්. මාර්ගඵලලාභී දෙවිවරු ඇසුරු කරන්නට පිළිවන්. ඒ සත්පුරුෂ දෙවිවරු ඇසුරු කර නිවන් මාර්ගයට අවතීර්ණ වීමට අපට හැකියාව ලැබෙනවා.

අද මනුස්ස ලෝකය පංචකාමයට ගොදුරු වූ මඩ ගොහොරුවක් බවට පත්වෙලා තියෙන්නේ. ඒ නිසා තිසරණය තුළ ස්ථාපිත වුණු කෙනා ශීලය දියුණු කරගතහොත් සංයුක්ත නිකායේ උත්පත්ති සංයුක්තයට අනුව සෝතාපන්න මට්ටමකට ජීවිතය සකස්කරගන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ නිසා ඔබත් මේ උදාර දවසේ උතුම් තිසරණය තුළ අවබෝධයෙන් සරණ ගොස් තම පවුලේ සියලු දෙනාම ඒ තත්ත්වයට පත්කර ගෙන උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්නට අධිෂ්ඨාන කරගන්න. ඔබ සැමට තෙරුවන් සරණයි.

අයන්ති විතාන



# ඉලක්ක ජය ගැනීමට ඉවසීම පුහුණු කිරීම

**අනුරාධපුරයේ සිටි ලෝමසනාග නම් භික්ෂූන් වහන්සේ නමක් සීත කාලයේ එක් දිනක සක්මන් මළුව කෙළවර වෙවුලමින් සිටින කල්හි එහි පැමිණි උන්වහන්සේගේ ශිෂ්‍ය හිමියෝ “ස්වාමිනි, පිටත අධික සීතලයි. ඇතුළට වඩින්නැ’යි පැවසූහ. එවිට ගුරු හිමි,**
**“පොඩි නම, මම සීතලට බය හෙයින් එළියේ සිටිමි”**
**යනුවෙන් පැවසූහ.**
**“සීතලට බය නම් පිටත සිටීම නො මැනවැ”යි**
**ගෝල හිමියන් පැවසූ කල්හි**
**ලෝකාන්තරික නරකේ යනුවෙන්**
**“ලෝකයේ සීතල දරුණු” යැයි**
**ලෝමසනාග හිමි පැවසුවේ ය.**

තවත් අවස්ථාවක දැඩි උෂ්ණයක් පවතින එක් දිනක ලෝමසනාග හිමි දහඩිය වගුරුවමින් ආවාස ගෙයින් පිටත සිටිනු දුටු ශිෂ්‍ය හිමියෝ

‘ස්වාමිනි, දහඩිය දමමින් අව්වේ සිටින්නේ ඇයි? ඇතුළට ව ඩින්නැ’යි පැවසුවේ ය. එවිට “පොඩි නම මම උෂ්ණයට බිය නිසා පිටත සිටිමි. අපායේ ගිනිදැල් මෙයට වඩා අධික උෂ්ණයක් ගෙන දෙන්නේය”යි ලෝමසනාග හිමි පැවසුවේ ය. ලෝමසනාග හිමි මෙන් සීතල හා උෂ්ණත්වය දරාගැනීමට අපට ද ශක්තියක් තිබිය යුතු ය. ශීත හා උෂ්ණත්වය මෙන් ඇනුම් බැනුම්, කීර්ති ප්‍රශංසා ආදියේ දී ද අප ඉවසිය යුතු ය.

අටුවාවේ මෙවන් කතා පුවතක් ද දක්නට ලැබේ. දකුණු පළාත හෙවත් මාගම තේකිකඅභය නම් හිමි නමක් රාත්‍රි පහන් වන තෙක් ධර්මය දේශනා කළ අතර, ධර්ම ශ්‍රවණයට බොහෝ ගිහි පැවිදි පිරිස් පැමිණියහ. දේශනාව අතරතුර සමහරු පිරිකර පූජා කළහ. මෙය දුටු එක් භික්ෂූන් වහන්සේ නමක් ඊර්ෂ්‍යා පරවශ සිතිවිල්ලෙන්

මේ තේකිකඅභය කුමක් කරන්නේ ද?

බණ කියනවා යැයි මෙහි කෝලාහල කරන්නේ ය. ඔය කියන්නේ බණ ද? ආදී වශයෙන් දෙස් පැවරුවේ ය.

දේශනාව අවසානයේ තේකිකඅභය හිමි ධර්ම ශාලාවෙන් පිටතට වඩින කල්හි දෙස් පැවරූ භික්ෂුව ද පිටව ගියේ ය. ඔවුනොවුන් හඳුනා නො ගෙන භික්ෂූන් වහන්සේලා දෙදෙන ගමන් කළ අතර ගව්වක් පමණ දුර යන තෙක් වියපත් භික්ෂූන් වහන්සේ තේකිකඅභය භික්ෂූන් වහන්සේට දෙස් නගමින් ගමන් කළේ ය.

ගව්වක් ගිය තැන උන්වහන්සේ වෙන් වූ අතර එහි දී තේකිකඅභය භික්ෂූන් වහන්සේගේ ශිෂ්‍ය හිමියන් සිය ගුරුහිමි අමතා “ස්වාමීනි, ඔබ වහන්සේ රාත්‍රි



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
මහාචාර්ය
**මැදගොඩ අභයතිස්ස හිමි**

එළිවන තුරු ධර්මය දේශනා කළමුත්, ගව්වක් පමණ දුර, ගව්වක් බැණුම් අසමින් නිහඬ ව ආවේ ඇයි දැයි විමසුවේ ය. එවිට ගුරුහිමි පවසා සිටියේ දෙස් නැගීම උන්වහන්සේට අයත් කාර්යයක්. ඉවසීම මට අයත් වැඩක්” යනුවෙනි. එනයින් පැහැදිලි කරන්නේ ඉවසීම අප තුළ ඇති කරගත යුතු මහඟු ගුණ ධර්මයක් බවයි.

ඉවසීම සඳහා අප ආශ්‍රව දැක්විය යුතු ය. කිසියම් අකැමැති අරමුණක් අප තුළ හටගත් කල්හි රත් වූ උණ කටුවේ රසදිය කඳ ඉහළ යන්නා සේ, වේදනාත්මක ස්වරූපයක් අප ශරීරය තුළ ක්‍රියාත්මක වේ. අපට යම් ද්වේෂ සහගත සිතිවිල්ලක් ඇති වූ බැව් දැනගත් විට තමන්ගේ දුර්වලකම පිළිබඳ ව සිතිය හැකි ය. එහෙත් අප නිරන්තරයෙන් කරන්නේ අනුන්ගේ දුබලකම් පිළිබඳව සිත යොමු කිරීමයි. එය වැරැදි ක්‍රියාවකි. එනයින් එකම ආකාරයේ ක්‍රියාවන් දෙකක් දෙයාකාරයකින් ක්‍රියාත්මක වන බව ප්‍රත්‍යක්ෂ වේ.

ආක්‍රෝශ බ්‍රාහ්මණයා බුදුන් වහන්සේට පරිභව කළ අවස්ථාවේ දී, චිංචිමානවිකාව බුදුන් වහන්සේ බරපතළ චෝදනාවකට ලක්කළ අවස්ථාවේ දී, ලොව්තුරා බුදුන් වහන්සේ කලබලයට පත් නොවූ සේක. යම් සිදුවීමක් පුද්ගල මනසට බලපානු ලබන්නේ ඔහු සිතන පිළිවෙළ අනුව ය. යමෙක් අපට දෙස් නගන විට ඉවසා නිහඬව නො සිට යම් ප්‍රතික්‍රියාවකට පෙළ ඹුණහොත් එතැන් සිට එම වරදට අපි ද, හවුල්කරුවන් වෙමු. එසේ නම් තමන් අත වරදක් නො මැති බව හොඳින් දත් පුද්ගලයන් බාහිරෙන් පැමිණෙන ආක්‍රෝෂාදියේ දී කම්පා නොවීම ඉතා වැදගත් කාරණාවකි.

එක් අවස්ථාවක අපට හමු වූ 55 වියැති මවක් බෝගම්බර සිපිරි ගෙදර මරණීය දණ්ඩනයට නියම වී සිටියා ය. ඇය විසින් කරන ලද වරද පිළිබඳ ව විමසීමේ දී දැනගන්නට ලැබුණේ සිය ස්වාමියා අනියම් සම්බන්ධතාවයක් පැවැත් වූ කාන්තාවක් වෙත ගොස් එම සම්බන්ධය නවත්වන මෙන් ඉල්ලීමක් කළ ද ඇය එයට අවනත නොවූ හෙයින්, අසල තිබූ ආයුධයකින් ගසා ඇය මරණයට පත් කළ බවයි. ඒ අනුව මරණකාරියට මරණීය දණ්ඩනය නියම විය. ගැටුම සිදු වූ අවස්ථාවේ දී ඇය ඉවසීමෙන් ක්‍රියා කළේ නම් ඇගේ ජීවිතය අදත් ආරක්ෂිත ව පවතිනු ඇත.

වත්මන් සමාජය තුළ ළමා පරපුරේ ඉවසීම අතිශයින් දුර්වල තත්ත්වයක පවතී. අධ්‍යාපනය ලබන දරුවන් සිය ඉගෙනීම කළ යුතු ය. ඉවසීමක්, දරාගැනීමක් ඇති පුද්ගලයා සමාජයේ ජයග්‍රාහකයෙක් වනු ඇත. එසේ සැප හා දුක දරාගැනීමට අප පුරුදු වීම ජීවිතය ජය ගැනීමට මහත් උපකාරයක් වනු ඇත.

මෑත යුගයේ අප රටේ විසූ කීර්තිධර ව්‍යාපාරිකයෝ ඉතා දුක සේ ජීවිත අරඹා ව්‍යාපාර ලොව හිණිපෙත්තට ම නැඟී අය වන අතර, ඔවුන් දරාගැනීම සම්බන්ධයෙන් අපට කදිම උදාහරණ ලබාදෙන්නෝ වෙති. බුදුන් වහන්සේ පූරණය කළ ඛන්ති පාරමිතාව, වීර්ය පාරමිතාව, අධිෂ්ඨාන පාරමිතාව මෙහි වැදගත්කම අපට මැනවින් පැහැදිලි කරයි.

දීපංකර බුද්ධ පාමුල නියත විවරණ ලැබූ බෝසතාණන් වහන්සේ තනිව අරහත් බව ලැබීම පසෙක ලා සසර දුක තෝරා ගත්තේ උන්වහන්සේ තුළ තිබූ, ශාන්ති, වීර්ය, අධිෂ්ඨාන පාරමී ගුණ හේතුවෙනි.

පොළොවෙහි රෝපිත ඉන්ද්‍රඛීලය සිවු දෙසින් හමා එන සුළඟින් නො සෙල්වෙන්නා සේ අකම්පිත ජීවිතයක් සකස් කරගත් පුද්ගලයා ඉදිරියට ම ගමන් කරනු ඇත. සැපත තුළ ගොඩනැගී ජීවිතයක් ගත කරන්නන්ට නිවනට යාම අපහසු කාර්යයකි. නිවන ලැබීම සඳහා අප ධර්මයෙන් සන්නද්ධ විය යුතු ය. ඉලක්කයක් කරා යාමට හොඳ දරාගැනීමේ හා අධිෂ්ඨාන ශක්තියක් ඇති විය යුතු ය. අද විවාහ ජීවිත දෙදරායාම ආදියට පදනම් වන්නේ ඉතා පහසුවෙන් විසඳා ගත හැකි සුළු කාරණාවන් බව පැහැදිලි ය. අන්‍ය මත ගරු නො කිරීම හා ආධ්‍යාත්මික ශක්තියක් ගොඩනගා නො ගැනීම නිසා ඉතා සුළු කාරණාවන් උදෙසා මිනිසා මිනී මරා ගනී. දරා ගැනීම පුහුණු කොට, චිත්තය දමනය කරගත යුතුවේ.

ස්ථාවර, නො වෙනස්වන ජීවිත සකස් කරගත් රහතන් වහන්සේලා සැනසීමට පත් වූහ. දෙස් පරොස්, නින්ද – අපහාස ආදියෙන් ජීවිතය දුකට පත් කරගැනීම ධර්මය අපේක්ෂා නො කරන හෙයින් අපි අකම්පිත ජීවිත ඇති කරගැනීමට උත්සාහ කළ යුතු වෙමු.

## ඓතිහාසික තිස්සමහාරාම මහ විහාර පෙරහර

පොසොන් පුන් පෝ දින (05) තිස්සමහාරාම පොසොන් මහ පෙරහර මේ වසරේදීත් 120 වන වරට පැවැත්වීමට තීරණය කර ඇත.

රටෙහි පවතින වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂය තුළදී පෙරහර සීමා කර ඇත.

පෙරහරට සමගාමීව මැයි 27 සිට ජුනි 05 දක්වා බෝධිපූජා පින්කම ද, මැයි 29 සිට ජුනි 04 දක්වා සති පිරිත් දේශනාව ද, ජුනි 04 දින දේවදූත පෙරහර සහ දෙරකඩ අස්න අනුශාසනාව ද ජුනි 05 වැනිදා මහා සංඝ දක්ෂිණාව ද, ජුනි 06 දින පුණ්‍යානුමෝදනා බෝධි පූජාව ද, 10 වැනිදා දේව ශාන්ති කර්මය ද, 11 වැනිදා දේව දනය ද පැවැත්වීමට නියමිත බව තිස්සමහාරාම සඳගිරි උභය විහාරවාසී ගලගම ධම්මදින්න හිමියෝ දන්වා සිටියි.



# මිහිඳු මා හිමි චරිතයෙන්...

**ධර්මාශෝක රජුගේ පුත්‍ර රත්නය වූ මිහිඳු මහ රහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වසර 236ක් ගත වූ තැන ලංකාවට වැඩම කර ගෞතම බුදු සසුන ලංකාවේ ස්ථාපිත කළා. අද අප කතා කරන්නේ ලංකාවට වැඩම කිරීමට පෙර මිහිඳු මා හිමි චරිතයේ අංශු මාත්‍රයක් පිළිබඳව යි.**

බින්දුසාර මහ රජු ධර්මාශෝක කුමාරයාට යුවරජ පදවිය ලබා දී අවන්ති රට භාර දුන්නා. අශෝක යුවරජු අවන්ති රටට යන අතරේ එහි නගරය වන උජ්ජේනි නුවරට යන්නට කලින් වේදිසගිරි නගරයේ දේවා නම් සිටුවරයාගේ මාළිගයේ නවාතැන් ගත්තා. ඒ සිටුතුමාට ඉතා ශෝභා සම්පන්න දියණියක් සිටියා. ඇය දේවි කුමරිය යි.

ඒ කුමරිය දුටු අශෝක යුවරජුට ඇ පිළිබඳ සිතක් ඇතිවුණා. තම සිතෙහි හට ගත් කරුණ සිටුතුමාට දැනුම්දුන් විට ඔවුන් තම දියණිය අශෝක යුවරජුට සරණ පාවා දුන්නා. අශෝක කුමරු නිසා දේවි කුමරියගේ කුසින් ඉතා පින්වන්ත කුමාරයෙක් උපන්නා. කුමරුට 'මිහිඳු' යන නම ලැබුණා. පුතු ලැබී වසර දෙකක් ගත වූ විට දේවි කුමරියට සංඝමිත්තා නමින් දියණියක් ද ලැබුණා. අශෝක කුමරු පාටලී පුත්‍රයේ රජකමට පත් වෙද්දී දේවි කුමරිය තම දරුවන් දෙදෙනා පාටලීපුත්‍රයේ දරුවන්ගේ පියාණන් ළඟට පිටත් කර එව්වා. ඇ දිගටම වේදිස නගරයේ සිටු මැදුරේ ම වාසය කළා .

ධර්මාශෝක රජතුමා හිස් වූ යුවරාජ පදවිය මහින්ද කුමරුට බාර දීමට කැමැත්තෙන් සිටියා. එහෙත් මිහිඳු කුමාරයා යුවරාජ පදවියට වඩා පැවිදිවීමට බොහෝ සේ ආශා කළා. එනිසා රජතුමා තම පුත්‍රයාත්, සංඝමිත්තා දියණියත් මහත් ගරුසත්කාර සහිත ව ගෞතම බුදු සසුනේ පැවිදි කරවූවා. ඒ වනවිට මිහිඳු කුමාරයාට වයස අවුරුදු විස්සයි. සංඝමිත්තා කුමරියට අවුරුදු දහඅටයි. මිහිඳු කුමරු පැවිදි වූ දිනයේ ම උන්වහන්සේට උපසම්පදාවත් ලැබුණා. මිහිඳු තෙරුන්ගේ උපාධ්‍යායාචාර්යන් වහන්සේ වූයේ මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ යි. මහාදේව රහතන් වහන්සේ කුමරු පැවිදි කළා. මජ්ඣන්තික තෙරුන් වහන්සේ උපසම්පදාවේ දී කර්ම වාක්‍ය ප්‍රකාශ කළා. උපසම්පදා මාලකයේ දී මිහිඳු නමැති නවක භික්ෂුව සතර පටිසම්භිධායෙන් යුතුව උතුම් අරහත්වය ශාක්ෂාත් කළා. මිහිඳු මහරහතන් වහන්සේ පැවිදි උපසම්පදාව ලබා තුන් අවුරුද්දක් ඇතළත මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගෙන් ත්‍රිපිටකය සම්පූර්ණයෙන් ම ඉගෙන ගත්තා.

අපගේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ බිය තැතිගැනීම් නැති විශාරද භාවයට පත්, සය වැදෑරුම් අභිඥ ඇති, ත්‍රිපිටකධාරී, සතර පටිසම්භිදලාභී රහත් භික්ෂූන් වහන්සේ දහස් නමක් තෝරා ගත්තා. ඒ තුන්වැනි ධර්ම සංගායනාව පිණිස යි. උන්වහන්සේලා විසින් අශෝකාරාමයේ දී තුන්වන ධර්ම සංගායනාව සිදු කරනු ලැබුවා.

අපගේ මහාකස්සප මහරහතන් වහන්සේ ප්‍රථම ධර්ම සංගායනාව කරන ලද්දේ යම් අයුරින් ද, යස මහ තෙරුන් වහන්සේ දෙවන ධර්ම සංගායනාව කරන ලද්දේ යම් අයුරකින් ද එසෙයින් ම අපගේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ තුන්වෙනි ධර්ම සංගායනාව සිදු කළා.

තුන්වන ධර්ම සංගායනා මණ්ඩපයේ දී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ අන්‍ය වූ අධර්මවාදී මතිමතාන්තරයන් මර්ධනය කරන්නා වූ කතා වස්තු නමැති ප්‍රකරණය වදාළා. මේ ආකාරයට ධර්මාශෝක රජු විසින් සළසන ලද ආරක්ෂාව ඇතිව රහතන් වහන්සේ දහස් නමක් ගේ සහභාගිත්වයෙන් කරන ලද මේ තුන්වන ධර්ම සංගායනාව නව මාසයකින් නිමාවට පත්වුණා.

ඒ වනවිට ධර්මාශෝක රජු රාජාභිෂේක කර දහත් අවුරුද්දක්. මොග්ගලිපුත්තතිස්ස මහරහතන් වහන්සේ උපසම්පදාව ලබා වස් හැත්තෑ දෙකක් ඇතිව වැඩසිටියා. උන්වහන්සේ මහා පවාරණයේ දී සංගායනාව සමාප්ත කොට වදාළා.

එවිට ගෞතම බුදු සස්න බොහෝ කල් පවතින ආකාරයෙන් සිදු වූ මේ තුන්වන ධර්ම සංගායනාව අවසානයේ දී සාධුකාර දෙන්නා සේ මහ පොළොව කම්පාවට පත්වුණා.

තුන්වැනි ධර්ම සංගායනාවෙන් පසුව රහතන් වහන්සේ ඈත පිටිසර රටවලට පිටත්කොට යවන කාලයේ දී මහා නුවණැති, මහා මහින්ද මහරහතන් වහන්සේට උපසම්පාදව ලබා දොළොස් අවුරුද්දයි. උන්වහන්සේගේ උපාධ්‍යාය වූ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසිනුත්, උතුම් සංඝ රත්නය විසිනුත් උන්වහන්සේට නියම කරනු ලැබුවේ ලංකාවට වඩින්නට යි. එවිට උන්වහන්සේ ගෞතම සම්මා සම්බුදු සසුන කෙරෙහි ලංකාද්වීපවාසීන් පහදවනු පිණිස ඊට සුදුසු කාලය බලාපොරොත්තුවෙන් සිටියා. "ලංකාවේ දැන් සිටින මුටසීව රජු ඉතා මහලුයි. ඔහුගේ පුත්‍ර වූ දේවානම්පියතිස්ස කුමරු ඊළඟට රජු බවට පත්වේවා!" යි සිතා වදාළා.

ලංකා රාජ්‍යයේ අලුත් රජෙක් බිහිවන කාලය අතරතුර තමන් වහන්සේගේ නෑදෑයන් දකින්නට අදහස් කළා. ඒ සඳහා උපාධ්‍යායන් වහන්සේත්, සංඝ රත්නයත් වැඳ අවසර ගෙන සිය පියාණන් වූ ධර්මාශෝක රාජ්‍යයාටත් දැනුම් දුන්නා. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සතර නමත්, ෂඩ් අභිඥාලාභී මහා ඍද්ධිමත් සුමන නැමති සාමණේරයන් වහන්සේත් කැටුව ඥතීන්ට උපකාරී වන්නට රජගහ නුවර හරහා දක්ඛිණාගිරි ජනපදයට වැඩම කළා. ඉල් මාසයේ සිට බක් මාසය දක්වා පා ගමනින් වැඩි ඒ ගමනට හය මාසයක් ගතවුණා.

අනුක්‍රමයෙන් තමන් වහන්සේගේ මෑණියන් වූ දේවි කුමාරියගේ නගරය වන වේදිසගිරියට වැඩම කළා. මව් දේවිය තමන්ගේ ප්‍රිය පුත්‍රයන් වහන්සේ දැක සඟ පිරිස සහිත උන්වහන්සේට වේදිසගිරි විහාරය පූජා කොට උපස්ථාන කළා.

අනාගතයේ දී සිදුවන දේ පිළිබඳ සුදුසු කාලය දන්නා අපගේ මිහිඳු මහරහතන් වහන්සේ වේදසගිරි විහාරයේ වැඩ හිඳ මේ ආකාරයට සිතින් අධිෂ්ඨාන කොට වදාළා. "ඒ දෙවනපෑතිස් රජු ලබන පොසොන් පොහෝ දිනයේ මිස්සක නමැති පර්වතයට නගීවා! ඒ දිනයේ දී අප උත්තම ලංකාද්වීපයට යන්නට ඕනෑ" කියා අධිෂ 'ඨාන කළා.

ලංකාවට වැඩම කළ උන්වහන්සේ අධර්මයෙන් මුදවා ධර්මයට මිනිසුන් පමුණුවා ලංකාවේ සම්බුදු සසුන පිහිටුවීමේ ඒකායන අදහසින් යුක්ත වුණා. ලංකාවේ රජ මැදුරේත්, ඇත් හලේත් යන ස්ථාන දෙකේ දීම ලංකාවසීන් කතා කරන දීප භාෂාවෙන් ධර්මය වදාළා. මේ දිවයිනට පිළිසරණ වූ උන්වහන්සේ සද්ධර්ම මාර්ගයෙහි ගමන් කරන්නට කටයුතු කොට වදාළා. අපගේ මිහිඳු මහරහතන් වහන්සේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන උතුම් ශාසනය ඉතා යහපත් ලෙස ත්‍රිපිටක ධර්මය කටපාඩම් කරවීමේ ආදියෙන් භාෂක පරම්පරා බිහිකොට ලංකාදීපය බැබළවූවා. මහ සඟ පිරිවරකින් යුක්ත වුණා. උන්වහන්සේ ලොවට යහපත පිණිස බොහෝ කටයුතු සිදුකොට වදාළා.

එනිසා අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේට සිංහල බෞද්ධ අප හැම දෙනාම ණය ගැතියි. උන්වහන්සේ නිසයි අපට සෑ වන්දනා , බෝ වන්දනා ආදිය කර පින් රැස්කර ගන්නට ලැබුණේ. එනිසා මහින්දාගමනය සිහිපත් කරන මේ පොසොන් පෝ දිනයේ අපත් ආමිස, ප්‍රතිපත්ති පූජාවල යෙදී උන්වහන්සේට කෘතගුණ සලකමු.




පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංවිතයේ නිර්මාතෘ සහ අනුශාසක

**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

**නයනා නිල්මිණී**

# ජීවිතයෙහි සැනසුම සිතෙහි පිවිතුරුබව ම ය



බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය

**මිරිස්සේ ධම්මික නා හිමි**

**මහ රජ, අපි තථාගතයාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වෙමු. ඔබට සහ ඔබගේ මේ වැසියන්ට අනුකම්පාවෙන්, දඹදිව සිට මෙහි පැමිණියෙමු.**

**බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය සාරාංශ කොට මිහිඳු මා හිමියන් විසින් රජතුමාට මුලින් පැවසූ මේ වදන් චිත්තපාරිශුද්ධියට මුල්වන බව ඉතා පැහැදිලි යි.**

මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිව වැඩම කළ පළමු දිනය සේ ම, ඉන් අනතුරුව උදා වූ දින කිහිපය ම ලාංකේ ය සමාජයේ ප්‍රබල විපර්යාශයකට හේතු විය. එය යහපත් වූ විපර්යාසයකි. අනුබුදු මිහිඳු මා හිමියන් ලංකාද්වීපයට ආගන්තුක වුව ද උන්වහන්සේ දේශනා කළ ධර්මය ආගන්තුක වූයේ නැත. මනුෂ්‍යත්වයේ උතුම් බව පෙන්වා දෙමින්, ඒ උතුම් මනුෂ්‍යත්වයෙන් නිසි ප්‍රයෝජන ලබන ආකාරය පිළිබඳ දෙසූ දහම ආගන්තුක වූයේ නැත. ඒ දහම අකාලික ය. ආරම්භයේ පටන් තේරුම්ගත හැකි දහමකි. ලෝකයේ කෙළවර දක්වා ම ගැළපෙන දහමකි. ඒ අකාලික වූ දහම හෙළ ජන ජීවිතය ට කා වැදුණි.

උන්වහන්සේ පළමුවෙන් දේශනා කළ සූත්‍ර දේශනාව සිහියට නගන්න. ඒ "චුල්ලහත්ථිපදෝපම" සූත්‍ර දේශනාවයි. "සුළු ඇත් පිය උපමා" කොටගත් දේශනාව හැටියට ද මේ දේශනාව හඳුන්වා දී තිබෙනවා. මේ සූත්‍ර දේශනාවෙන් පෙනුමෙන් ආගන්තුක වූ, තමන් වහන්සේ පිළිබඳවත්, ආගන්තුක වූ දහම පිළිබඳවත් මුලින් ම ලක්වැසියනට හඳුන්වා දුන්හ. මහා කාරුණික ව ප්‍රඥාවෙන් පිරිපුන් වූ තථාගත බුදුරජාණන් වහන්සේ පිළිබඳව හඳුන්වා දුන්හ. ඒ අනන්ත බුදුගුණ ඔබටත් මටත් ලක්ෂවාර ගණනින් මතකයේ පවතින "ඉතිපිසෝ භගවා අරහං" ආදී වශයෙන් බුදුගුණ තුළින් හඳුන්වා දුන්හ. ඒ බුදුගුණ අසාගෙන සිටින විට සිත ස්වභාවයෙන් ම පිරිසුදු බවට පත්වේ. එහි ප්‍රතිඵලය වූයේ රජතුමා ඇතුළු රට වැසියන් එක ම ධර්ම දේශනාවකින් ම තෙරුවන් සරණ ගිය බෞද්ධයන් බවට පත් වීම ය.

"අරහං" නම් බුදුගුණය සිහිපත් කරන්න. තථාගතයන් වහන්සේ සියලු දෙවි බඹු මිනිසුන්ගේ ආමිස ප්‍රතිපත්ති පූජාවන් ට සුදුසු වූයේ කුමක් නිසා ද? ඝෝර සසර ගමනේ ජීවිතය හා පැවැත්මේ ඇති කම්කටොළු ස්වභාවය නිසරු බව තේරුම් ගත් බෝධිසත්වයන් ඒ දුකින් නිදහස් වීම පිණිස අත්හැරීම නම් වූ පරමාර්ථ ධර්ම මාර්ගය පැහැදිලි වේ. සම්මත ලෝකය තුළ "මම" "මගේ" කියා පවත්වන පණ ඇති පණ නැති සියල්ල ම පරමාර්ථ වශයෙන් බලන විට හට අරගෙන නැසී යන ස්වභාවයක් ගනී. බැහැරවන ස්වභාවයක් ගනී. ඉවත්ව යන ස්වභාවයක් ගනී.

මේ නිසා සම්මත ලෝකය තුළ පැවැත් වුවත් පරමාර්ථ වශයෙන් කිසිවක් ස්ථිර නොවේ. සදාකාලික නොවේ. එබැවින් සිතින් යමක් දැඩිව අල්ලා ගැනීමෙන් නිදහස් කරගත යුතු බව පෙන්වා දේ. එය අවබෝධකරගත් උතුමෝ "අරහත්" හැටියට නම් කරති. "භගවත්" හැටියට නම් කරති. මේ නිසා අරහත් වූ භගවත් වූ බුදුරජාණන් වහන්සේ සියලු දෙවි බඹු මිනිසුන්ගේ ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වෙති.

දෙවැනි පැතිස් රජතුමා මුණ ගැසුණු පළ මු අවස්ථාවේ දී ම අසන ලද අඹ ප්‍රශ්නයෙන් හා ඥාති ප්‍රශ්නයෙන් ඒ ප්‍රශ්නවලට දෙවන පැතිස් රජතුමා ලබාදුන් පිළිතුරු ඔස්සේ මනා වූ දහම් අවබෝධයක් ඇති කර ගත හැකි පිරිසක් මේ තම්බපණ්ණිය තුළ සිටින බව තේරුම් ගත්තා.

මේ නිසා "චුල්ලහත්ථිපදෝපම" සූත්‍ර දේශනාවෙහි තෙරුවන් පිළිබඳව කියවන විට හඳුන්වාදෙන විට තමාගේ ම හදවත පිරිසුදු වන බවක් ලක්වැසියාට දැනෙන්නට ඇත. තමන් ගත කරන ජීවිතය ආහාර ගැනීම, නිදා ගැනීම, වර්ගයා බෝවීමට පමණක් යොමු නොවී මරණ භයෙන් යුක්තව පමණක් ගත කළ යුතු ජීවිතයක් නොවන බවත් වටහා ගන්නට ඇත. එහි ප්‍රතිඵල ලෙස ලක්වැසියන් විශාල පිරිසක් තෙරුවන් සරණ ගියහ. බොහෝ පිරිසක් පැවිදි වීමේ අභිලාෂ ඇත්තේ වූ හ. "චුල්ලහත්ථිපදෝපම" සූත්‍ර දේශනාවෙන් තෙරුවන් පිළිබඳවත් ඒ වගේ ම දුර්ලභව ලැබූ මනුෂ්‍ය ජීවිතය කෙසේ ගත කළ යුතු ද කියන ආකාරයත් හඳුන්වා දුන්හ.

විමාන වත්ථු දහම් කතාවෙන් පාපයෙන් හෙවත් අකුසලයෙන් බැහැර වී කුසලයට යොමුවීම නිසා සතර අපායෙන් නිදහස් ව මනුෂ්‍ය ජීවිතයක් ලබන බව විශේෂයෙන් ම දෙව්ලොව උපදින ආකාරය පෙන්වා දුන්හ. කෙසේ හෝ ආහාර සපයා ගැනීමේ දී සිදුවෙන ප්‍රාණඝාත, සොරකම් ආදී පස් පව් බැහැර වෙන්න හේතුවක් වුණි. විමාන වත්ථු තුළින් මිහිඳු මහ රහතන් වහන්සේ ඒ පිළිබඳව ජන හදවත්වලට කාවැද්දනු ලැබූහ. මනුෂ්‍යයන් අතරම දෙවියන් හැටියට ජීවත්විය හැකි ආකාරය මේ දහම් කතාවෙන් පෙන්නා දුන්හ.

ඒ වගේ ම "පේතවත්ථු" තුළින් එසේ නොමැතිව ප්‍රාණඝාත, සොරකම්, කාමමිච්ඡාචාර, බොරුකීම්, රහමෙර මත්වතුරට යොමුවීම් ආදී වශයෙන් පස් පව් දස අකුසල්වලට යොමුවීම නිසා සතර අපායේ උපදින ආකාරය, සතර අපායේ ඉපදීමෙන් කල්ප ගණනාවක් නිදහස් නොවී දුක්විඳිමින් ගත කරන ආකාරය පෙන්වා දුන්හ. මනුෂ්‍ය ජීවිතය ම ඇසුරුකොටගෙන, පියවි ඇස්වලට නොපෙනුණත් තම වටා පිටාවේ ම ඒ ප්‍රේත ලෝකය පවතින ආකාරය ඔවුන්ට වැටහෙන්නට ඇත. පිනට කුසලයට බ්‍රහ්ම චරියාවට මිනිස් හදවත් යොමු කළා, මෙන් ම පාපයෙන් අකුසලයෙන් බැහැර කොට මනුෂ්‍යයන් ලෙස උපත ලබා ප්‍රේතයන්, තිරිසනුන් ලෙස ජීවත් නොවිය යුතු ආකාරය, ආදීනව හා සමගින් ප්‍රේත වත්ථු තුළින් මතුකොට දැක්වූහ. මේ සූත්‍ර දෙක මනා කොට ගැළපෙන විට නියත වශයෙන් ම හැම මනුෂ්‍යයෙක් ම මේ දුර්ලභව ලබාගත් මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම තේරුම් ගන්නට ඇත.

පේත වත්ථු තුළින් පෙන්නුම් කළ මරණින් පසු ජීවිතය මොනතරම් භයානක ද කියන කාරණය ඔවුන්ට වැටහුණි.

රාජ්‍ය පාලනය පවා දස රාජ ධර්මවලින් යුක්තව සිදු කෙරිණි. ලෞකික පැවැත්ම තුළ විටින් විට රාජ්‍යයන්වල ගැටුම් ඇති වූ බව සැබෑ ය. නමුත් ඒ ගැටුම්වලින් අනතුරුව ඒ හැම කෙනෙක් ම මහණ දම් පුරන්නට පවා යොමු වූහ. ඒ එදා මිහිඳු මහ රහතන් වහන්සේ ලබාදුන් දහම් පණිවුඩය බාහිර පරිසරය ගෘහ කර්මාන්තයෙන්, වාරි කර්මාන්තයෙන්, අක්ෂර කර්මාන්තයෙන්, චිත්‍ර කලාවෙන්, කැටයම් කලාවෙන් ආදී වශයෙන් අලංකාර වුණාටත් වඩා හදවත්වල ඇති වූ පාරිශුද්ධි ස්වභාවය මනුෂ්‍යයා මොනතරම් පිවිතුරු බවකට ගෙන ගියා දැයි පැහැදිලියි. මේ ඔස්සේ ගමන් කරන්නේ සියලු කෙලෙසුන්ගෙන් නිදහස්වීම ය.

මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ "දේවදූත" සූත්‍රය තුළින් සසරෙහි ඇති භයානක බව විශේෂයෙන් ම පස්පව් දස අකුසල් සිදු කිරීමෙන් දුගතියේ ඉපදී විඳින්නා වූ අප්‍රමාණ දුක් පිළිබඳ කතාව පෙන්නුම් කරයි.

ලාංකේයයෝ එවකට නොයෙක් ආකාරයේ විශ්වාසයෙන්ගෙන් යුක්තව සිටියහ. ඔවුන් සැබෑ මාර්ගයක් පිළිබඳව නිසි අවබෝධයක්, මඟ පෙන්වීමක් නැති වුණත් නොපෙනන බලවේගයන් හා දෙවියන් හා අමනුෂ්‍යයන් පිළිබඳ ව යම් වූ ද අදහස් හැඟීම් තිබුණහ. ජන ව්‍යවහාරයේ පැවතුණු සිරිත් විරිත්වලින් එය පැහැදිලි ය. ඒ අනුව දෙවියන් පිළිබඳව, ප්‍රේතයන් පිළිබඳව, සතර අපාය පිළිබඳව දේශනා කළ දහම් පෙළ උපකාර වූයේ වඩාත් පිළිගත හැකි හා නිවාරැදි මාර්ගයකින් අවබෝධ කරගෙන යහපත් වූ මාර්ගයකට යොමු කරවීමක් හැටියට ය.

දේවදූත සූත්‍රය තුළින් තවදුරටත් දුර්ලභව ලැබූ මනුෂ්‍ය ජීවිතය, ළමා කාලයේ පටන් ම නිසි ලෙස පවත්වා ගත්තේ නැති නම් අඩුම තරමේ තරුණ කාලයේ, එසේත් නැතිනම් ගිලන් වූ විටක, මහලු වූ විටෙකවත් ජීවිතයේ සැබෑ ස්වභාවය තේරුම් ගත්තේ නැතිනම් අධාර්මික වූයේ නම් මරණින් මතු දුගතියට වැටී යමපල්ලන් විසින් ලබාදෙන දුක් පිළිබඳව, දඬුවම් පිළිබඳව මතු කොට දැක්වූ හ.

මින් අදහස් කරන්නේ පරලොව පෙන්වා මෙලොව බය ගැන්වීමක් හැටියට නොවේ. මෙලොව අකර්මන්‍ය කිරීමක් හැටියට නොවේ. මුලින් සඳහන් කළා සේ ඔහුන්ට සම්මුතිය පිළිබඳව හැඟීමක් තිබුණි. ඒ නිසයි හැම රජ කෙනෙක් ම තම රට ජාතිය ආගම වෙනුවෙන් යුධ වැදුණා කියන වචන පෙළත් අපේ රටේ ඉතිහාසයට එකතු වී තිබෙන්නේ. මහා වංශය තුළින් එය පැහැදිලියි. ඔවුන් එතැනට ගියේ ධර්මය පිළිබඳ අවබෝධයක් ඇතිව ම ය. එය පසු කාලයක දුටුගැමුණු ආදී රජවරුන්ගේ කතාවලින් ඉතාම පැහැදිලි වේ. ඔවුන් රට කරදර බාධකවලින් විදේශීය ආක්‍රමණවලින් නිදහස් කර ගත්තායින් පසුව නැවතත් ධර්ම මාර්ගයට එකතු වී දුර්ලභව ලබාගන්නා වූ ජීවිතවල සැබෑම යථාර්ථය තේරුම, ඵලය ඔහුන් ඉටු කරගත්හ. ගමයි, පන්සලයි, වැවයි, දාගැබයි කියන සංස්කෘතිය සිත්වලට ඇති වුණේ. ඒ නිසාම ය. ලක් ජන සමාජය ගොවිතැන් කටයුතු කිරීමේ දීත්, සත්ත්ව පාලනයේ දීත්, පස්පව්වලින් බැහැරව කටයුතු කළහ. ආධ්‍යාත්මික වශයෙන් එයට නොදෙවෙනි ව ඔවුහු විහාර දාගැබ් ආදී සියල්ල ම සිද්ධ කළහ. ඒ මාර්ගයට ඇතුළු වී පහසුවෙන් ආධ්‍යාත්මික දියුණුවක් ලබන තැනට පැමිණීමට යොමු කළහ. එය ශාසනය නමින් හැඳින්වූහ. එයට බොහෝ සේ උපකාර කළහ. සියල්ල අත්හැර ද කාමභෝගී ජීවිතයෙන් බැහැරව තුන් සිවුර හා පාත්‍රය පමණක් නො ඇලීමෙන් යුතුව තමා සතුයි යන සිතිවිල්ලෙන් කටයුතු කරන පිරිසක් බිහිවූහ. ඒ පිරිස ලක්ෂ ගණන් බවට පත්වූහ. එදා මිහිඳු මහ රහතන් වහන්සේ දේශනා කළ, තථාගත බුදුරජාණන් වහන්නේ පළමුව දේශනා කළ "ධම්මචක්කප්පවත්තන" සූත්‍ර දේශනාවත් මුල් දින කිහිපයේ දී ම දේශනා කළහ. ඒ දේශනාව ඔස්සේ සාමාජික වශයෙන්, සංස්කෘතික වශයෙන් යම් මඟකට ජන සමාජය ගෙන ඉන් අනතුරුව එක එල්ලේ ම ආර්ය අෂ්ඨාංගික මාර්ග, චතුරාර්ය සත්‍ය නිවන දක්වා යොමු කරනු ලැබූහ. අදටත් අවුරුදු දහස් ගණනාවක් මුළුල්ලේ සද්පුරුෂ, ගුණවන්ත මනුෂ්‍යයන් ලෙසින් ජීවිත පවත්වන්ට උපකාර වූ හ. මිහිඳු මහ රහතන් වහන්සේගේ මේ ශ්‍රී සද්ධර්මයෙන් පිරිපුන් වූ ආලෝකමත් වූ සූත්‍ර ඒ දේශනා ඔස්සේ කරන ලද ධර්ම ප්‍රචාරය නිසාම ය. මෑත කාලයේ පසු ගිය අවුරුදු දහසක් හෝ ඊට ටිකක් වැඩි කාලයක ඇති වූ බාහිර බටහිර ආදී වශයෙන් ආක්‍රමණ නිසා ඒ උතුම්, මිහිඳු මහ රහතන් වහන්සේ ලබාදුන් උපදෙස් ලාංකේය ජන හදවත්වලින් ටිකෙන් ටික බැහැරව ගියත්, කෙසේ වෙතත් තවමත් මේ ලක්දිව වැඩිපිරිසක් වූ ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවෝ ඒ දහමෙන් සැනසෙති. නුඹලාට අනුකම්පා පිණිස ධර්මරාජයාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ අපි මෙහි පැමිණියෙමු කියන ඒ අදහස අද දවසෙත් අපේ සිත්වලට හදවත්වලට දැනෙන විට අපේ සිත්වලට ඇතිවන චිත්ත පාරිශුද්ධිය මතු මත්තේත් කුරා කුහුඹියකුටවත් වරදක් නොවී තමනුත් සැනසී අනුන් ද සනසන සිතිවිලි මේ දහවත්වල රැව් දෙනු ඇත. තථාගත බුදුරජාණන් වහන්සෙස් අපමණ කලක් පාරමී ධර්ම සම්පූර්ණ කොට සම්මා සම්බුද්ධත්වය ලබා තුන් ලොවක් සැනසූයේ ද ඒ අදහස මුල් කොටගෙන මිහිඳු මහ රහතන් වහන්සේ මේ රටට වැඩම කොට ලබාදුන් ඒ දහම් උපදේශ අපගේත් ආධ්‍යාත්මය සුවපත් කරන්න, පිරිසුදු කරන්න සසර ගමනෙන් නිදහස් කරවන්න උතුම් චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධය පිණිස කෙතරම් බලපෑවේ දැයි සාරාංශ කොට ඔබට මේ දහම් තේරුම් ගත හැකි ය.

දීපා පෙරේරා



# මිහිපිට ඇති ලොකු ම සැපත නිරෝගී සැපතයි

මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ, සිරි වජිරඤාණ ධර්ම විද්‍යාලයේ ප්‍රධානාචාර්ය පණ්ඩිත **හක්මන සුමනසිරි හිමි**

**ආතුර වූ ලෝකයා අතර බුදුරජාණන් වහන්සේ අනාතුර වූ උත්තමයෙකි. බුදුරජාණන් වහන්සේ ද ලෝක සත්ත්වයාගේ සිතෙහි හටගන්නා කෙලෙස් රෝග නිවාරණය පිණිස කටයුතු කරන බැවින් මනෝ වෛද්‍යවරයෙකි. එනිසා ම බුදුරජාණන් වහන්සේ ප්‍රකට වූයේ බවදුකට වෙදාණන් හැටියට ය.**

ආතුරවූවන්ගේ සිත්හි ඇති රාගාදි කෙලෙස් උල් උදුරා දමන බැවින් බුදුරජාණන් වහන්සේ ශල්‍ය මනෝ වෛද්‍යවරයෙකි. එබැවින් බුදුරජාණන් වහන්සේගේ ධර්මය කායික මෙන් ම මානසික ව්‍යාධීන්ට ඖෂධයක් ලෙස පිළිගැණින.

හැම කායික හා මානසික රෝගයනට නිදානයක් ඇත. ආහාර, විහරණ, උතු, පුද්ගල හා අජ්ඣාස යන වැරදි සප්පායන් බෙහෙවින් ම කායික රෝගයනට ප්‍රධාන හේතූන් වන අතර මානසික රෝගයන්ගේ නිදානය නම් මනසෙහි බලපවත්වන කෙලෙස් වේ. සංඛ්‍යාත්මකව බලන විට ත්‍රිවිධ අකුසල මූලයන් ආශ්‍රය කරගෙන මිනිස් සිතෙහි ක්‍රියාත්මක වන එබඳු කෙලෙස් එක්දහස් පන්සියයකට අධික බව සඳහන් වේ.

කායික මානසික වශයෙන් රෝගයෝ දෙයාකාර වේ. විවිධ කායික රෝගයනට වෛද්‍ය ප්‍රතිකාර මඟින් සුවය ලබා ගැනීමට හැකි ය. කායික රෝගයක පැවැත්ම රඳා පවතින්නේ ජීවත්ව සිටින කාලයේදී පමණි. මරණින් මතු කායික රෝගයේ පැවැත්මක් නැත.

චිත්ත සන්තානයේ අඛණ්ඩ පැවැත්ම භවයෙන් භවයට ගමන් කරන බැවින් මානසික රෝගවල පැවැත්ම සසර පුරා බල පැවැත්වේ යැයි සිතිය හැකි ය.

නිරෝගිකම උතුම් ලාභයක් වශයෙන් පිළිගත් බුදුරජාණන් වහන්සේ නිරෝගිකම උසස් අන්දමින් පවත්වා ගෙන යැම සඳහා අවශ්‍ය අවවාද – අනුශාසනා නොඅඩුව ලබා දුන්හ. පරිසරය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයිනට අරණ්‍යගත ව, රුක්මුල්ගත ව හා ශූන්‍යාගාරගතව වාසයේ ඇති වැදගත්කම දේශනා කළහ.

තුරු සෙවණින් ලැබෙන සහනය, නොඉඳුල් ස්වාභාවික පරිසරයේ ඇති වටිනාකම, වනයෙහි පවතින නිහැඬියාව හා වාතාශ්‍රයෙහි ඇති පිරිසිදු බව වර්ණනා කළහ. බුදු සිරිතේ වැඩි කාලයක් ගත වූයේ ස්වාභාවික පරිසරය ඇසුරු කරගෙන බව ඇට්ටේරියා වනය, පාරිලෙය්‍ය වනය, භේසකලා වනය, අනුපිය අඹ උයන හා සුංසුමාරගිරිය වැනි ස්ථාන දෙසට අවධානය යොමු කරන විට පෙනේ. එසේම බුදු සිරිතේ සැම සුවිශේෂී අවස්ථාවක් ම සිදු වූයේ ස්වභාවික පරිසරය ඇසුරු කර ගෙන ය.

බුදුරජාණන් වහන්සේ මානසික රෝග සුව කිරීමට වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව සූත්‍රාගත තොරතුරු අනුව පැහැදිලි වේ. බොහෝ සූත්‍ර දේශනාවල බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේ හැඳින්වීම සඳහා යොදා ඇත්තේ මහණෙනි, මම ලොව සිටින උසස් ම වෛද්‍යවරයා වෙමි යනුවෙනි. සිත රෝගී වූ විට කය ද රෝගී වේ. එසේ වුවත් සිත ශක්තිමත් තැනැත්තහුගේ කය රෝගී වුවත් සිත රෝගී නොවේ. එවැනි මානසික තත්ත්වයන් දහසයක් අනුමාන සූත්‍රයේ දැක්වේ. මෙම දුර්වල මානසික තත්ත්වයන් නිසා මානසික සෞඛ්‍යය පිරිහෙන අතර කායික සුවතාවය ද පිරිහීමට පත්වේ. කායික – මානසික සුවතාවය පිරිහීම නිසා දහමින් අපේක්ෂිත උසස් පරමාර්ථ සාධනයට ද විවිධ බාධා ගෙන දෙයි. බුද්ධ දේශනාවේ බොහෝ සූත්‍රවල සිත ලෙඩ කරවන්නේ පඤ්ච නීවරණ වලින් බව සඳහන් වේ.

පඤ්ච නීවරණ මිනිස් සිතක ක්‍රියාත්මක වීම, ඒ තැනැත්තා ණයකාරයෙක් වීම, රෝගියෙක් වීම, කෙනෙකුගේ දාසභාවයට පත්වීම, කාන්තාරයකට පැමිණීම වැනි යැයි දක්වා තිබේ. එයින් නිදහස් වීමට මාර්ගය බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. ඒ තුළින් පඤ්ච නීවරණ දුරු කොට උසස් මනසක් ගොඩනගා ගෙන, මානසික රෝග සුවපත් කරගෙන, නිවීම ලබා ගන්නා අයුරු බොහෝ සූත්‍රවල දක්වා තිබේ. බුදුරජාණන් වහන්සේ තමන් වෙත පැමිණෙන රෝගීන්ගේ මනසේ ස්වභාවය හඳුනාගෙන ඔවුන්ගේ මානසික සුවතාවය ඇති කිරීමට ක්‍රියා කොට ඇත. එබැවින් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා . මහණෙනි, ධර්මය නමැති ඖෂධය තරම් වෙනත් ඖෂධයක් නැත.එය පානය කරන්න යැයි වදාළ සේක.

මානසික නිරෝගිතාවය රැක ගැනීමට නම් අතීත සිදුවීම් ගැන සිතා ශෝක නොකිරීමත්, අනාගත අධික බලාපොරොත්තු නොතබා ජීවත්වීමත්, වර්තමානයේ සැහැල්ලු පැවැත්මෙන් ජීවත්වීමත් වැදගත් වෙයි.

අතීතය ගැන ශෝක කිරීමත්, අනාගතය ගැන සිහින මැවීමත් මනෝ ව්‍යාධියකි. බලාපොරොත්තු සුන්වීම හා ප්‍රාර්ථනා කඩවීම (අපේක්ෂා භංගත්වය ) බරපතල මානසික ගැටලුවකි. ප්‍රිය විප්‍රයෝගය හා අප්‍රිය සම්ප්‍රයෝගය ද මනසේ කනස්සල්ලට හේතු වේ.

අති ධාවනයෙන් කීර්ති, ප්‍රශංසා, ලාභ සත්කාර පසු පස්සේ හඹා යැමත් ඒවාට ගිජුබවත් මනස විකෘති කිරීමට හේතුවකි. බුද්ධ විෂය, ධ්‍යාන විෂය, කර්ම විෂය හා ලෝක විෂය යන කරුණු හතර අචින්තෙය්‍ය කරුණු ලෙස ධර්මයෙහි සඳහන් වේ. මෙබඳු කරුණු විෂයයෙහි අසීමාන්තික ව කල්පනා කිරීමත්, මනස විඩාවට පත් කරයි. මනසේ පවත්නා සමබරතාවය බිඳ දමයි.

බුදුරජාණන් වහන්සේ මානසික සුවතාවය මෙන් ම කායික සුවතාවය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව බොධ්‍යංග සූත්‍ර, ගිරිමානන්ද සූත්‍රය හා විනය පිටකයේ භේසජ්ජක්ඛන්ධකය විමසා බැලීමේ දී පැහැදිලි වේ. මිනිස් සිතෙහි හටගන්නා අප්‍රමාණ රෝග අතර සල්ලේඛ සූත්‍රයෙහි පමණක් රෝග 44 ක් දක්වා ඇත.

එම මානසික රෝගවලින් නිදහස්වීම සඳහා ධර්මානුකූල බෙහෙත් (ප්‍රතිකාර විධි ) ද දක්වා ඇත. ගිරිමානන්ද සූත්‍රය අනුව බලවත් සේ ගිලන් ව සිටි ගිරිමානන්ද තෙරුන්ට රෝගී සඤ්ඤාව වෙනුවට වෙනත් ධර්මානුකූල සඤ්ඤා 10 ක් ලබා දෙමින් සුවපත් කළ ආකාරය පැහැදිලි වේ. නිරෝගකමට පෙර කර්ම ද ආධාර වන්නාක් මෙන් ම මෙලොව සුදුසු ආහාර විහරණාදිය ද මහෝපකාරී වේ.

සියල්ල කර්මයෙන් සිදු වන්නේ යැයි පිළිගැනීම ද මිථ්‍යාදෘෂ්ටියකි. අසප්පාය ආහාර, අසප්පාය විහරණ, අසප්පාය ඍතු ගුණ, අසප්පාය පුද්ගලාශ්‍රය යන මේවා ප්‍රධාන වශයෙන් රෝග බහුල වීමට හේතු වී තිබේ. අසප්පාය ආහාර නම් තමනට පථ්‍ය නැති ගුණ නැති ආහාර යි. අසප්පාය විහරණ නම් ශරීර සනීපයට නොගැලපෙන ඉඳුම් හිටුම් ආදී විහරණ යි. අසප්පාය ඍතු ගුණ නම් ශරීරයට අහිතකර වූ ශීතෝෂ්ණාදිය යි.

බුදුරජාණන් වහන්සේ බොධ්‍යංග සූත්‍රවලදී තමන් වහන්සේ පුරුදු පුහුණු කළ බොධ්‍යංග ධර්ම සිහිපත් කරමින් මහා කාශ්‍යප, මහා මොග්ගලාන යන තෙරුන් වහන්සේලා සුවපත් කළ අයුරු පැහැදිලි වේ. චුන්ද බොධ්‍යංගයේ දී දැඩි සේ ගිලන් වූ බුදුරජාණන් වහන්සේ ද සුවපත් වූ අයුරු පැහැදිලි වේ. ධර්ම ශක්තිය තුළින් මානසික රෝග පමණක් නොව කායික රෝග ද සුවපත් කළ හැකි බව එම සූත්‍රවලින් මොනවට පැහැදිලි වේ.

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### පොසොන් පුර පසළොස්වක පෝය

ජූනි 05 සිකුරාද පූර්ව භාග 03.51 න් පුර පසළොස්වක ලබා06 සෙනසුරාද පූර්ව භාග 00.42 න් ගෙවේ . සිකුරාද සිල්.

### පොසොන් අව අටවක පෝය

ජූනි12 සිකුරාද අපර භාග 10.52 න් අව අටවක ලබා 14 ඉරිද පූර්ව භාග 00.59 න් ගෙවේ . සෙනසුරාද සිල්.

### පොසොන් අමාවක පෝය

ජූනි 20 සෙනසුරාද පූර්ව භාග 11.52 අමාවක ලබා 21 ඉරිද අපර භාග 12. 11 ට පෝය ගෙවේ. සෙනසුරාද සිල්

### ඇසළ පුර අටවක පෝය

ජූනි 28 ඉරිද පූර්වභාග 02.53න් පුර අටවක පෝය ලබා 29 වැනිද සඳුද පූර්වභාග 00.35 පෝය ගෙවේ. ඉරිද සිල්.



# ජීවිතය දිනන්නට මඟ හෙළිකරදුන් බුදු මඟ යළි පෙන් වූ වසංගත බිය

**මුළු ලොව මොහොතින් මොහොත නැසෙන සුළු නිසා ලෝකයයැයි කියනු ලබන බව ලෝක සූත්‍රයෙහි සඳහන් වේ.**

මිනිසාගේ වාසභූමිය මේ ලෝකය යි. මහා පෘථිවිය හා එයට බලපාන ඉර හඳ ඇතුළත් ග්‍රහලෝක තාරකාවලින් යුක්ත වූ මුළු විශ්වය ම මේ ලෝකයට ඇතුළත් කොට තිබේ.

මෙම ලෝකය තුළ ඇති ඉර, හඳ, තාරකා, ගොඩබිම, ජලය , වාතය, සාගර, මුහුදු, ගංගා හා විවිධවායු මෙන් ම පෘථිවිය තුළ තිබෙන විෂබීජ වර්ග. වායු ආදිය මිනිසාගේ මෙන් ම සත්ත්වයන්ගේ හා ශාකවල පැවැත්මට අනුබල ආධාර දෙයි.

ඒ අතරට ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ප්‍රාණීන් හා භූතයන් ලෙස සැලකෙන ප්‍රේතයන්, දෙවිවරු සිටින බව විශ්වාසයක් පවතී.

එසේනම්, අප ජීවත්වන ලොව පිළිබඳ ඉහත දැක්වූ විශ්වාසයක් තිබුණත් 'කාලාම සූත්‍රය', චූල්ලහත්ථි පදෝපම සූත්‍රය, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍ර වලින් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ සත්ත්වයන් අතර ශ්‍රේෂ්ඨ වන්නේ මිනිසා බව යි, ඉහත දැක්වූ මූලික ලක්ෂණ ඇති ලොව, මිනිසාගේ උප්පත්තිය දුර්ලභ බව දක්වා ඇත. මිනිසාගේ පැවැත්මට බලපාන ධර්මතාවයන් රැසක් බුදුන් වහන්සේ වදාළ සේක. බීජ නියාමය, ඍතු නියාමය, ධර්ම නියාමය, කර්ම නියාමය හා චිත්ත නියාමය යන පංච නියාම ධර්මයන් දක්වා ඇත. මෙහි දක්වන ලද බීජ හා ඍතු නියාමයන් ස්වභාව ධර්මය තුළ ඇතුළත් ධර්ම වන අතර, ඉතිරි දෙක පුද්ගලයා ඇසුරෙන් ක්‍රියාත්මක වේ. මෙම නියාම ධර්මයන් එකින් එක හුදෙකලාව ම හෝ එකතුව ක්‍රියාත්මක වේ. ධර්මයන් අතර පවතින සම්බන්ධතාවය සංකීර්ණ ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකි ය. එසේම හේතු ඵල ධර්මය ද මිනිසාගේ පැවැත්මට බලපායි.

ලොව හැම දෙයක් ම නිර්මාණය හා පැවැත්ම මෙන් ම , අභාවය, විනාශය මෙන් ම සමාජීය අර්බුධ, ආර්ථික දුෂ්කරතා ආදිය ක්‍රියාත්මක වන්නේත් හේතුඵල ධර්මය අනුව යි. හේතුඵල ධර්මය අනුව සිදුවන සෑම ක්‍රියාවක් ම ඇති නැති වන හැම සත්ත්වයෙක් ම, ශාකයක් ම, ද්‍රව්‍යයක් ම ධර්ම නියාමය අනුව සිදුවන බව බුද්ධ දේශනාවේ දැක්වේ.

මේ වනවිට අප රටතුළ බිහිවී තිබෙන 'කොරෝනා වෛරසය' ගැටලුව යම් තරමකින් ක්‍රමානුකූල ව පවත්වාගෙන යන්නේ පාලක රජයේ විධිමත් වැඩපිළිවෙළ නිසාම ය.

බුදු දහම විනය ගරුක සමාජයක් සඳහා පංචශීල ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇති අතර, රාජකීය නීති සංග්‍රහයේ ද මෙය වෙනත් නම්වලින් දක්වා ඇත. ආගම මගින් පනවා ඇති ශික්ෂා මගින් ස්වයං පාලනයක් ඇති කරගත යුතු ය. අද ඇඳිරි නීතිය පනවා ඇත්තේ රටේ ජනතාවගේ ආරක්ෂාව සඳහා ය. රාජ්‍ය නීති රීති මගින් හෝ පුද්ගලයා හික්මවීම කළ යුතු ය. ලොව අන් රටවල් දෙස බලන විට අප රටට විශාල හානියක් ගෙනදෙන අවස්ථාවක සැනසුම් සුසුමක් හෙළිය හැක්කේ මිනිසුන් තුළ විනය තිබීම නිසා ය. නමුත් ඒ අතරින් කීප දෙනෙකුගේ හැසිරීම නිසා විශාල ප්‍රමාණයක ආසාදිතයන් බිහිවීම සිදුවූයේ ක්‍රමයෙන් නොදැනුවත්ව ම ය. එනිසා ආගම තුළින් ඇතිකරන විනය සමාජ යහපැවැත්මට මනා අනුබලයක් වෙයි.

සමාජයේ ආචාරශීලී මිනිසකු වීමට නම්, මෛත්‍රිය, කරුණාව, මුදිතාව, හා උපේක්ෂාව යන සතර බ්‍රහ්ම විහරණ ගුණ තමාගේ හැසිරීම තුළින් ප්‍රකට කළ යුතු ම ය. එ පමණක් නොව රටක් වශයෙන් එකාවන් ව සිතන්නට බොදු දහම තුළින් ඔබට අවස්ථාව ලැබී ඇත. උස් – පහත්, දුප්පත් – පොහොසත්, කුලවත් – කුලීන වශයෙන් නොසිතා මේ අවාසනාවන්ත ලෙස අත්වැල් බැඳ ගැනීමට සිතීමේ කාලය එළඹ ඇත.



ශාස්ත්‍රපති
**අග්‍රහැරේ කස්සප හිමි**

දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව යන සතර සංග්‍රහවස්තු අනුගමනය කරමින් සමාජයේ සෙසු අය සමඟ සුහදශීලී ව කටයුතු කිරීමට වග බලාගත යුතු ය.

මේ මොහොතේ ලද දෙයින් සතුටු වීම පිළිබඳව සිතීමට කාලය එළඹ ඇත. තමාට ඇත්තා වූ දෙය තමාට උරුම වූ දෙය නොමනාකොට සලකා අනුන්ට අයත් දේ ගැන ලෝභ කිරීම 'අතිච්ඡතා' නම් වේ. එය ලැබූ දෙයින් පිරිහීමට ද, නොලැබූ දෙය නොලැබීමට ද නොයෙක් විපත්වලට ද, මරණින් මතු අපායට යෑමට ද හේතුවකි. අද සමහර අය කොපමණ වස්තුව තිබුණත් තව තවත් අයට ගත නොහැකි ලෙසට රැස්කර තබා ගනිති.

අතීතයේ අපේ පැරැන්නෝ එකාවන් ව වැඩකටයුතු කළ ආකාරයත්, බෙදාහදා ගන්නා ආකාරයත් දකින්නට ලැබේ. ඒ අපේ රටේ සංස්කෘතියේ විශිෂ්ඨ ලක්ෂණයකි.

'මහිච්ඡතාව නමින් දක්වන අධික ලෝභයෙන් යුක්ත වූ තැනැත්තාට කොපමණ වස්තුව ලැබුණත් මෙලොව සැපයක් නැත.නමුත් කළ යුත්තේ කුමක් ද යන්න බුදුරදුන් මෙසේ වදාරා ඇත. නුවණැත්තන් ලබන ධනයතමාත් ප්‍රයෝජනයට ගෙන, වැඩි කොටසක් කර්මාන්තයන්හි යොදන්නේ ය. පරලොවට වැඩ පිණිස කළමණා දන් පිණිස මැනවින් යොදන්නේ ය. ස්වකීය ඥාති සමූහයාගේ ප්‍රයෝජනයට ද වියදම් කරන්නේ ය. එසේ ධනයෙන් ගතමනා ප්‍රයෝජන ගෙන ලොවෙහි නුවණැත්තා ගේ ප්‍රශංසාවට ද භාජනය වී මරණින් මතු සුගතියට පැමිණෙන්නේ ය.

නුවණින් විමසා බැලුවහොත්, මිනිසුන් තමන්ගේ කෑම බීම ආදී කටයුතුවලටත්, අනුන් පිළිබඳව ඉටුකළ යුතු වූ කටයුතු පිණිසත් නොයොදා ධනය රැකගෙන සිට මියගියහොත් පරලොව ජීවිතයෙහි ද වටිනාකමක් නැත්තේ ය.

සැවොම මෙලෙස සිතීමට උත්සාහ ගත යුතු ය. ල ද දෙයින් සතුටුවීම නමැති උසස් ගුණ ධර්මය වඩා තම තමන්ගේ චිත්ත සන්තානය නිරෝගීව තබා ගැනීමෙන් මෙලොව නිරෝගී ව , දීර්ඝ කාලයක් ජීවත්වීමේ භාග්‍ය උදාකර ගැනීමෙන් මෙලොව දියුණුවත්, පරලොව දියුණුවත් සලසා ගැනීමට පරිසරය සුරැකීමේ වගකීම ද මේ වනවිට කාගේත් කතාබහට ලක් වී තිබේ. ආහාර හිඟය මතු වූ විට සියලුම දෙනා පිටරට දෙස බලා සිටියේ එහි ආධාර මත යැපෙන්නට යි. නමුත් මුළු ලොවම අපදාවට ලක්වූ සැනෙන් සියල්ලටම තමාගේ දෛනික ජීවිතය හා වටපිටාවේ අඩුවත්, තමාගේ නොසැලකිල්ලත් සිහි විය. එය පාලකයන් පවා වහා අවබෝධ කරගත් නි සා මිනිසුන්ගේ දෙනෙත් ඇරවීමට ගත් උත්සාහයන් ඉතාමත් අගය කළ යුතු ම ය.

මේ රමණීය කුඩා දිවයින තුළ ඇති භූමියේ වටිනාකම මිනිසුන්ට දැනුණේ 'කොරෝනා' වෛරසයේ ආසාදනය මතුවීමත්, ආහාර හිඟයත් නිසා ම ය. හිස්ව තිබූ තමාගේ ගෙවතු දෙස කවදාවත් නෙත් නොහෙළූ ජනතාව නෙත් හෙළීම තුළින් අපේ රටේ සෞභාග්‍යය උදාවූයේ යැයි සිතෙයි

බුදු සිරිත තුළින් ද සොබා දහමේ අපූර්වත්වය මනාව පැහැදිලි ව දක්වා ඇත. බෝසතාණන් වහන්සේ මෙලොව ජනිත වූයේ බෝරුක් සෙවණේ දී ය. පිරිනිවන් පෑවේ සල් මල් මලින් සුසැදි උයනක දී ය.

පරිසරයෙන් ආස්වාදය ලැබූ බුදුරජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවක පිරිස බොහෝ විට ගිමන් හැරියේ, සැතපුණේ එළිමහන් රුක්මුල් ආශ්‍රිතව ය.

බුදුන් වහන්සේ භික්ෂූන්ට සිවුරු සකස් කරගන්නට අනු දැන වදාළේ මගධ කෙත්යායේ ස්වරූපය අනුව යි. සිවුරු පාට කරගන්නට අනුදැන වදාළේ ගස්වල මුල්, පොතු , කඳ, මල් තම්බා ලබාගත් ශාකසාර වලිනි. එසේනම් අද අප රටේ සිදුවන ගස්, වැල් විනාශ කිරීමේ ප්‍රමාණය වැඩි වී ඇත්තේ ඉහත දැක්වූ ශාසනික වශයෙන් ආහාරමය වශයෙන් මෙන්ම අපගේ සියලු දේටම සර්ව වස්තුවක් වූ ගස්වලට කොතරම් අදූර දර්ශිවදැයි කල්පනා කර බලන්න. පැළෑටියේ සිට විශාල ගස්වැල් දක්වා අද බොහෝ දෙනා විවිධාකාර ආකාරයේ ව්‍යාපාරවලට යොදාගෙන ඇත්තේ සියලු වනස්පතිය ම විනාශ කරවමිනි.

එහි විපාකය මෙවර ජනතාවට අවබෝධ වීම මහත් සතුටකි. බුදුන් වහන්සේ එදා වදාළ දේ අදත් සිතීමට පුරුදු වන්න. ඇලීමෙන් ගැලීමෙන් හා ගැටීමෙන් තොරව සොබා දහම තුළ අසිරිය සුන්දර ලෙස විඳීමට සිතට ගන්න.

තමාගේ ගෙවත්තේ අවශ්‍ය එළවළු, පළතුරු, ඖෂධ වගාකරගත් අපේ මුතුන් මිත්තන්, මී මුත්තන් යළි සිහිකරන්න, මේ ආපදාව තුළින් හැම කෙනෙක්ම තමාට අවශ්‍ය දේ වගා කරගත යුතු බව සිතට ගන්න. මේ චින්තනය කොරෝනා ගෙනා යහපත් වෙනසකි. නිරෝධායනය කාලවල දී ඔබ ගෙවත්ත තුළ වැඩ කළා නම් ඔබගේ හදවතට පණිවුඩයක් ලබා දෙන්නට ඇත. ඒ ණයක් නොවී වස විෂ වලින් තොර ගුණාදායක පලා එළවළු, පලතුරු ධාන්‍ය වගාවට එක්වෙනවා යන්න යි. එසේ වූ විට අපේ රටට විදේශ රටවලින් එවැනි දේ අපනයනය කරගන්නට අවශ්‍ය නොවේ.

කොරෝනා වසංගතය නිසා අපේ රටේ සැඟව සිටි නිර්මාණශීලීන් හඳුනාගන්නට ලැබීමත් අප ලැබූ වාසනාවකි. ඈත ගම්මානවල දූ දරුවෝ තම තමන්ගේ හැකියාව මතුකොට නිෂ්පාදනය කළ විවිධ වෛද්‍ය උපකරණ ඇතුළු දේ අනාගතයේ යහපත් පරම්පරාවක් සිටින බව පෙන්වූවා නේද?


අපේ රටේ මිනිසුන් අතර තිබූ සමාජ අසමගිතාවයන් දුරු කිරීමට මෙම කොරෝනා වෛරසය හේතු වූයේ නොපෙනෙන බලවේගයක් මෙනි.

තමාගේ තනතුරේ ලොකු පොඩිකම් ඉවත දමා අත්වැල් බැඳගෙන රෝගීන් සමඟත් වැඩකරන ආකාරය දුටු ඔබට සිතුණේ කුමක් ද? ත්‍රිවිධ හමුදාව, පොලීසිය, වෛද්‍යවරු ක්ෂේත්‍රයේ සියලුම දෙනා එකාවන් ව අත්වැල් බැඳ ගත් ආකාරය මුළු ලෝකයම මවිත කරන්නක් වූවා මෙන් ම අගය කරන්නක් ද වූ බව ඔවුන්ගේ ප්‍රවෘත්ති ජාලා තුළින් දකින්නට ඇත. සියලුම දෙයින් ආඪ්‍ය වූ රටවල්වලට වඩා ශ්‍රී ලංකාව ජාතීන් කීපයක්, ආගම් කීපයක් සමඟින් ළෙන්ගතුවෙමින් සාමූහික ව කුරිරු වෛරස රෝගයට මුහුණ දුන් ආකාරය විශ්මය ජනක ය. ඒ අපේ රටේ පැවැති සංස්කෘති රටාවේ යහපත්කම නිසා ය.

'ආරද්ධ විරියං' එළඹ සිටි වීර්යයෙන් කටයුතු කිරීමට පුරුදු වූ තැනැත්තා ජීවිතයේ බොහෝ දේ ජයගන්නා බව බුදු දහම පෙන්වා දී ඇත. එසේම මාරයා පවා ජයගත හැකි ය.

පර්වතයක් පෙරළීමට සුළඟට බැරි සේ ම ඉහත කීගුණ පිහිටි පුද්ගලයා විනාශ කිරීමට මාරයාට හැකියාවක් ද නැති බව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ.

# ප්‍රඥාවට මුල් තැන දුන් අවිහිංසාවාදී ධර්ම දූත සේවාව



පරවාහැර චන්ද්‍රරතන හිමි

**මෙතෙක් බිහිවූ සියලු ආගම් තුළ උත්සාහ කරනු ලබන්නේ මිනිසා විසින් නොදන්නා කිසිවක් පිළිබඳව කියා දීමට ය. විශ්වය හා සත්වයාගේ ආරම්භය පිළිබඳ ව හෝ අනාගත පැවැත්ම හෝ මරණින් මතු ජීවිතය පිළිබඳව කිසියම් විග්‍රහයක් කිරීමටය.**

ආගමික ලක්ෂණ සහිතව පසුකාලීන ව ආගමක් ලෙස හැඳින්වුවත් ආගමක් හෝ දර්ශනයක් නොව දහමක් වන බුදු දහම තුළද මෙකී උත්සාහය දක්නට ලැබේ.එහෙත් බුදු දහම හා අන් ආගම් දර්ශනයන් හාත්පසින් ම එකිනෙකට වෙනස් වෙයි. පොදුවේ ගත් කළ ඉහත කිසිදු ආගමක බුදු දහමේ තරම් චින්තන නිදහසක් ලබා දෙන්නේ නැත. අදාළ ප්‍රස්තුතය පුද්ගලයා ඉදිරිපිට තබා තීරණය ඔහුටම භාර කරන ආගමක් ලොව නැත. පැමිණ පරීක්ෂා කර බලා පමණක් පිළිගන්නට පුද්ගලයා යොමු කරන දහමක් වේ නම් ඒ බුදු දහම පමණි.

චින්තන නිදහස මූලික ව ධර්ම ප්‍රචාරය කිරීම බුදු දහම ඉතාම අගය කළ දෙයකි.

දිගු උණ ගසක රත් හඳුන් පාත්‍රයක් තබා එය ගැනීමට අහසින් එන රහතන් වහන්සේ නමයි. ආරාධනා කිරීමත් එය කළ නොහැකි නම් රහතුන් නැතිය යන්න තහවුරු කරන්නට උත්සහ කිරීමත් යන මේ කරුණු පාදක වන සිද්ධියක් පිළිබදව බෞද්ධ ඉතිහාසයේ සදහන් වෙයි.

රජගහ නුවර සිටුවරයාගේ මෙම ක්‍රියාවෙන් පසුව රහතුන් නැතැයි මතයක් නුවර පුරා පැතිරෙන්නට වූ කල පිණ්ඩෝල භාරද්වාජ මහරහතන් වහන්සේ සිය සුළැඟිල්ලෙන් විශාල ගල් පර්වතයක් රඳවා අහසින් එම ස්ථානයට පැමිණෙයි. ඉන් පසුව රජගහ නුවර සිටුවරයා පාත්‍රය විවිධ සුවඳ ද්‍රව්‍ය වලින් පුරවා උන්වහන්සේට පූජා කළේය. මේ සිද්ධිය දැන ගත් බුදු රජාණන් වහන්සේ එයට දැඩිව විරුද්ධත්වය පළ කරමින් ඍද්ධි ප්‍රාතිහාර්ය පෑම තහනම් කරමින් ශික්ෂා පදයක් පවා පැනවූහ. එම රත් හඳුන් පාත්‍රය කැබලිවලට කඩා බෙහෙත් ආදියට ගන්නට නියම කළහ.

මෙහිදී ඍද්ධි ප්‍රාතිහාර්ය තහනම් කරන්නට පවා බුදු රජාණන් වහන්සේ කටයුතු කළේ ඒ හරහා ජනතාව වෙත යන පණිවිඩය ප්‍රඥා මූලික නොවන නිසා ය. එම නිසා හැම විටම බුදුරජාණන් වහන්සේගේ ධර්ම ප්‍රචාරය පදනම් වී තිබුණේ මිනිසාට යමක් දේශනා කොට අවබෝධ කරවීමටයි. ප්‍රත්‍යක්ෂ මූලික, ප්‍රඥා මූලික ධර්ම දූත සේවාවකි බෞද්ධ ධර්ම දූත සේවය.

අවම වශයෙන් කිසිවෙකුට වේදනාවක් හෝ හානියක් හෝ මරණයක් උරුම නොවන ප්‍රාතිහාර්ය පෑම තුළින් පවා දහම ප්‍රචාරය කිරීම බුදුරජාණන් වහන්සේ අනුදැන වදාරා නැත. එයට හේතුව වන්නේ බුදු දහම සොයන්නේ ප්‍රඥාව මූලික කර ගනිමින් ධර්ම මාර්ගයේ යන ශ්‍රාවක පිරිසක් වන නිසා ය.

ප්‍රථම රහත් හැටනම විෂයයෙහි බුදුරජාණන් වහන්සේ කරන අවවාදය වන්නේ ද මුල මැද අග යහපත් වූ ධර්මය දේශනා කරන ලෙසයි. "දෙසේථ භික්ඛවේ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියෝසාන කල්‍යාණං" යන මේ බුද්ධ වචනයෙන් පැහැදිලි වන්නේ මිනිසුන්ට සත්‍ය අවබෝධ කිරීම විෂයෙහි සැබෑ ශාස්තෘවරයෙක් ගන්නා උත්සාහය පිළිබඳවයි.

එහි විශේෂිත ව තිබෙන්නේ සිය ගොඩ වැඩි කර ගැනීම නොව සිය පාර්ශවය වැඩි කරගැනීම නොව, මිනිසුන් නිවැරදිව යථාර්ථය අවබෝධ කරගන්නවා ද යන්නයි. මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කර ගන්නට යෙදුණු සත්‍ය, ලෝකයට බෙදාදීමේ කාර්යභාරයෙහි එක්තරා සන්ධිස්ථානයක් ලෙස මහින්දාගමනය සැලකිය හැකි ය.



සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 300 පමණ කාල පරිච්ඡේදය වන විට බුද්ධ ශාසනය කෙරෙහි බොහෝ උපද්‍රව ඇතිවී තිබිණි. එම උපද්‍රවයන් අතර අන්‍යාගමික බලපෑම් ඉතා ප්‍රබල විය. ලාභාපේක්ෂාවෙන් බුදු සසුනෙහි පැවිදි වූ බොහෝ අන්‍යාගමිකයෝ සසුන කෙළෙසන්න ට පටන් ගෙන තිබිණි. අනෙක් අතින් භික්ෂූන් වහන්සේලා අතර ද ධර්මය කරුණු පිළිබඳව විශාල සංවාද විවාද පැවතිණි. එකී වාද විවාද හරහා ද අන්‍යාගමිකයන්ට විවිධ ලාභයන් සැලසී තිබුණි. ධර්මාශෝක රජතුමාගේ ධර්ම සේවය නොවන්නට වර්තමානයේ බුදු සසුන පවතින්නාවූ තත්ත්වය දැකගන්නට හැකි වේ ද යන්න සැක සහිත ය. ඉතා විශාල අර්ධද්වීපයක් වන පැරණි භාරතය විවිධ ආගම් සාහිත්‍යය සාමයික පසුබිම් හි තිඹිරිගෙය ලෙස හැඳින්වුවහොත් එය නිවැරදි ය. ඒ වන විට ඉතාමත්ම ප්‍රබල ලෙස මුල් බැසගෙන පැවති ආගමික දේව විශ්වාසයන්ට ප්‍රතිවිරුද්ධ වූ දහමක් වන බුදු දහමට අනිත් ආගමිකයන්ගෙන් තිබූ බලපෑම සුළු බලපෑමක් නොවේ. ජන සමාජය තුළ ආත්මගතව තිබූ හින්දු දේව විශ්වාසයන්ට ප්‍රතිවිරුද්ධ වූ බුදු දහම කෙරෙහි ඉතාමත් ප්‍රසිද්ධ වූ රජවරුන් පැහැදීම හා බුදු සමය තුළ කුල භේදයට පහර ගැසීම ආදී කරුණු ද මේ ප්‍රතිවිරුද්ධතාවය දැඩිවීමට ප්‍රබල හේතු විය. විශේෂයෙන් සමාජයේ බලය අල්ලාගෙන සිටියේ බ්‍රාහ්මණ පෙළපත වූ අතර සමහර බමුණන් පැවිදි වීම කෙරෙහි යොමු වීම ඔවුන් ඉතා විශාල පරිහානියක් ලෙස දුටහ. මේ කවර ප්‍රතිවිරුද්ධ තාවයන් තිබුණ ද බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලය තුළ ඒ සියල්ල අභිබවා බුද්ධ ශාසනය ඉස්මතු වී තිබිණි. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව එකී පාලනය වී තිබුණු බොහෝ ප්‍රතිවිරුද්ධ අන්‍යාගමික ශක්තීන් ඉස්මතුව පැමිණි අතර ධර්මාශෝක රජ සමයේ වන විට එහි ඉතා උච්චතම අවස්ථාවට පැමිණ තිබිණි. මේ නිසා ධර්මාශෝක රජතුමා පළමුව සිදු කරන්නේ එවක වැඩසිටි ශාසනභාරධාරී තෙර නමක් ලෙස ප්‍රකට මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ සමඟ සාකච්ඡා කොට ධර්ම සංගායනාවකට දායකත්වය සැපයීමයි. මහා පරිනිර්වාණයෙන් වසර තුන්සියයකට පසු ඇරඹෙන ධර්මදූත ක්‍රියාවලියෙන් පළමු පියවර ලෙස මේ ධර්ම සංගායනාව හැඳින්විය හැකි ය.

චින්තන නිදහස හා කරුණාව මෛත්‍රිය වැනි කරුණු ධර්මදූත සේවයෙහි කිසිකලක බැහැර නොවීම ඉතා ප්‍රශංසනීය වේ. එයට සාක්ෂි සපයන විශේෂතම සිදුවීම ධර්මාශෝක රජතුමාගේ ධර්මදූත සේවයයි. ධර්මාශෝක රජතුමා බුදු දහම හඳුනා ගන්නා අවධිය වන විට එම අවධියේ සිට ඉතාමත්ම ප්‍රබලම අධිරාජයා ඔහු ය. අවට රාජ්‍යයන් වූ තායිලන්තය, බුරුමය, කාශ්මීරය වැනි රාජ්‍යයන් වලට බලහත්කාරයෙන් බුදුදහම පැටවීම ඔහුට ඉතා පහසුවෙන් කළ හැකි ව තිබිණි. එහෙත් අවිහිංසාව මූලික කරගත් බෞද්ධ ධර්මදූත සේවයක පුරෝගාමියෙකු ලෙස ධර්මාශෝක රජතුමා බලය පාවිච්චි කොට එකී කටයුත්ත සිදු නොකරන්නේ එය බෞද්ධ ධර්මදූත සේවයට අනුගත නොවන බැවිනි. මේ අනුව ඉන්දියාවේ ම බොහෝ ප්‍රදේශවලට ධර්මදූතයන් පත් කර යවන ලදී. ඉන්දියාවෙන් බැහැර වූ බුරුමය ශ්‍රී ලංකාව වැනි රටවල් වලට ද බුදුදහම පැමිණෙන්නේ මෙකී ව්‍යායාමයේ ප්‍රතිඵලයක් ලෙස ය. එසේම ඉතිහාසඥයින් තහවුරු කරන ආකාරයට සිරියාව, ඊජිප්තුව, මැසිඩෝනියාව වැනි රටවල්වලට ගිහි ධර්ම නියෝජිතයින් පත්කර යවන ලද බව සඳහන් වේ. දිග්විජය තුළින් රටවල් අල්ලා ගැනීමේ මෙහෙයුමක නිරත වූ චණ්ඩාශෝක රජතුමා බුදු දහමෙහි ආභාෂය තුළින් ධර්මාශෝක බවට පත්ව ධර්මය බෙදා හැරීම තුළින් එකී ජයග්‍රහණයන් ලබන්නට ගත් උත්සාහය ඉතා ප්‍රශංසනීයයි.

ලංකාවට උතුම් ලොව්තුරා බුදු දහම රැගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ පැවිදිව රහත් වූ ධර්මාශෝක මහරජතුමාගේ පුත්‍රයා වන මිහිඳු මහරහතන් වහන්සේටය. දහස් වාරයක් අසා ඇති මුත් ජීවගුණය මදකින් අඩු නොවන ලක්බිම මහ රජු හා මිහිඳු මහරහතන් වහන්සේගේ හමුවීම ලංකාවේ ඉදිරි ගමන් මාර්ගය සම්පූර්ණයෙන්ම වෙනස් කළ ඓතිහාසික සංධිස්ථානය ලෙස සටහන්ව තිබේ. බෞද්ධ ධර්මදූත සේවාවෙහි ගෞරවනීය ලක්ෂණ වූ අවිහිංසාව සහ බුද්ධි ප්‍රකෝපනය ලංකා ඉතිහාසයට ඇතුල්වන පළමු අවස්ථාවේ ම සටහන්ව තිබේ. කිසිදු ප්‍රාතිහාර්යකින් රජු බය ගැන්වීමක් නොකොට තමන් කවුද යැයි හඳුන්වා දෙන මිහිඳු මහරහතන් වහන්සේ සැඟවූ යටි අරමුණක් නොමැතිව තමන් ආගමන පිළිබඳව එවක ලක්දිව රජුවූ දෙවන පැතිස් රජුට ප්‍රකාශ කර සිටියහ.

"සමණාමයං මහාරාජ ධම්මරාජස්ස සාවකා තමේව අනුකම්පාය ජම්බුදීපා ඉධාගතා" යන මේ චිරප්‍රසිද්ධ ප්‍රකාශය බෞද්ධ ධර්මදූත සේවය විවෘතභාවය පෙන්වාදෙන ඉතාමත් අනගි අවස්ථාවකි.


**(මෙම ලිපියේ ඉතිරි කොටස අව අටවක පෝද පත්‍රයේ පළ වේ)**

# අයහපත ඉවත දමා යහපතට යොමු වෙන්න



'ස්වාමීන් වහන්සේලා,පිපාසිත ප්‍රේතයාගේ මුඛයට සහ සිරුරට ජලය ඉස දානයට වැඩම කරන්නට සූදානම් වුණා. නමුත් ප්‍රේතයා පැවසුවේ ස්වාමීනි, වතුර පොදක්වත් සිරුරට නොවැටුණු බව යි. බලන්න, කර්මයක මහිමය.'

## ප්‍රේත වස්තු සහ විමාන වස්තු



අම්බලන්ගොඩ, කහව ගල්දූව
ගුණවර්ධන යෝගාශ්‍රමයේ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමයේ මහා
ලේඛකාධිකාරී කම්මට්ඨානාචාර්ය
ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද

**කහගොල්ලේ සෝමවංශ හිමි**

**ලොවුතුරා බුදුරජාණන් වහන්සේගේ අසූහාර දහසක් ධර්මස්කන්ධය සූත්‍ර , විනය, අභිධර්ම යනුවෙන් පිටක තුනක් වශයෙන් පවතිනවා.**

සූත්‍ර පිටකයට ධර්මස්කන්ධ විසි එක් දහසක් ද , විනය පිටකයට ධර්මස්කන්ධ විසි එක් දහසක් ද , අභිධර්ම පිටකයට ධර්මස්කන්ධ හතළිස් දෙදහසක් ද ඇතුළත් ව අසූහාර දහසක් වෙනවා. විමාන වත්ථු පේථ වත්තු ග්‍රන්ථ දෙක සූත්‍ර පිටකයේ ඛුද්ධක නිකායට අයත් වෙනවා.

මෙය කවුරුත් ඉගෙන ගත යුතු ග්‍රන්ථ දෙකක්. කුසල කර්මයන්ගෙන් විමාන බවට, දෙවියන් අතරට පත්ව සැප විඳින ආකාරය විමාන වස්තු ප්‍රකරණයේ ද තණ්හාවෙන් මිය ගොස් ප්‍රේත ලෝකවලට වැටී දුක් විඳින බව ප්‍රේත වස්තු ප්‍රකරණයේ ද, සඳහන් වෙනවා. ප්‍රේත වස්තුව කියවන විට සිතට විශාල බියක් දැනෙනවා. සමහර ප්‍රේතයන්ගේ මුඛය ඉඳිකටු මලක් වැනි යි. උගුර තිබුණත්, උදරය නැහැ. උදරය තිබුණත් උගුර නැහැ. යමක් අනුභව කරන්නට නොහැකිව කුසගින්නේ කෑ කෝ ගසනවා. දූ දරුවන්, ගේ දෙර , මිල මුදල් , ඇඳුම් පැළඳුම් ආදියෙහි තණ්හාවෙන් මිය ගිය සැවොම ප්‍රේත ලෝකයට වැටී දුක් විඳිනවා.

'දවසක් ස්වාමීන් වහන්සේ කිහිප නමක් දවල් දානයට වඩින විට ගංගාවක අවතාරයක් එහෙ මෙහෙ යනවා දුටුවා. උන්වහන්සේලා මේ ගැන විමසූ විට අවතාරය පැවසුවේ, ස්වාමීනී, මෙය ගංගාවක් බව මා නොදන්නා බවත් වසර ගණනාවක සිට ජලය සොයන බවත් ය. බලන විට ගඟේ සිටියදීත් ජලය නැහැ. මොකද හේතුව? ප්‍රේතයෙක් ව උපත ලැබීම යි. ස්වාමීන් වහන්සේලා,පිපාසිත ප්‍රේතයාගේ මුඛයට සහ සිරුරට ජලය ඉස දානයට වැඩම කරන්නට සූදානම් වුණා. නමුත් ප්‍රේතයා පැවසුවේ ස්වාමීනි, වතුර පොදක්වත් සිරුරට නොවැටුණු බව යි. බලන්න, කර්මයක මහිමය. ඔහු සංසාරයේ කෙනෙකුට ජල පොදක් නුදුන් විපාකය. ජලය අපවිත්‍ර කළා. තුනුරුවන්ට පූජාවක් දුන්නා නම්, එය විසි කරනු ලැබුවා. මෙහි විපාක වශයෙන් කෙතරම් කලක් පිපාසිත දුකෙන් පීඩිත වෙන්න වෙයිද? එයින් සැපවත් ජීවිතයක් ලබා සුඛිත මුදිත ව සිටිය හැකි යි. පිනක් දහමක් නොකළොත්, තණ්හාවෙන් මිය ගියොත්, ප්‍රේත ලෝකයට වැටී අනාදිමත් කාලයක් සාගිනි වේදනාවෙන් දුක් විඳින්න සිදු වෙනවා. අන් ප්‍රේතයන්ගේ ගල් මුල් පහරින් අනෙක් ප්‍රේතයාගේ සිරුරේ ලේ කඳුළක් ගානේ පානය කරනවා. සමහර ප්‍රේතයන් අශූචි වලවල ද, ගිනි ජාලා මද ද වාසය කරනවා. එකිනෙකා පොරෝ පහරින් පොර බදා අතපය කඩාගන්නවා. මෙලෙස ප්‍රේත ලෝකයේ ලැබෙන දඬුවම , දුක සීමාවක් නැහැ.

පන්සිල් රැක, හොඳින් බුද්ධ වන්දනාව සිදු කර ගන්න. දාන මාන පින්කම් කර ගන්න, ඉතිපි සෝ ගාථාව, බුදු ගුණ භාවනාව නිතර මෙනෙහි කරන්න. එවිට තමාට හොඳ පිනක් කරගෙන දෙව්ලොවට පත් ව මහා දිව්‍ය රාජයෙක් වෙන්නට පුළුවන්. දෙවියන්ට කුමන දෙයකින්වත් අඩු පාඩුවක් නැත්තේ දාන , ශීල, ආදී පින්කම්වල විපාක නිසා යි.

රුවන්මැලි මහා සෑය ඉදි කළෙත් එහි තිබූ වෘක්ෂයක් විමානයක් කර වැඩ සිටි දිව්‍යාංගනාවකගෙන් අවසර ගෙන යි. සෑය ඉදිකළ දුටුගැමුණු රජතුමාගේවත් නාමය නොයොදා විමානය හිමිකරුවා ලෙස වාසය කළ 'ස්වර්ණමාලී' දව්‍යාංගනාවගේ නාමය යෙදුවා. ඒ නිසා රුවන්මැලි මහා සෑය, ස්වර්ණමාලී මහා චේතිය නම් වූවා. මෙලෙස වෘක්ෂයන්ට අධිගෘහිත විමාන සකසා ගෙන දෙව් දේවතාවුන් වැඩ සිටිනවා. ඒ අයටත් සියලු සම්පත් ඇති අතර, ඊටත් වඩා තාවතිංසය, තුසිතය ආදී විමානයන්හි වැඩ සිටින දෙවියන්ට සියලුම සැප සම්පත් තිබෙනවා. එසේනම්, සිත හොඳින්, සතුටෙන්, ශ්‍රද්ධා ආදී ගුණ මතු කරගෙන පුණ්‍ය කර්මයන් කළ යුතු යි. තණ්හාව , තරහව, වෛරය, ඊර්ෂ්‍යාව දුරු කරගෙන, නුවණ පහළ කරගත යුතු යි. එබඳු සිතකින් කරගනු ලැබූ පින්කමෙන් සරු සාර විපාක ලැබෙයි.

අප සිතම සකසා ගත යුතු යි. කරුණා, මෛත්‍රී , දයාව, අනුකම්පා ආදී ගුණ දියුණුවෙන් අවිහිංසාවාදී ව කාටවත් කරදර , පීඩාවක් නැතිව ජීවත් විය යුතු යි. තුනුරුවන් වැඳ පුදා ගනිමින් , දාන, ශීල, භාවනා , පින්කම් කරගත යුතු යි. එවිට, විමානයකට පත්ව දිව්‍යාංගනාවක්, දිව්‍යරාජයෙක් ව සියලු සැප සම්පත් අනුභව කළ හැකි යි. පින හොඳින් වැඩි කරගත්තොත් නිවනට පත් වෙන්නත් පුළුවන්.

අද ලෝකයේ මිය යන විශාල සංඛ්‍යාවක් දුකටයි, පත් වෙන්නේ. බොහෝ දෙනා මවට, පියාට සලකන්නේ නැහැ, පන්සිල් රකින්නේ නැහැ, අනුන්ට කරදර පීඩා කරනවා, වෙහෙර විහාරස්ථානවලට කරදර කරනවා, ඒ නිසා ඒ අයගේ ජීවිත සැපවත් වන්නට බැහැ. සතර අපාය තිරි සතුන්ගෙන් පිරී පවතිනවා. පින් දහම් කළ බොහොම ස්වල්ප දෙනෙක් පමණක් මරණින් මතු සුගතිගාමී ව දෙව්ලොවට, බඹලොවට යනවා. නිවනට පත්වෙන්නේ අතලෙ ාස්සක් පිරිස පමණ යි.

නිවැරැදි ප්‍රතිපත්ති මඟ ගමන් කළොත්, ඕනෑම කෙනෙකුට දිවයන සම්පත් ලබන්න පුළුවන්. දිව්‍ය විමාන වලට පත් ව සුඛිත මුදිත ව සිටින්න පුළුවන්. මෛත්‍රී මහ බෝසතාණෝ , දුටුගැමුණු දිව්‍ය රාජයා , කාවන්තිස්ස රජතුමා, විහාර මහා දේවි, ආදී උතුමන් මහා දිව්‍ය විමානවල දිව්‍ය සම්පත් අනුභව කරන්නේ කළ පින්කම්වල විපාක නිස යි. මේ ගැන සිතා කවුරුත් පවට බිය වී පින් දහම් වැඩි කළොත්, සැපවත් විමානයක වාසය කළ හැකි යි.

බොහෝ සත්ත්ව සංඛ්‍යාවක් නරක, තිරිසන් , ප්‍රේත , අසුර සතර අපායන්ට වැටී දුක් විඳින්නේ සිත හොඳ නැති නිස යි. පවිටු චේතනාවන් දියුණු කරගෙන මිය ගොස් නරකාදියට වැටෙනවා. මේ ගැන කවුරුත් කල්පනාවෙන් හොඳ දේ කළොත් හොඳ විපාක ද , නරක දේ කළොත්, නරක විපාක ද ලැබෙන බව තේරුම් ගන්නවා නම්, ලොවේ සැමට ම සුගතිගාමී විය හැකි යි. නමුත් එය තේරුම් ගන්නට තරම් නුවණ මදි නිසා සතුන් මැරීමේ , සොරකමේ, මත් ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවීම, බොරුව, වංචාව, කපටිකම, කාමමිථ්‍යා චාරය, ආදිය අද ලොවේ සීමාවක් නැහැ. මෙලෙස දරුණු පව් කර ඒ අය මෙලොවත් , සංසාරයේත් දුක් විඳිනවා.

දෙව්ලොව, බඹලොව පතා පින් නොකර සැම කෙනෙකුම නිවන් සුව පතා පින් දහම් කර ගන්න. එවිට මරණින් මතු සුගතිගාමී විය හැකි යි. ලොවුතුරා බුදුවරු වැඩ සිටින කාලයේ අති විශාල පිරිසක් යහපත් දේ සිදු කර, සුගති පරායන වී වටිනා විමාන වස්තු වලට පත් වෙනවා. ඒ බුද්ධ ශාසනය ඔබ අප සැමට ම ලැබී තිබෙනවා. එය ආරක්ෂාවෙන් දියුණුවෙන් කටයුතු කළොත්, වටිනා ජීවිත පෙළක් තමන්ට ලබන්න පුළුවන්. අනන්ත බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලාගේ අතීත චරිත දෙස බැලීමේ දී නිවන් දකිනා තුරා සුගතිගාමී ව වාසය කළා. ඒ හොඳ ක්‍රියාවන් සිදු කර සිතම දියුණු තියුණු කරමින් කටයුතු කළ නිස යි.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**



අම්බස්තල දාගැබ

# මිහින්තලාවේ හෙළ අභිමානය ලොවටම පෙන්වන විස්මිත නිමැවුම්

**මිහින්තලේ හෙවත් මිස්සක පව්ව නමින් හැඳින්වෙන කඳු පර්වතය ආශ්‍රිත පෙදෙස අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ මහ රහතන් වහන්සේලා සිය ගණනකට සෙවණ සැලසූ අතර උන් වහන්සේලාගේ පාද ස්පර්ශයෙන් පාරිශුද්ධත්වයට පත් වූ පින්බිමකි. මිහින්තලා භූමිය අනුරාධපුරයේ සිට ත්‍රිකුණාමලය මාර්ගයේ කිලෝමීටර් 15ක් පමණ දුරින් මාර්ගයට ඉතා සමීපව පිහිටා ඇත. මිහිඳු හිමියන් වැඩම කළ මිහින්තලයට යන සැහැදැවතුන් විසින් නැරැඹිය යුතු ස්ථාන රැසක් ඇත**

## අම්බස්තල දාගැබ

මහාදාඨික මහා නාග රජු විසින් පළමුවෙනි සියවසේදී අම්බස්තල සෑය ඉදි කළ බව සැලකේ. සේල චෛත්‍යය ලෙසද හැඳින්වෙන මේ දාගැබ මහාවංශයේ දැක්වෙන පරිදි කණිට්ඨ තිස්ස රජු (ක්‍රි.ව. 167 – 186) ඒ වටා චේතියඝරයක් හෙවත් වටදා ගෙයක් ඉදිකර ඇත. ගෝඨාභය රජු (ක්‍රි. පූ. 249 – 262) විසින් මෙම චේතියඝරය ප්‍රතිසංස්කරණය කර ඇති බවත් මහා වංශයේ ම සඳහන් වේ. මිහිඳු හිමි දේවානම් පියතිස්ස රජුගෙන් විමසූ ‘අඹ පැනයට‘ අයත් අඹ ගස පිහිටා තිබූ ස්ථානයද මෙම ස්ථානය බවට විශ්වාසයක් පවතී.

## මිහින්තලා මහ සෑය

ක්‍රිස්තු වර්ෂ 9 වන සියවසේ රජකළ මහාදාඨික මහා නාග රජු විසින් කරවන ලද මිහින්තලා මහා සෑය මිස්සක පව්වේ පිහිටි විශාලතම දාගැබයි. බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතුන් වහන්සේ නිදන් කොට තනන ලදැයි පැවසෙන මෙම මහා සෑය පූජාවලියේ හා සිවුවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ ද හැඳින්වෙන්නේ ‘අම්බුළු දාගැබ‘ ලෙසිනි.

## මිහිඳු සෑය

මිහිඳු මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු උන්වහන්සේගේ ධාතුන් වහන්සේ කොටසක් නිධන් කොට, දේවානම් පියතිස්ස රජුගේ බාල සොහොයුරු උත්තිය රජු විසින් ක්‍රි.පූ. 2 වන සියවසේදී කරවන ලද මිහිඳු සෑය මෙරට මුල්ම දාගැබ් අතරින් එකක් ලෙස සැලකේ.

1951 වසරේදී ස්තූපයේ කළ කැණීම්වලදී කළු මැටියෙන් නිම කළ කරඬුවක් හමු වූ අතර එය අඟල් 5 3/8 ක උසින් යුත් හා පතුලේ විෂ්කම්භය අඟල් 2 7/8කින් යුක්තය. එකිනෙකට යා වෙන කොටස් තුනකින් යුක්ත වූ එහි ඉහළම කොටස පියන ලෙසත්, අනික් කොටස් දෙක වෙනම හෙප්පු දෙකක් ලෙසත් භාවිත කර ඇත. මෙම කරඬුව ලංකාවේ මෙතෙක් සොයාගත් වටිනාම මැටි කරඬුව ලෙස සැලකේ.



මිහිඳු සෑය




ආරාධනා ගල




පුරාණ වෙදහල




කණ්ඨක චෛත්‍ය



කටුසෑය



මිහින්තලා මහ සෑය



රාජගිරි ලෙන් කන්ද

## පුරාණ වෙදහල

මිහින්තලා කන්දට යන මාර්ගයේ දකුණු පස ‘අඹ කොටුව‘ අසල නටබුන් ව ගිය විශාල භූමිය පුරාණ වෙදහල ලෙස හැඳින්වේ. දහස් ගණනක් වූ භික්ෂූන් වහන්සේ ද, උන් වහන්සේ සඳහා ඇප උපස්ථාන කරන්නට සිටි සේවක ජනයා ද ඇතුළු විශාල පිරිසකගේ සෞඛ්‍ය අවශ්‍යතා උදෙසා මේ වෙදහල ස්ථාපනය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

දෙවන සේන රජතුමන් ක්‍රි.ව. 853 – 887 අතර කාලයේ මේ වෙදහල කළ බව චූලවංශයේ දක්වා තිබේ. වෙදහලේ ඇති ‘බෙහෙත් ඔරුව’ සුවිශේෂී වූවකි. මෙම වෙදහලේ තිබී හමු වූ බෙහෙත් මංජුසා 2 ක් මිහින්තලයේ කෞතුකාගාරයේ ඇත.

## කණ්ඨක චෛත්‍ය

අතීතයේ ‘කිරි බඩ පවු දාගැබ‘ – ‘කිරිබත් වෙහෙර‘ නමින් හඳුන්වා ඇති මෙය 1934 වසරේදී පාදා ගැනීමට පෙර මහ ගස්වලින් පිරි කඳු ගැටයේ ම කොටසක් වශයෙන් සලකන ලදී. චෛත්‍යය හඳුනා ගැනීමට උපකාරීවන සෙල් ලිපියක් මෙම දාගැබේ බටහිර වාහල්කඩට නුදුරුව ගලක කොටා තිබී සොයා ගන්නා ලදී.


සතරදිශාවට මුහුණලා සාදා ඇති වාහල්කඩ චෛත්‍යයේ විශේෂිතම ලක්ෂණයකි. මේ වාහල්කඩ ඉපැරැණි සිංහල මූර්ති හා කැටයම් විශිෂ්ටත්වය පෙන්වීමට හොඳම නිදසුනකි.

එම ස්තූපය කණ්ඨක චෛත්‍ය නමින් නම් කර ඇත්තේ සිදුහත් කුමරුගේ කණ්ථක අශ්වයා සිහි කිරීමට බවද පුරා විද්‍යාඥයෝ පවසති.

## අටසැට ලෙන්

කණ්ඨක චෛත්‍ය අසල නැගෙනහිර කඳු බෑවුමේ ඇති ලෙන් මිහින්තලයට වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේගේ පරිහරණය සඳහා දේවානම් පියතිස්ස රජු විසින් අට සැට ලෙන් පිළියෙළ කරන ලදී. ලෙන් හැට අටක් වූ හෙයින් අටසැට ලෙන් නමින් හඳුන්වා තිබේ. භාවනා කළ භික්ෂූන් හට ලෙන් පූජා කරන්නට ඇති බව විශ්වාස කෙරේ.

ගල් ලෙන් උඩ බ්‍රාහ්මී අක්ෂර කොටා ඇති අතර පූජා කළ භික්ෂූන්ගේ නම් එහි ඇතුළත් ය. සතර දිගින් පැමිණි, නොපැමිණි භික්ෂු සංඝයා වහන්සේගේ පරිහරණය සඳහා දේවානම් පියතිස්ස මහරජු, ඔහුගේ භාර්යාව, සොහොයුරු උත්තිය රජු හා රජ පවුලේ සාමාජිකයන් මෙන් ම



අටසැට ලෙන්

සැදැහැවතුන් විසින් පූජා කළ බව ද එම බ්‍රාහ්මී ලිපිවලින් පැහැදිලි වේ. ගල්ලෙන් ඇතුළත වර්ෂා ජලයෙන් නොතෙමෙන්නට ගල උඩින් කටාරම් කොටා ඇත.



නාග පොකුණ



ඇත්වෙහෙර




සන්නිපාත ශාලාව



කළුදිය පොකුණ



මිහිඳු ගුහාව




ඉදිකටු සෑය



දාන ශාලාව



ධාතු මන්දිරය හා මිහිඳු රජුගේ පුවරු ලිපි



සිංහ පොකුණ

## සන්නිපාත ශාලාව

භික්ෂූන් වහන්සේ රැස්වී විවිධ පොදු කරුණු සාකච්ඡා කිරීම පිණිස ඉදි කළ මණ්ඩපයකි. සංඝයා වහන්සේලා එක්තැන් වූ ස්ථානය මේ නමින් හැඳින්වේ. සමචතුරශ්‍රාකාර එම ගොඩනැගිල්ල එක් පැත්තක් අඩි 63 පමණ වේ. ගලින් කරන ලද, මේ ගොඩනැගිල්ල ගල් කණු 64කින් පමණ දරා සිටි වහලයකින් සමන්විත ය.

එය රැස්වීම් ශාලාවක ස්වරූපය ගත් බව පැහැදිලි ය. එහි සිව් දිසාවට දොරටු සතරකි. ශාලාව මැද ආසනයකි. එය මූලසුන හෙබවූ භික්ෂූන් වහන්සේගේ ආසනය බව සැලකේ.

## ධාතු මන්දිරය හා මිහිඳු රජුගේ පුවරු ලිපි

සිවුවන මිහිඳු රජුගේ (ක්‍රි.ව. 950 – 972) මිහින්තලා පුවරු ලිපිය පිහිටා ඇත්තේ, ධාතු මන්දිරයට ඇතුළුවන දොරටුව දෙපස ය. ධාතු මන්දිරය චතුරශ්‍රාකාර ගොඩනැගිල්ලකි. මෙම මන්දිරය ඉහළ මාලයකින් ද සමන්විත වන්නට ඇතැයි සැක කෙරේ. පහත මාලය පිළිම ගෙයක් වශයෙන් සකස් වන්නට ඇතැයි ද සිතිය හැකි ය.

මිහින්තලේ ඉතිහාසය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු රාශියක් හෙළි කරන මිහිඳු පුවරු ලිපි හතරවන මිහිඳු රජු කාලයේ කරවා ඇත. මෙම පුවරු ලිපි දෙක දිගින් හා පළලින් එක සමානය.

## සිංහ පොකුණ

කණ්ඨක චෛත්‍ය හා සන්නිපාත ශාලාව අසබඩ ජීවත් වූ භික්ෂූන් වහන්සේගේ පැන් පහසුව පිණිස මෙය ස්ථාපිත කළ බව සඳහන් වේ.

සිංහ පොකුණ යැයි හැඳින්වුව ද මෙය පොකුණක් ම නොව, පසු පාද දෙකින් සිටගෙන සිටින අයුරින් ගලින් නෙළන ලද සිංහයකුගේ මුවින් ජලය පිටවන දිය පිහිල්ලකි. මෙතැනට ජලය ලබාගෙන ඇත්තේ ඉහළින් ඇති නාග පොකුණේ සිට යොදා ගත් මැටියෙන් කළ නළ මගිනි.

## දාන ශාලාව

මිහින්තලා මැද මළුවට පිවිසෙන ප්‍රධාන දොරටුව අසලින් වම්පසින් දාන ශාලාව පිහිටා ඇත. බත් ගෙය නමින් ද හැඳින්වෙන මෙය දිගින් අඩි 114ක් හා පළලින් අඩි 77ක් ද වන මැද මිදුලක් සහිත ගොඩනැගිල්ලකි. මැද මිදුල දිග අඩි 62කින් හා පළල අඩි 25කින් යුක්ත ය. භික්ෂූන් වහන්සේ දහස් ගණනකට එකම වේලාවක දානය වළඳන්නට එහි ඉඩකඩ සකසා ඇත.

ගොඩනැගිල්ලේ දකුණු කෙළවර මුල්තැන්ගේ ය. බටහිර කොටස ගබඩාවක් වූ බවට සැක කෙරේ. නැගෙනහිර පැත්තට වන්නට පැන්, කැඳ, බත් ආදිය පහසු ලෙස තබා ගන්නට සකස් කරන ලද ඔරු දෙකක් ඇත. එයින් කුඩා ඔරුව කැඳ ඔරුව වශයෙන් සැලකේ.

## ආරාධනා ගල

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රථමයෙන් දේවානම්පියතිස්ස මහ රජතුමාට 'තිස්ස' යන නාමයෙන් ආමන්ත්‍රණය කළේ මෙම ගල් පර්වතයේ සිට බව සාම්ප්‍රදායික විශ්වාසයයි.

මිහිඳු මහ රහතන් වහන්සේගේ මඟ පෙන්වීම අනුව සුමන සාමණේරයන් වහන්සේ විසින් දෙවියන්ට ධර්මය ශ්‍රවණය සඳහා මේ පර්වතයේ සිට ආරාධනා කරනු ලැබූ හෙයින් එය 'ආරාධනා ගල' යනුවෙන් ද මතයක් පවතී.

## මිහිඳු ගුහාව

අම්බස්තල දාගැබේ සිට කඳු බෑවුම් දෙසට දිවෙන කුඩා අඩිපාර මිහිඳු ගුහාව තෙක් විහිදේ. මිහිඳු ගුහාව මිහිඳු මහ රහතන් වහන්සේ සැතපී විවේක ගත් ස්ථානය ලෙස සැලකේ.

මිහිඳු මහ රහතන් වහන්සේ වස් විසීම සඳහා තෝරා ගෙන ඇත්තේ ද මෙම මිහිඳු ගුහාවයි.

මිහිඳු ගුහාව අභ්‍යන්තරයෙහි ගලේ ම කොටා ඔප මට්ටම් කළ ඉතා සිනිඳු ඇතිරිල්ලක් බඳු ආසනයක් ඇත. එය ස්වභාවයෙන් ම නිර්මාණය වී තිබෙන්නකි. මිහින්තලා කන්දේ බෑවුමක පිහිටා ඇති හෙයින් අවට පරිසරය ඉතා සිත් ගන්නා සුළු ය.

## නාග පොකුණ

පළමුවැනි අග්ගබෝධි (ක්‍රි. ව. 575 – 608) කාලයේ මෙම පොකුණ කළ බව චූලවංශයේ දැක්වේ. මිහිඳු මාහිමියන් අනුරාධපුරයේ සිට වස් වැසීම පිණිස මිහින්තලයට වැඩම කළ අවස්ථාවේ මෙම පොකුණෙන් පැන් පහසුව සලසා ගත් බව මහාවංශයේද දැක්වේ.

දිග අඩි 36ක් පමණ හා පළල අඩි 15ක් පමණ ප්‍රමාණයකින් යුත් නාග පොකුණ ගල් බැමි බැඳ නයි පෙන පහකින් අලංකාර කොට ඇත. ඉහළ කඳු මතින් ගලා එන දිය පාර එක් රැස් කර එය තනා ඇත.

## ඇත්වෙහෙර

මිහින්තලා කඳු පන්තියේ උසම කන්ද ලෙසින් සැලකෙන්නේ ඇත් වෙහෙර කන්දයි. මෙම ස්තූපයට මහාදාඨික මහානාග රජු විසින් කරන ලද පූජාවක් පිළිබඳව ද සෙල්ලිපියක සඳහන් වේ. ඇතුළු විහාරය යන නම ඇසුරෙන් මෙම දාගැබ ඇත් වෙහෙර නමින් හැඳින්වේ.

## ඉදිකටු සෑය

පොළව මට්ටමේ සිට අඩි 5 1/2ක් උසට බැඳි ඇති හතරැස් ගල් වේදිකාවක් මත පිහිටා ඇත. වේදිකාව නැගීමට පිය ගැට පෙළක් ඇත. මෙම ස්තූපය 1 වන සේන රජුගේ රාජ්‍ය සමයේ ඉදිකරන ලද්දක් බව පුරාවිද්‍යාත්මක සාධක අනුව නිර්ණය කොට ඇතත් ගොඩනැගූ අය ගැන සඳහනක් නොමැත.

## කටුසෑය

හතරවන මිහිඳු රජතුමාගේ මිහින්තලා පුවරු ලිපියෙහි හඳුන්වා ඇති කටු සෑය මෙය බව හඳුනාගෙන ඇත. ජනප්‍රවාදවල කියවෙන පරිදි මිහින්තලේ ගොඩනැගිලි තැනීම ආදි කර්මාන්ත සඳහා භාවිත කළ අවි ආයුධ හා උපකරණ තැන්පත් කර කටුසෑය ඉදි කර ඇත. නැගෙනහිරින් දොරටුව ඇති මෙහි මුරගල්, කොරවක් ගල්, සඳකඩ පහණ, පියගැට පෙළ ආදිය ද දක්නට ඇත. වේදිකාවක් මත ඉදිකර ඇති චෛත්‍යය පේසා වළලුවලින්ද සමන්විත ය.

## රාජගිරි ලෙන කන්ද

ප්‍රධාන කඳු 4 කින් සමන්විත මිහින්තලා කඳු පන්තියේ එක් කන්දක් ලෙස රාජගිරි ලෙන කන්ද දැක්විය හැකිය. මිහින්තලේ කළුදිය පොකුණට ප්‍රතිවිරුද්ධ දෙසින් වූ මෙය ක්‍රි.පූ. 3 වන සියවසේ සිටම භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා වැඩසිටි ස්ථානයකි. එහි කටාරම් සහිත ගල්ලෙන් ගණනාවක් පවතින අතර මහනුවර යුගයට අයත් පිළිම ගෙයක් ද දක්නට ලැබේ. එහි තිබූ සැතපෙන බුද්ධ ප්‍රතිමාව නටබුන් බවට පත්වී තිබේ. ලෙන් වල ඇති බ්‍රාහ්මී අක්ෂර ක්‍රි.පූ. 3 වන සියවසට අයත් වන අතර එහි දේවානම්පියතිස්ස රජුගේ නම සඳහන් වන බැවින් මෙම ස්ථානය 'රාජගිරි ලෙන' ලෙස හඳුන්වයි.


## කළුදිය පොකුණ

භාවනායෝගී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඉදිවූ ආරණ්‍ය සේනාසනයක් උදෙසා ගහකොළින් වට වූ පෙදෙසක කළුදිය පොකුණ ඉදි කර ඇත. පොකුණට එම නම ලැබුණේ පොකුණ අවට ගස්වැල්වල ඡායාව දියෙහි පතිත වූ අඳුරු පැහැති ස්වභාවය නිසා බව ජනතා විශ්වාසයයි. නිසසල පරිසරයක පිහිටි දිගින් අඩි 200ක් පමණ ද, පළලින් අඩි 70ක් පමණ වූ මෙම පොකුණ හතරවන කාශ්‍යප රජු විසින් ඉදිකර ඇති බව පුරා විද්‍යාඥයන් ගේ මතයයි. කළුදිය පොකුණ ආසන්නයේ ගල්ලෙන්, ස්නානාගාර, දානශාලා, භාවනා ශාලා, දාගැබ් හා පිරිවෙන් රැසක් ම දක්නට ලැබේ. සිවුවන කාශ්‍යප රජු විසින් මෙම පොකුණ ඉදි කළ බව සඳහන්ය.

තාරක වික්‍රමසේකර

සේයාරූ - ගාමිණී ජයසිංහ

# දැහැමි රාජ්‍ය පාලනයක ශ්‍රී විභූතිය



**බුදුරජාණන් වහන්සේට ‘අනුත්තරෝ පුරිසදම්ම සාරථී’ කියනවා. මේ ලෝකයේ බොහොම දරුණුම මිනිස්සු, දරුණු පුද්ගලයෝ , අකීකරු අය, කෙනෙක් ඉදිරියේ මාන්නයෙන් පිළිගන්නේ නැති, දමනය කරගන්න අපහසු බොහොම දැඩි පුද්ගලයන් පවා බුදුරජාණන් වහන්සේට දමනය කරන්න පුළුවන් වුණා, ධර්මය තුළ හික්මවන්න පුළුවන්කම තිබුණා. ඒ අතර බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවාට පසුව උන්වහන්සේගේ ධර්මය ශාස්තෘත්වයට පත් කළා.**

එද බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා අවුරුදු දෙසිය තිස් ගණනකට පසුව දඹදිව පහළ වුණ බොහොම දරුණු අධිරාජ්‍යයෙක් ව සිටි ‘චණ්ඩාශෝක’ නමින් යුධකාමී දරුණු මිලේච්ඡ රජකෙනෙක් සිටියා. මේ රජතුමා කෙළවරක සිටන් ප්‍රදේශ යටත්කරගෙන , මිනිසුන් මරමින් විශාල යුද්ධයක් දිගින් දිගටම කරගෙන ගියා.‘කාලිංග‘ නම් වූ මේ යුද්ධයත් සමඟ දස දහස් ගණන්, ලක්ෂ ගණන් මිනිස්සු යුදපිටිවල, යුදභූමියේ මිය ගියා. මෙලෙස විශාල යුද්ධයකින් පසුව මුළු දඹදිව තලයම යටත් කරගෙන බොහොම යුදකාමී මිලේච්ඡ රජෙක් ලෙස ‘චණ්ඩාශෝක’ රජතුමා මිනිසුන් හැඳින්වූවා.

නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ ආශ්චර්ය නිසා චණ්ඩාශෝක ‘ධර්මාශෝක’ බවට පත්වුණා. පුංචි සාමණේර ස්වාමීන් වහන්සේ නමක් මේ රජතුමා දමනය කළා.

පුංචි සාමණේර මහ රහතන් වහන්සේ ධම්මපදයේ සඳහන්වෙන ‘අප්පමාද වර්ගයේ’ ගාථා ඇතුළත් කරමින් රජතුමාට දහම් දෙසුවා. එහි සඳහන් වෙන්නේ අප්‍රමාදී ව, ධර්මය දියුණු කරන ආකාරය යි. අකුසල් ප්‍රහාණය කර, කුසල් දියුණු කරගනිමින් අප්‍රමාදී ව ධර්මාවබෝධය කරා යන ආකාරය යි. එද ධර්මය ශ්‍රවණය කළ රජතුමා පැහැදීමෙන්, නිතර ධර්මය ශ්‍රවණය කරන්න, ස්වාමීන් වහන්සේ මුණ ගැසෙන්න , බුද්ධ ශාසනය ගැන සොයන්න, මහ රහතන් වහන්සේලා ඇසුරු කරන්න පටන් ගත්තා. එද දරුණු ‘චණ්ඩාශෝක’ රජතුමා ‘ධර්මාශෝක’ බවට පත්වුණේ කුඩා ස්වාමීන් වහන්සේගෙන් බණ ඇසීමෙන්.

දවසක් ධර්මාශෝක රජතුමා සොයා බැලුවා ඒ වෙද්දී වැඩ සිටින ශ්‍රේෂ්ඨතම මහ රහතන් වහන්සේ කවුද යනුවෙන්. එවිට දැනගත්තා මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ යනුවෙන්. පණිවුඩ කිහිපයක්ම යැවුවත් මුණ නොගැසුණු ස්වාමීන් වහන්සේ අවසානයේ බුද්ධ ශාසනය වෙනුවෙන් වැඩම කළා. රජතුමා උන්වහන්සේ බොහොම ගෞරවයෙන් වඩම්මවා ‘ස්වාමීනි, බුදුන් වහන්සේගේ ධර්මය කෙතරම් ද’යි විමසුවා. අසූහාරදහසක් බව වදළ විට ‘ස්වාමීනි, මගේ රාජ්‍ය තුළ යොදුනින් යොදුන අසූහාරදහසක් වෙහෙර විහාර ඉදිකරන බව වදළා. එද වුණ පොරොන්දුව ඉෂ්ඨ සිද්ධ කළ රජතුමා තමන්ගේ එකම පුතණුවන් වන මහින්ද කුමාරයා මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේ ළඟ පැවිදි කළා. ධර්ම විනය හොඳින් හදරා , ත්‍රිපිටක ධර්මය හොඳින් කටපාඩම් කරගෙන උතුම් ඍද්ධි බල සම්පන්න මහ රහතන් වහන්සේ නමක් බවට මිහින්ද මහ රහතන් වහන්සේ පත් වුණා.

තම දියණිය ද සංඝමිත්තාව ද , මුණුබුරා සුමන සාමණේරයන් වහන්සේ ද බුද්ධ ශාසනය තුළ පැවිදි වුණා. රජතුමා බුද්ධ ශාසනයට විශාල සේවයක් සිදු කළා.



අතුරුගිරිය සදහම් පදනමේ අනුශාසක

**ගලිගමුවේ ඤාණදීප හිමි**

තුන්වන ධර්ම සංගායනාව සූදනම් කරන්න මූලිකත්වය ද දැරුවේ රජතුමා යි. බලන්න, රජකෙනෙක් තිසරණයේ පිහිටියාට පසුව ,ධර්මය ගැන පැහැදුණාට පසුව බුද්ධ ශාසනය කෙතරම් යහපතක් ද? ඒ වෙද්දී ශාසනය ඇතුළත්ව ධර්ම විනය විකෘති කරමින් සිටි අන්‍ය තීර්ථකයන් බොහෝ පිරිසක් සිවුරු දරාගෙන ඒ අයගේ දූර්මත ධර්මය ලෙස පැවසුවා. බුද්ධිමත් රජතුමා මහ රහතන් වහන්සේලාගේ උපදෙස් පරිදි , අවවාද අනුශාසනා පරිදි ශාසනය පිරිසුදු කරන්න මූලිකත්වය ගත්තා. ඒ අනුව සිවුරු දරාගත් අන්‍ය තීර්ථකයන් හැට දහසක් ශාසනයෙන් ඉවත් කර රහතන් වහන්සේ දහසක් එකතුවෙන් තුන්වන ධර්ම සංගායනාව සිදු කළා. එහිදී මෙන්න ධර්මය, මෙන්න විනය යනුවෙන් ධර්ම විනය ස්ථාපිත කළා. එමෙන්ම රටවල් ගණනාවකට ධර්ම දූත කණ්ඩායම් පිටත් කර යවා ධර්මය ව්‍යාප්ත කළා. එකල ලක්දිව රජ කළේ මුටසීව රජතුමා යි. වයෝවෘද්ධ ව සිට මියගිය එතුමාගේ පුතණුවන් වන දේවානම් පියතිස්ස රජතුමා මුලින්ම ‘තිස්ස’ නමින් රාජාභිෂේක ලැබුවා. එද දඹදිව රාජ්‍ය කළ ‘ධර්මාශෝක’ රජතුමා ලක්දිව තිස්ස රජතුමාට දෙවියන්ට ප්‍රිය වූ ‘දේවානම්පියතිස්ස’ නමින් ගෞරව නාමය ලබා දී දෙවන වතාවට රාජාභිෂේක ලැබුවා.

පොසොන් පෝ දවසක මිස්සක පව්වට මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු ඉත්ථිය, උත්තිය, සම්භල, භද්දසාල, සුමණ සාමණේරයන් වහන්සේ භණ්ඩුක උපාසක තුමාත් සමඟ ලංකාභූමියට වැඩම කළා. එද විසි දහසක් පිරිවර සමඟින් ‘දේවානම් පියතිස්ස රජතුමා’ දඩයමේ ගියා. නමුත් ඇමැතිවරු විසිදහසක් සමඟින් රජතුමා දඩයමේ ගියේ මාලිගාවේ කැමට යමක් නැතිව නොවේ. පෝය දවසක වුණත් රජතුමා පුරුදු වෙලා සිටියේ විනෝදයට දඩයමේ ගිහින් ප්‍රාණඝාත ආදී අකුසල් කරන්න යි. එද මිහිඳු මහ රහතන් වහන්සේ , රජතුමා ඇතුළු විසි දහසක් පිරිස මිස්සක පව්වේ දී තිසරණයෙහි පිහිටවූවා.

පොසොන් පොහොය දවස බුද්ධ ශාසනයේ ඉතා වැදගත් දිනයක්. එද වූ විශේෂිත සිදුවීම් අතර මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස රජතුමාට මුණ ගැසීම, රජතුමා සමඟ කළ කතා බහ ආදී කරුණු ඔබ දන්නවා.

දස රාජ ධර්මයන්ගෙන් රටක් පාලනය කරන ආකාරය , රජකෙනෙක් තුළ තිබිය යුතු රාජ්‍ය පාලන ක්‍රමය , රටවැසියා තුළ ඇතිකරගත යුතු මෛත්‍රී සහගත සිතිවිලි ,ධාර්මිෂ්ඨකම ආදී සෑම දෙයක් ම මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩම කිරීමත් සමගම එද මේ රටේ රජවරු, ප්‍රාදේශීය රජවරු, අමාත්‍යවරු , රාජ්‍ය පාලනය කළ සියලුම දෙනා බුදු දහමෙන් පෝෂණය වුණ ,ධර්මයෙන් පෝෂණය වුණ, ධර්මානුකූල රාජ්‍ය පාලනයක් පවත්වාගෙන ගියා. ඒ නිසා තමයි, මේ රජ පරම්පරාවන් බුද්ධ ශාසනයට තුනුරුවන්ට ජීවිතය පූජා කරමින් අපේ රටේ ඉතිහාසය පාලනය කළ බොහෝ රජවරු ලංකා රාජ්‍ය කිහිප වතාවක් ම සම්බුදු ශාසනයට පූජා කරනවා.

රුවන්මැලි මහා සෑය වැනි මහා සෑය ලක්දිව අනුරපුර, පොළොන්නරුව ආදී රාජ්‍යයන්හි වෙහෙර විහාර, විශාල චෛත්‍ය ඉදි කළා. අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණ ඇතිවුණ වේලාවේ පවා අපේ රජවරු පලාගිය තැන් සෑම තැනකම වෙහෙර විහාර ඉදිකරමින්, ඔබ අසා ඇති පරිදි වළගම්බා රජතුමා වසර ගණනාවක් සොළී ආක්‍රමණ යටතේ සැඟවෙමින් සේනා සංවිධාන කරගෙන සිටියා. මේ සෑම තැනකම ආරාම, වෙහෙර විහාර ඉදි කළා. අද ලංකාවේ තියෙන සෑම තැනම විහාරස්ථානවලින් විශාල ප්‍රමාණයක් වළගම්බා රජතුමා සැඟවෙමින් සිටි, සේනාසංවිධාන කළ සෑම ප්‍රදේශයකම ඉදි කළ බොහෝ වෙහෙර විහාර යි.

ඒ නිසා අපේ රටේ ඉතිහාස රජවරු තෙරුවන් සරණ ගොස් , බුද්ධ ශාසනය ගැන පැහැදී , බොහෝ වෙහෙර විහාර ඉදිකරමින්, මහා සංඝයාගේ අවවාද අනුශාසනා මත , ධර්මානුකූල, ධාර්මිෂ්ඨ, රාජ්‍ය පාලනයක් පවත්වාගෙන ගියා. ඒ නිසා මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම වීමත් සමඟ ම බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලංකාභූමියට ලැබුණා වගේ ම අපේ රටේ පාලකයන්ට, මිනිසුන්ට ධර්මානුකූලව තමන්ගේ ජීවිතය එදිනෙද මෙලොවත් පරලොවත් යහපත පිණිස ජීවත් වීමේ ජීවන රටාවක් ජීවිතයට එකතු කරගන්න ලැබුණා.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**



# ලොවක් වසඟ කළ හෙළ කලා ශිල්ප

## චමත්කාරජනක සෞන්දර්ය විඥානය

**බෞද්ධාගම පදනම් වූ සංස්කෘතියක් ඇති කිරීම සඳහා මිහිඳු මාහිමියෝ දුරදර්ශී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළහ. මෙරටට වැඩම කිරීම සඳහා සුදුසු කාලය තීරණය කිරීම, රජතුමා සහ රටවැසියන්ට දේශනා කිරීමට සුදුසු ධර්ම දේශනා තෝරාගැනීම පමණක් නොව, බුද්ධ ශාසනය ලංකා භූමියෙහි මනාව ස්ථාපිත කිරීම සඳහාත් උන්වහන්සේ තවත් පියවර කීපයක් ම අනුගමනය කළහ.**

ලක්දිව පාලන අගනගරය වුණු අනුරාධපුරය ඇතුළත් කර මහාවිහාර සීමාව ලකුණු කරන්නට යෙදුණේ ඒ සීමාවට යටත් වූ ප්‍රදේශය බුද්ධාඥාවට යටත් වන්නේ යැයි සැලකීම හේතුවෙනි. මුළු රටම පාලනය කරන අගනුවර බුද්ධාඥාවට ලක්වීම මුළු රටම බුද්ධාඥාවට යටත් වූවා හා සමානය. එනම් මුළු රටේම බුද්ධ ශාසනය පැතිරීගියා හා සමාන ය. ලංකා භූමියෙහි පමණක් නොව ලක් වැසියන්ගේ සිත්වල ද බුදු දහම ස්ථාවර වීමට එකී ක්‍රියාව හේතු වූ බව නිසැකය. එසේම ලංකාවේ ම මව්පියන්ගෙන් ලංකාවේ ම උපන් පුතකු ලංකාවේ ම පැවිදි වී, ලංකාවේ ම විනය හදාරා ලංකාවේම විනය සංගායනා කළ විට සසුන මුල්බැස ගන්නේ යැයි සැලකූ බැවින් මිහිඳු මාහිමියන් විසින් ගන්නා ලද ඊළඟ පියවර වූයේ අරිට්ඨ කුමරු පැවිදි කිරීම, තමා සමඟ සම අස්නෙහි හිඳ විනය සජ්ඣායනා කිරීම සහ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා යෙදවීමයි. එතැන් පටන් ජාතිය හා ආගම දෙකක් නොව එකක් ලෙස සැලකුණු අතර රාජ්‍ය සංස්ථාව විකාශනය වූයේ ද, ක්‍රියාත්මක වූයේ ද බෞද්ධාගම පාදක කරගෙන ය. ඉතිහාසය මුළුල්ලේ ම රජකම හිමිවීම සම්බන්ධයෙන් බලපෑ නීති පද්ධතියේ ප්‍රථම නීතිය වූයේ මෙරට පාලකයා අනිවාර්යයෙන්ම බෞද්ධයෙකු විය යුතු බවයි. මෙය කඩකළ නොහැකි වූත්, සෑම අතින්ම ආරක්ෂා කළ යුතු වූත් නීතියක් විය. මෙතැන් සිට ලංකා වාසීන්ට බුද්ධාගම හුදෙක් මෙලොව පරලොව සෙත සලසන ආගමක් හෝ බුද්ධිමය දර්ශනයක් පමණක් නොවී ය. එය එදිනෙදා ජීවිතය කෙරෙහි බලපෑ සමාජ නීති පද්ධතියේත් හැඩ ගැසීම හා පැවැත්ම කෙරෙහි විශේෂ බලපෑමක් ඇති කළ සංස්කෘතික දර්ශනයක් විය. එසේ හෙයින් මෙම යුගයේ පටන් ආරම්භ වුණු සාහිත්‍ය මෙන්ම කලා නිර්මාණවල පවා බෞද්ධ සංස්කෘතියෙන් ඔප්නැංවුණු නිර්මාණ ලක්ෂණ විද්‍යාමාන වෙයි.

නව ආගමික පරිසරය නිසා හඳුනාගන්නට ලැබුණු නැවුම් සංකල්ප ද අල්පේච්ඡතාව සහ සරල බව ද තාක්ෂණික ඥානය සහ නිර්මාණාත්මක බව ද ලක්දිව කලා නිර්මාණවලට සෞන්දර්යාත්මක ආරම්භයක් එක් කළේ ය. බෞද්ධ වන්දනා ක්‍රම අතර මූලික වන ශාරීරික, පාරිභෝගික, උද්දේසික ධාතු වන්දනය සඳහා අවශ්‍ය නිර්මාණ ගොඩනැංවීම සිදුවූයේ මහින්දාගමනයෙන් අනතුරුව හඳුනාගත් බෞද්ධ සංස්කෘතියේ මහිමයෙනි. වෘක්ෂ වන්දනය වෙනුවට උතුම් ශ්‍රී මහා බෝධි වන්දනයටත්, මළවුන් ඇදහීම වෙනුවට නිවන් මග අවබෝධ කරගත් බුදුරජාණන් වහන්සේ වන්දනයේත් වටිනාකම ජනතාවට වටහා දුන් උන්වහන්සේ බුදුන් වැඳීම සඳහා සර්වඥ ධාතූන් නිධන් කළ චෛත්‍යයක අවශ්‍යතාව හඳුන්වා දුන් හෙයින් බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ නිධන් කළ ථූපාරාමය ඉදි කෙරිණි. බුදු දහම වැළඳගත් සෙසු රාජ්‍ය පාලකයන් ද පසු කාලයේ සර්වඥ ධාතු නිධන් කරමින් විශාල ප්‍රමාණයේ ස්තූප ගොඩනැංවූයේ මිහිඳු මාහිමි විසින් හඳුන්වා දෙන ලද නිර්මාණ සම්ප්‍රදාය අනුගමනය කරමිනි. චෛත්‍ය කෙරෙහි වූ ගෞරවය හා භක්තිය ප්‍රකාශ කිරීම සඳහා නිර්මාණ ශිල්පීන් විසින් පසුකාලීන ව ස්තූපයට පරිවාර අංග නිර්මාණය කරනු ලැබිණි.

ස්තූපයේ පරිවාර අංග ලෙස පියගැටපෙළ පාමුල සඳකඩපහණ ද, දෙපසින් මුරගල් සහ කොරවක්ගල් ද, අලංකාර කැටයමින් යුක්ත ව නිර්මාණය කරමින් ද්වාර ප්‍රවේශය සඳහා සෞන්දර්යාත්මක ප්‍රවේශයක් ඇති කෙරිණි. එම නිර්මාණ සඳහා ද බෞද්ධ සංකල්ප ම ඇසුරු කිරීමට නිර්මාණ ශිල්පීහු පෙළඹුණහ. සඳකඩපහණ බෞද්ධාගමේ හරය කැටිකොටගත්තක් වූ අතර, කැටයම් සඳහා පවා බෞද්ධ සංකල්ප හා බැඳුණු සත්ත්ව රූප තෝරා ගැනිණි. මහාචාර්ය සෙනරත් පරණවිතානගේ මතයට අනුව සඳකඩපහණෙන් සංකේතවත් වන්නේ භව චක්‍රයයි. අර්ධ කවයේ පිටතින් ම ඇත්තේ රාග ද්වේෂාදී ගිනිදැල් ය. විහාරයට ඇතුළු වන තැනැත්තා මේ ගිනිදැල් මැඩ ඇත්, අස්, සිංහ, ගව රූ පෙළින් නිරූපිත ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතර බය නැති කරගෙන, ලියවැල නමැති තෘෂ්ණාව යටපත් කරගෙන පාරිශුද්ධිය කරා ගමන් කරයි. සඳකඩපහණ යනු පූජනීය ගොඩනැගිල්ලක ප්‍රවේශ දොරටුවේ ඇති මුල්ම නිර්මාණ අංගයයි. මෙකී සංකල්පයක් ඉදිරිපත් කිරීමේ පරමාර්ථය වූයේ එම ගොඩනැගිල්ලට පිවිසෙන්නාගේ මනස සංවර කිරීමට එය හේතු වන හෙයිනි. සංයමය මෙන්ම බුද්ධිගෝචර බව බෞද්ධ සංස්කෘතිය විසින් කලා නිර්මාණ කෙරෙහි හඳුන්වා දෙන ලද ප්‍රමුඛතම සංකල්පයයි. ක්‍රි.ව 9 සහ 10වන සියවස්වල සලපතල මළුව සහ වැලිමළුවත් ඇත් පවුරත් නිර්මාණය කර ස්තූපයේ අලංකාරය තවත් වැඩි කර තිබේ.

කුඩා ස්තූප සඳහා වටදාගේ ද විශාල ස්තූප අලංකරණය පිණිස වාහල්කඩ ද නිර්මාණය කරන්නට යෙදුණේ දෙවන පියවරක් වශයෙනි. වාහල්කඩ, ස්තූපයට එක් වූයේ මහින්දාගමනයෙන් සියවස් හතරකට පමණ පසුව ය. අනුරාධපුරයේ මිරිසවැටිය, රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය සහ මිහින්තලේ කණ්ටක චෛත්‍යය යන ස්තූප සඳහා නිර්මිත වාහල්කඩ ස්තූපය හා බැඳි බෞද්ධ සංස්කෘතික නිර්මාණ සම්ප්‍රදායේ මුල්ම පියවර කීපයකි. එම නිර්මාණ පවා හැකි තරම් සංයමයෙන් යුත් සෞන්දර්යාත්මක කැටයම්වලින් අලංකාර කිරීමට කලා ශිල්පීහු උනන්දු වූහ.

ලක්දිව චිත්‍ර සහ මූර්ති කලාවේ ආරම්භය ද මහින්දාගමනයේ ප්‍රතිඵලයක් විය. මහින්දාගමනය සිදුවූ ආසන්නයේ ම ලක්දිව වාස්තු විද්‍යාවේ නිර්මාණාත්මක අගය වැඩිදියුණු වූ නමුත් මූර්ති සහ චිත්‍ර ශිල්පයේ වර්ධනය සිදු වූයේ ඊට පසු කාලයේ දී ය. අනුරාධපුර යුගයේදී ආගමික මෙන්ම ලෞකික සිතුවම් කලා පිළිබඳ ව තොරතුරු විද්‍යමාන වේ. ආගමික විෂය සහිත සිතුවම් හෙවත් ජාතක කථා ස්තූප ගර්භය ඇතුළත ඇඳි බව මහාවංසය හා ථූපවංසයෙහි පැහැදිලිව විස්තර වෙයි. වන්දනය සඳහා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කළේ ද නිර්මාණශිල්පීන් බෞද්ධ කලාවෙන් ලද ආභාසයෙනි. අනුරාධපුරයේ බෞද්ධ මූර්ති අතර අග්‍රගන්‍ය නිර්මාණය වන්නේ බුදු පිළිමයයි. මහාථූපයේ ධාතු ගර්භයේ තැන්පත් කිරීම සඳහා දුටුගැමුණු රජතුමා අතින් ක්‍රි.පූ 2වන සියවසවන විට බුද්ධ ප්‍රතිමා නිර්මාණය ද සිදු වූ බවට සාහිත්‍ය මූලාශ්‍රය තොරතුරු දක්වයි. මහින්දාගමනයෙන් අනතුරුව හඳුනා ගන්නට යෙදුණු බුද්ධ චරිතයේ උතුම් ගුණාංග, හැකිතාක් ප්‍රතිමාවක් මඟින් නිර්මාණය කිරීමට කලා ශිල්පියා උත්සාහ කළ බවට අනුරාධපුරයේ සමාධි, තොළුවිල, අවුකන බුද්ධ ප්‍රතිමා නිදර්ශන වෙයි. මේ හා සමගාමී ව පාරිභෝගික හා උද්දේසික චෛත්‍ය සඳහා පිළිමගෙවල් සහ බෝධිඝර නිර්මාණය කිරීම බෞද්ධ කලාවේ දියුණුවේ හා ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් විය.

ගිහි පැවිදි අවශ්‍යතා සඳහා විවිධ ගෘහ නිර්මාණ ද මේ අතර බිහි විය. භික්ෂූන් වහන්සේලාට විනය කර්ම සඳහා උපෝසථ ඝර හෙවත් පොහොය ගෙවල් ද භික්ෂූන්වහන්සේලාගේ වාසය සඳහා නිර්මිත පඤ්චකාවාස හා පධානඝර හෙවත් පියන්ගල් ද, දාන ශාලා ද ආරෝග්‍යශාලා ද, ජන්තාඝර හෙවත් උණුදිය නාන පොකුණු, අනුරාධපුර බෞද්ධ කලා නිර්මාණ අතර හමුවෙයි. මේ සියල්ලක් ම මූලික අවශ්‍යතාවලට අනුව කැටයමින් ද අලංකාර කර තිබේ. පධානඝරවල දක්නට ඇති වැදගත් ලක්ෂණයක් වන්නේ කිසිදු ද්වාර ප්‍රවේශ කැටයමක් පවා නොමැති වුවත් අලංකාර බාහුල්‍යයෙන් යුත් මනහර කැටයම් සහිත කැසිකිළි ගල් පිහිටුවා තිබීමයි. මෙම කැසිකිළි ගල්වල ඉතා රමණීය විමාන නෙළා ඒ මැද කැසිකිළි සිදුර කැටයම් කර තිබේ. විසිතුරු කැටයම් නොමැති ගොඩනැගිල්ලක විසිතුරු කැටයම් සහිත කැසිකිළි ගලක් පමණක් නිර්මාණ කර තිබීම විශේෂත්වයකි.

මෙ පරිද්දෙන් ශ්‍රී ලංකාවේ බෞද්ධ යුගය ආරම්භ වීමත් සමගම ලක්දිව කලා නිර්මාණ බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ඇසුරු කරමින් වර්ධනය විය. උත්තර භාරතීය කලා සම්ප්‍රදාය මෙරට පැවති සංස්කෘතියට, දේශගුණයට සහ ආකල්පවලට ගැළපෙන සේ නව මුහුණුවරක් ගෙන හැඩගැසුණේ ය. එය මෙරට වාස්තු විද්‍යාව මෙන්ම චිත්‍ර, මූර්ති ප්‍රමුඛ වෙනත් සංස්කෘතික අංග කෙරෙහි ද බලපෑ ධර්මයක් විය. ඒ අනුව සරල සහ අල්පේච්ඡ බව ඔස්සේ හඳුනාගත් චමත්කාර ජනක සෞන්දර්ය විඥානය ද බෞද්ධාගම නිසා ලැබුණු අනුරාධපුර කලා නිර්මාණවල අනන්‍යතාව වෙයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ
ආචාර්ය **අංජලී වික්‍රමසිංහ**

# නිවන පහසු කළ මහින්දාගමන යුගයේ සමාජය



කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
මහාචාර්ය, රාජකීය පණ්ඩිත
**නාබිරිත්තන් කඩවර ඤාණරතන හිමි**

**මිහිඳු මා හිමියන් ලංකාවට බුද්ධාගම හඳුන්වා දුන් අවස්ථාව බුද්ධාගමේ දෙවන ආරම්භය හැටියටයි අපට දැනෙන්නේ. දෙවන ආරම්භය පළමු ආරම්භයට වඩා ප්‍රබලයි. ඊට හේතු ගණනාවක් තිබෙනවා. බුදුහාමුදුරුවන්ගෙන් ආරම්භ වූ ශාසනික සේවාව අවුරුදු තුන්සියයක් විතර යන කොට ඉන්දියාව තුළම අභාවයට යන තත්ත්වයකයි තිබුණේ. නමුත් මිහිඳු මා හිමියන් විසින් ලංකාවේ ඇති කළ ආරම්භය නිසා අවුරුදු දෙදහසක් විතර මේවන විට පැවතිලා තිබෙනවා.**

බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස් හයකට පසුවයි බුද්ධාගම ලක්දිවට හඳුන්වා දෙන්නේ. ඒ අවස්ථාවේ ලංකාව තුළ බුද්ධාගම වේගයෙන් ව්‍යාප්ත වුණා පමණක්ම නොවෙයි. බුද්ධ කාලයේදී වගේම විශාල පිරිස් නැවත මගඵල නිවන් අවබෝධ කරගන්න පටන් ගත්තා. මේ අනුව බලන විට පෙනී යන්නේ අද මේ දියුණුයි කියන සමාජයට වඩා එදා පැවැති නොදියුණු සමාජය ධර්මාවබෝධයට ඉතාමත් හිතකර බවයි.

මිහිඳු මා හිමියන් ලංකාවට වැඩම කරලා දින 26ක් එක දිගට අනුරාධපුරයේ වැඩ සිටිමින් මිනිසුන්ට ධර්මය දේශනා කර තිබෙනවා. ඒ අනුව මහින්දාගමනය සිදුවූ අවධියේත් ඉන් අනතුරුවත් විශාල වශයෙන් ජනතාව පැවිදි වී ඇති බවත්, ධර්මාවබෝධය ලැබ නිවන් මගඵල පසක් කරගත් බවත් , වංශ කතා හා අටුවාවල දැක්වෙනවා.

ආර්යය මාර්ගය යෙදිල තිබෙන්නේ ඉතා සරල නිස්කලංක වටපිටාවක් ඔස්සේ. බුදුහාමුදුරුවන් පහළ වූ කාලයත්, භාරතයෙන් මිහිඳු මාහිමියන් වැඩම කළ කාලයත් ලංකාවේ ඒ සරල වටපිටාව තිබුණා.

ඒ ඒ කන්නයේ ගොවිතැන් වැඩ හමාර වුණාම හැමෝටම විවේකයි. ඒ නිසා තමයි මේ තරම් වෙහෙර විහාර, වැව් අමුණු හදන්න හැකි වුණේ. අද කාලයේ වැඩක් නොකරන වෙලාවට මිනිස්සු කරන දේ පෙනෙනවානේ. ඒ කිසිවක් එදා තිබුණේ නැහැ. ඒ නිසා බුද්ධ ධර්මය හඳුන්වා දුන්නාම මිනිස්සු බුද්ධාගම සැබෑවටම වැළඳගත්තා. මුළු ජීවිතය ම ධර්මනුකූල වුණා.

අප අහල තිබෙනවා සාර්ථකත්වයට පත් අය ගැන කියන විට දුක දිනූ අය කියලා.. අගහිඟකම්, අසරණකම්, කියන්නේ පසුතැවෙන්න, සියදිවි හානි කරගන්න හේතු නොවෙයි. ධනාත්මක ව හිතන්න හැකි නම්, දුප්පත්කම නිසා දියුණු වීමට අවශ්‍ය ලොකු ජවයක්, ධෛර්යයක් හිතේ උපදිනවා. අද දුප්පත්කම කියන්නේ සල්ලි නැතිකමට ම පමණයි.ගුණ නුවණ, නිරෝගිකම , ආදරය , සෙනෙහස වැනි දේ මොනතරම් තිබුණත් සල්ලි නැත්නම්, දුප්පත් කියන මානසිකත්වයකයි අද මිනිසුන් ජීවත්වෙන්නේ. ස්වීඩනය,නෙදර්ලන්තය , පින්ලන්තය වැනි පළමු ලෝකයේ රටවලුත්, තුන්වන ලෝකයේ රටක් වන භූතානයත් සතුට වත්කම හැටියට සලකන බව අපට පෙනෙනවා. එය බුද්ධාගමේ උගන්වන සන්තුට්ඨී පරමං ධනං යන ඉගැන්වීමට අනුගතයි.

බුද්ධ ධර්මයට අනුව ධර්මාවබෝධයට අවශ්‍ය කායික විවේකයට වැඩිය මානසික විවේකයයි. ලෝකය භෞතික ව දියුණු වෙන විට විවිධ තාක්ෂණික මෙවලම් නිෂ්පාදනය කරගෙන මිනිස්සු කායික ව කළ යුතු වැඩ විශාල වශයෙන් අඩුකරගෙන තිබෙනවා. ඒත් ඒ තාක්ෂණයත් සමඟ අනවශ්‍ය ලෙස බැඳීම නිසා මානසික නිදහස මුළුමනින් ම වාගේ ඇහිරිලා . කායික ව නතරවෙන හැම මොහොතකම මානසික වැඩ. ඉතින් හැමෝම කියන්නේ නිදහසක් නැහැ වැඩ කියලයි.

මේ දවස්වල කොරෝනා වසංගතය විසින් මිනිස්සුන් බලයෙන්ම එක්තැන් කරනු ලැබ තිබුණා. ඒ කාලය ආසාදිත අයට හැර අනෙක් හැමෝටම වාගේ සෑහෙන්න සිතන්න විවේකයක් ලබාදුන්නා. නමුත් දැන් මිනිසුන්ට එක තැන නතරවෙලා සිටින එක මහා වදයක් වෙලා. ඒක දරාගන්න බැහැ. කොහොමහරි ඇවිදින්න අවශ්‍ය වෙනවා. කාටහරි කතා කරන්න අවශ්‍ය වෙනවා. මොනවහරි නිතරම කන්න අවශ්‍ය වෙනවා., අහන්න, බලන්න අවශ්‍ය ම වෙනවා. එහෙම බලනකොට මහින්දාගමනය සිදුවූ කාලයේ සමාජය අදට වඩා නිවනට සමීප බවයි පෙනෙන්නේ.

අදනම්, කැමැති කැමැති තැනක කැමැති කැමැති වෙලාටව බණ අහන්න පුළුවනි. ඒ කාලයේ බණ අහන්න තිබුණ අවස්ථා ව ඉතා ම සීමිත බව අප දන්නවා. මිනිස්සු බණ අහන්න ගියාම මුළු රැයක් පුරාවට බණ අහනවා. රජවරු පවා එහෙම කළා කියලා සඳහන් වෙනවා.

මොනතරම් බණ ඇහුවත් සිත තැන්පත් නැහැ. එහෙම වෙන්න හේතු ගෙදරම තිබෙනවා. වෙන දෙයක් අවශ්‍ය නැහැ. විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයක ප්‍රවෘත්තිවලට පැය බාගයක් විතර අවධානය යොමුකරගෙන සිටින අවස්ථාවක සිත මොනතරම් ව්‍යාකූල වෙනවා ද?

ඒ වගේම තමයි. ඒ හැම ප්‍රවෘත්තියක් සමඟ ම හිතේ ආවේග ඇතිවෙනවා. ඒ ආවේග ශරීරයේ ඉන්ද්‍රිය පද්ධතියට නරක ආකාරයට බලපානවා. අවශ්‍ය අනවශ්‍ය සෑම ප්‍රවෘත්තියක්ම හිසෙහි පිරෙන කොට නොදැනුවත්ව ම මානසික පීඩනය වැඩි වෙනවා. ඒ නිසා ඉන්ද්‍රිය දුර්වල වීම වේගවත් වෙනවා. අප බොහෝ විට වෛද්‍යවරයාට කියන්නේ කායික රෝගයක් ගැන වුණාට රෝග නිධානය තිබෙන්නේ අවිවේකී මනස තුළයි.

මහින්දාගමනය සිදුවූ සමාජයේ සිටි මිනිසුන්ට තමන්ගේ ගමෙන් එපිට සිදුවන දේ ගැනවත් දැනුම්වත් වෙන්න ක්‍රම තිබුණේ නැහැ. එහෙත් අද මොකද වෙලා තිබෙන්නේ? තමන් ජීවත් වන රටේම තොරතුරු පමණක් නොවෙයි. ලෝකයේ හැම රටකම සිදුවන දේ අහන්න දකින්න සිදුවෙනවා. ඒ ප්‍රවෘත්ති මගහැර ල ඉන්න බැරි තත්ත්වයක් තමයි උදාවෙලා තිබෙන්නේ. මුළු ලෝකයතුළ තිබෙන දැනුමෙන් හිස පිරුණහම කොහොම ද මානසික නිදහසක් ඇති වෙන්නේ.

මහින්දාගමනය සිදුවූ කාලයේ සමාජය ඉතාමත් සරලයි. ගිහි පැවිදි කවුරුත් නිස්කලංක ජීවිත ගත කළා. සිත තුළ රාග, ද්වේෂ, මෝහ නමැති කෙලෙස් කහට අඩුයි. බුදුහාමුදුරුවෝ වත්ථූපම සූත්‍රය, දේශනාකොට වදාළා. පිරිසුදු වස්ත්‍රයකට වර්ණ ගැන්වූ විට හොඳින් වර්ණ ගැන්වෙනවා වගේ පිරිසිදු සිතටත් හොඳින් ධර්මය අල්ලගන්නවා කියලා. නමුත් වික්ෂිප්ත සිතක ධර්මය රැඳෙන්නේ නැහැ. බොර වූ වතුරක ඇතුළේ තිබෙන්නේ මොනවාද? කියලා නොපෙනෙනවා වගේ කැළඹුණ සිතකත් අභ්‍යන්තරය දකින්න බැහැ.

මිහිඳු මා හිමියන් ලංකාවට වැඩම කරළ පැවැත්වූ ධර්ම දේශනා දෙස බලන්න. ඒවායේ වැඩි හරියක් සැපදුක් ලැබෙන හැටි පිළිබඳවයි ප්‍රකාශ වෙන්නේ. මුලින්ම උන්වහන්සේ පැහැදිලි කළේ විමානවත්ථු පේතවත්ථු පිළිබඳවයි. ඒවායේ සඳහන් වන්නේ පින් කර දෙව්ලොව ගිය පුද්ගලයන් ගැනත්, පව් කර අපායේ උපන් පුද්ගලයන් පිළිබඳවත්. මිහිඳු මා හිමියන් වදාළ හැම දේශනාවක්ම මනෝවිද්‍යාත්මක ව ඉතා ප්‍රවේශමෙන් තෝරාගත් බවක් සිතන්න පුළුවන්. ඒ කාලයේ ඇතැම් මිනිසුන් දඩයම, මසුන් මැරීම වගේ දේ කළා නම්, ඒවායෙන් ඉවත්වෙන්න පෙළඹවීමක් මෙම සූත්‍රවලින් සිදු වුණා.

මහින්දාගමනය කාලයේ ඇයි විශාල පිරිසක් ධර්මය වටහා ගත්තේ? ඒ . කාලයේ මිනිසුන්ට සිතෙන තැනට යන්න ප්‍රවාහන ක්‍රම තිබුණේ නැහැ. කැමැති කැමැති වෙලාවට විවිධ පුද්ගලයන් සමඟ කතා කරන්න දුරකථන වාගේ සන්නිවේදන ක්‍රම තිබුණේ නැහැ. නෙත පිනවන රූපවාහිනී හෝ ගත පිනවන සුව පහසු නිවාස හෝ තිබුණේ නැහැ. විවිධ රසවත් කෑම හදමින්දිව පිනවන්න තිබුණේ නැහැ. අතිබහුතරයක් විවේකයෙන් කාලය ගත කළා. මේ නිදහස ධර්මාවබෝධයට ලොකු පිටිවහලක් වුණා.

අනෙක් අතට අද වගේ නෙවෙයි, එදා මිනිසුන්ට තමන් ජීවත් වන මේ මහ පොළොව මත අති සුඛෝපභෝගී දේ දකින්න තිබුණේ නැහැ. දියුණු කියන රටවල් තිබුණේ නැහැ.කම්සැප උපරිමයෙන් ලබන්න නම්, දිව්‍ය ලෝකයට යා යුතුයි කියන පණිවිඩය ඔවුන්ට ලැබුණා. එතැනත් සදාකාලික නැති නිසා වැඩි අවධානය යොමුවුණේ සදාකාලික නිවන් සැප ලබන්නයි.

අද අපට සමාජයක් හැටියට මහින්දාගමන යුගයට ආපසු යන්න නොහැකියි. කළ යුතු වන්නේ තම තමන්ගේ ජීවිත අප්පකිච්ච,සන්තුට්ඨී, සල්ලහුක වුත්ති,සන්තින්ද්‍රියය, සුභර වැනි ගති ලක්ෂණ සහිත ජීවිතයකට අනුගත වීමයි. ඒ සඳහා නොකෑ යුතු කෑම, නොයා යුතු ගමන් , නොබැලිය යුතු හා නොඇසිය යුතු දේ , නොවිඳිය යුතු වින්ඳනයන් යම් තරමකට හෝ තේරුම් ගැනීම ඉතා ප්‍රයෝජනවත් වේවි.



හේමමාලා රන්දුනු



# මිහින්තලාවේ පුරාවිද්‍යාත්මක උරුමය

## පරිසරය සමඟ ඇතිකරගත් සෞන්දර්යාත්මක නිර්මාණශීලීත්වය

**අක්කර 600ක පමණ පැතිරී ඇති මිහින්තලේ පුදබිම ,කනදරා ඔයේ වම් ඉවුරේ පිහිටි මුහුදු මට්ටමේ සිට මීටර් 300ක් පමණ උස ශේෂ කඳු කීපයක පැතිරී ඇත.**

මිහින්තලේ යනු, එක් කන්දක් පමණක් යැයි හැඟී ගියත් මෙම ඓතිහාසික පුදබිම මිහින්තලේ (අම්බස්ථල) කන්ද,ගිරිබන්ඩ සෑය කන්ද,කණ්ඨක සෑය හා අටසැටලෙන් පිහිටි කන්ද,ඇත්පැටියා කන්ද (ආනයිකුට්ටි කන්ද) ඇත්වෙහෙර කන්ද හා රාජගිරිලෙන කන්ද යන කඳු පංතියක පැතිරී ඇත.

ථෙරවාද බුදු දහම පිළිබඳ පණිවිඩය අප රටට පළමුවෙන් ගෙනඑන ලද්දේ මිහින්තලාවට බව ඓතිහාසික මූලාශ්‍රය ගණනාවක දැක් වේ. මිහින්තලාව ම තෝරාගැනීම සඳහා එවකට ලාංකික ජනයා අතර ජන ඇදහිලි සඳහා මිහින්තලේ ප්‍රකට වී තිබීම හේතුවක් වන්නට ඇති බව මහාචාර්ය විනී විතාරණ මැතිතුමා පෙන්වා දී ඇත. අපේ රටේ හැරවුම් ලක්ෂයක් වූ මේ ඓතිහාසික සිදුවීමට පාදක වූ මිහින්තලාව මිශ්‍රක පර්වත, මිස්සක පවුව, අම්භස්ථලය, අඹතලාව හා සෑගිරිය ආදි විවිධ නම්වලින් ද හඳුන්වා ඇත.

මිහින්තලෙන් හමු වී ඇති සෙල්ලිපි ප්‍රමාණය 100කට වැඩි වේ. පැරණි ම පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි 75ක් පමණ ඇතුළත්ව සෑම සියවසක් ම පාහේ නියෝජනය කරමින් ක්‍රිස්තු වර්ෂ 10 වැනි සියවස දක්වා කාලයට අයත් සෙල්ලිපි මේ අතර පවතී. ලංකාවේ සෙල්ලිපි, අක්ෂර, භාෂාව, භාෂා පරිණාමය හා පැරණි සමාජය පිළිබඳ හදාරන විද්‍යාර්ථියෙකුට මිහින්තලේදී ඒ සියල්ලට නිදසුන් පහසුවෙන් සපයාගත හැකි වේ. මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ අදහස අනුව, ලංකාවේ රජ කෙනෙකු හා සම්බන්ධ පැරණිම නැතිනම් නිශ්චිත ව කාල නියම කළ හැකි සෙල්ලිපි හමු වන්නේ මිහින්තලෙනි. ඒ දෙවානම්පියතිස්ස රජුගේ සොහොයුරෙකු වූ උත්තිය රජු හා සම්බන්ධ සෙල්ලිපියි. ලක්දිව බෙහෙවින් ප්‍රකට හතර වැනි මිහිඳු රජු විසින් ලියවන ලද මිහින්තලේ පුවරු ලිපි දැකගත හැක්කේ ද මිහින්තලයේ දීමයි. මිහින්තලේ විහාරයේ පාලන හා පරිපාලන කරුණු මෙම ලිපියේ ඇතුළු වී ඇත.

අපේ ශිෂ්ටාචාරයෙන් තිපන් විශිෂ්ටම නිර්මාණ අතර වාරි තාක්ෂණය ඉදිරියෙන්ම පවතී. 'පද්ධති වැව්' හෙවත් 'එල්ලංගාව' අප රටේ අනන්‍යතාව පෙන්වයි. පැරණි වාරික්‍රම පිළිබඳ විශේෂඥයෙකු වන මහාචාර්ය සී.ඇම්. මද්දුමබණ්ඩාර මැතිතුමාගේ අදහස අනුව, මිහින්තලේ පැවති ජල කළමනාකරණ ක්‍රමය මේ විශිෂ්ට නිර්මාණය සඳහා ලාංකිකයිනට මග පෙන්වා දී ඇත. සියුම් ව බැලුවොත් මිස මේ නිර්මාණ අදවන විට අප්‍රකට ව පැවතීම අවාසනාවකි.

කඳු කීපයක පැතිරී ඇති මිහින්තලය අපූර්ව වන ආරාමයකි. පරිසරයට අවම මැදිහත්වීමක් පමණක් සිදුකර විහාර අංග සියල්ලක්ම පරිසරයේම කොටස් ලෙස මතුකර දක්වා තිබීම අපූර්ව කරුණකි.

මිහින්තලේ කඳු මතත්, පා මුලත් විසිරී ඇති පැරණි වාස්තු නිමැවුම් හා ඒවායේ අගය සවිස්තරාත්මක ව දැක්වීම මෙවැනි කෙටි ලිපියකින් කළ නොහැක්කකි. නමුත් ප්‍රධාන තැන් කෙටියෙන් හෝ සටහන් කිරීම යුතුකමකි. අටසැටලෙන්, පැරණි රෝහල, මනිනාග විහාරය, කණ්ඨක චේතිය, ගිරිභණ්ඩ සෑය, දාන ශාලාව, ධාතු මන්දිරය, සන්නිපාත ශාලාව, නාග පොකුණ, සේල චේතිය, ආරාධනා ගල, මිහිඳු ගුහාව, අම්බස්ථල මහා සෑය, මිහිඳු සෑය, ඇත් වෙහෙර, සිංහ පොකුණ, කටු සෑය, ඉදිකටු සෑය, රාජගිරි කන්ද හා කළුදිය පොකුණ ඒ අතුරින් සඳහන් නොකරම බැරි තැන් වේ.

සිංහල–බෞද්ධ මිනිසුන් සිතන පතන විදිහත්, පරිසරය සමඟ පැවති සම්බන්ධතාවත් පෙන්නුම් කරන නිර්මාණ වෙසෙසකි, ගල්ලෙන්. ශුද්ධ පවිත්‍රකර, ඇතුළත මැනවින් සකසා වැසි වතුර ලෙන තුළට ඒම වැළැක්වීමේ අරමුණින් කටාර කපා අනතුරුව දන්දීම ගැන කෙටි ලිපියක් ද කොටා ඇති මෙම නිර්මාණ පරිසරයේ ම කොටසකි. ලංකාවත් දකුණු ඉන්දිය ප්‍රදේශත් හැරුණු විට මෙවැනි සම්ප්‍රදායක් ලොව වෙනත් තැනක නැත.

ඓතිහාසික වාර්තා අනුව, ලොව පැරණිම රෝහලක් වන මිහින්තලේ පැරණි වෙදහළ මහාවංසයේ 51 වැනි පරිච්ඡේදයේ දැක්වෙන ආකාරයට ක්‍රිස්තු වර්ෂ 853–887 කාලයේ සිටි දෙ වැනි සේන රජු විසින් කරවූවකි.

සුප්‍රසිද්ධ මිහින්තලේ පියගැටපෙළේ මුල එහි පසෙකින් පිහිටි මනිනාග විහාරය, අනුරාධපුරයේ පංචාවාස විහාර හඳුනාගැනීම සඳහා උචිත ම තැනකි. අපේ වාස්තු විද්‍යාව, කැටයම් හා සිතුවම් කලාව මෙන්ම මිනිසුන්ගේ සංස්කෘතික–ආගමික චින්තනය කැටිකළ තැනක් වශයෙන් 'කණ්ඨක චේතිය' හඳුනාගත හැකි වේ. මෙය පුරාණ හෙළ කලාව පිළිබඳ කටුගෙයක් වශයෙන් හැඳින්වූව වරදක් නොවේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමාගේ අප්‍රතිහත උත්සාහය නිසාම කණ්ඨක සෑය ද අද අපට දැකබලා වැඳපුදාගත හැකි වේ.

මැද මළුවේ පිහිටි දාන ශාලාව, ධාතු මන්දිරය හා සන්නිපාත (රැස්වීම්) ශාලාව පැරණි විහාර වාස්තු විද්‍යාව ගැන උගෙනීමට ඉවහල් වේ. දාන ශාලාවේ ඇති 'බත් ඔරුවේ' හා 'කැඳ ඔරුවේ' ප්‍රමාණ බලන විට මිහින්තලේ විහාරයේ භික්ෂූන් වහන්සේලා 2,000ක් පමණ වැඩසිටි බවට ෆා–හියං භික්ෂූන් වහන්සේ ලියා ඇති සටහන අතිශයෝක්තියක් නොවන බව තහවුරු වේ. නාග පොකුණ, සිංහ පොකුණ හා මිහිඳු ගුහාව වනාහි ආදි සිංහලයින් පරිසරය සමඟ ඇතිකරගත් සෞන්දර්යාත්මක නිර්මාණශීලීත්වය පෙන්වන කදිම නිර්මාණ වේ.

මිහින්තලේ පැමිණෙන්නකුගේ සිතේ නොමැකෙන අයුරින් සටහන් වන ස්ථානය ආරාධනා ගලයි. මිහිඳු හිමියන් පළමුවෙන් දේවානම් පියතිස්ස නිරිඳු සම්මුඛ වූයේ මේ ස්ථානයේ දී බව බොහෝ දෙනාගේ අදහයි. එම පර්වතය තරණය කිරීම ද ආශ්වාදනීය අද්දැකීමකි.

මිහින්තලේ පූජනීයත්වය අතින් ඉහළම තැන් ගන්නේ සේල චේතිය, අම්බස්ථල මහාසෑය හා මිහිඳු මහා සෑයයි. බුදුහිමියන් වහන්සේ මෙරටට වැඩම කළ අවස්ථාවක කෙටිකාලයක් සමවත් සුවයෙන් වැඩසිට පූජනීයත්වයට පත් කළ තැන ආවරණය කරමින් ක්‍රිස්තු පූර්ව 41–19 කාලයේ මෙරට පාලකයා වූ කූටකණ්ණතිස්ස රජු විසින් ඉදිකළ ගල් ස්තූපය 'සේල චේතිය' බව විශ්වාස කෙරේ. පසු කාලීන ව මේ වටා ස්තූප ඝරයක් කරවා ඇත.ක්‍රිස්තු වර්ෂ 9–21 කාලයේ මෙරට පාලකයා වූ මහාදාඨික මහානාග රජු විසින් කරවනු ලැබූ 'අම්බස්ථල මහා සෑය' ලංකාවේ ඇති පුදුමාකාර නිමැවුමකි. උස අඩි 154ක් ද විශ්කම්භය අඩි 122ක් ද පමණ වන මෙම ස්තූපයේ ප්‍රමාණයත්, එය පිහිටි තැනත් අනුව, මෙය රුවන්වැලි සෑයට නොදෙවැනි නිර්මාණයක් බව මහාචාර්ය පරණවිතාන මැතිතුමා පෙන්වා දී ඇත. බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතූන් වහන්සේ අෂ්ටවංක මාණික්‍යයක් තුළ බහා මෙම මහා යෑයේ තැම්පත් කර ඇති බව විශ්වාස කරනු ලැබේ.

මහා සෑයට දකුණින් ඇති නටඹුන් සෑය මිහිඳු මහරහතන් වහන්සේගේ භෂ්මාවශේෂ නිධන් කර නිමැවූ ස්තූපය බව තහවුරු වී ඇත. 1951 දී මහා ස්තූපයේ සුන්බුන් ඉවත් කරන අතරතුර මෙහි ස්තූපයක් ඇතැයි දැනගත්තේ මහාචාර්ය පරණවිතානයන්ගේ අනුමානය අනුව සිදුකළ කැනීමක් මගිනි. පූජනීය වස්තු රැසක් හමුවූ මෙම ස්තූපය මිහිඳු මහ රහතන් වහන්සේගේ භෂ්මාවශේෂ නිධන් කරමින් ක්‍රිස්තු පූර්ව 9 දී පමණ උත්තිය රජු විසින් කළ ස්තූපය බව තහවුරු වීම ජාතියේම වාසනාවකි.

'කටු සෑය' මෙන්ම 'ඉදිකටු සෑය' ද ප්‍රධාන පාර අද්දර දී දැකගත හැකි වේ. මිහින්තලේ උසින් වැඩිම ඇත් වෙහෙර කන්ද මුදුණේ 'ඇත් වෙහෙර' පිහිටා ඇත. 'රාජගිරි කන්ද' මෙන්ම 'කළුදිය පොකුණ' විහාරයන්ගේ ඇති පුරාණ නිමැවුම් මෙරට ඓන්ද්‍රිය වාස්තු නිර්මාණ පිළිබඳ කදිම උදාහරණයි. මේ තැන් දෙකේම ඇති පැරණිම නිර්මාණ බැතිමතුන්ගේ සිත්තුළ ආහ්ලාදජනක සිතුවම් මැවීමට සමත් වේ.

ජනප්‍රවාදය අනුව, මිහින්තලයේ ලෙන් හැට අටකි,ස්තූප සිය ගණනකි. තවමත් සම්පූර්ණයෙන් එකිනෙක ලේඛනගත කර නැතත් මේ කතා සත්‍යයට බෙහෙවින් සමීප බව මූලික ගවේෂණ තුළින් පෙනේ.

මිහින්තලේට උතුරින් පිහිටි මොණරගල සිතුවම් හා අනුළාදේවි දාගැබ, ඊසාන දෙසින් පිහිටි මහකණදරාව වැව, ගලේ පන්සල හා ගල්පාලම, ගිණිකොණ දෙසින් පිහිටි කටුපොත කන්ද වැදගත් තැන් අතර පවතී.

කෙටි ලිපියකින් ලියා නිමකළ නොහැකි තරමේ ආගමික, සංස්කෘතික, වාස්තු, ඉතිහාස,පුරාවිද්‍යාහා පරිසර වශයෙන් අනුපමේය වටිනාකම් හිමි තැනක් නිසාම මිහින්තලේ වනාහි සමස්ත ලාංකේය බෞද්ධ ප්‍රජාවට පමණක් නොව සමස්ත ලෝක මානව ප්‍රජාවට ම ආඩම්බර විය හැකි තැනකි. එබැවින් මේ අගනා වටිනා පුදබිම 'ලෝක උරුමයක්' වශයෙන් නම්කළ යුතු තැනක් බවත් සටහන් කළ යුතු වේ.



ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ
පුරාවිද්‍යා හා උරුම
කළමනාකරණ අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**චන්දිම බණ්ඩාර අඹන්වල**

# මිහිඳු මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය හා එහි ඓතිහාසික විශ්වසනීයත්වය



මිහිඳු සෑය

ඡායාරූපය අන්තර්ජාලය ඇසුරිනි

පරිපූර්ණ ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට අවශ්‍ය සංවිධානාත්මක ආගමක් හා දියුණු වූ භාෂාවක් ජනතාව සතුවීම නිසා ශ්‍රී ලාංකේය ජනතාවට ඒකරාශි වී උදාර ශිෂ්ටාචාරයක් ගොඩනැංවීමට අවස්ථාව උදාවුණේ මිහිඳු මහරහතන් වහන්සේගේ පැමිණීම නිසා ය.

මේ ආකාරයට දීපවංසය, මහාවංසය හා වංසත්ථප්පකාසිනී ඇතුළු ග්‍රන්ථ රාශියක ම මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය නිසා අපගේ පැවති පැරණි ශිෂ්ටාචාරයේ හැරවුම් ලක්ෂයක් වන බව විවිධ අන්දමින් සඳහන් කර තිබේ. මේ අන්දමින් අති විශිෂ්ට සේවාවක් කළ මහින්ද මහා රහතන් වහන්සේ එවකට ශ්‍රී ලංකාවේ රජු වූ උත්තිය රජතුමාගේ අටවැනි රාජ්‍ය වර්ෂයෙහි දී වප් මස පුර පක්ෂයෙහි අටවැනි දිනයෙහි දී අවුරුදු අසූවක් ආයු වළඳ වස්වැස සිටියදී පිරිනිවන් පෑ සේක.

මහාවංසයෙහි සඳහන් වන්නේ අවුරුදු හැටේදී පිරිනිවන් පෑ බවයි. එහෙත් උන්වහන්සේගේ උපසම්පදාව සිදුවූයේ වයස අවුරුදු විස්සෙහි දී නම් ලංකාවට පැමිණෙනවිට උන්වහන්සේගේ වයස දෙතිසක් වන්නට ද පිරිනිවන සිදුවනවිට වයස අසූවක් වන්නට ද ඇත.

මහාවංසයෙහි සඳහන් වන ආකාරයෙන් 'ඒ මහාමහේන්ද්‍රස්ථවිර වනාහි පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන උතුම් බුදුසස්න මොනවට ලක්දිව්හි බබුළුවා ලංකාවට ප්‍රදීපයක් බඳු වූයේ මහාසමූහ ඇත්තේ ලක්දිව බුදුන් වැනි වූයේ බොහෝ ලෝවැඩ කොට ඒ උත්තිය රජුගේ රාජ්‍යාභිෂේකයෙන් අටවැනි ජයවර්ෂයෙහි සැට වයස් පිරුණු සේක් වස්සාන මාසයන්හි සෑගිරියෙහි වෙසෙමින් වප්මස ශුක්ල පක්ෂයෙහි අටවක් දවස් ද්වීපවර්ධනයට හේතු වූ මහේන්ද්‍ර ස්ථවිර තෙමේ පිරිණිවන් පෑ සේක. අටවක් දවස්හි මහේන්ද්‍ර ස්ථවිරයන් පිරිනිවි කරුණෙන් දවස ද අටවක් පෝදායි සම්මතවී. ඒ අසා උත්තිය රජතෙමේ සෝක නමැති හුලින් පහරණ ලදුයේ සෑගිරි ගොස් තෙරුන් වැඳ නොයෙක්වර නොයෙක් පරිද්දෙන් හඬා සුවඳතෙල් පුරවන ලද රන්දෙණක මහාස්ථවිර දේහය බහා මොනවට වසන ලද ඒ දෙණ අලංකෘත රන්කුළුගෙයක්හි තබ්බවා කුළුගෙය ගෙන්වාගෙන සාධු ක්‍රීඩා කෙළවමින් ඒ ඒ දිගින් ආ මහත් ජන සමූහයා කැටිව මහත්වූ භට සමූහයා ලවා පූජා විධාන කරවමින් සැරසූ මගින් නොයෙක් අලංකාරයෙන් සරහන ලද නුවරට ගෙනවුත් නුවර රාජවීථීන්හි හසුරුවා මහවෙහෙරට ගෙනවුත් මෙහි පැණඹ මළුවෙහි කුළුගෙය තබ්බවා සත්දිනක් ඒ මිහිපල් තෙමේ තොරන් කොඩිමාලා හා ගන්ධපූර්ණ ඝටයෙන් ද විහාරයන් අවට තුන්යොදුනකුත් රජහුගේ ආනුභාවයෙන් සරහන ලදුයේ විය.

එසේම මුළු ලක්දිව දෙවියන්ගේ ආනුභාවයෙන් සරහන ලද්දේ විය. ඒ මිහිපල් තෙමේ සත්දවසක් මුළුල්ලෙහි නානාප්‍රකාර පූජා සත්කාර කරවා පූර්ව දිසා භාගයෙහි තෙරුන්ගේ බද්ධමාලක නම් තැන සුවඳ දර සෑයක් කරවා මහසෑය ප්‍රදක්ෂිණා කරමින් මනරම් කුළුගෙය එහි පමුණුවා දරසෑයෙහි තබ්බවා අන්තිම සත්කාරය කෙළේ ය. ධාතූන් ගන්වා මෙහි සෑයක් ද කරවී. ක්ෂත්‍රිය තෙමේ ධාතුභාගයක් ගන්වා සෑගිරිවෙහෙරද සියලු විහාරයන්හි ද සෑ බැඳවී. ඒ සෘෂීහුගේ ශරීරය බැහූ තැන අවකාසය ද බුහුමනින් ඉසිභූමංගණ නමැයි කියන ලදි. එතැන් පටන් එය සිසාරා තුන්යොදුන් මානයෙහි කලුරිය කළ ආර්යයන්ගේ ශරීර ගෙන ඒ පෙදෙස්හි දී දවනුලැබේ." (මහාවංසය 30-49 ගාථා, ජාතික කෞතුකාගාර ප්‍රකාශනය, 1995)

මෙහි සඳහන් වන ආකාරයට උන්වහන්සේගේ ධාතූන් වහන්සේලා ගෙන්වා සෑයක් නිර්මාණය කළ බව සඳහන් වේ. මේ පිළිබඳ ව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සිය පුරාවිදු පර්යේෂණ නම් ග්‍රන්ථය තුළ කරුණු දක්වා තිබේ.

මිහින්තලේ මහසෑය අසල තිබූ ගොඩැල්ල තුළ අගලක් කැණ බැලූවිට එය සුන්බුන් ගොඩක් නොවන බවත් ජරාවාස වූ දාගැබක් බවත්, පෙනී ගියේ ය. වර්තමානයේ එය වටා මුලුමනින් ම පාහේ ශුද්ධ කර එහි පේසා වළලු දෙකත්, ධාතු ගර්භයත් පාදා ඇත. ධාතු ගර්භයේ පිටපැත්ත හොඳින් ආරක්ෂා වී තිබේ. සුන්බුන් අතර වූ ගඩොල් ගණනාවක ක්‍රිස්තු පූර්ව වකවානුවකට අයත් බ්‍රාහ්මී අක්ෂර කොටා තිබුණි. එම අක්ෂර වඩු ලකුණු ලෙස සැලකීමට පුළුවන. මෙම ස්තූපය ක්‍රිස්තු පූර්ව අවධියකට අයත් බව මෙයින් ඔප්පු වේ. මෙය කඳු මුදුණේ වූ ශුද්ධ භූමියේ සතර අතට පෙනෙන ස්ථානයක ඉදිකර ඇති හෙයින් පෙර දවස ඉතා වැදගත් සිද්ධස්ථානයක් වන්නට ඇතැයි සිතන්නට පුලුවන. මෙය වර්තමානයෙහි දී මිහිඳු සෑය නමින් හැඳින්වේ.

> උන්වහන්සේගේ උපසම්පදාව සිදුවූයේ වයස අවුරුදු විස්සෙහි දී නම් ලංකාවට පැමිණෙනවිට උන්වහන්සේගේ වයස දෙතිසක් වන්නට ද, පිරිනිවන සිදුවනවිට වයස අවුරුදු අසූවක් වන්නට ද ඇත.

එහි බදාමය පවා විශිෂ්ට ක්‍රමයකට සකස් කරන ලද්දකි. මේ සිත් ඇද ගන්නා ස්තූපය වෙනත් ස්තූප හා සමාන කර බලනවිට කුඩා ගොඩනැගිල්ලක් ලෙස පෙනුණත් දැන් එය සංරක්ෂණය කර ඇති නිසා මිහින්තලේ කන්ද දෙස පහළ සිට බලන කෙනෙකුට ඉතා මනස්කාන්ත දර්ශනයක් දිස් වේ.

මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරන අන්දමට ලංකාවේ හෝ ඉන්දියාවේ හෝ එතෙක් කිසිවිටෙක හෙළිවී නැති වර්ගයකට අයත් ඔප දැමූ කළු මැටියෙන් ඔප නිම වූ කරඬුවක් එහිදී හමුවී තිබේ. එය ග්‍රීවාකාර කරඬුවකි. එකිනෙකට හාවෙන කොටස් තුනකින් යුක්ත වූ එහි ඉහළම කොටස පියන ලෙසත්, අනිත් කොටස් දෙක වෙනම හෙප්පු දෙකක් ලෙසත් භාවිත කර තිබිණි. මෙම කරඬුව ලංකාවේ මෙතෙක් සොයාගත හැකිවී ඇති ඉතාම වටිනා මැටි බඳුන වන්නේ ය. මෙම ධාතු කරඬුවෙන් නිරූපණය කර ඇත්තේ ඉන්දියාවේ ඇති පුරාණතම ස්තූපය වන සාංචි ස්තූපයේ නිර්මාණ ක්‍රමයයි. එබැවින් මෙම ධාතු කරඬුව තැනූ අය තමන් දවස ප්‍රචලිත ව තිබුණු ස්තූපවල ආකාරය ස්වකීය නිර්මාණයෙන් නිරූපණය කරන්නට ඇතැයිද, ඒ අනුව බලනවිට මෙය ක්‍රි. පූ. තෙවැනි හෝ දෙවැනි හෝ සියවසේ නිර්මාණයක් විය යුතු යැයි ද නිගමනය කිරීම සාධාරණ ය. මෙය සුන්බුන් අතර වූ ගඩොල්කැටවල කොටා තිබුණු බ්‍රාහ්මී අක්ෂරවලටත් ගැළපෙන වකවානුවකි. මුල් ස්තූපයත්, ධාතු කරඬුවත් එකම කාලයකට අයත් යැයි සිතිය හැකි නිසා කරඬුවෙහි තිබුණු අළුද ස්තූපයක් සාදා නිදන් කර ගරු කළ යුතු තරම් ශ්‍රේෂ්ඨ යැයි සැලකූ අතිපූජිත සමකාලීනයකුගේ අළු යැයි සැලකිය හැකි ය. මීට අමතරව අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් ලැබෙන සෙල්ලිපියකින් ද මිහිඳු හිමියන්ගේ පරිනිර්වාණය පිළිබඳ ව තොරතුරු ලැබේ.

මෙසේ ලක්දිව සුබ සිද්ධිය සඳහා මුළු ජීවිත කාලයම කැප කළ ඒ මාහිමියාණෝ ජීවතුන්ගේ ලෝකයෙන් වෙන්ව ගියහ. එහෙත් උන් වහන්සේගේ නාමය අද දක්වාත් මෙරට වාසීන්ගේ සිත්සතන්වල නොමැකී පවතියි. අද පවා දහස් ගණන් වන්දනාකරුවෝ එ හිමියන් සිටි තැනට ගලින් කැපූ එක්දහස් අටසියයකට අධික පියගැටපෙළ තරණය කරති. අද එම පර්වතය මිහින්තලේ (මහින්ද ථල) යන නමින් ද, එහිමියන් සිටි ගල් ගුහාව මිහිඳු ගුහා යන නමින් ද හැඳින්වේ. කඳු මුදුනට ස්වල්පයක් පහළින් දක්නට ලැබෙන කුඩා ගල්තලය මිහිඳු මාහිමියන් සැතපුණු සයනාසනය යනු ජනප්‍රවාදයෙන් එන විශ්වාසය වේ.




පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
ඉතිහාසය අධ්‍යයනාංශයේ
මහාචාර්ය
**එන්. ඒ. විමලසේන හෑලෝගම**


වර්ෂ 2020 ක් වූ ජුනි 05 වනදා සිකුරාදු කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.